වාර්ෂික වාර්තාව

2015

මධ්‍යම පරිසර අධිකාරිය

මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය

දැක්ම

විශිෂ්ට සෙවාවක් තුලින් “

පිවිතුරු

හරිත පරිසරයක් ”

මෙහෙවර

“මනා සම්බන්ධීකරණය, ප්‍රවර්ධනය,

මහජන සහභාගීත්වය, නීති ක්‍රියාත්මක කිරීම,

නිසි තාක්ෂණික මැදිහත්වීම් සහ

පරිසර අධ්‍යාපනය හා දැනුවත්කිරීම් මඟින්

පරිසරයේ ගුණාත්මක බව සුරකින

සහ හසුරුවන ජාතියේ පෙර ගමන්කරු”

පෙරවදන

2015 වර්ෂය සඳහා වූ මෙම වාර්ෂික වාර්තාව මෙම අධිකාරියේ අංශ / ඒකක 15 ක, පළාත් කාර්යාල 09 ක අධ්‍යක්ෂවරුන්, ඒකක ප්‍රධානීන් හා පරිසර සභාව විසින් සපයනු ලැබූ තොරතුරු මත සම්පාදනය කරන ලදි. තවද, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විශෙෂ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය හා අදල තොරතුරු මෙහි අන්තර්ගත වී ඇත. මෙම වාර්ෂික වාර්තාවේ ප්‍රධාන කාර්යාලයේ ඒ ඒ ප්‍රධාන අංශ / ඒකකයන්හි හා පළාත් කාර්යාල වල ප්‍රගතිය පිළිවෙලින් වාර්තා වී ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 වන වගන්තිය ප්‍රකාර හා යහ පාලන ගුරු උපදෙස් අනුව මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික ප්‍රගතිය, වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාව ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර, පාර්ලිමේන්තුවට ද ඉදිරිපත් කළ යුතුය.

මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා ඒ ඒ අංශ / ඒකක/ පළාත්කාර්යාල ප්‍රධානීන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය තොරතුරු සපයා දෙමින්, දෙනු ලැබූ අගනා සහයෝගය හා දායකත්වය සම්බන්ධයෙන් ඔවුනට ස්තූතිය පිරිනැමීම සඳහා සැලසුම් හා පසුවිපරම් ඒකකය මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නෙමු.

සැලසුම් හා පසුවිපරම් ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ පණිවුඩය

මධ්‍යම පරිසර අධිකාරියෙහි 2015.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා අධිකාරියෙහි විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ විස්තරය සහ විගණකාධිපතිතුමාගේ වාර්තාව ඔබ හට මෙලෙස පිළිගැන්වීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

ශ්‍රී ලංකාවේ වර්තමානයෙහි ඇති වී තිබෙන සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියෙහි දී පරිසර සංරක්ෂණය පිළිබඳව කටයුතු කරන ප්‍රධානතම ආයතනය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය සුවිශෙෂී වූ කාර්යභාරයක් ඉටුකරමින් සිටී.

2015 වර්ෂයෙහි, මධ්‍යම පරිසර අධිකාරියෙහි නීති අංශය විසින්, පරිසර බලපෑම් ඇගයීමේ රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙහි නීති උපදේශක සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, ඒ අනුව පරිසර බලපෑම් ඇගයීමේ රෙගුලාසි යටතේ තිබෙන්නා වූ නියමිත ව්‍යාපෘති සහ ව්‍යාපෘති අනුමත කරන්නා වූ නියෝජිත ආයතන නාම ලේඛනය සංශෝධනය කිරීම සඳහා කටයුතු සම්පාදනය කරන ලද අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම පාර්ශවකාර ආයතනයන්හි සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය නිලධාරීන්ගේ අදහස් ලබාගන්නා ලදි. තවද නව සැලසුම් කාර්යයන් ලෙස ව්‍යාපෘති යෝජක විසින් පරිසර කළමනාකරණ සැලැස්මක් (Environment Management plan) ඇතුලත් කිරීම ප්‍රධාන කොන්දේසියක් ලෙස පරිසර බලපෑම් ඇගයීමේ කොන්දේසි යටතේ ඇතුලත් කිරීමට තීරණය කරන ලදි.

මහජනතාවගේ අවශ්‍යතා සඳහා ප්‍රධාන ජල මූලාශ්‍රයන්ගේ ජල තත්වය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම ඉතා වැදගත් කාර්යයකි. එහෙත් කර්මාන්තශාලා වලින් පිට කරන්නා වූ අපද්‍රව්‍ය ප්‍රධාන ජල මූලාශ්‍රයන්ට මුදාහැරීම තුලින් ප්‍රධාන ජල මූලාශ්‍ර දූෂණය වීම මහජනයා මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුන්වාදීමට කැමැත්තෙමි. මෙයට පිළියමක් ලෙස මධ්‍යම පරිසර අධිකාරියෙහි රසායනාගාරය මඟින් වාර්තා කරන ලද වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල මූලාශ්‍රයන්ගේ ජල සාම්පල එකතු කිරීම, විශ්ලේෂණය කිරීම සිදුකරන ලද අතර, මෙම විශ්ලේෂණ පරිසර ආරක්ෂණ කටයුතු ක්‍රියාවලියේ දී එකතු කර ගන්නා කාර්මික අපසන්දනයන් සඳහා වාණිජමය කටයුතු සඳහා , දෛනික පසුවිපරම් සඳහා හා නීතිමය අවශ්‍යතා මත විවිධ වූ ජල මූලාශ්‍රයන්හි මතුපිට හා භූගත ජල තත්වයන් පරීක්ෂා කිරීම සිදුකරනු ලබයි.

තවද, 2015 වර්ෂයෙහි අප අධිකාරියෙහි ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ පසුවිපරම් ඒකකය මඟින් අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටු කිහිපයක්ම ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සියළුම ආයතන සම්බන්ධීකරණය කොට පවත්වන ලද අතර ඒ යටතේ ප්‍රධාන ලෙස ජලාධාර ප්‍රදේශ සංරක්ෂණය, පස සංරක්ෂණය පිළිබඳ මාර්ගෝපදේශ සැකසීම සහ බොල්ගොඩ ගැසට් පත්‍රය සංශෝධනය පිළිබඳ තීරණ ගැනීම සිදු කරනු ලැබේ. තවද ජාතික පරිසර පනත යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ සියළුම තේ වතු ආශ්‍රිත ජලාධාර ප්‍රදේශ පරිසර ආරක්ෂණ ප්‍රෙද්ශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට තීරණය කරන ලදි.

මධ්‍යම පරිසර අධිකාරිය වෙත පරිසර පනත යටතේ බලය පවරා ඇති විධි නියෝගයන් සඳහාත් ලෝකය හා එක්වෙමින් පරිසර ක්ෂෙත්‍රයේ නව නිපැයුම් හා ජයග්‍රහණ ළඟාකර ගැනීම ඉතා වැදගත් වන බැවින්, පරිසර කළමනාකරණ සහ සැලසුම් සඳහා වූ ජාත්‍යාන්තර සමුළුව බත්තරමුල්ල Water's Edge හෝටලයෙහි පෙබරවාරි මස 23 සහ 24 යන දෙදින තුළ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉතා සාර්ථක ලෙස පවත්වන ලදි. මෙයට අමතරව වර්තමානයෙහි පරිසර දූෂ්‍ය කාරක කර්මාන්ත ශාලාවන්හි ව්‍යාප්තිය පිළිබඳ තත්වය හඳුනාගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් නිර්දේශිත ව්‍යාපෘති පිළිබඳ අවකාශීය තොරතුරු ඇතුළත්ව දත්ත පද්ධතිය මාසිකව යාවත්කාලීන කරනු ලබයි. මෙම දත්ත පද්ධතිය දූෂණ පාලන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම හා නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා ඉමහත්වූ කාර්යභාරයක් ඉටුකරන බව පෙන්වාදීමට කැමැත්තෙමු.

වර්තමාන ශ්‍රී ලංකාව තුළ ඉලෙක්ට්‍රොනික උපකරණ සඳහා වූ ඉල්ලුම ඉහළ යාම සැලකිය යුතු ගැටළුවක් ලෙස පසුගිය වර්ෂය හඳුනාගෙන ඇත. ඉලෙක්ට්‍රොනික උපාංග උපද්‍රවකාරී ද්‍රව්‍යවලින් සමන්විත වන බැවින් අපද්‍රව්‍ය පිළිබඳ සුවිශෙෂී වූ අවධානය යොමු කළ යුතුව ඇත. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරිය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ ඒකාබද්ධව "පවිත්‍ර ගංගා සියළු බිඳුවක්ම වටී" යන තේමාව පදනම් කරගෙන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් වීම

ඉහළ ප්‍රදේශ හඳුනාගැනීම හා එම ස්ථානයන්හි ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන් කීපයක් පවත්වන ලදි. මෙම වැඩසටහන හරහා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය මෙ.ටො. 6.8 පමණ ප්‍රමාණයක් එක්රැස් කරන ලද අතර එම අපද්‍රව්‍ය ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රලාභීන් හරහා බැහැර කිරීම සිදු කරන ලදි.

මධ්‍යම පරිසර අධිකාරිය පරිසරය කෙරෙහි මහජනතාවගේ දැනුවත් භාවය ඉහළ නැංවීම හා ඒ පිළිබඳ අධ්‍යාපනය ලබාදීම මඟින් ඔවුන්ව ශක්‍රීය ලෙස පරිසර සංරක්ෂණය සඳහා දායක කර ගැනීම හා ඔවුන්ගේ පරිසරය පිළිබඳ සැලකිලිමත්භාවය ඉහළ නැංවීම සඳහා වූ වගකීමක් දරන ආයතනයක් ලෙස මධ්‍යම පරිසර අධිකාරියෙහි අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ අංශය විසින් විවිධ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

තවද 2015 වසරේ ලෝක පරිසර දින සැමරුම “තිරසාර භාවිතය සුරැකි මිහිතලය “ යන තේමාව යටතේ ජාතික වැඩ සටහන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසෙන මහතාගේ ප්‍රධානත්වයෙන් වටදාගෙය පරිශ්‍රයේ දී ජුනි මස 05 වන දින ඉතා සාර්ථක ලෙස පවත්වන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

නිවාස, ව්‍යාපාරික ස්ථාන සහ පොදු ස්ථාන ආශ්‍රිතව අපද්‍රව්‍ය එක්රැස් කිරීම අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ පලාත් පාලන ආයතනයන්ට පැවරී ඇති ප්‍රධාන වගකීමකි. එහෙත් නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් නොමැතිකම ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරියෙහි පිළිසරු ව්‍යාපෘතිය යටතේ නව කොම්පෝස්ට් අංගන 09 ක්, ජීව වායු ඒකක 06 ක් සහ එක් කසළ දාහකයක් ඉදිකිරීම සඳහා 2015 වර්ෂයෙහි රුපියල් මිලියන 21 ක් ලබා දී ඇත.

පලාත් පාලන ආයතන ශක්තිමත් කිරීමට අමතරව මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පසුභාවිත පොලිතින් ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මඟින් පෞද්ගලික අංශ ව්‍යාවසකයින් සඳහා පහසුකම් සැලසීම සිදු කරනු ලබයි. මේ යටතේ මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පසුභාවිත ප්ලාස්ටික් හා පොලිතින් ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි වූ අපද්‍රව්‍ය එකතුකරන්නන් සහ ප්‍රතිචක්‍රීකරණයන් සඳහා හැඳුනුම්පතක් ලබාදෙන ලදි. එමෙන්ම, පොලිතීන් ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය දිරිගැන්වීම සඳහා ප්ලාස්ටික් අපද්‍රව්‍ය කැබලි කරන යන්ත්‍ර 07 ක් තෝරාගත් ප්‍රතිචක්‍රීකරණය කරන කර්මාන්ත සඳහා ලබාදෙන ලදි.

ඉහත දක්වන ලද සුවිශෙෂී කෘත්‍යයන් මධ්‍යම පරිසර අධිකාරියෙහි, තාක්ෂණික අංශයන් සහ ව්‍යාපෘතීන් ඔවුන්ගේ සුවිශෙෂී දායකත්වය ලබාදුන් අතර අප ආයතනයේ අනෙකු පහසුකම් සපයන අංශයන් වන සැලසුම්, මානව සම්පත් සංවර්ධන, පරිපාලන හා මුදල් අභ්‍යන්තර විගණන අංශය සහ තොරතුරු තාක්ෂණ අංශයන් මඟින්ද සුවිශෙෂී දායකත්වයන් මධ්‍යම පරිසර අධිකාරියේ කටයුතු සාර්ථකත්වන් කරා ගෙනයාම සඳහා පිරිනමන ලද බව ප්‍රකාශ කර සිටිමි.

අවසාන වශයෙන් පසුගිය වසර තුළ මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීමේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ඉතා කැපවීමෙන් සහ උනන්දුවෙන් සිය යුතුකම් නොපිරිහෙලා ඉටුකරමින් ඒ සඳහා සහාය ලබාදුන් අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරන්නෙමි. තවද, අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා පරිසර සභාව මඟින් අධිකාරියේ දියුණුව උදෙසා ලබාදෙන සහාය, උපදෙස් පිළිබඳව ඉතා කෘතඥ වෙමි. එමෙන්ම පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයෙහි ලේකම් අතිරේක ලේකම් සහ සමස්ථ නිලධාරින් විසින් අධිකාරියේ කාර්යයන් සාර්ථක කර ගැනීමට ලබාදෙන සහයෝගය සහ උපදෙස් සම්බන්ධයෙන් අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලය වෙනුවෙන් මාගේ ඉමහත් කෘතඥතාවය පිරිනමමි.

අවසාන වශයෙන් අධිකාරියේ කටයුතු සඳහා ලබාදුන් අහනා උපදෙස් හා මහ පෙන්වීම් පිළිබඳ ගරු පරිසර ඇමති අතිගරු මෛත්‍රිපාල සිරිසෙන මැතිතුමාට මාගේ ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි.

සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය

මධ්‍යම පරිසර අධිකාරියේ ආයතනික ව්‍යුහය



මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි මහතා (B.A., M.A., Pg. Dip., M. Sc., PhD)

සභාපති

කේ.එච්. මුතුකුඩආරච්චි මහතා (විද්‍යාවේදී ,විද්‍යාපති)

අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. ජේ.එම්.යූ. ඉන්ද්‍රරත්න මහතා (විද්‍යාවේදී (ඉංජිනේරු) (ගෞරව), ශාස්ත්‍රපති, වරලත් ඉංජිනේරු, FIE(SL), MIE (Aus.))

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මා.ස.සං., පරිපාලන හා මුදල්)

යූ.කේ.ඩී.ජී. ජයසිංහ මහතා (විද්‍යාවේදී, විද්‍යාපති)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර කළමනාකරණ හා ඇගයීම්)

එම්.ජේ.ජේ. ප්‍රනාන්දු මහතා (විද්‍යාවේදී, විද්‍යාපති, පශ්චාත් ඩිප්ලෝමාව (**RS & GIS**))

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම්)

ආචාර්ය ආර්.එම්.එස්.කේ .රත්නායක මහතා (විද්‍යාවේදී)විශෙෂ,(දර්ශනශූරී)පේරාදෙනිය ව්.වි ,වරලත් රසායනඥ ,(.රසායන විද්‍යා ඩිප්ලෝමාව)

වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර දූෂණ පාලන)

එම්.කේ.එස්. නානායක්කාර මහතා (වාණිජවේදී (ගෞරව), ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජික, වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික)

අධ්‍යක්ෂ (මුදල්)

කාන්ති ද සිල්වා මිය (විද්‍යාවේදී, විද්‍යාපති)

අධ්‍යක්ෂිකා (පරිසර බලපෑම් ඇගයීම්)

එම්.එස්.ඒ.ඊ. තිස්මල්පොල මහතා (නීතිඥ, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා)

අධ්‍යක්ෂ (මා.ස.සං./ රාජකාරී ආවරණ, පරිපාලන)

එම්.ඒ.ඒ.එන්. හෙමකුමාර මහතා (විද්‍යාවේදී, විද්‍යාපති)

අධ්‍යක්ෂ (භූගෝලීය තොරතුරු තාක්ෂණය)

නීල් පෙරේරා මහතා (ශාස්ත්‍රවේදී ආර්ථික විද්‍යා (විශෙෂ), ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා), කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමාව)

අධ්‍යක්ෂ (පරිසර අධ්‍යාපන හා දැ.කි.)

මනූජා විමලසෙන මිය (නීතිවේදී උපාධිය (ශ්‍රී ලංකා), නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස් (සිංහල / ඉංග්‍රීසි), දිවුරුම් කොමසාරිස්, සමාගම් ලේකම්)

අධ්‍යක්ෂිකා (නීති)

ටී.එම්.ඒ.එස්.කේ. රුදිගු මහතා (විද්‍යාවේදී, විද්‍යාපති (වන විද්‍යාව))

අධ්‍යක්ෂ (ස්වභාවික සම්පත් කළමනාකරණ සහ පසු විපරම්)

වසන්තා විජේසිංහ මිය (විද්‍යාවේදී (රසායන විද්‍යාව, ගෞරව), විද්‍යාපති (විශ්ලේෂණ රසායන විද්‍යාව) **M.I.chem.**, වරලත් රසායනඥ)

අධ්‍යක්ෂිකා (රසායනාගාර සෙවා)

ජී.ඒ. වීරසුන්දර මහතා (විද්‍යාවේදී, දර්ශනපති)

අධ්‍යක්ෂ (අපද්‍රව්‍ය කළමනාකරණ)

ආර්. වල්පොල මහතා (ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති (සමාජ විද්‍යාව))

අධ්‍යක්ෂ (පිළිසරු ව්‍යාපෘතිය)

කුමාරි කුලතිලක මිය (ශාස්ත්‍රවේදී)

අධ්‍යක්ෂිකා (සැලසුම් හා පසුවිපරම්)

සුනිල් ද සිල්වා මහතා (විද්‍යාවේදී, පශ්චාත් ඩිප්ලෝමා (තොරතුරු තාක්ෂණය) , විද්‍යාපති (පරිගණක තාක්ෂණය), MBCS, CITP)

වැඩ සටහන් සම්පාදක / විශ්ලේෂක

ඩී. විතානගේ මිය (විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර කළමනාකරණය), පශ්චාත් ඩිප්ලෝමා (පරිසර විද්‍යාව))

අධ්‍යක්ෂිකා (කාර්මික සම්බන්ධතා)

ඒ.සී.පී. දාබරේ මිය (ශාස්ත්‍රවේදී, වරලත් පුස්තකාලයාධිපති, ශාස්ත්‍රපති)

ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතිනි

යූ. විතානාරච්චි මිය (විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන), ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජික, වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික, HDM)

අභ්‍යන්තර විගණක

කේ.ජී.ටී.එන්. කිරිඇල්ල මහතා (විද්‍යාවේදී, විද්‍යාපති)

අධ්‍යක්ෂ (මධ්‍යම පළාත)

කේ.ඒ.පී. වැලිකන්නගේ මහතා (විද්‍යාවේදී, විද්‍යාපති, ශාස්ත්‍රපති, පශ්චාත් ඩිප්ලෝමාව (පරිසර විද්‍යාව), මානව සම්පත් කළමනාකරණය හා අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව)

අධ්‍යක්ෂ (සබරගමුව පළාත)

එම්. සිවකුමාර් මහතා (විද්‍යාවේදී, විද්‍යාපති)

අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත)

එච්.එස්.ප්‍රේමචන්ද්‍ර මහතා (විද්‍යාවේදී ගෞරව (විශෙෂ), විද්‍යාපති, වරලත් පරිසරවේදී, M.I.Biol, MIEPSL, MPMI (US))

අධ්‍යක්ෂ (ගම්පහ දිස්ත්‍රික්කය)

එන්.එස්.ගමගේ මහතා (විද්‍යාවේදී, දර්ශනපති)

අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)

සුසන්ත වෙදගේ මහතා (විද්‍යාවේදී, විද්‍යාපති)

නියෝජ්‍ය අධ්‍යක්ෂ (උඟව පළාත)

සමන්තා මල්පතිරණ මිය (විද්‍යාවේදී, විද්‍යාපති)

නියෝජ්‍ය අධ්‍යක්ෂිකා (දකුණු පළාත)

ජී.එම්.කේ. පෙරේරා මහතා (විද්‍යාවේදී, විද්‍යාපති (වන විද්‍යාව)), **පශ්චාත් ඩිප්ලෝමා** (පරිසර විද්‍යාව)

නියෝජ්‍ය අධ්‍යක්ෂ (උතුරු මැද පළාත)

විජිතා සත්‍යකුමාර් මිය (විද්‍යාවේදී, විද්‍යාපති (ස්වභාවික සම්පත් කළමනාකරණ), පශ්චාත් ඩිප්ලෝමා (පාරිසරික විද්‍යාව))

වැ.බ./ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා (උතුරු පළාත)

ඩී.එම්.කේ. දිසානායක මහතා (විද්‍යාවේදී, විද්‍යාපති)

වැ.බ./ නියෝජ්‍ය අධ්‍යක්ෂ (වයඹ පළාත)

පටුන

පෙරවදන ii
මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ පණිවුඩය iii
පටුන ix
වගු ලැයිස්තුව xi
රූප ලැයිස්තුව xiii
1.0මධ්‍යම පරිසර අධිකාරිය 1
1.1. හැදින්වීම 1
1.4. අධිකාරියේ සාමාජිකයෝ 2
.2.0අධිකාරියේ වගකීම් සහ කාර්යයන් 7
3.0. පරිසර දූෂණ පාලන අංශය 12
3.1 පරිසර දූෂණ පාලන ඒකකය 12
3.1.1 නියාමනය සහ පසුවිපරම් 12
3.1.2 ප්‍රතිපත්ති ප්‍රවර්ධනය 14
3.1.3 පරිසර දූෂණය පාලනය සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම. 15
3.2 රසායනාගාර සෙවා අංශය 20
3.2.1වායු සම්පත් කළමනාකරණ සහ පසුවිපරම් ඒකකය 20
3.2.2ජල තත්ත්ව සහ පසුවිපරම් අංශය 25
3.3 අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය 31
3.3.1 ශ්‍රී ලංකාව තුල උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම 31
3.3.3රසායනික ද්‍රව්‍ය කළමනාකරණය. 31
3.3.4ඇස්බැස්ටස් කළමනාකරණය 32
3.3.5ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය. 32
3.3.6තුනී පොලිතීන් රෙගුලාසිය ක්‍රියාත්මක කිරීම. 33
4.0. පරිසර කළමනාකරණ සහ ඇගයීම් අංශය 34
4.1 පරිසර බලපෑම් හා ඇගයීම් ඒකකය (ඇ.බ.ප) 34
.4.2ස්වභාවික සම්පත් කළමනාකරණ හා පසුවිපරම් ඒකකය 44
පර්යේෂණ හා සංවර්ධන ඒකකය 4.2 52
5.0 නීති ඒකකය 64
6.0පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය 69
.භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 6.1 69
7.0සැලසුම් හා පසුවිපම් ඒකකය 79
8.0පැමිණිලි ඒකකය 82
9.0තොරතුරු තාක්ෂණ ඒකකය 87
10.0අභ්‍යන්තර විගණන ඒකකය 89
11.0මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ පිළිවෙල 90
11.1 මධ්‍යම පරිසර අධිකාරියේ බලය පලාත් කාර්යාල වෙත විමධ්‍යගතකරණය කිරීම 90
11පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම .2. 90

11 3.දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීම් කමිටුව)DELEC) 91
12.0මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩ පිළිවෙල 92
12.1. හැඳින්වීම.....92
12.3 නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම.....94
12.4. පරිසර දූෂණය, ඉන් ඇතිවන පීඩාව සහ ස්වාභාවික සම්පත් අධිපරිභෝජනය සම්බන්ධ මහජන පැමිණිලි විසඳීම. 95
13.0 මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශෙෂ ව්‍යාපෘති. 100
13ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ”පිළිසරු“ 1. 100
13.2 පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය 130
14.3 පාසල් පරිසර නියමු වැඩසටහන 138
13.4 මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරයන් බල ගැන්වීම සහ එමගින් දිවයින පුරා සිදු කරනු ලබන පසු විපරම් ක්‍රියාවලියේ ශක්‍යතාවය ප්‍රවර්ධනය කිරීම 148
ශ්‍රී ලංකායේ ඝන අපද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 13.5 159
13.6 ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජලාශ වල ජල තත්ව පසුවිපරම් කිරීමේ හා මධ්‍යම පරිසර අධිකාරියේ බලාත්මක කිරීමේ කාර්ය මණ්ඩලය බලගැන්වීමේ JICA ව්‍යාපෘතිය. 170
14.0 ආයතනික යහපාලන වාර්තාව 176
15.0 මානව සම්පත් සංවර්ධන, පරිපාලන හා මුදල් අංශය 179
මානව සම්පත් සංවර්ධන ඒකකය 15.1.....179
15.2 මානව සම්පත් කළමනාකරණ ඒකකය 181
15.3 මුදල් ඒකකය.....184
16.0විගණකාධිපති වාර්ථාව..... 234

වගු ලැයිස්තුව

වගුව 1.1 පරිසර සභාවේ සාමාජිකයන් 3
වගුව 1.2 පරිසර කළමනාකරණය හා ආරක්ෂණය පිළිබඳ විද්වතුන් 4
වගුව 1.3 ස්වේච්ඡා සංවිධාන වල නියෝජිතයන් 4
වගුව 1.4 2015 වසරේ පවත්වන ලද රැස්වීම් 5
වගුව 3.1 2015 වසරේදී නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගණන 12
වගුව 3.2 2015 වසරේදී එකඟතාවය ලබාදුන් කර්මාන්ත ප්‍රමාණය 13
වගුව 3.3 ප.බ.ඇ ඒකකය මගින් විමර්ශනය කල පැමිණිලි ලැයිස්තුව 13
වගුව 3.4 රන් සම්මාන ලේඛනය 17
වගුව 3.5 කටයුතු කරන ලදී. ප්‍රගති සාරාංශය - 2015 පරිසර දූෂණ පාලන ඒකකය 18
වගුව 3.6 2015 වසර තුල රැස් කළ කාර්මික අපසන්දන නියැදි සංඛ්‍යාව 25
වගුව 3.7 2015 වසර තුල මතු පිට ජල ප්‍රභවයන්ගෙන් ලබා ගත් ජල නියැදි සංඛ්‍යාව 26
වගුව 3.7 : කැළණි ගඟේ නියඳි රැස් කිරීමේ ස්ථාන 27
වගුව 4.1 2015 වසරේ පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් අනුමැතිය ලබාදුන්, ප්‍රතික්ෂෙප කරන ලද ව්‍යාපෘති නාම ලේඛනය 34
වගුව 4.2 ප්‍රතික්ෂෙප කරන ලද ව්‍යාපෘති 35
වගුව 4.3 පරිසර අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂෙප කිරීම සඳහා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන වෙත මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබාදුන් ව්‍යාපෘති 35
වගුව 4.4 ප්‍රතික්ෂෙප කරන ලද ව්‍යාපෘති 36
වගුව 4.5 පරිසර බලපෑම් ඇගයීම් අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පැවැති ව්‍යාපෘති නාම ලේඛනය 36
වගුව 4.4 2015 වසර තුලදී පසුවිපරම් කරන ලද ව්‍යාපෘති පහත දැක්වේ. 40
වගුව 4.5 දැන්වීම් පුවරු සවිකළ ස්ථාන 45
වගුව 4.6 සමීක්ෂණය මගින් හඳුනාගත් දියඇලි 48
වගුව 4.7 ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය හා පසුවිපරම් කටයුතු සිදු කිරීම. 48
වගුව 4.8 යෝජිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වල වර්තමාන ප්‍රගතිය 50
වගුව 4.9 දිස්ත්‍රික්ක මට්ටමේ කර්මාන්ත දත්ත පදනමේ අවසාන සාරාංශය 59
වගුව 4.10 වාණිජමය වශයෙන් සපයන ලද භූගෝලීය තොරතුරු සෙවාවන් 62
වගුව 6.1 සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන තුල සිදුකෙරුන වැඩසටහන් 70
වගුව 6.2 පරිසර වැඩසටහන් සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ සිදුකල වැඩසටහන් 72
වගුව 6.3 ප්‍රවෘත්ති හා මාධ්‍යය නිවේදන 75
වගුව 8.1 2015 වසරේදී මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි අංශ, ඒකක, පළාත් හා දිස්ත්‍රික් කාර්යාල අතර බෙදී යාම. 82
වගුව 12.1 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය පලාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම 93
වගුව 12.2 නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම 94
වගුව 12.3 2015 වසර තුලදී හසුරුවන ලද පැමිණිලි 96
වගුව 12.4 මූලික පාරිසරික පරීක්ෂණ) IEE / (පරිසර බලපෑම් ඇගයීම) EIA (නියමයන්ට අනුකූලව201 5 වසර තුළදී අනුමත වූ ව්‍යාපෘති ලැයිස්තුව. 97
වගුව 12.5 2015 වසරේදී ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා ලබාදුන් පාරිසරික නිර්දේශ ලැයිස්තුව 98
වගුව 13.1 වගුව 01 - කොම්පෝස්ට් අංගන පසු විපරම් සටහන 2015 106
වගුව 13.2 දිස්ත්‍රික් මට්ටමින් ක්‍රමවත් සැසිවාර පිළිබඳ විස්තර 108
වගුව 13.3 දිස්ත්‍රික් මට්ටමින් ක්‍රමවත් කිරීමේ සැසිවාර පිළිබඳ විස්තර 111
වගුව 13.4 පවතින කොම්පෝස්ට් අංගනවල වැඩිදියුණු කිරීම් සඳහා සහයෝගය ලබා දීමේ විස්තර 115
වගුව 13.5 2015 වර්ෂයේදී සිදු කළ නව ව්‍යාපෘති පිළිබඳ විස්තර 116
වගුව 13.6 අත රැඳවුම් මුදල් නිදහස් කළ පළාත් පාලන ආයතන 118
වගුව 13.7 පළාත් පාලන ආයතන වෙත හලන යන්ත්‍ර ලබාදීම - 2015 118
වගුව 13.8 2015 වර්ෂයේ කොම්පෝස්ට් බදුන් බෙදා දීම 123
වගුව 13.9 අපද්‍රව්‍ය වෙන් කිරීම දැනුවත් කිරීමේ වැඩසටහන 124
වගුව 13.10 2015වසර තුළ පැවති තනතුරු හා පත්කිරීම් 127
වගුව 13.11 ක්‍රියාකාරකම් මට්ටමේ මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය 128
වගුව 13.12 2015 වර්ෂයේ පවත් වන ලද දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 134
වගුව 13.13 දිවයිනේ මුළු පාසල් සංඛ්‍යාව 10,012 (සිංහල හා දෙමළ) 138
වගුව 13.14 ප්‍රාථමික පාසල් ගුරුභවතුන් සඳහා පුහුණු වැඩසටහන් 139
වගුව 13.15 නායකත්ව පුහුණු වැඩසටහන් 139
වගුව 13.16 පෙර පාසල් ගුරුභවතුන් සඳහා වූ පුහුණු වැඩසටහන් 140
වගුව 13.17 වර්ෂයේ පරිසර නියමු ගුරු පුහුණු වැඩසටහන් 141
වගුව 13.18 විදුහල්පති පුහුණු වැඩසටහන් 141
වගුව 13.18 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවත්වන ලද වැඩසටහන් 143
වගුව 13.19 පරිසර නියමු වැඩසටහනට අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය 143

වගුව 13.20 2015 වර්ෂයේ දී පරිසර ළමා සමාජ ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රගතිය 144
වගුව 13.21 පෙර පාසල් ගුරු අත්පොත මුද්‍රණය 144
වගුව 13.22 2015වර්ෂය තුල ජල තත්ත්ව පසුවිපරම් කටයුතු සිදු කිරීමේ ප්‍රගතිය 148
වගුව 13.23 2015 වසර තුලදීපසු විපරමට ලක් කළ ජල ප්‍රභව 149
වගුව 13.24 මා ඔයේ ජල නියඳි රැස් කිරීමේ ස්ථාන 149
වගුව 13.25 දඬුගම් ඔයේ ජලයේ තත්ත්වය පසු විපරමට ලක් කිරීම 153
වගුව 13.26 සංශෝධිත සැලැස්මේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් 167
වගුව 13.27 ව්‍යාපෘති කාර්ය මණ්ඩලය 168
වගුව 13.28 මූල්‍ය ප්‍රගතිය 2015 169
වගුව 13.29 සවිස්තරාත්මක වියදම් 169
වගුව 15.1 2015 වසරේ දී සිදුකල දේශීය පුහුණු වැඩසටහන් 179
වගුව 15.2 2015 වසර සඳහා බඳවා ගැනීම් / උසස් වීම් / ඉල්ලා අස් වීම් / තනතුරු හැරයාම් සහ විශ්‍රාම ගැනීම් 181
වගුව 15.3 “පිළිසරු” ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 182
වගුව 15.4 පසු භාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමණාකරන ජාතික ව්‍යාපෘතිය 182
වගුව 15.5 ඝණ අප ද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ජාතික ව්‍යාපෘතිය 183
වගුව 15.6 මධ්‍යම පරිසර අධිකාරියට ලැබූ ප්‍රදානයන් 187
වගුව 15.7: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය 189
වගුව 15.8: මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 192
වගුව 15.9: මුදල් ප්‍රවාහ ප්‍රකාශය 195
වගුව 15.10: හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 199
වගුව 15.11: ඝටහන 4 අ 201
වගුව 15.12: ඝටහන 4ආ 203
වගුව 15.13: ඝටහන 5 206
වගුව 15.14: ඝටහන 6 207
වගුව 15.15: ඝටහන 7 208
වගුව 15.16: ඝටහන 8 209
වගුව 15.17: ඝටහන 9 209
වගුව 15.18: ඝටහන 10 210
වගුව 15.19: ඝටහන 11 211
වගුව 15.20: ඝටහන 12 212
වගුව 15.21: ඝටහන 13 212
වගුව 15.22: ඝටහන 14 215
වගුව 15.23: ඝටහන 15 216
වගුව 15.24: ඝටහන 16 217
වගුව 15.25: ඝටහන 17 219
වගුව 15.26: ඝටහන 18 219
වගුව 15.27: ඝටහන 19 221
වගුව 15.28: ඝටහන 20 222
වගුව 15.30: ඝටහන 22 224
වගුව 15.31: ඝටහන 23 229
වගුව 15.32: ඝටහන 24 231
වගුව 15.33: ඝටහන 25 231

රූප ලැයිස්තුව

රූපය 3.1. කොළඹ නගරයේ වසර 18 ක් තුල PM_{10} වාර්ෂික සාමාන්‍ය අගයේ වෙනස් වීම. 20
රූපය 3.2 නුගේගොඩ නගරයේ 2015 වර්ෂයේ වායු දූෂණ තත්වය (PM_{10}) 21
රූපය 3.3 නුගේගොඩ නගරයේ 2015 වර්ෂයේ වායු දූෂණ තත්වය ($PM_{2.5}$) 21
රූපය 3.4 නුගේගොඩ නගරයේ පැය 24 NO_2 සාන්ද්‍රණය 22
රූපය 3.5 නුගේගොඩ නගරයේ පැය 8 CO සාන්ද්‍රණය 22
රූපය 3.6 නුගේගොඩ නගරයේ පැය 24 SO_2 සාන්ද්‍රණය 23
රූපය 3.7. දොරමඩලාව නිරීක්ෂණභූමියේ PM_{10} සාන්ද්‍රණයේ වෙනස්වීම 24
රූපය 3.8 කැළණි ගඟේ නියඳි රැස් කිරීමේ ස්ථාන 27
රූපය 3.8: 2015 වසර තුළ දී කැළණි ගඟේ පිළුවී අගය විචලනය 28
රූපය 3.9: 2015 වසර තුළ දී කැළණි ගඟේ විද්‍යුත් සන්නායකතා අගය විචලනය 29
රූපය 3.10: 2015 වසර තුළ දී කැළණි ගඟේ ආවිලතා අගය විචලනය 29
රූපය 3.11: 2015 වසර තුළ දී කැළණි ගඟේ දිය වූ ඔක්සිජන් අගය විචලනය 30
රූපය 4.1. ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාල ප්‍රකාශන 45
රූපය 4.3 ම.ප.අ අදාල පර්යේෂණ දත්තපදනම 52
රූපය 4.4. මහනුවර දිස්ත්‍රික්කයේ භූමි භායනය දැක්වෙන සිතියම 54
රූපය 4.5. වර්ෂ 1972 සිට 2015 දක්වා වන භූමි ව්‍යාප්තියේ වෙනස්කම් 55
රූපය 4.6. වර්ෂ 1972 සිට 2015 දක්වා ජනාවාස ව්‍යාප්තියේ වෙනස්කම් 56
රූපය 4.7. වර්ෂ 1972 සිට 2015 දක්වා කුඹුරු ඉඩම් වල ව්‍යාප්තියේ වෙනස්කම් 56
රූපය 4.9. 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ කර්මාන්ත වල ව්‍යාප්තිය දිස්ත්‍රික්ක මට්ටමින් 59
රූපය 4.10. ගාල්ල,මාතර,පොළොන්නරුව හා නුවර එළිය දිස්ත්‍රික්ක සඳහා සකස් කරන ලද සංයුක්ත තැටිවල මුල්පිටු 61
රූපය 6.1. සොබාකෙත ඩිවිඩි තැටි 76
රූපය 6.2 නිල්වන පෙත ඩිවිඩි 76
රූපය 8.1. ඒකක සහ පලාත් කාර්යාල අතර පැමිණිලි බෙදියන ආකාරය 84
රූපය 8.2. 2015 වසරේ මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි ප්‍රමාණය හා විසඳා අවසන් කර ඇති පැමිණිලි ප්‍රතිශතය. 84
රූපය 14.1 මොන්රෝවියාවත්ත තාවකාලික බිම් පිරවුම 124
රූපය 14.2. බෙදාහරිනලද ලිපිගොනු කවර, අත්පත්‍රිකා, පෝස්ටර් 135
රූපය 14.3: මා ඔයේ නියඳි රැස් කිරීමේ ස්ථාන 150
රූපය 14.4: 2015 වසර තුල මා ඔයේ ජලයේ pH විචලනය 151
රූපය 14.5 : 2015 වසර තුල මා ඔයේ ජලයේ ආවිලතාවයේ විචලනය 151
රූපය 14.6: 2015 වසර තුල මා ඔයේ ද්‍රාවිත ඔක්සිජන් ප්‍රමාණය විචලනය 152
රූපය 14.7: 2015 වසර තුල මා ඔයේ ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුමෙහි විචලනය 152
රූපය 14.8: 2015 වසර තුල මා ඔයේ ජලයේ ක්ලෝරයිඩ ප්‍රමාණය විචලනය 153
රූපය 14.9: 2015 වසර තුල මා ඔයේ ජලයේ මුළු කෝලි ආකාර බැක්ටීරියා ප්‍රමාණය විචලනය 153
රූපය 14.10: දඬුගම් ඔයේ ජල නියඳි රැස් කිරීමේ ස්ථාන 154
රූපය 14.11 : 2015 වසර දඬුගම් ඔයේ ජලයේ pH අගය විචලනය 154
රූපය 14.12 : 2015 වසර දඬුගම් ඔයේ ජලයේ විද්‍යුත් සන්නායකතාව විචලනය 155
රූපය 14.13: 2015 වසර දඬුගම් ඔයේ ජලයේ ද්‍රාවිත ඔක්සිජන් මට්ටම විචලනය 155
රූපය 14.14: 2015 වසර දඬුගම් ඔයේ ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුම විචලනය 155
රූපය 14.15: 2015 වසර තුල දී දඬුගම් ඔයේ ජලයේ ක්ලෝරයිඩ ප්‍රමාණයේ විචලනය 156
රූපය 14.16: 2015 වසර දඬුගම් ඔයේ ජලයේ නයිට්රේට ප්‍රමාණය විචලනය 156
රූපය 14.17 : 2015 වසර බෙන්තොට ගඟේ ජලයේ pH අගය විචලනය 157
රූපය 14.18: 2015 වසර බෙන්තොට ගඟේ ජලයේ විද්‍යුත් සන්නායකතාව විචලනය 157
රූපය 14.19: 2015 වසර තුල බෙන්තොට ගඟේ ජලයේ ද්‍රාවිත ඔක්සිජන් ප්‍රමාණය විචලනය 157
රූපය 14.20: 2015 වසර තුල බෙන්තොට ගඟේ ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුම විචලනය 158
රූපය 14.21 ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශ 162

1.0 මධ්‍යම පරිසර අධිකාරිය

1.1. හැඳින්වීම

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ 1981 ස්ථාපිත කරනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය 2015 වන විට වසර 34 ක් සම්පූර්ණ කරයි .පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය මඟින් ඇති කරනු ලැබූ පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ආයතන වලින් එකකි .2015 වාර්ෂික වාරතාව මඟින් 2015 වසර තුල මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය සාධනය හා මහා භාණ්ඩාගාරයේ අරමුදල් හා විදේශ මූල්‍යාධාර යොදවමින් පළාත් කාර්යාල 09, දිස්ත්‍රික් කාර්යාල 15 හා එක් සම්බන්ධීකරණ කාර්යාලයෙහි ක්‍රියාකාරකම් සහ 2015 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශෙෂ ව්‍යාපෘතීන්ගේ ළඟා කරගත් කාර්ය සාධනය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සපයනු පිණිස එම වර්ෂය තුල සාක්ෂාත් කරගත් සාර්ථකත්වය මෙන්ම අසාර්ථකත්වය පිළිබඳ තක්සෙරුවක් ද පෙන්නුම් කරයි.

1.2. අරමුණු

මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය මත 1980 අංක 47 දරන පාරිසරික පනත පිළිවෙලින් 1988 අංක 56 දරන පාරිසරික පනත යටතේ සහ 2000 අංක 53 දරන පනත යටතේ සංශෝධනය කරන ලදි. 1980 ජාතික පාරිසරික පනත පහත සඳහන් ප්‍රධාන බලතල වලින් සමන්විත වේ.

ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිසරයේ අනතුරුදායක මෙන්ම, අනතුරුදායක වීමට ඉඩ තිබෙන අපද්‍රව්‍ය මුදා හැරීම, තැන්පත් කිරීම හෝ වෙනත් දූෂණ මාර්ග වල ස්වභාවය, ප්‍රමාණය, අන්තර්ග්‍රහණය සහ බලපෑම් විධිමත් කිරීම, පවත්වාගෙන යාම හා පාලනය කිරීම.

පාරිසරික බලපෑම් ඇගයීම් උපයෝගී කරගෙන, ක්‍රමවත්ව ඇගයීමට ලක් කරන ලද පාරිසරික ගැටළු මඟින් පරිසරයට හිතකාමී සංවර්ධනයන් තහවුරු කරමින් රටේ ස්වභාවික සම්පත් පද්ධතිය ආරක්ෂා කිරීම.

පරිසරය ආරක්ෂා කිරීමෙහිලා මහජන සහයෝගය සහ සහභාගීත්වය ලබාගැනීම. විශෙෂයෙන් පාසල් ළමුන්ගේ සහයෝගය ලබාගැනීම අරමුණු කොට දේශීය, ජාතික මෙන්ම භූගෝලීය පරිසර ගැටළු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම

අනුග්‍රාහක පිරිස් වැඩි දෙනෙකුට සෙවය සලසමින් පරිසර ආශ්‍රිත තොරතුරු සහ දත්ත සපයන මධ්‍යම මධ්‍යස්ථානයක් සෙ ක්‍රියා කිරීම.

1.3. බලතල, කාර්ය සහ රාජකාරී

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතෙහි සඳහන් බලතල, කාර්ය හා රාජකාරී වලින් මධ්‍යම පරිසර අධිකාරියේ දැනටතම අවධානය පහත සඳහන් ප්‍රධානතම බලතල, කාර්ය සහ රාජකාරී වලට යොමු කරයි.

ජාතික පාරිසරික පනතේ විධිවිධාන හා ඒ යටතේ සාදන ලද නියෝග හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

දූෂණ ඇතිවීමේ හේතූන්, එහි ස්වභාවය, ප්‍රමාණය සහ එය වැලැක්වීමෙහිලා සමීක්ෂණ හා විමර්ශන පැවැත්වීම සහ ඊට සමාන සමීක්ෂණ සහ විමර්ශන පවත්වන්නා වූ වෙනත් තැනැත්තන්ට හෝ ආයතනවලට සහාය වීම සහ සහයෝගය දීම.

පාරිසරික පරිහානියේ යම් අංශයකට අදාලව පරීක්ෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම හෝ එවැනි පරිහානි

වැලැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීමට ද, වැඩි දියුණු කිරීමට ද උපමානයන් වර්ධනය කිරීම.

පරිසරය වැඩදායී ලෙස උපයෝගී කර ගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා ද, එහි තත්වය පවත්වාගෙන යාම සඳහා ද ප්‍රමිති, න්‍යායන් සහ උපමානයන් නිශ්චය කිරීම.

පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සම්බන්ධයෙන් වූ යම් අංශ පිළිබඳව වාර්තා සහ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම

පරිසරය ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම හා අධ්‍යාපනය ලබාදීම.

1988හා 2000 වර්ෂ වලදී ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමෙන් මධ්‍යම පරිසර අධිකාරියට බලතල පැවරිනි .අනෙකුත් දේ අතර, මෙම සංශෝධනය මඟින් මධ්‍යම පරිසර අධිකාරියට පැවරෙන ප්‍රධාන බලතල පහත දැක්වේ.

පරිසරයට දූෂ කාරකයන් පිට කිරීම සිදු වන අවස්ථා වලදී එම කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිති හා මිනුම් දඬු වලට අනුකූලව නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ එසෙ කිරීමට නියම කිරීම.

පරිසරය කෙරෙහි අහිතකර බලපෑම් ප්‍රබල ලෙස ඇති වන්නා වූ යම් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙරාතුව ඒවා විසින් පාරිසරික බලපෑම් ඇගයීම් කළ යුතු යැයි නියම කිරීම.

නිශ්චිත කටයුතු ලෙස පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින, තැන්පත් කරන හෝ පිටකරන කටයුතු ගැසට් කිරීමට සහ මෙම පනතේ සඳහන් උපමාන සහ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමටත්, අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර නොමැතිව කිසිම පුද්ගලයෙකු කිසිම නිශ්චිත කටයුත්තක් නොකිරීම තහවුරු කිරීම.

1.4. අධිකාරියේ සාමාජිකයෝ

ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල යටතේ පරිසර විෂය භාර අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් අධිකාරිය සමන්විත වේ .ඉන් දෙදෙනෙක් පරිසර විෂය පිළිබඳ ප්‍රමාණවත් විශෙෂඥතාවක් හා සුදුසුකම් ඇත්තන් විය යුතු අතර, ඉන් එක් තැනැත්තෙක් පාරිසරික කළමනාකරණය පිළිබඳ මනා පරිපාලන කුසලතාවයක් හා ඒ පිළිබඳ පළපුරුද්දක් ඇත්තෙකු විය යුතුය .මේ තිදෙනා අතුරින් එක් අයෙකු අධිකාරියේ සභාපති වන්නේ ය .

අතිගරු ජනාධිපතිතුමා විසින් 02.02.2015 වැනි දින මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි මහතා මධ්‍යම පරිසර අධිකාරියේ සභාපත්වරයා ලෙස පත්කරන ලදි .එමෙන්ම, අජිත් ද කොස්තා මහතා 09.03.2015වැනි දින ද, වෛද්ය කේ .හසිත් අරවින්ද මහතා 30.01.2015 ද පත්කරණු ලැබූ අතර මහා භාණ්ඩාගාරය නියෝජනය කිරීම සඳහා 04.03.2015වැනි දින ආර් අනුෂියානාදන් මහත්මිය පත් කරන ලදි .

එතැන්සිට පහත නම් සඳහන් සාමාජිකයිනගෙන් ගෙන් එය සමන්විත වේ.

මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි මහතා - සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය

අජිත් ද කොස්තා මහතා - සාමාජික

වෛද්ය කේ .හසිත් අරවින්ද මහතා - සාමාජික

ආර් අනුෂියානාදන් මහත්මිය - මහා භාණ්ඩාගාර නියෝජිත

මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වන කේ .එච් .මුතුකුඩආරච්චි මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස පනතින් ලැබී ඇති බලය අනුව කටයුතු කරයි.

ගත වූ වසර තුල පරිසර කළමනාකරණයට අදාලව අධිකාරිය මෙහෙයවමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11ක් පවත්වන ලදි .

1.5 පරිසර සභාව

1.5.1 හැඳින්වීම

සංශෝධිත පරිදි වූ 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව පරිසර සභාව පිහිටුවන ලදි.

1.5.2 පරිසර සභාවේ ප්‍රධාන කාර්ය භාරය

ඉහත සඳහන් පනත අනුව පරිසර සභාව සතු ප්‍රධාන කාර්ය භාරයන් පහත පරිදි වේ.

මධ්‍යම පරිසර අධිකාරියේ වගකීම්, බලතල, කාර්ය හා කර්තව්‍ය සම්බන්ධයෙන් වූ කාරණය පිළිබඳව අධිකාරියට සාමාන්‍යයන් උපදෙස් දීම සහ අධිකාරිය විසින් සභාවට යොමු කරන ලද යම් කාරණා පිළිබඳව අධිකාරියට උපදෙස් දීම

1.5.3 පරිසර සභාවේ ව්‍යුහය

සංශෝධිත පරිදි 1980 අංක 7 දරණ ජාතික පරිසර පනතෙහි සඳහන් පරිදි පරිසර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් පරිසර සභාව සමන්විත වේ. පසුගිය 2015 වසර තුල දී පහත දැක්වෙන ආකාරයට පරිසර සභාවේ 12 වන සැසිය පැවැත්වුණි.

1.5.4 12 වන සැසිය

ගරු පරිසර අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන සාමාජිකයින් පරිසර සභාවේ 12 වන සැසිය සඳහා පත් කරනු ලැබිණ.

වගුව 1.1 පරිසර සභාවේ සාමාජිකයන්

	පරිසර සභාවේ සාමාජිකයාගේ නම	**නියෝජනය වන අමාත්‍යාංශය**
1	ඩබ් පී එම් ජී ආර් ශාන්ත කුමාර මුහන්දිරම් මහතා 2015 ඔක්තෝබර් සිට අද දක්වා) පී එම් නානායක්කාර මහතා 2015 අප්‍රේල් මස සිට සැප්තැම්බර් දක්වා) එස් ඩී ඒ බී බොරලැස්ස මහතා (2013 ඔක්තෝබර් සිට)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඉඩම් අතිරේක ලේකම් (ඉඩම්) ඉඩම් අමාත්‍යාංශය අධ්‍යක්ෂ (ඉඩම් ප්‍රතිපත්ති) ඉඩම් අමාත්‍යාංශය අතිරේක ලේකම් (ඉඩම්) ඉඩම් අමාත්‍යාංශය
2	එම්. ඒ. අල්ලාම් මහතා	අතිරේක ලේකම් (පාලන) කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය
3	එන් පී ඒ සි පියතිලක මහතා 2015 අප්‍රේල් සිට) අසෝක සිරිවර්ධන මහතා (2013 ඔක්තෝබර් සිට)	අතිරේක ලේකම් (පාලන හා මුදල්) කෘෂිකර්ම අමාත්‍යාංශය අතිරේක ලේකම් (පාලන) කෘෂිකර්ම අමාත්‍යාංශය
4	කේ සුභද්‍රා වල්පොල මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පළාත් පාලන) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය

	පරිසර සභාවේ සාමාජිකයාගේ නම	නියෝජනය වන අමාත්‍යාංශය
5	ජේ. ජී. එල්. සුලක්ෂන ජයවර්ධන මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
6	එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න මහතා	අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
7	වෛද්‍ය සරත් අමුණුගම මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සෙවා) සෞඛ්‍ය අමාත්‍යාංශය
8	මොන්ටි රණතුංග මහතා	අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
9	කේ එච් මුතුකුඩආරච්චි මහතා	අධ්‍යක්ෂ ජනරාල් මධ්‍යම පරිසර අධිකාරිය ලේකම් /පරිසර සභාව

පරිසර කළමනාකරණය හා ආරක්ෂණය පිළිබඳ විද්වතුන්

වගුව 1.2 පරිසර කළමනාකරණය හා ආරක්ෂණය පිළිබඳ විද්වතුන්

1	මහචාර්ය ඩබ් එම් ඩී බී වන්නිනායක මහතා	මහාචාර්ය ජ්‍යෙෂ්ඨ සාගර ජෛව විද්‍යාඥ සාගර විශ්ව විද්‍යාලය
2	ආචාර්ය නිර්මලී පල්ලෙවත්ත මිය	අංශ ප්‍රධානී, සත්ත්ව විද්‍යා අංශය, කොළඹ විශ්ව විද්‍යාලය
3	ආචාරය සුධීරා රන්වල මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශාක විද්‍යා අංශය, කොළඹ විශ්ව විද්‍යාලය
4	ජගත් ගුණවර්ධන මහතා	නීතිඥ හා පරිසරවේදී (සභාපති/පරිසර සභාව)

ස්වේච්ඡා සංවිධාන වල නියෝජිතයන්

වගුව 1.3 ස්වේච්ඡා සංවිධාන වල නියෝජිතයන්

1	නිවටන් ගුණරත්න මහතා	හිටපු සභාපති ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
2	ශ්‍යාමෙන් විදානගේ මහතා	වැඩසටහන් සම්බන්ධීකාරක පරිසරය සංරක්ෂණය සඳහා වූ අන්තර් ජාතික සංගමය

3	ඩග්ලස් තිසෙරා මහතා	අධ්‍යක්ෂ කඩොලාන වැඩසටහන කුඩා මත්ස්‍ය පදනම
4	තිලක් කාරියවසම් මහතා	සභාපති. පරිසර සංරක්ෂණ භාරය

පවත්වන ලද රැස්වීම්

2015 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රැස්වීම් වාර 9 (නවයක්) පමණ පවත්වන ලදි. එම විස්තර පහත සඳහන් පරිදි වේ.

වගව 1.4 2015 වසරේ පවත්වන ලද රැස්වීම්

පවත්වන ලද රැස්වීම්	පවත්වන ලද මාසය	දිනය
14 වන රැස්වීම	ජනවාරි	22
15 වන රැස්වීම	පෙබරවාරි	26
16 වන රැස්වීම	මාර්තු	19
17 වන රැස්වීම	අප්‍රේල්	23
18 වන රැස්වීම	මැයි	21
19 වන රැස්වීම	ජූනි	19
පරිසර සභාව නොපවත්වන ලදි	ජූලි	
	අගෝස්තු	
	සැප්තැම්බර්	
20 වන රැස්වීම	ඔක්තෝබර්	22
21 වන රැස්වීම	නොවැම්බර්	19
22 වන රැස්වීම	දෙසැම්බර්	17

සාකච්ඡා කළ කරුණු

- උතුරු අධිවේගී මාර්ගය
- යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය
- උමා ඔය ව්‍යාපෘතිය ඉදිකිරීමේ දී ඇති වන ගැටළු
- පරිසර සංරක්ෂණ ප්‍ර දේශ

- කුරුවිට ප්‍රාදේශීය සභාවේ කසළ ප්‍රශ්නය
- වරාය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ ගැටළු
- මන්නාරම විඩත්තිලතිව් ප්‍ර දේශයේ INDIAN Courser) අභිජනන ස්ථානය ආරක්ෂා කර දීම
- කිරිඅම්මා උල්පත ප්‍රදේශීය සංරක්ෂණය කිරීම
- අනවසර ඉඩම් ගොඩකිරීම වැල්ලම්පිටිය කිත්තම්පහුව
- වයඹ පළාත් පරිසර ගැටළු
- පුත්තලම කලපුව ආශ්‍රිත ගැටළු
- පරිසර උපාය මාර්ගයික සැලසුම පිළිබඳ ගැටළු
- කඩොලාන පරිසර පද්ධතිය
- කඩොලාන තෙත් බිම් පරිසරය පද්ධතිය
- ක්‍රමෝපායික පාරිසරික බලපෑම් තක්සේරුව
- මොරපිටිය අත්වැල්තොට දියඇල්ල ආශ්‍රිත කුඩා විදුලි බලාගාරය
- නාඋල බොබැල්ල ප්‍ර දේශ පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස සරක්ෂණය කිරීම
- බුවල්කා ස්ටීල් සමාගම මගින් සිදුවන පරිසර දූෂණය
- හරිත සම්මාන ඇගයීම
- කර්මාන්ත වලින් පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය වර්ගීකරණය
- කැළණි ගඟට අපද්‍රව්‍ය මුසුකර කොකා කෝළා ආයතනය
- පවිත්‍ර ගංගා වැඩසටහන
- ලංකාවට CAT Fish නැමැති මත්ස්‍යයන් ආනයනය කිරීම
- පාරිසරක හා ඓතිහාසික වශයෙන් වැදගත් වන සුවිශෙෂි ශාක ආරක්ෂා කිරීම
- වරාය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ වර්තමාන තත්වය පිළිබඳ සාක්ච්ඡා කිරීම
- නිලාවෙලි පුල්මුඩෙ මාර්ගයේ කුඹුරුපිටිය ග්‍රාමයේ කි මී 22 කණුව ඉදිරිපස වනපියස වනජීවී ආරක්ෂණ කලාපයක් කිරීම
- කාබනික පොහොර, පොහොර සහනාධාරය ලෙස සැලකීම
- සුවිශෙෂි ස්ථාන ආරක්ෂා කිරීම පිළිබඳ ළමුන් සඳහා වැඩසටහන් සකස් කිරීම
- ආරණ්‍ය සෙනාසන භූමි ආරක්ෂා කිරීම
- 2017 වර්ෂයේ ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු භාවිතය තහනම් කිරීම

2.0. අධිකාරියේ වගකීම් සහ කාර්යයන්

මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් තාක්ෂණික වශයෙන් විශේෂිත වූ ක්ෂේත්‍ර 04 ක් පාදක කොට ගෙන, ආයතන ව්‍යුහය සමන්විත වේ.

- පරිසර දූෂණ පාලන අංශය
- පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය
- පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය
- මානව සම්පත් සංවර්ධනය, පරිපාලන හා මුදල් අංශය

පරිසර කළමනාකරණ අංශයෙහි ඉමහත් පළපුරුද්දක් සහිත අධ්‍යාපනික සහ වෘත්තීමය දැනුමක් ලත් නිලධාරීන් මෙම අංශයන්හි ප්‍රධානීන් ලෙස කටයුතු කරනු ඇත.

පරිසර දූෂණ පාලන අංශය

පරිසර දූෂණ පාලන අංශය යටතේ පිහිටුවන ලද ඒකක තුනෙහි කාර්යයන් පහත පරිදි වේ.

පරිසර දූෂණ පාලන ඒකකය

- ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා පරිසර එකඟතාවය ලබාදීම (නව පරිසර නිර්දේශ හා පරිසර ආරක්ෂණ බලපත්‍ර)
- විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සඳහා ස්ථාන නිර්දේශයන් ලබාදීම
- විදුලි සංදේශ කුළුණු සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම
- පරිසර දූෂණය සම්බන්ධ මහජන පැමිණිලි විසඳීම.
- ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාදාමයට සහභාගීවීම.
- පරිසර දූෂණය පාලනය සඳහා තාක්ෂණික පහසුකම් සැපයීම
- මානව හිමිකම් කොමිසමේ සහ උසාවියේ ප්‍රවීණ සාක්ෂිකරුවන් ලෙස පෙනී සිටීම හා පාර්ලිමේන්තු කමිටු, මානව හිමිකම් කමිටුව හා උසාවි සඳහා තාක්ෂණික වාර්තා සැපයීම
- දූෂණය පාලනය සඳහා කාර්යක්ෂම නව උපාය මාර්ග ක්‍රම හා මෙවලම් හඳුන්වා දීම

අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය

- උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ නීති හා රෙගුලාසි හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම
- අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ප්‍රධාන ව්‍යාපෘති සැලසුම් හා පසුවිපරම් කිරීම
- අනුකූලතා පසුවිපරම් කිරීම
- කසළ කළමනාකරණය සඳහා තාක්ෂණ න්‍යාමන ක්‍රම ප්‍රවර්ධනය කිරීම
- බහුජාතික පාරිසරික සම්මුතීන් ක්‍රියාත්මක කිරීම (බාසල් සම්මුතිය - රොටර්ඩෑම් සම්මුතිය)
- කර්මාන්ත ගැටළු කළමනාකරණය
- කාර්මික රසායනික ද්‍රව්‍ය කළමනාකරණය
- කසළ කළමනාකරණ ව්‍යාපෘතීන් - ක්‍රියාකාරකම් සඳහා පාරිසරික අනුමැතිය ලබා ගැනීමට සහයෝගය ලබා දීම
- නීතිය ක්‍රියාත්මක කරවීම සඳහා තාක්ෂණික සහයෝගය ලබා දීම
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නියම ව්‍යාපෘති ඇති කිරීම
- මහජන පැමිණිලි විමර්ශනය
- අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සහයෝගය ලබා දීම
- කසළ කළමනාකරණ ව්‍යාපෘති අධීක්ෂණය
- නිකුත් කරන ලද නිර්දේශය පසුවිපරම් කිරීම

- අනෙකුත් ආයතන වල කසළ කළමනාකරණය ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම

වායු තත්ව සහ ජල තත්ව රසායනාගාර ඒකකය

- මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් අංශ සහ දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය විශ්ලේෂණ සෙවා සැපයීම
- පාරිසරික තත්ව / ප්‍රමිති පසුවිපරම් කිරීම
- තෝරාගත් ස්ථාන වල ජල හා වායු තත්ව පසුවිපරම් කිරීම
- වායු, ශබ්ද, කම්පන හා ජල තත්ව පිළිබඳ පාරිසරික පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු සිදු කිරීම
- ශබ්දය, වායු තත්ව සහ ජල තත්ව පිළිබඳ රෙගුලාසි සකස් කිරීම

පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය

පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය ඒකක තුනකින් සමන්විත වේ.

පරිසර බලපෑම් ඇගයීම් ඒකකය

- මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.
- පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.
- පරිසර බලපෑම් ඇගයීමේ හා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය හා සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පරිසර බලපෑම් ඇගයීම හා මූලික පාරිසරික පරීක්ෂණයන්ට අදාළ ගුරු උපදෙස් සකස් කිරීම
- උපාය මාර්ගික පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.

ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය

- පරිසර බලපෑම් ඇගයීම් හා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියට අයත් නොවන ව්‍යාපෘති සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම
- ව්‍යාපෘති පසුවිපරම් කටයුතු සිදු කිරීම
- ස්වභාවික සම්පත් භායනය පිළිබඳ මහජන පැමිණිලි විභාග කිරීම
- ස්වභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගුරු උපදෙස් නිකුත් කිරීම

පර්යේෂණ හා සංවර්ධන ඒකකය

- භූගෝලීය තොරතුරු ආශ්‍රයෙන් දත්ත රැස් කිරීම
- පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- දිස්ත්‍රික් පැතිකඩ සඳහා සිතියම් පිළියෙල කිරීම
- පාරිසරික පර්යේෂණ සම්බන්ධීකරණ සහ පර්යේෂණ වල ප්‍රතිඵල ලබාදීම

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය

- මුද්‍රිත මාධ්‍ය, ඉලෙක්ට්‍රොනික මාධ්‍ය සහ කණ්ඩායම් සන්නිවේදන මාර්ග හරහා පරිසරය පිළිබඳ අධ්‍යාපනය ලබාදීම හා දැනුවත් කිරීම.
- ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් පුහුණු වැඩමුළු සහ ප්‍රදර්ශන පැවැත්වීම.
- මහජනතාව වෙත පාරිසරික තොරතුරු ලබාදීම
- රාජ්‍ය නොවන සංවිධාන වෙත අවශ්‍ය සහයෝගය ලබාදීම හා ලබාගැනීම.
- පාරිසරික දිනයන් සැමරීම.
- සොබාකෙත මධ්‍යස්ථාන ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය

- පාරිසරික තොරතුරු රැස් කිරීම හා වැඩිදියුණු කිරීම.
- පුස්තකාල ජාලය හා ජාලයට අයත් නොවන පුස්තකාල සම්බන්ධීකරණය.
- ජාතික පාරිසරික තොරතුරු අවශ්‍ය සියළු දෙනාට එම තොරතුරු ලබාදීමට පහසුකම් සැලසීම.

ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය

- සියළුම වැඩ සටහන් සම්පාදකයන් සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සැපයීම.
- මධ්‍යම පරිසර අධිකාරිය හා පාරිසරික අමාත්‍යාංශය විසින් පවත්වන ලද සියළු වැඩ සටහන් ශ්‍රව්‍ය දෘශ්‍ය ආවරණය කිරීම.
- අධ්‍යාපනික හා දැනුවත් කිරීම් සඳහා වීඩියෝ පටි සැකසීම.
- වීඩියෝ පට සැකසීම සඳහා පහසුකම් සැපයීම.

මානව සම්පත් සංවර්ධන, පරිපාලන සහ මුදල් අංශය

මානව සම්පත් සංවර්ධන, පරිපාලන හා මුදල් අංශය, මානව සම්පත් සංවර්ධන, පරිපාලන හා මුදල් යන ඒකක තුනකින් සමන්විත වේ.

මානව සම්පත් සංවර්ධන ඒකකය

- මානව සම්පත් කළමනාකරණ සැලසුම් සකස් කිරීම.
- තෝරා ගැනීම, බඳවා ගැනීම සහ උසස්වීම් ලබාදීම.
- පුහුණු වැඩ සටහන් වෙත කාර්ය මණ්ඩලය යොමු කිරීම.
- පුද්ගල කාර්ය සාධන ඇගයීම.
- පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සහ දේශීය / විදේශීය පුහුණුවීම් සඳහා සුදුසු නිලධාරීන් යොමු කිරීම.
- කාර්ය මණ්ඩල සාමාජිකයන් හට සිදු වූ අසාධාරණකම් සොයා බලා ඒ වෙනුවෙන් කටයුතු කිරීම.
- මානව සම්පත් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම.

පරිපාලන ඒකකය

- මිලදී ගැනීම්, අත්පත් කර ගැනීම් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තුව.
- සෙවා එකඟතා නිකුත් කිරීම හා අළුත් කිරීම.
- රක්ෂණ පහසුකම් සඳහා ප්‍රවර්ධන පහසුකම් ලබාදීම.
- ආයතනික සෞඛ්‍ය ආරක්ෂණය සහ සුභසාධනය.
- සාමාන්‍ය පරිපාලනය.

මුදල් ඒකකය

- වාර්ෂික ආදායම් / වියදම් සකස් කිරීම හා අවසන් මුදල් වාර්තා ඉදිරිපත් කිරීම.
- අවසන් ප්‍රගති වාර්තා සකස් කිරීම හා මාසික ආදායම් / වියදම් පාලන වාර්තාව සකස් කිරීම.
- වැටුප් හා වෙනත් ගෙවීම් පිළිබඳ වාර්තා සකස් කිරීම හා ගෙවීම.
- ව්‍යාපෘති ගිණුම් පවත්වාගෙන යාම.
- ඵලදායී ගෙවීම්.

නීති ඒකකය

- ජාතික පාරිසරික පනත යටතේ නීති කෙටුම්පත් සංශෝධනය හා නව නීති රෙගුලාසි පැනවීම.
- ජාතික පාරිසරික පනත බලාත්මක කිරීම හා රෙගුලාසි ගැසට් කිරීම.
- පරිසර පනත යටතේ 12 වන වගන්තිය සහ 24 වගන්ති යටතේ නියෝග නිකුත් කිරීම.

- නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර අත්හිටුවීම / අවලංගු කිරීම හා ප්‍රතික්ෂෙප කිරීම.
- ආයතන කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් වගන්ති 23 S යටතේ නියෝග නිකුත් කිරීම.
- පරිසර ආරක්ෂණ බලපත්‍ර කොන්දේසි අනුමත කිරීම හා අධිකරණයට වාර්තා ඉදිරිපත් කිරීම.
- මධ්‍යම පරිසර අධිකාරිය ගොනු කළ හා මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව ගොනු කළ නඩු කටයුතු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- අමාත්‍යාංශයේ පැවැත්වෙන විමර්ශන හා ඇපැල් විභාග සඳහා පහසුකම් සැපයීම.
- අධිකරණ නෛතික කටයුතු සඳහා ලිපිලේඛන සැකසීම.
- පාරිසරික ව්‍යවස්ථා නීතිකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම හා සම්පත් දායකයන් ලෙස ද කටයුතු කිරීම.
- පාරිසරික නෛතික කටයුතු පිළිබඳ අනෙකුත් අංශ හා ආයතනයන්ට උපදෙස් ලබාදීම.
- ගිවිසුම් කෙටුම්පත් කිරීම හා අනුමත කිරීම.
- පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පොලිස් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම.

සැලසුම් හා පසුවිපරම් ඒකකය

- මූලික දත්ත රැස්කිරීම, අවශ්‍ය දත්ත සහ දත්ත ප්‍රභවයන් හඳුන්වාදීම සහ දත්ත ප්‍රභවයන් හා දත්ත රැස්කරන ක්‍රම සම්බන්ධ කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ සංයුක්ත සැලැස්ම සකස් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ සංයුක්ත සැලැස්ම, වාර්ෂික සැලැස්ම හා මධ්‍යකාලීන වැඩ සටහන් මත පදනම්ව ඒ ඒ ප්‍රතිපාදන යටතේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම.
- පසුවිපරම් කිරීම පිළිබඳ සැලසුම් සකස් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ විවිධ අංශ සහ දිස්ත්‍රික් / පළාත් කාර්යාල අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- ඇගයීම් සංවිධානය කිරීම.
- ප්‍රගති වාර්තා සකස් කිරීම සහ වෙනත් අදාල ආයතන වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.
- වාර්ෂික වාර්තාව සකස් කිරීම.
- මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පිළිබඳ දේශීය - විදේශීය මූල්‍යාධාර ආයතන, පුද්ගලික අංශයේ අදාල ආයතන හා වෙනත් අදාල ආයතන දැනුවත් කිරීම.

පැමිණිලි ඒකකය

- පාරිසරික ගැටළු, හානි හා උපද්‍රව සම්බන්ධ මහජන හා ආයතනික පැමිණිලි ලබාගැනීම
- එකී ගැටළු අදාල ආයතන වලට යොමු කිරීම හා ඒ සම්බන්ධව කටයුතු කිරීම

අභ්‍යන්තර විගණන ඒකකය

- ගණකාධිකරණ හා අභ්‍යන්තර පාලන ක්‍රියා පිළිවෙල පිළිබඳ සමාලෝචනය.
- මූල්‍ය හා මිනුම් තොරතුරු විමර්ශනය කිරීම.
- ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ආර්ථික බව, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පිළිබඳ මූල්‍ය හා මූල්‍ය නොවන පාලනයන් පිළිබඳ ප්‍රගති සමාලෝචනය කිරීම.
- ආයතනයේ අභ්‍යන්තර හා බාහිර නීති රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති හා මඟ පෙන්වීම් ක්‍රියාත්මක කෙරෙන්නේදැයි පරීක්ෂා කිරීම.
- කළමනාකරණය විසින් ව්‍යවස්ථානුකූලව පවරන ලද විශෙෂ විමර්ශණ.

පළාත් කාර්යාල

- පාරිසරික කළමනාකරණය සම්බන්ධ පහත සඳහන් කාර්යයන් පළාත් කාර්යාල වෙත පවරා දී ඇත.
- මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් / දිස්ත්‍රික් කාර්යාල වල කාර්යභාරය.

- යෝජිත සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම
- නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම.
- කර්මාන්ත සඳහා නියමිත කටයුතු / පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම (පළාත් පාලන ආයතන වෙත බලය පවරා නොමැති)
- පළාත් පාලන ආයතන වෙත බලය පවරන ලද ක්‍රියාවලීන් සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය සහ පළාත් පාලන ආයතන අතර සම්බන්ධීකරණය, පසුවිපරම් කටයුතු සිදුකිරීම සහ අවශ්‍යතාවය අනුව තාක්ෂණික උපදෙස් ලබාදීම.
- ස්වභාවික සම්පත් කළමනාකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- මූලික පාරිසරික පරීක්ෂණයට / පරිසර බලපෑම් ඇගයීමට ලක් නොවන එනම්, මැණික් ගැරීම, ඉඩම් ගොඩ කිරීම, ගස් කැපීම වැනි ව්‍යාපාර සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය ලබාදීම.
- පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- පරිසරය සම්බන්ධ ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වෙන රැස්වීම් හා කාර්යයන් සඳහා මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරමින් සහභාගී වීම.
- රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන, වෙනත් ස්වේච්ඡා ආයතන, කර්මාන්ත හා වෙළෙඳ සංගම්, පාසල් සහ තරුණ සංවිධාන අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, ගම් මට්ටමින් හා පාසල් මහින් ක්‍රියාත්මක වන පාරිසරික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.
- පරිසර කළමනාකරණයට අදාල ප්‍රාදේශීය මට්ටමින් තොරතුරු / දත්ත රැස්කිරීම, දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.
- මධ්‍යම පරිසර අධිකාරියේ පස් අවුරුදු වැඩ සටහනට අනුකූලව පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සඳහා වාර්ෂික ක්‍රියාත්මක වැඩ සටහන් සකස් කිරීම.

අධිකාරියේ කාර්ය සාධනය

පහත පරිච්ඡේදයෙන් ඒ ඒ අංශ, ඒකක හා පළාත් කාර්යාල වලින් 2015 වසර තුල ඉටු කරන ලද කාර්ය සාධනයන විග්‍රහ කෙරේ.

3.0. පරිසර දූෂණ පාලන අංශය

3.1 පරිසර දූෂණ පාලන ඒකකය

පරිසර දූෂණ පාලන අංශය යටතේ පවතින පරිසර දූෂණ පාලන ඒකකය පරිසරය දූෂණය වැලැක්වීම හා පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම දරයි. පරිසර දූෂණ පාලනය සඳහා නව ක්‍රමවේද සකස් කර හඳුන්වාදීමත්, මෙම කටයුතු පිළිබඳව විධිමත් පසුවිපරම් සිදු කිරීමත් මෙහි මූලික අරමුණු වේ. මෙකී අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා පරිසර දූෂණ පාලන ඒකකය මගින් නිරන්තරව සිදුකරනු ලබන විධිමත් ක්‍රියාකාරකම් වලට අමතරව JICA ආයතනයේ ආධාර ඇතිව මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාර නිලධාරීන්ගේ හා බලාත්මක නිලධාරීන්ගේ හැකියාවන් දියුණු කිරීමේ ව්‍යාපෘතියක් 2015 වර්ෂයේ සිට ආරම්භ කර ඇත.
ඉහත ක්‍රියාකාරකම් වඩාත් පහසු ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන විෂයපථ කාණ්ඩ හතරකට ගොනු කරන ලදී.

1. නියාමනය සහ පසුවිපරම්
2. ප්‍රතිපත්ති ප්‍රවර්ධනය
3. තාක්ෂණික පහසුකම් සැපයීම.
4. පරිසර දූෂණ පාලනය සඳහා විශෙෂ වැඩ සටහන්.

3.1.1 නියාමනය සහ පසුවිපරම්

3.1.1.1 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.

1533/16 හා 2008.01.25 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයේ පළකර ඇති නියමිත ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමේ ක්‍රමවේදය පරිසර දූෂණ පාලන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.
කර්මාන්ත මඟින් සිදුවන පරිසර දූෂණ තත්වයන් ප්‍රායෝගිකව අධ්‍යනය කිරීමෙන් අනතුරුව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගතයුතු නියමිත ක්‍රියාකාරකම් ගැසට් නිවේදනයේ කාණ්ඩ “අ’’ “ආ’’ සහ “ඇ’’ වශයෙන් ලැයිස්තු ගතකර ඇත. ඒ අනුව “අ’’ කාණ්ඩයට අයත් මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත 80 ක්ද “ආ” කාණ්ඩයට අයත් මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත 33 ක්ද “ඇ ’’ කාණ්ඩයට අයත් සුළු පරිමාණ දූෂකාරක කර්මාන්ත 25 ක්ද මෙම ලැයිස්තුවට අයත් වේ. “අ” සහ “ආ” කාණ්ඩයට අයත් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල මඟින් සිදුකරනු ලබන අතර “ඇ” කාණ්ඩයේ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය අදාල පළාත් පාලන ආයතන මඟින් සිදුකරනු ලැබේ.
පරිසර දූෂණ පාලන අංශය මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත සඳහා ක්‍රමික දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබන අතර, ඒවා සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේදී විධිමත් අංකන ක්‍රමයක් භාවිතා කිරීම මගින් එම තොරතුරු ක්‍රමානුකූලව දත්ත ජාලයට ඇතුලත් කිරීම කරනු ලැබේ.

වගුව 3.1 2015 වසරේදී නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගණන

නව පරිසර ආරක්ෂණ බලපත්‍ර අංක	1791
අලුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර අංක	2531

3.1.1.2 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යාපෘතින් සඳහා පාරිසරික එකඟතාව ලබාදීම.

ආයෝජන මණ්ඩල පනතේ කාණ්ඩ අංක 17 ට අනුව, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත/ව්‍යාපෘති සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබාදීමෙන් අනතුරුව අදාල පරිසර ආරක්ෂණ බලපත්‍රය ආයෝජන මණ්ඩලය මගින් නිකුත් කරනු ලැබේ. ඒ අනුව ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ කර්මාන්ත/ ව්‍යාපෘති සඳහා එකඟතාවය ලබාදීමේදී එම ක්‍රියාකාරකම් වල පරිසර දූෂණ පාලනය සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් පරිසර දූෂණ පාලන අංශය මඟින් සිදුකරනු ලබයි.

2015 වසර තුලදී ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යාපෘති/ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම සහ ස්ථානගත කිරීමට යෝජිත ව්‍යාපෘතින් සඳහා එකඟතාවය ලබාදීම පහත පරිදි වේ.

වගුව 3.2 2015 වසරේදී එකඟතාවය ලබාදුන් කර්මාන්ත ප්‍රමාණය

නව පරිසර ආරක්ෂණ බලපත්‍ර සංඛ්‍යාව	59
අළුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර සංඛ්‍යාව	433
ස්ථාපිත කිරීමට නියමිත නව ව්‍යාපෘතින් සඳහා එකඟතාවය ලබාදීම	99
කර්මාන්ත පසුවිපරම්	142
සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ	33

3.1.1.3 පැමිණිලි විමර්ශණය කිරීම සහ පසුවිපරම් කිරීම.

මහජන පැමිණිලි විමර්ශණය කිරීම හා කර්මාන්ත කටයුතු මඟින් සිදුවන පරිසර දූෂණ පාලනය පිළිබඳ ඇගයීම් වාර්තා (අපජල තත්ව වාර්තා, ශබ්දය හා කම්පනය රසායනාගාර මිනුම් වාර්තා) පිළිබඳ විමර්ශණය කිරීම පරිසර දූෂණ පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ. ආයෝජන මණ්ඩලයේ අනුමත කර්මාන්ත වලට අදාලව ලැබෙන පැමිණිලි සහ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් සෘජුවම යොමුකරන අනෙකුත් විශෙෂ පැමිණිලි විමර්ශණය කිරීම පරිසර දූෂණ පාලන ඒකකය විසින් සිදුකරනු ලබයි.

වගුව 3.3 ප.බ.ඇ ඒකකය මගින් විමර්ශනය කල පැමිණිලි ලැයිස්තුව

පැමිණිලි	**BOI කර්මාන්ත**	**BOI නොවන කර්මාන්ත**
ලැබුණු පැමිණිලි	59	02
පරීක්ෂාකර ක්‍රියාමාර්ග ගත්	58	-
අදාල ආයතන වෙත යොමුකළ	01	02

3.1.1.4 අපනයන ප්‍රවර්ධන කලාප සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ කර්මාන්ත ස්ථානගත කොට ඇති අපනයන සැකසුම් (Export Processing Zone) කලාප 12 ක් දිවයින තුළ ඇත. පරිසර බලපෑම් ඇගයීම් සිදුකොට පිහිටුවන ලද මෙම කලාපයන්හි පවතින කර්මාන්ත මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත ලෙස ගැසට් නිවේදනයට අනුව සඳහන් කළහැක. ඒ අනුව මෙම කර්මාන්ත කලාපයන්හි පරිසර දූෂණ පාලනය පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය හරහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන ඒකකය මඟින් සිදුකරනු ලැබේ. තවද මෙම කර්මාන්ත මඟින් පරිසරයට මුදාහරින අපජලය සහ විමෝචනය කරන දූෂකාරක පාලනය සහ අවම කිරීමේ අරමුණින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කරනු ලබන අතර, ඒ සඳහා අඛණ්ඩ පසුවිපරම් කටයුතු සිදුකරනු ලැබේ.

පරිසර දූෂණ පාලන ඒකකය මඟින් මල්වත්ත, හොරණ, වතුපිටිවල, මීරිගම, අවිස්සාවේල්ල, බියගම, කටුනායක හා කොග්ගල අපනයන කලාප පරීක්ෂා කර ඇත. එමෙන්ම මල්වත්ත, හොරණ හා වතුපිටිවල අපනයන කලාප සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇත.

3.1.1.5 පාරිසරික නිර්දේශය ලබාදීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීම.

අළුතින් ආරම්භ කරන කර්මාන්ත/ ව්‍යාපෘති හා පවතින කර්මාන්ත/ව්‍යාපෘති සඳහා වන පුළුල් කිරීම් සඳහා අංක 1/2015 (නීති) මා 2015.04.29 දරණ චක්‍රලේඛය මඟින් පරිසර නිර්දේශ ලබා ගැනීමට නියෝග කර ඇත. අංක 1533/16 හා 2008.01.25 ගැසට් නිවේදනයේ සඳහන් කර්මාන්ත (අ,ආ,ඇ) සඳහා මෙය අත්‍යාවශ්‍ය වේ.

3.1.2 ප්‍රතිපත්ති ප්‍රවර්ධනය

3.1.2.1 නියමිත ක්‍රියාකාරකම් ලැයිස්තුව සංශෝධනය කිරීම.

2015 වර්ෂයේ දී 2008.01.25 දිනැති අංක 1533/16 දරණ අතිවිශෙෂ ගැසට් නිවේදනයේ සඳහන් ලැයිස්තුව සංශෝධනය කිරීම සිදු කරන ලදී. අවසාන කෙටුම්පත අනුමත කිරීම හා ගැසට් ගත කිරීම සඳහා නීති අංශය වෙත යොමුකරන ලදී. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ යෝජිත රෙගුලාසි සම්බන්ධව සාකච්ඡා වාර 3 ක් පවත්වන ලදී

3.1.2.2 අපජලය බැහැරලීම සඳහා වූ ප්‍රමිති හා උපමාන රෙගුලාසි සංශෝධනය කිරීම.

ජීවීන්ට හිතකර ලෙස ජලයේ තත්ත්වය පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය කරුණකි. එසෙ වුවද වර්තමානයේදී ජල ප්‍රභවයන්ට කර්මාන්ත මඟින් මුදාහරිනු ලබන අපජල ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවන බව දක්නට ලැබේ.

මේ නිසා කර්මාන්ත වලින් පිටකරනු ලබන අපජලය සඳහා ජල තත්ව ප්‍රමිති නියාමනය කිරීමට පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය යොදාගත හැක.

මධ්‍යම පරිසර අධිකාරිය මඟින් විවිධ වූ ක්‍රියාකාරකම් වෙනුවෙන් අපජලය බැහැරලීම සඳහා අදාල ජල තත්ව ප්‍රමිති සකස් කොට ඇත. දැනට පවත්නා අංක 1534/18 සහ 2008.02.01 දිනැති ගැසට් නිවේදනය සංශෝධනය කර අවසාන කෙටුම්පත් නීති අංශය වෙත යොමු කරන ලදී. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ මේ සම්බන්ධව සාකච්ඡා වාර 3 ක් පවත්වන ලදී.

3.1.3 පරිසර දූෂණය පාලනය සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම.

3.1.3.1 පාරිසරික සංවේදී කලාප තුළ මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත පිහිටුවීම පිළිබඳ තීරණය කිරීම සඳහා චූ කමිටුව.

අපනයන සැකසුම් කලාප සහ කර්මාන්තපුර වලින් පිටත මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත ස්ථානගත කිරීම් තීරණය කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් ස්ථාපනය කරන ලදී. මෙය නව කර්මාන්ත ස්ථානගත කිරීම සම්බන්ධව තීරණ ගන්නා ඉතා විධිමත් තාක්ෂණික කමිටුවකි. මෙම කමිටුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, කර්මාන්ත අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතන වල විධායක මට්ටමේ තාක්ෂණික නිලධාරීන්ගෙන් සමන්විත වේ.

කොළඹ ප්‍රදේශයේ ජල ඉල්ලුම සපයන අඹතලේ පොම්පාගාරයට ජලය කැලණි ගඟෙන් ලබාගන්නා නිසා කාර්මික අපදියර වලින් කැලණි ගඟ දූෂණය වීම අවම කිරීම මෙම කමිටුවේ ප්‍රධාන අරමුණ විය. නමුත් දැනට මෙම කමිටුව මඟින් කැලණි ගංඟා ද්‍රෝණියට බාහිරින් පිහිටුවා ඇති විශාල අපජල ප්‍රමාණයක් පිටකරන මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පිළිබඳවද අවධානය යොමුකර ඒවා සඳහා ද අවශ්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදීම සිදුකරනු ලබයි.

පරිසර දූෂණ පාලන අංශය 2015 වසර තුළදී එවැනි රැස්වීම් 10 ක් පැවැත්වූ අතර, කර්මාන්තකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 85 ක් ඇගයීම සිදුකරන ලදී. ව්‍යාපෘති 37 ක්අනුමත කළ අතර, ව්‍යාපෘති 20 ක් ප්‍රතික්ෂෙප කරන ලදී. තවද ව්‍යාපෘති 28 ක් වැඩිදුර අධ්‍යනය හා වාර්තා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

3.1.3.2 පාරිසරික බලපෑම් තක්සේරු කිරීම (EIA) සඳහා තාක්ෂණික සහාය ලබාදීම.

පරිසර දූෂණ පාලන අංශයේ නිලධාරීන් පරිසර දූෂණ පාලන ක්‍රමවේදයන් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීමේ කමිටුවේ විශෙෂ සාමාජිකයන් ලෙසට කටයුතු කරමින් නියමිත ව්‍යාපෘතීන්හි පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ සහ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා ඇගයීමේ රාජකාරී වලද නියැලේ. EIA/IEE ක්‍රියාවලින්හිදී නිලධාරීන් තම පරිසර දූෂණ පාලන විෂය ක්ෂෙත්‍රයට අනුව අදහස් හා නිර්දේශ ලබාදෙමින් රාජකාරී කටයුතු සිදුකරනු ලැබේ.

මේ අනුව පරිසර දූෂණ පාලන ඒකකයේ නිලධාරීන් 2015 වර්ෂය තුළදී ව්‍යාපෘති 30 ක් සඳහා තාක්ෂණික කමිටු සාමාජිකයන් ලෙස සහභාගි වී පරිසර දූෂණ පාලන ක්ෂෙත්‍රයේ තාක්ෂණික සහාය ලබාදී ඇති අතර සාමූහික ක්ෂෙත්‍ර පරීක්ෂණ 13 ක් සඳහා ද සහභාගී වී ඇත.

3.1.3.3 කර්මාන්ත ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික පහසුකම් සැලසීම.

අ) පරිසර දූෂණ පාලනය සඳහා තාක්ෂණික විශෙෂඥ උපදේශක ආයතන හා රසායනාගාර වාර්ෂිකව විමර්ශණය කිරීම හා යාවත්කාලීන කිරීම.

කර්මාන්තශාලා වලින් සිදුවන පාරිසරික දූෂණ තත්ත්වයන් මෙම අධිකාරිය මඟින් අනුමත තත්ත්වයන්ට අනුකූල වන පරිදි පාලනය කරගැනීමට කර්මාන්තකරුවන්ට අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම් උපදෙස් හා විශෙෂඥ සහාය ලබාගැනීමට පහසුකම් සැලසීම සඳහා රසායනාගාර/ තාක්ෂණික විශෙෂඥ/උපදේශක ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කර එම ලේඛන වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබේ.

මෙහි අරමුණ වනුයේ කර්මාන්තකරුවන්ට අඩු වියදමකින් වඩා ඵලදායී තාක්ෂණික සෙවාවක් ලබාදීම මඟින් පාරිසරික හානිය අවම කර ගැනීමයි.

මෙහිදී රසායනාගාර පහසුකම් සලසන ආයතන වලට මෙන්ම උපදේශන සෙවා සපයන්නන්ට ද තම ආයතනයේ අඩුලුහුඩුකම් නිවැරදි කර ගනිමින් වඩා පුළුල් සෙවාවක් සැපයීමට හැකි වේ.

මේ අනුව 2015 වසර සඳහා රසායනාගාර 32 ක් සහ තාක්ෂණික විශෙෂඥ ආයතන 53 ක් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ලදී. එම ඉල්ලුම් පත් ඇගයීමෙන් හා ව්‍යාපෘති පසුවිපරම් කිරීමෙන් පසු රසායනාගාර 29 ක් හා තාක්ෂණික විශෙෂඥ ආයතන 46 ක් මධ්‍යම පරිසර අධිකාරියේ 2015 වසර සඳහා ලියාපදිංචි කර ඇත. තවද මෙම ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කර ඇති අතර, අදාල තොරතුරු සහිත පත්‍රිකා මුද්‍රණය කොට කර්මාන්තකරුවන් වෙත බෙදාදීමට කටයුතු කර ඇත. 2016 වර්ෂයෙහි ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත් කැඳවීම ප්‍රචාරණය කිරීම ඉංග්‍රීසි, සිංහල හා දෙමළ යන භාෂා තුනෙන්ම 2015 වර්ෂයේ අවසාන කාර්තුවේදී සිදුකරන ලදී.

ආ) අන්තර් රසායනාගාර විශ්ලේෂණ නිපුණතාව පරීක්ෂා කිරීම.

මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය හා ශ්‍රී ලංකා රසායනාගාර පරීක්ෂක සංවිධානය (Sri Lanka Association of Testing Laboratory) ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙය වාර්ෂික රසායනාගාර ලියාපදිංචි කිරීමේ වැඩසටහනට අදාලව ක්‍රියාත්මක වේ. වාර්ෂිකව ලියාපදිංචි කරන ලද රසායනාගාර මේ සඳහා තෝරා ගන්නා ලදී. මෙම රසායනාගාර මඟින් සිදුකරනු ලබන විශ්ලේෂණ සහ නිකුත් කරනු ලබන වාර්තා වල නිරවද්‍යතාවය මෙන්ම වඩාත් කාර්යක්ෂම ලෙස කටයුතු සිදුකිරීම වැඩිදියුණු කිරීම් මෙහි අරමුණ වේ.

ඒ අනුව රසායනාගාර 14 ක් 2015 වර්ෂයේදී මෙම විශ්ලේෂණ නිපුණතාවය පරීක්ෂා කිරීමේ වැඩ සටහනට දායක කරගන්නා ලදී. පරිසර දූෂණ පාලන අංශය, මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාර සහ රසායනාගාර පරීක්ෂා කිරීමේ සංවිධානය මෙම වැඩසටහන වාර්ෂිකව සිදුකිරීමට අදහස් කොට ඇත.

3.1.4 පරිසර දූෂණ පාලනය සඳහා විශෙෂ ව්‍යාපෘති සහ වැඩසටහන්

3.1.4.1 රසායනික අනතුරු වලක්වා ගැනීමේ ව්‍යාපෘතිය

රසායනික අනතුරු හා ව්‍යසන බොහොමයක් නිසිපරිදි සිදුකළ, පෙර සුදානම් මඟින් හා පසුවිපරම් මඟින් වලක්වාගත හැක. මේ සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් හා තත්ත්වයන් පවත්වාගෙන යාම සඳහා එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ ආධාර ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

2015 වර්ෂය තුලදී පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

1. රසායනික ඉහිරුම් වැලැක්වීම සම්බන්ධ දෙදින වැඩමුළුව.
2. මෙම වැඩසටහන පරිසර දූෂණ පාලන ඒකකය හා සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරිය එක්ව 2015 මැයි මස 14, 15 දෙදින තුළ මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පැවැත්විය.
3. කෝස්වේ පේන්ට් ආයතනයේ නිලධාරීන් හා සෙවකයන් වෙත රසායනික ද්‍රව්‍ය ඇසුරුම් කිරීම, ලේබල් කිරීම, වර්ග කිරීම හා උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය සම්බන්ධ හා සෞඛ්‍ය ගැටළු සම්බන්ධව දේශනයක් 2015.12.06 දින 50 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

ගෝලීය එකමුතු ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්ස් ආයතයේ විධායක නිලධාරීන් සඳහා බියගම දී පවත්වන ලදී.

3.1.4.2 ජාතික හරිත සම්මාන වැඩ සටහන

ජාතික හරිත සම්මානය මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පරිසර හිතකාමී ලෙස කටයුතු කරන

ව්‍යවසායකයන් හට පිරිනමනු ලබන එකම සම්මානය වේ. පරිසර හිතකාමී ලෙස පවත්වාගෙන යනු ලබන පුද්ගලික සහ රාජ්‍ය අංශයේ ව්‍යවසායකයන් ඇගයීම මෙම වැඩ සටහනේ මුඛ්‍ය පරමාර්ථය වේ. මෙම වැඩ සටහන හරිත ශ්‍රී ලංකාවක් කරා යන ගමනට මහඟු පිටිවහලක් වන අතර, කර්මාන්ත ප්‍රජාව පරිසර සුරැකීමේ මහඟු සත්කාරයට දායක කර ගැනීමේ ප්‍රායෝගික ක්‍රමයක් ද වේ. මෙහි මූලික පරමාර්ථය කර්මාන්තකරුවන් හා විවිධ සෙවා සපයන්නන් පසුවිපරම් මත පදනම් වූ පරිසර දූෂණය පාලනය හා පරිසර කළමනාකරණ ක්‍රමෝපායන් සඳහා දිරිගැන්වීමත්, එමගින් පාරිසරික ප්‍රමිති හා උපමාන කරා ලහාවීම මෙන්ම තිරසාර පරිසරයක් කරා කර්මාන්ත ප්‍රජාව රැගෙන යාමත් ය.

2015 වසරේ දී ජාතික හරිත සම්මාන වැඩ සටහන සඳහා අංශ 16 ක් යටතේ අයදුම්පත් කැඳවන ලදී. ඒවා අතර කර්මාන්ත අංශ 10 ක් කසළ කළමනාකරණ ව්‍යාපෘති හා පළාත් පාලන ආයතන, වගුව 3.4 රන් සම්මාන ලේඛනය

කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති , පොලිස් පරිසර කොට්ඨාශ, ඉදිකිරීමේ කර්මාන්ත සම්බන්ධ ආයතන, රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා පාසල් ද ඇතුලත් විය. මෙහිදී රන් සම්මාන 06 ක්, රිදී සම්මාන 18 ක්, ලෝකඩ සම්මාන 17 ක් හා කුසලතා සම්මාන 17 ක් ප්‍රදානය කෙරිණි. ඒ අනුව අයදුම්පත් 470 ක් ලද අතර, පළපුරුදු හා විද්වත් විනිශ්චය මණ්ඩලය මගින් ඒවා ඇගයීමට භාජනය කරන ලදී. විද්වත් විනිශ්චය මණ්ඩලය මගින් තෝරාදුන් අයදුම් පත් 54 ක් සඳහා පමණක් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකරන ලදී. මෙම සම්මාන උළෙල 2015 ඔක්තෝබර් මස 5 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසෙන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාතයන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සිදුකරන ලදී. මීට අමතරව ආරාධිත අමුත්තන් 600 ක් ද මේ සඳහා සහභාගී වන ලදී.

අංකය	අංශය	නම	ස්ථානය
01	ඇඟලුම්	මාර්ස් පුද්ගලික සමාගම	පල්ලේකැලේ
02	ආහාර පාන	කිරුවන්ගහ තේ වත්ත	මොරගල කිරිලිපන
03	හෝටල්	සිනමන් සිටඩෙල් හෝටලය.	මහනුවර
04	කසළ කළමනාකරණ ව්‍යාපෘති හා පළාත් පාලන ආයතන	බලන්ගොඩ නගර සභාව	බලන්ගොඩ
.05	පාසල් 1 වර්ගය /AB	රාජකීය විද්‍යාලය	කොළඹ .07
06	පාසල්3 හා 2 වර්ගය /	බප හාන්දුපැල්පොල කණිෂ්ඨ/හෝ/ විද්‍යාලය	හොරණ.

කැලණි ගඟ දෙපස කර්මාන්ත පසු විපරම් කිරීම.

කැලණි ගඟට තෙල් මිශ්‍රවීම සිදුවීමත් සමඟම පරිසර දූෂණ පාලන ඒකකය මඟින් කැලණි ගඟ දෙපස කර්මාන්ත පසුවිපරම් වැඩසටහනක් ආරම්භ කර ඇත. එමඟින් කැලණි ගඟ දෙපස කර්මාන්ත ශාලාවල ප්‍රමිතිය හා පාරිසරික තත්ත්වයන් දියුණු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

මෙහිදී ආයෝජන මණ්ඩලය කර්මාන්ත 13 ක් හා කර්මාන්ත කලාප 02 ක් (බියගම/ අව්ස්සාවේල්ල) පසුවිපරම් කරන ලදී.

පුහුණු වැඩමුළු රැස්වීම් සහ ඉදිරිපත් කිරීම්.

පරිසර දූෂණ පාලනය සම්බන්ධව පුහුණු වැඩමුළු පැවැත්වීම හා දැනුම හුවමාරු කරගැනීම අත්‍යාවශ්‍ය අංගයක් වන අතර, මේ සම්බන්ධව පරිසර දූෂණ පාලන අංශය මඟින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙහිදී ඉදිරිපත් කිරීම් හා දේශන 15 ක්, වැඩමුළු 14 ක් , රැස්වීම් 35 ක් සඳහා පරිසර දූෂණ පාලන ඒකකය

වගුව 3.5 කටයුතු කරන ලදී. ප්‍රගති සාරාංශය - 2015 පරිසර දූෂණ පාලන ඒකකය

ක්‍රියාකාරකම්,	**ප්‍රගතිය**		**විශේෂිත කරුණු**
	භෞතික	**මූල්‍ය**	
1.පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම - ආයෝජන මණ්ඩලයට අයත් නොවන			
නව කර්මාන්ත හා පාරිසරික නිර්දේශ	99	සමුපූර්ණ මුදල් වෙන්කිරීම පරිසර දූෂණ පාලන අංශය සඳහා 2015 වර්ෂයේදී රු-/750,000.	ක්‍රියාත්මක කිරීම සඳහා යන වියදම ආයෝජන මණ්ඩලය විසින් දරනු ලබයි.
කර්මාන්ත වල පාරිසරික ආරක්ෂණ අළුත් කිරීම සඳහා පාරිසරික එකඟතා	433		
නව කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා පාරිසරික එකඟතා	59		
පසුවිපරම් කිරීම	142		
2. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම - BOI නොවන		මෙම මුදලින් 707,000.00ක් පරිසර දූෂණ පාලන අංශය	
පැමිණිලි ආයෝජන මණ්ඩලයේ නොවන - ලැබෙන පැමිණිලි	50		

ක්‍රියාකාරකම්,	ප්‍රගතිය		විශේෂිත කරුණු
	භෞතික	මූල්‍ය	
- ක්ෂේත්‍ර පරීක්ෂණ - යොමුකළ	12 38	මහින් වැය කරන ලදී.	
- ආයෝජන මණ්ඩලය ලැබුණු පැමිණිලි - ක්ෂේත්‍ර පරීක්ෂණය කල - යොමු කල පැමිණිලි	59 58 20		
3.උපදේශන ආයතන ලැයිස්තුව යාවත්කාලීන කිරීම සහ රසායනාගාර ලැයිස්තුව යාවත් කාලීන කිරීම.			
රසායනාගාර ලියාපදිංචිය සඳහා ලැබුණු අයදුම් පත්	32		
උපදේශන ආයතන ලියාපදිංචිය සඳහා ලැබුණු අයදුම් පත්	53		
තෝරාගත් රසායනාගාර	29		
තෝරාගත් උපදේශන ආයතන	46		
4. විශාල හා මධ්‍ය පරිමාන කර්මාන්ත සම්බන්ධ පැවැත්වූ රැස්වීම.			
- පැවැත්වූ රැස්වීම.	10		
- ඇගයීම සිදු කල කර්මාන්ත	85		
- නිර්දේශ කල	37		
- ප්‍රතික්ෂෙප කල	20		
5. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අංකනය කිරීම.			
නිකුත් කල"අ" කාණ්ඩයේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර	1791		
නිකුත් කල"අ" කාණ්ඩයේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීම.	2531		
6. වැඩමුළු			
- ඉදිරිපත් කිරීම් දේශන /	15		
- වැඩමුළු	14		
- රැස්වීම්	32		
.7EIA තාක්ෂණික කමිටු සඳහා සහය වීම.	13		
1. ජාතික හරිත සම්මාන 2015 - රන් සම්මාන - රිදී සම්මාන - ලෝකඩ සම්මාන - කුසලතා සම්මාන	 06 18 13 17		වියදම් දැරීම මහ භාණ්ඩාගාරය මහිනි
රසායනික අනතුරු වැලැක්වීමේ පෙර සූදානම් ව්‍යාපෘතිය.			

3.2 රසායනාගාර සෙවා අංශය

3.2.1 වායු සම්පත් කළමනාකරණ සහ පසුවිපරම් ඒකකය

කොළඹ නගරයේ සංසරණ වායු ගෝලයේ තත්ත්වය මිනුම් කිරීම 2015 වසරේදී ද කොළඹ කොටුව දුම්රිය ස්ථානය අසල පිහිටා ඇති නිරීක්ෂණ මධ්‍යස්ථානයේදී සිදු කරන ලදී. රසායනික විශ්ලේෂණ (Wet Chemical) ක්‍රම භාවිතා කරමින් සල්ෆර් ඩයොක්සයිඩ් (SO2) සහ නයිට්‍රජන් ඩයොක්සයිඩ් (NO2) සාන්ද්‍රණය මිනුම් කරන ලදී. තවද වායුගතික විෂ්කම්භය මයික්‍රොමීටර් 10 ට අඩු ක්ෂුද්‍ර අංශූන් (PM 10) සාන්ද්‍රණය ද මිනුම් කරන ලදී. මීට අමතරව ජංගම සංසරණ වායු තත්ව පසු විපරම් රසායනාගාරය භාවිතා කරමින් නුවර, නුවර එළිය, පොළොන්නරුව, බදුල්ල, මාතර සහ නුගේගොඩ යන නගර වල සංසරණ වායු තත්වයන් නිරීක්ෂණය කරන ලදී. මෙම දත්ත උපයෝගි කරගෙන ඉතා සිසුයෙන් ඉහල යන රථ වාහන සංඛ්‍යාව හා අනෙකුත් විමෝචන ප්‍රභවයන්ට සාපේක්ෂව මේ වන තෙක් වායු තත්වය කළමනාකරණය සඳහා ගත් ක්‍රියා මාර්ග වල සාර්ථකත්වය පරීක්ෂා කිරීම සිදු කරන ලදී.

3.2.1.1 ශ්‍රී ලංකාවේ වාතයේ ගුණාත්මක තත්ත්වය

කොළඹ නගරයේ වායුගතික විෂ්කම්භය මයික්‍රෝ මීටර 10 ට අඩු අංශුමය ද්‍රව්‍ය සාන්ද්‍රණයේ (PM10) වාර්ෂික සාමාන්‍ය අගයේ වෙනස් වීම පහත දක්වා ඇත.

පසුගිය වසර 16 ක කාලය තුළ කොළඹ කොටුව වායු තත්ත්ව නිරීක්ෂණ මධ්‍යස්ථානයේ දත්තයන්ට අනුව වායුගතික විෂ්කම්භය මයික්‍රොමීටර් 10 ට අඩු අංශුමය ද්‍රව්‍ය සාන්ද්‍රණයේ (PM 10) අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්වුවද එය නිර්දේශිත වාර්ෂික සාමාන්‍ය උපරිම අගය ඉක්මවා පවතී. නමුත් 2015 වර්ෂයේ PM 10 වාර්ෂික සාමාන්‍ය අගය 2014 වර්ෂයේ අගයට වඩා වැඩි වී ඇති අතර පාරේ ධාවනය වන මෝටර් රථ සංඛ්‍යාව වැඩි වීම මෙයට හේතු විය හැක.

3.2.1.2 ප්‍රධාන නගර වල දූෂණ තත්ව



රූපය 3.1. කොළඹ නගරයේ වසර 18 ක් තුල PM_{10} වාර්ෂික සාමාන්‍ය අගයේ වෙනස් වීම.

පහත වගු මඟින් නුගේගොඩ නගරයේ 2015 වර්ෂයේ වායු දූෂණ තත්වය පිළිබඳ දත්ත ඉදිරිපත් කරනු ලබයි.



රූපය 3.2 නුගේගොඩ නගරයේ 2015 වර්ෂයේ වායු දූෂණ තත්වය (PM_{10})

PM_{10} - ජංගම රසායනාගාරයේ පැයක සාමාන්‍ය අගය වාර්තා වන අතර, ඒ අනුව පැය 24 ක සාමාන්‍ය අගය දින 07 ක් සඳහා ගණනය කර ඇත. PM_{10} සාන්ද්‍රණය පැය 24 ක සාමාන්‍යයේ උපරිම අගය වන ඝන මීටරයට මයික්‍රෝග්‍රෑම් 100 අගය ඉක්මවා නැත.



රූපය 3.3 නුගේගොඩ නගරයේ 2015 වර්ෂයේ වායු දූෂණ තත්වය ($PM_{2.5}$)

PM 2.5 (වායුගතික විෂ්කම්භය මයික්‍රොමීටර් 2.5 ට අඩු ක්ෂුද්‍ර අංශූන්) - ජංගම රසායනාගාරයේ පැයක සාමාන්‍ය අගය වාර්තා වන අතර, ඒ අනුව පැය 24 සාමාන්‍ය අගය දින 7 ක් සඳහා ගණනය කර ඇත. PM 2.5 සාන්ද්‍රණය පැය 24 සාමාන්‍යයේ උපරිම අගය වන ඝනමීටරයට මයික්‍රොග්‍රෑම් 50 අගය ඉක්මවා නැත.



රූපය 3.4 නුගේගොඩ නගරයේ පැය 24 $N0_2$ සාන්ද්‍රණය

$N0_2$ - ජංගම රසායනාගාරයේ පැයක සාමාන්‍ය අගය වාර්තා වන අතර, ඒ අනුව පැය 24 සාමාන්‍ය අගය දින 7 ක් සඳහා ගණනය කර ඇත. $N0_2$ සාන්ද්‍රණය පැය 24 සාමාන්‍යයේ උපරිම අගය වන දසලක්ෂයකට කොටස් 0.05 ඉක්මවා නැත.



රූපය 3.5 නුගේගොඩ නගරයේ පැය 8 CO සාන්ද්‍රණය

CO (කාබන් මොනොක්සයිඩ්) - ජංගම රසායනාගාරයේ පැයක සාමාන්‍ය අගය වාර්තා වන අතර, උපරිම අගයන් ලැබූ පැය 8 සාමාන්‍ය අගය දින 7 ක් සඳහා ගණනය කර ඇත. C0 සාන්ද්‍රණය පැය 8 සාමාන්‍යයේ උපරිම අගය වන දසලක්ෂයකට කොටස් 9 ඉක්මවා නැත.



රූපය 3.6 නුගේගොඩ නගරයේ පැය 24 SO_2 සාන්ද්‍රණය

SO_2 ජංගම රසායනාගාරයේ පැයක සාමාන්‍ය අගය වාර්තා වන අතර, ඒ අනුව පැය 24 සාමාන්‍ය අගය දින 7 ක් සඳහා ගණනය කර ඇත. SO_2 සාන්ද්‍රණය පැය 24 සාමාන්‍යයේ උපරිම අගය වන දසලක්ෂයකට කොටස් 0.03 ඉක්මවා නැත.

3.2.1.3 දේශසීමා හරහා සිදුවන වායු දූෂණයේ තත්ත්වය පසුවිපරම.

3.2.1.3.1 මාලේ ප්‍රකාශන ව්‍යාපෘතිය.

මාලේ ප්‍රකාශනයේ ක්‍රියාකාරකම් වලට අදාල වූ දකුණු ආසියානු රට රටවල දේශසීමා හරහා සිදුවන වායු දූෂණ තත්ත්ව එහි බලපෑම සහ වායු දූෂණ තත්ත්ව වැලැක්වීමේ සහ පාලනය කිරීමේ කටයුතු සිදු කිරීමේදි මාලේ ප්‍රකාශනයේ කටයුතු ක්‍රියාත්මක කරන ජාතික ආයතනය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය එම කටයුතු සිදුකරන අතර, වායු සම්පත් කළමනාකරණය හා පසුවිපරම් අංශය ඉහත ප්‍රකාශයට අදාලව දේශ සීමා හරහා සිදුවන වායු තත්ව පසුවිපරම් කරනු ලබයි.

අනෙකුත් දකුණු ආසියානු රටවල් හා සමාන්තරව මෙම වැඩසටහනට අදාල වූ රට රටවල දේශසීමා හරහා වූ වායු දූෂණ තත්ත්වයන් පිළිබඳව අධ්‍යයනයක් රසායනාගාරය මඟින් සිදුකරනු ලබයි.

3.2.1.3.2 දේශසීමා හරහා සිදුවන වායු දූෂණයේ පසුවිපරම්.

දොරමඩලාව නියැදි රැස්කරන ස්ථානය තුල වායුගතික විශ්කම්භය මයික්‍රොමීටර් 10 ට අඩු ක්ෂුද්‍ර අංශු සාන්ද්‍රණය (පැය 24 තුලදී) මැනීමේ පරීක්ෂණ සතිපතා සිදු කෙරේ.

දොරමඩලාව නිරීක්ෂණ භූමි භාගය තුල සවිකරන ලද උපකරණ



රූපය 3.7. දොරමඩලාව නිරීක්ෂණභූමියේ PM_{10} සාන්ද්‍රණයේ වෙනස්වීම.

3.2.1.4 ශබ්ද දූෂණය පාලනය

ශබ්ද දූෂණය ශ්‍රී ලංකාවේ ජනතාවට බලපාන ප්‍රධාන පාරිසරික ගැටළුවකි. මධ්‍යම පරිසර අධිකාරිය වෙත කර්මාන්ත වලින් සහ විවිධ මහජන ක්‍රියාකාරකම් වලින් සිදුවන ශබ්ද දූෂණය සම්බන්ධ බොහෝ පැමිණිලි ලැබෙන අතර වායු සම්පත් කළමනාකරණ සහ පසුවිපරම් ඒකකය ශබ්ද දූෂණ පසුවිපරම් කටයුතු සිදුකරනු ලබයි.

කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම සහ කොන්දේසි පසුවිපරම් කිරීම සඳහා ශබ්ද මට්ටම මැනීම හා සාමාන්‍ය ජනතාවගේ පැමිණිලි විශ්ලේෂණය කිරීම සඳහා රසායනාගාරය මඟින් ශබ්ද මට්ටම් මැනීම සිදු කෙරේ. 2015 වර්ෂයේ දී මෙවැනි ශබ්ද මිනුම් ගත කිරීම් 200 ක් පමණ සිදු කර ඇත.

ක්ෂේත්‍රයේ ශබ්ද මිනුම් කිරීමක්

වාහන නළා මඟින් ඇතිවන ශබ්ද දූෂණය අවම කිරීමට 2011 අංක 01 දරණ ජාතික පාරිසරික (වාහන නළා) නියෝග ප්‍රමිතීන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සකස් කර ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කර ඇත.

මෙම නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා වායු සම්පත් කළමනාකරණ හා පසුවිරපම් ඒකකය පාර්ශවකරුවන් සමඟ රැස්වීම්, දැනුවත් කිරීම් සහ ප්‍රධාන නගර වලදී වාහන නළා මිනුම් කටයුතු පොලිස් ප්‍රවාහන පරිසර කොට්ඨාශ හා ඒකාබද්ධව සිදුකරන ලදී.

2015 වර්ෂයේදී කොළඹ කොටුව, නුවර, ගාල්ල සහ මාළඹේ යන නගර වලදී වාහන නලා මිනුම් කටයුතු ජනතාව දැනුවත් කිරීම සඳහා සිදු කරන ලදී.

3.2.2 ජල තත්ත්ව සහ පසුවිපරම් අංශය

3.2.2.1 කාර්මික කටයුතු මගින් සිදු වන පරිසර දූෂණය පසුවිපරම සහ කලමනාකරණය

පරිසර ආරක්ෂණ බලපත්‍ර යනු ජාතික පාරිසරික පනතෙහි ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක නීතිමය මෙවලමකි. පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත/නියමිත කටයුතු රජයේ ගැසට් නිවේදනය මගින් අ,ආ,ඇ වශයෙන් කොටස් තුනක් යටතේ වර්ග කර ප්‍රකාශයට පත් කර ඇත.

ඒ සඳහා අවශ්‍ය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන අංශයට අදාලව ජල තත්ත්ව සහ පසු විපරම් රසායනාගාරය ක්‍රියාත්මක වෙයි.එහි ප්‍රධානම කාර්ය වනුයේ කාර්මික අපසන්දන සහ මතු පිට ජලය සම්බන්ධව විශ්ලේෂණ වාර්තා සපයමින් ජල සම්පත කලමනාකරණය සහ සංරක්ෂණය සඳහා මුලු දිවයිනම ආවරණය වන පරිදි කාර්මික අපසන්දන පසු විපරමට ලක් කිරීමයි.

මේ අනුව 2015 වසර තුල දී ජල නියැදි 1005 ක් රැස් කර විශ්ලේෂණය කිරීමට රසායනාගාරයට හැකි විය.මෙම ජල නියැදි අතර පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම,වානිජමය,නීතිමය,මතු පිට සහ භූ ගත ජල ප්‍රභව පසු විපරමට ලක් කිරීම ආදී විවිධ කටයුතු සඳහා අදාල ජල නියැදි අන්තර්ගත වේ.

විවිධ අවශ්‍යතා සඳහා දිවයින පුරා සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් රැස් කරන ලද කාර්මික අපසන්දන නියැදි පහත පරිදි වේ.

වගුව 3.6 2015 වසර තුල රැස් කළ කාර්මික අපසන්දන නියැදි සංඛ්‍යාව

නියැදි රැස් කිරීමේ අරමුණ	රැස් කළ නියදි ගණන
නව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම/අලුත් කිරීම	181
නීතිමය අවශයතා සඳහා	51
පැමිණිලි විභාග කිරීම සඳහා	123
පසු විපරම් සඳහා	128
අප ජල පිරිපහදු පද්ධතිය	33
වෙනත්	1
වාණිජමය	117
මුළු	634

එක් නියැදියක් අවම වශයෙන් පරාමිතීන් 6 -9 අතර සංඛ්‍යාවක් සඳහා විශ්ලේෂණය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කරන ලදී.

මතු පිට ජලයේ තත්ත්වය පසු විපරම් කිරීමේ වැඩසටහන

කාර්මික අපසන්දන පසු විපරමට ලක් කිරීම මෙන්ම කැළණි ගඟ, මහ ඔය,දඬුගම් ඔය සහ බෙන්තොට ගඟ යන මතු පිට ජල පභවයන්හි ජලය මාසිකව පසු විපරමට ලක් කිරීම ද සිදු කරන ලදී. එහි දී සාමාන්‍ය පරිදි 2015 වසරේදී ද පෙර නිර්ණය කරනලද නියදි රැස් කිරීමේ ස්ථාන වලින් මාසිකව ජල නියදි ලබා ගෙන ඒවායේ භෞතික, රසායනික සහ ක්ෂුද්‍ර ජෛව විද්‍යාත්මක පරාමිතීන් පසු විපරමට ලක් කරන ලදී. එම තොරතුරු **වගුව 1.2.1** හි දක්වා ඇත.

වගුව 3.7 2015 වසර තුල මතු පිට ජල ප්‍රභවයන්ගෙන් ලබා ගත් ජල නියැදි සංඛ්‍යාව

මතුපිට ජල ප්‍රභවයේ නම/ අරමුණ	රැස් කළ නියදි ගණන
කැළණි ගඟ	146
මහ ඔය	74
දඬුගම් ඔය	70
බෙන්තොට ගඟ	71
වාණිජමය	10
මුළු එකතුව	371

කැළණි ගඟේ ජලයේ තත්ත්වය පසු විපරමට ලක් කිරීම

මෙහි ප්‍රධාන අරමුණ වනුයේ නියමිත භාවිතයන් සඳහා කැළණි ගඟේ ජලයේ සුදුසු බව පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ජල දූෂක පරාමිතීන් පිළිබඳව ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමත් ය(සරල ලෙස පිරිපහදු කර පානය සහ නෑම හෝ සෙදීම් කටයුතු සඳහා).මේ යටතේ ජල විශ්ලේෂණ දත්තත් එමගින් නිරූපනය වන පරිදි එම ජලය භාවිතයට සුදුසුවන ආකාරයත් පිළිබඳව එක් එක් ජල නියැදි රැස් කිරීමේ ස්ථාන වල පිහිටුවා ඇති ප්‍රදර්ශන පුවරු මත නිරූපනය කරන ලදී.

මේ අනුව 2015 වර්ෂය තුල දී කැළණි ගඟේ ස්ථාන 7 ක් සහ එහි අතු ගංගා වල ස්ථාන 5 ක් පරාමිතීන් 14 ක් සඳහා මාසිකව පසු විපරම් කරන ලදී. එම ජල නියැදි ලබා ගත් ස්ථාන **රූපය 1.2.1.1** හි දක්වා ඇත.



රූපය 3.8 කැළණි ගඟේ නියදි රැස් කිරීමේ ස්ථාන

ප්‍රධාන ගංගාවේ ස්ථාන 7 වනුයේ සීතාවක තොටුපොල, පූගොඩ තොටුපොල, හංවැල්ල පාලම, කඩුවෙල පාලම, වැලිවිට පාලම සහ වික්ටෝරියා පාලම වන අතර වක් ඔය(අතු ගංගාව), පූගොඩ ඇළ, පුස්වැලි ඔය, මහ ඇළ සහ රග්ගහවත්ත ඇළ අතු ගංගා 5 වේ.

එම තොරතුරු වගුව 1.2.1.1 හි දක්වා ඇත.

මෙම තෝරාගත් ස්ථාන 12 ක ජලයේ විශ්ලේෂිත පරාමිතීන් වනුයේ pH, විදයුත් සන්නායකතාව, ආවිලතාවය, උෂ්ණත්වය, ද්‍රාවිත ඔක්සිජන් ප්‍රමාණය, රසායනික ඔක්සිජන් ඉල්ලුම, ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම,ක්ලෝරයිඩ, දිය වූ ක්‍රෝමියම්, දිය වූ ලෙඩ්, නයිට්‍රේට නයිට්‍රජන්, පොස්පරස් පොස්පේට්, සහ කෝලි ආකාර බැක්ටීරියා ප්‍රමාණය යි.

වගුව 3.7 : කැළණි ගඟේ නියදි රැස් කිරීමේ ස්ථාන

අක්ෂාංශ	දේශාංශ	නියදි රැස් කල ස්ථාන	GEMS හඳුනාගැනීමේ අංකය
6 57 14	80 13 12	තල්දූව පාලම	-76005
6 58 37	80 11 39	සීතාවක තොටුපොල	-76006
6 55 02	**80 05 53**	වක් ඔය (අතු ගන්ගාව)	-76011
		පූගොඩ තොටුපොල	-76009
6 56 38	**80 08 18**	පූගොඩ ඇළ(අතු ගන්ගාව)	-76010

අක්ෂාංශ	දේශාංශ	නියඳි රැස් කල ස්ථාන	GEMS හඳුනාගැනීමේ අංකය
6 54 36	80 05 00	හන්වැල්ල පාලම	-76007
6 54 26	**80 03 57**	පුස්වැලි ඔය (අතු ගන්ගාව)	-76012
6 56 00	**79 59 32**	මහ ඇළ (අතු ගන්ගාව)	-76013
		කඩුවෙල පාලම	-76008
6 56 21	79 58 09	රග්ගහවත්ත ඇළ (අතු ගන්ගාව)	-76001
6 56 18	79 56 50	වැලිවිට පාලම	-76003
6 57 37	79 52 40	වික්ටෝරියා පාලම	-76002

කැළණි ගඟේ ජලයේ තත්ත්වය ඇගයීම

2015 වසර තුළ දී මූලික පරාමිතින්ගේ සිදු වූ විචලනයන් පහත ප්‍රස්ථාරිකව නිරූපනය වේ.



රූපය 3.8: 2015 වසර තුළ දී කැළණි ගඟේ පීඑච් අගය විචලනය

එක් එක් ස්ථානයන්හි පීඑච් අගය මධ්‍යම පරිසර අධිකාරිය විසින් යෝජනා කර ඇති දේශීය ජල තත්ත්ව ප්‍රමිතින්ගෙන් කැපී පෙනෙන ලෙස අපගමනය වීමක් නොපෙන්වයි.



රූපය 3.9: 2015 වසර තුළ දී කැළණි ගඟේ විද්‍යුත් සන්නායකතා අගය විචලනය

පෙබරවාරි,මාර්තු සහ අගෝස්තු මාස වල දී වික්ටෝරියා පාලමෙන් ඉහළ විද්‍යුත් සන්නායකතා අගයක් වාර්තා විය.පැවති වියළි කාලයේ දී මුහුදු ජලය ඇතුලු වීම මෙයට හේතු විය හැක.එසෙම මාස කිහිපයක් තුලම සීතාවක තොටුපොල අසල සහ කඩුවෙල යන නියැදි ලබා ගැනීමේ ස්ථාන වල විද්‍යුත් සන්නායකතාව සැලකිය යුතු ලෙස ඉහළ යාමක් වාර්තා වූ අතර පෙබරවාරි සිට මාර්තු සහ අගෝස්තු යන මාස වල ඉහළම අගයක් ගන්නා ලදී. මේ සඳහා හේතු දෙකක් බලපෑ හැකි අතර එකක් නම් සීතාවක කර්මාන්ත පුරයෙන් බැහැර කරන කාර්මික අපසන්දන වන අතර අනෙක අධික ලෙස මැණික් ගැරීම නිසා ගංගා පතුල බාදනයට ලක් වීමයි.



රූපය 3.10: 2015 වසර තුළ දී කැළණි ගඟේ ආවිලතා අගය විචලනය

2015 වසර මුළුල්ලේම කාලගුණික තත්වයේ සිදු වූ විශාල වෙනස්කම් සමඟ ආවිලතා අගයන්වල ද කැපී පෙනෙන විචලනයන් නිරීක්ෂණය කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය විසින් යෝජනා කර ඇති දේශීය ජල තත්ත්ව ප්‍රමිතීන්ගෙන් අපගමනය වන මෙම ඉහළ ආවිලතා අගයන් වසර මුළුල්ලේම සියලුම නියැදි රැස් කිරීමේ ස්ථානවලින් වාර්ථා විය. මෙම තත්තවයට පාංශු බාදනය, ගංගාධාර ප්‍රෙද්ශ වල වන වැස්ම ඉවත් කිරීම සහ විවිධ ආකාරයේ සංවර්ධන සහ කැණීම් කටයුතු ආදිය හේතු විය

හැකි ය. එයට අමතරව වියළි කාලයකට පසු ඇති වූ තද වැසි ද බොහෝ ස්ථානවල ආවිලතා අගයන්ගේ විචලනයට හේතු වේ.



රූපය 3.11: 2015 වසර තුළ දී කැළණි ගඟේ දිය වූ ඔක්සිජන් අගය විචලනය

කර්මාන්ත මගින් සිදු වන දූෂණය සැලකියයුතු තරම් ඉහළ රග්ගහවත්ත ඇළ, මහ ඇළ, සහ සීතාවක යන ස්ථානවල පහළ මට්ටමේ ද්‍රාවිත ඔක්සිජන් අගයක් වාර්තා විය.

3.2.2.2 ජල තත්ත්ව සහ පසුවිපරම් ඒකකය මගින් සිදු කළ අනෙකුත් කියාකාරකම්

දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහභාගී වීම

2015 වසර තුලදී ජලතත්ත්ව රසායනාගාරයේ කාර්යමණ්ඩලය විසින් ජල දූෂණය සහ ඒ සම්බන්ධ ක්ෂෙත්‍ර පිළිබඳව විවිධ මහජන කණ්ඩායම් දැනුවත් කරවන ලදී.තවද පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක පිවිතුරු ගංගා වැඩසටහන යටතේ පාසල් ලමුන් සහ ඔවුන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී.එහිදී ජල තත්ත්ව විශ්ලේෂණ සිදුකරන ආකාරය සහ ඒ හා සම්බන්ධ කරුනු ඉදිරිපත් කරමින් ජලතත්ත්ව රසායනාගාරයේ කාර්යමණ්ඩලය ද එම වැඩසටහනට සක්‍රීයව දායක විය.

අනෙකුත් ක්‍රියාකාරකම්

2015 වර්ෂය තුල දී මධ්‍යම පරිසර අධිකාරියේ අභ්‍යන්තර අංශ මගින් කියාත්මක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය, අපද්‍රව්‍ය ව්‍යාපෘතිය, පරිසර බලපෑම් ඇගයීමේ ක්ෂෙත්‍ර පරීක්ෂණ සහ විෂයගත රැස්වීම් කිහිපයකටත් පාරිසරික රසායනාගාර සහ විශෙෂඥ සෙවා ආයතන ඇගයීමේ කටයුතු වලටත් සහ අධිකරණ කටයුතු කිහිපයකටත් ජලතත්ත්ව රසායනාගාරයේ කාර්යමණ්ඩලය සහභාගී විය.

3.3 අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය

2015 වර්ෂයේ ක්‍රියාත්මක සැලසුමෙන් හඳුනාගත් පරිදි උපද්‍රවකාරී අපද්‍රව්‍ය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව

අ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

ආ) අන්තර්ජාතික සම්මුතීන්ට අදාල කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකිරීම හා

ඇ) ඝන අපද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කලමනාකරණයට අදාල ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන කටයුතු ඉටු කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන අංශයේ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය වෙත පැවරී ඇත.

3.3.1 ශ්‍රී ලංකාව තුල උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

උපද්‍රවකාරී අපද්‍රව්‍ය කලමණාකරණ රෙගුලාසි (අංක 1534/18 දරන 2008 පෙබරවාරි 01 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය) ක්‍රියාත්මක කිරීමේ එක් කොටසක් ලෙස 2015 වසර තුල නිකුත් කරන ලද මුළු බලපත්‍ර සංඛ්‍යාව 131කි.

මීට අමතරව මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වල නිලධාරීන්ට තාක්ෂණික සහාය සපයනු වස් සබරගමුව හා වයඹ පලාත් කාර්යාල නිලධාරීන් සඳහා සායනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තාක්ෂණික වැඩමුළු 2ක් ද පවත්වන ලදි.

3.3.2 බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම

3.3.2.1 කර්මාන්ත සඳහා බාසල් සම්මුතියේ B ලැයිස්තුගත අපද්‍රව්‍ය ආනයනය කිරීම.

ශ්‍රී ලංකාව 1992.08.28 දින සිට උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනය හා අපහරණය සඳහා වූ බාසල් සම්මුතියට එලබ ඇති අතර එතැන් පටන් මධ්‍යම පරිසර අධිකාරිය ශ්‍රී ලංකාව තුල මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස පත් කොට ඇත.මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සම්බන්ධීකරණ කමිටුව එතෙක් මෙරට උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික කරුණු වලට අදාල නිසි තීරණ ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියට අවශ්‍ය සහය ලබාදීම සඳහා තාක්ෂණික ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කොට ඇත.මෙම කමිටුව විසින්ප්‍රධාන ලෙස බාසල් සම්මුතියෙන් B ලැයිස්තුගත අපද්‍රව්‍ය ආනයනය කොට අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් ආරම්භ කිරීමට යෝජිත කර්මාන්ත සඳහා නිර්දේශයන් ලබාදීම සිදුකරනු ලබයි.(බාසල් සම්මුතියේ A ලැයිස්තුගත අපද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම කැබිනට් අමාත්‍ය තීරණයක් විසින් තහනම් කොට ඇත.)

ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමේ පනත යටතේ උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය හා අපද්‍රව්‍ය ආනයනය සම්බන්ධයෙන් වූ රෙගුලාසි 2013 ජූනී 05 දිනැති ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත් කර ඇත.මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට අදාලව 2015 වර්ෂයේදී අනුමැතීන් 285 ක් නිකුත් කර ඇත.

3.3.2.2 දේශාන්තර උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනය

බාසල් සම්මුතියේ ශ්‍රීලංකාව තුල ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2015 වසරේදී බාසල් සම්මුතියේ A ලැයිස්තුගත අපද්‍රව්‍ය මෙරට දේශසීමා හරහා ප්‍රවාහනයට අනුමැතීන් 06 ක් ද මෙරටින් අපනයනය සඳහා අනුමැතීන් 7 ක් ද ලබා දිඇත.

3.3.3 රසායනික ද්‍රව්‍ය කළමනාකරණය.

ජාතික රසායනික පැතිකඩ යාවත්කාලීන කිරීමත් කර්මාන්ත රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා ක්‍රියාත්මක සැලැස්මක පිළියෙල කිරීමත් සිදුකරන ලදි.

රසායනික ද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීම යටතේ රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පාරිසරික නිර්දේශයන් 23 ක්ද, ඇතැම් රසායන ද්‍රව්‍ය ආනයනය සඳහා අනුමැතීන් 145 ක්ද නිකුත් කරන ලදි.

3.3.4 ඇස්බැස්ටස් කළමනාකරණය

ඇස්බැස්ටස් කෙඳි ආනයනය හා ඇස්බැස්ටස් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් වූ ක්‍රියාකාරකම් පිළිබඳව අදාල සියළු පාර්ශවයන් සමග සාකච්ඡා කරන ලදි. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක සැලැස්මක් කෙටුම්පත් කරන ලද අතර සූදානම් කරන ලද කැබිනට් පත්‍රිකාව පරිසර අමාත්‍යාංශය වෙත බාර දෙන ලදි.

3.3.5 ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය.

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා මධ්‍යම පරිසර අදිකාරිය ඒකාබද්ධව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතුකිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදි. මේ යටතේ වැඩසටහන් 4ක් කඩුවෙල මහ නගර සභාව, වත්තල නගර සභාව, සීතාවක ප්‍රාදේශීය සභාව හා කැළණිය ප්‍රදේශීය සභාව යන සීමා තුල නොවැම්බර්මස 6 සිට 13 වන දින දක්වා පවත්වන ලදි.

මෙම වැඩසටහන් වලදී මෙට්‍රික් ටොන් 6.8 ක පමණ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කරන ලද අතර ඒවා ලැයිස්තුගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රලාභී එකතුකරන්නන් හරහා බැහැරලීම සිදු කරන ලදි.

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැරලීමේ වැඩසටහන්

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැරලීමේ වැඩසටහන්

3.3.5.2 දැනුවත් කිරීමේ අත්පත්‍රිකා පිළියෙල කිරීම.

බැරලෝහ මගින් සිදුවන දූෂණය හා ගෘහාශ්‍රිත උපද්‍රවකාරී අපද්‍රව්‍ය පිළිබඳ අත්පත්‍රිකා 10,000ක් ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයෙන් පිළියෙල කරන ලදි.

3.3.6 තුනී පොලිතීන් රෙගුලාසිය ක්‍රියාත්මක කිරීම.

ජාතික පාරිසරික පනතේ නියෝග යටතේ ගරු පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍ය තුමන් විසින් ප්‍රකිශයට පත් කරන ලද 2006 ඔක්තෝබර් 10දිනැති අංක 5/1466 දරණ අති විශෙෂ ගැසට් පත්‍රෙයන් මයික්‍රෝන 20 හෝ ඊට අඩු පොලිතීන් හෝ ආශ්‍රීත නිෂ්පාදන නිෂ්පාදනය, අලෙවිය හා භාවිතය තහනම් කරන ලදි .මෙම රෙගුලාසිය 2016ග01ග 01දින සිට බලාත්මක කරනු පිණිස අදාල පාර්ශවයන්ගෙන් අදහස් විමසීම සඳහා රැස්වීම් පවත්වන ලද අතර මහජනතාව මෙම රෙගුලාසිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම්ද පළ කරන ලදි .පොලිතීන් මැනීම සඳහා භාවිතා කරන උපකරණ මිලදී ගැනීමටද අවශ්ය පියවර ගන්නා ලදි .තවද පොලිතීන් සඳහා විකල්පයන් හඳුන්වා දීම සඳහා අදාල පාර්ශවයන් සමග රැස්වීම් ද පවත්වන ලදි.

.

4.0. පරිසර කළමනාකරණ සහ ඇගයීම් අංශය

4.1 පරිසර බලපෑම් හා ඇගයීම් (ප.බ.ඇ) ඒකකය

නියමිත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කිරීම.

පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ ප්‍රධාන නියාමක කාර්යභාරය වනුයේ සැලකිය යුතු පාරිසරික බලපෑම් අවම කිරීමේ අදහසින් සියළුම නියමිත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ පරිපාලන ක්‍රියාදාමය පවත්වාගෙන යාමයි. මෙම කාර්යභාරයට විෂය ප්‍රමාණය කිරීමේ රැස්වීම් හා තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම්, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා සඳහා නිර්ණේය විෂයයන් සැකසීම, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා ඇගයීම, මහජන සහභාගීත්වය සඳහා අවකාශ ලබාදීම හා ඉන් අනතුරුව ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීම හා පසුවිපරම් කිරීම යන කරුණු ඇතුලත්වේ.

2015 වසර තුලදී ව්‍යාපෘති 79 ක් සඳහා ජාතික පාරිසරික පනතේ IV ඇ වගන්තිය යටතේ අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය වූ අතර, එම ව්‍යාපෘති පරිසර බලපෑම් ඇගයීමේ නියෝග යටතේ ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අනුව, ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික අනුමැතිය ලබාදුන් අතර ව්‍යාපෘති 2 ක් සඳහා අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂෙප කරනු ලැබීය. ව්‍යාපෘති 64 ක් අනුමැතිය අපේක්ෂාවෙන් ක්‍රියාත්මක වෙමින් පවති.

වගුව 4.1 2015 වසරේ පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් අනුමැතිය ලබාදුන්, ප්‍රතික්ෂෙප කරන ලද ව්‍යාපෘති නාම ලේඛනය

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
1.	මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය	පඇ.බ.
2.	අක් වෙරළ වැලි කැණීමේ ව්‍යාපෘතිය කෙරවලපිටිය (අනුමැතිය දීර්ඝ කිරීම)	පඇ.බ.
3.	යෝජිත වේයන්ගොඩ 132 .වො.තුල්හිරිය දක්වා කි -විදුලි සම්ප්‍රේෂණ මාර්ගය	මූ.ප.පා.
4.	යෝජිත වේයන්ගොඩ - කිරිඳිවැල -පාදුක්ක දක්වා කි 400/220 .වො.විදුලි සම්ප්‍රේෂණ මාර්ගය	මූ.ප.පා.
5.	පොල්පිටිය සිට පන්නිපිටිය දක්වා කි 220 .වො.විදුලි සම්ප්‍රේෂණ මාර්ගය	මූ.ප.පා.
6.	යෝජිත මානාකොල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.ප.පා.
7.	යෝජිත ඇතාමල ඇල්ල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ (අනුමැතිය දීර්ඝ කිරීම)	මූ.ප.පා.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
8.	පොල්පිටියේ සිට නව හබරණ දක්වා කි.වො. 132 විදුලි සම්ප්‍රේෂණ මාර්ගය	මූ.ප.පා.

වගුව 4.2 ප්‍රතික්ෂෙප කරන ලද ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
9.	මහනුවර නගර සභාව සඳහා යෝජිත ගුහාගොඩ කසල අපහරණ භූමිය පුනරුත්ථාපනය කිරීමේ හා ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාපිළිවෙලක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියේ (අනුමැතිය දීර්ඝ කිරීම)	පඇ.බ.

වගුව 4.3 පරිසර අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂෙප කිරීම සඳහා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන වෙත මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබාදුන් ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
1.	දිග්ගල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය- ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය)	පඇ.බ.
2.	'ෂෙරමන් හෝටලය', 265, ගාලු පාර, කොළඹ 03 (ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය - නාගරික සංවර්ධන අධිකාරිය)	මූ.ප.පා.
3.	හඳගිරි ඇල්ල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය)	මූ.ප.පා.
4.	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	මූ.ප.පා.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
	(නාගරික සංවර්ධන අධිකාරිය - ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය)	
1.	අත්වැල්තොට කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය, පාලින්දනුවර (ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව)	මූ.ප.පා.

වගුව 4.4 ප්‍රතික්ෂෙප කරන ලද ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
1.	ගැටඹේ කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය -ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය)	පඇ.බ.

වගුව 4.5 පරිසර බලපෑම් ඇගයීම් අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පැවැති ව්‍යාපෘති නාම ලේඛනය

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
2.	කොළඹ නගරයේ ඉහළින් ඉදි කිරීමට යෝජිත මාර්ග පද්ධතිය (Elevated Highway)	පඇ.බ. (අත්හරින ලදි)
3.	කොළඹ නගරයේ ඉහළින් ඉදි කිරීමට යෝජිත දුම්රිය මාර්ග පද්ධතිය (Monorail)	පඇ.බ.
4.	සබරගමුව අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (රුවන්පුර)	පඇ.බ.
5.	බදුල්ල මහනුවර අතර යෝජිත නව මාර්ගය -	පඇ.බ.
6.	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (පොතුහැර සිට නුවර දක්වා)	පඇ.බ.
7.	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (කඩවත සිට දඹුල්ල දක්වා)	පඇ.බ.
8.	මධ්‍යම අධිවේගී මාර්ගය හා පිටත වටරවුම් මාර්ගය එකතුවීමේ කඩවත අතුරු හුවමාරුව	පඇ.බ. (අතිරේක)
9.	මීගමුව මහ නගර සභා සීමාවෙහි අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය	පඇ.බ.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
10.	ගාල්ල මහ නගර සභා සීමාවෙහි අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය	පඇ.බ.
11.	යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, ගන්නොරුව පාර, පේරාදෙණිය	පඇ.බ.
12.	කැළණි ගඟෙහි හක්බෙල්ලාව කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	පඇ.බ.
13.	බැර කර්මාන්ත සඳහා විශෙෂ කලාපයක් පිහිටුවීම, සාම්පූර්, ත්‍රිකුණාමලය	පඇ.බ.
14.	යෝජිත සූරියවැව අපනයන පිරිසැකසුම් කලාපය, හම්බන්තොට සහ මොණරාගල	පඇ.බ.
15.	ගම්පහ දිස්ත්‍රික්කයේ යෝජිත නාගරික ඝන අපද්‍රව්‍ය මගින් බලශක්ති නිපදවීමේ ව්‍යාපෘතිය, කෙරවලපිටිය.	පඇ.බ.
16.	යෝජිත අපනයන සැකසුම් කලාපය, පර්ත් වතුයාය, හොරණ	පඇ.බ.
17.	හම්බන්තොට නව නගරය සඳහා යෝජිත අප ජලය එකතු කිරීම, ප්‍රතිකර්ම කිරීම හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය	පඇ.බ.
18.	දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ යෝජිත මළ අපවහන පද්ධතිය - දීර්ඝ කිරීම	පඇ.බ.
19.	අපද්‍රව්‍ය එකතුකිරීමේ හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටෙ.	පඇ.බ.
20.	යෝජිත බිබිල සීනි සංවර්ධන ව්‍යාපෘතිය	පඇ.බ.
21.	මෙ.වො. 2 X 250 ගල් අඟුරු බලාගාරය, ත්‍රිකුණාමලය	පඇ.බ.
22.	යෝජිත පහල මල්වතුඔය ජලාශ ව්‍යාපෘතිය	පඇ.බ.
23.	යෝජිත කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය	පඇ.බ.
24.	යෝජිත ඉහල ඇලහැර ඇල සංවර්ධන ව්‍යාපෘතිය	පඇ.බ.
25.	යෝජිත බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය	පඇ.බ.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
26.	වයඹ පළාතේ බෝවතැන්න ජලාශයේ සිට මහවැලි ගඟේ ජලය හැරවීමේ ව්‍යාපෘතිය	පඇ.බ.
27.	යෝජිත ගිංනිල්වලා ගඟ හැරවීමේ ව්‍යාපෘතිය -	පඇ.බ.
28.	යෝජිත මාදුරු ඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (බී කලාපය)	පඇ.බ.
29.	යෝජිත මාතර අදියර ජල සම්පාදන ව්‍යාපෘතිය 4	පඇ.බ.
30.	යෝජිත කළු ගඟ ලවණ බාධකය	පඇ.බ.
31.	යෝජිත “Grand Palace” කැමර හෝටල් ව්‍යාපෘතිය 200	පඇ.බ.
32.	යෝජිත ජාතික ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතියනුවරඑළිය ,	පඇ.බ.
33.	යෝජිත ‘Waters Edge’ හෝටලය සහ නිවාස	පඇ.බ.
34.	නිවාස සංකීර්ණය, 297, කටුගස්තොට පාර, මහනුවර.	පඇ.බ.
35.	යෝජිත ජාත්‍යන්තර යෝග භාවනා සහ ආයුර්වේද මධ්‍යස්ථානය, හන්තාන, මහනුවර	පඇ.බ.
36.	යෝජිත යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය	පඇ.බ.
37.	මහ කොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	පඇ.බ.
38.	යෝජිත අපද්‍රව්‍ය මගින් බලශක්ති නිපදවීමේ ව්‍යාපෘතිය, මාතර	
39.	යෝජිත හොරණ සිට කොට්ටාව දක්වා දුම්රිය මාර්ගය	පඇ.බ.
40.	යෝජිත කුරුණෑගල හබරණ දුම්රිය පාර විස්තීරණය කිරීමේ - දඹුල්ල - ව්‍යාපෘතිය	පඇ.බ.
41.	යෝජිත සම් හා සම්භාණ්ඩ නිපදවීමේ ව්‍යාපෘතිය	පඇ.බ.
42.	යෝජිත නිවාස සංකීර්ණය, හාරගම පාර, නුවර	පඇ.බ.
43.	සීතාවක ගඟ ජල විදුලිබලාගාර ව්‍යාපෘතිය, දෙහිඕවිට, කෑගල්ල	පඇ.බ.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මු
44.	පහල කොස්ගුලන කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	පඇ.බ.
45.	යෝජිත බෝගහහෙන කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	පඇ.බ.
46.	මෙ.වො. 1200 ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය, ත්‍රිකුණාමලය	පඇ.බ.
47.	වැලි කැණීමේ ව්‍යාපෘතිය, යාපන අර්ධද්වීපය	පඇ.බ.
48.	කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අක්වෙරළ මුහුදු වැලි කැණීමේ ව්‍යාපෘතිය	ප .අ.බ. (අතිරේක)
49.	දෙවන නව කැළණි පාලම් ව්‍යාපෘතිය	ප .අ.බ. (අතිරේක)
50.	යෝජිත බෙල්ලගස්වැව කර්මාන්තපුරය, හම්බන්තොට	මූ.ප.පා.
51.	වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අක්වෙරළ වැලි කැණීමේ ව්‍යාපෘතිය	මූ.ප.පා. (අත්හරින ලදි)
52.	යෝජිත සීනි පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය, හම්බන්තොට	මූ.ප.පා.
53.	ජේට් ඒ -2 ඉන්ධනය මුතුරාජවෙල සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල දක්වා ගෙන යාමට නල මාර්ගයක් ඉදිකිරීම හා අවශ්‍ය අනෙකුත් ඉදිකිරීම්	
54.	යෝජිත මාලිම්බොඩ කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.ප.පා.
55.	යෝජිත පෙව වෛද්‍ය අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පහසුකම් සැපයීම, කටුනායක	මූ.ප.පා. (අත්හරින ලදි)
56.	යෝජිත අපද්‍රව්‍ය මගින් බලශක්ති නිපදවීමේ ව්‍යාපෘතිය, හොරණ, කළුතර දිස්ත්‍රික්කය	මූ.ප.පා.
57.	යෝජිත පහල උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශය	මූ.ප.පා.
58.	නාදුකුඩා සිට මන්නාරම දක්වා කි.වො. 132 විදුලි සම්ප්‍රේෂණ මාර්ගය	මූ.ප.පා.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප /ඇ.බ. ප.පා.මූ
59.	යෝජිත පොල්පිටිය සිට හම්බන්තොට දක්වා කි.වෝ. 220 විදුලි සම්ප්‍රේෂණ මාර්ගය	මූ.ප.පා.
60.	ඉහලින් ඉදිකිරීමට යෝජිත මාර්ග පද්ධතිය, බත්තරමුල්ල උතුර (බෙස්ලයින් - රාජගිරිය)	මූ.ප.පා.
61.	ඉහලින් ඉදිකිරීමට යෝජිත මාර්ග පද්ධතිය, බත්තරමුල්ල දකුණ (මාලපල්ල-කිඹුලාවල)	මූ.ප.පා.
62.	කාලිංගනුවර, අංගමැඩිල්ල ජල යෝජනා ක්‍රමය	මූ.ප.පා.
63.	යෝජිත රන්වල ඔය කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.ප.පා.
64.	යෝජිත දෙමුහුම් පොල් බීජ උයනක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය, පුනරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මූ.ප.පා.

මීට අමතරව සංකීර්ණ පාරිසරික ගැටළු රහිත තෝරාගත් නියමිත ව්‍යාපෘති සඳහා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ පලාත් කාර්යාල වෙත බලය පවරා ඇත. මෙම ව්‍යාපෘතිවලට අදාල කටයුතු කරගෙනයාමේදී අවශ්‍ය සහාය සහ මග පෙන්වීම පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් ලබාදී ඇත.

මීට අමතරව අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත, ඔවුන්ට යොමු කර තිබෙන ව්‍යාපෘතිවලට අදාලව පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සහාය ලබාදී ඇත.

4.1.1 අනුමැතිය ලද ව්‍යාපෘති පසුවිපරම් කිරීම

ව්‍යාපෘති අනුමත කිරීමේදී දෙනු ලබන කොන්දේසිවලට යටත්ව ව්‍යාපෘති නිසි අයුරින් ක්‍රියාත්මක වන්නේ දැයි සහතික කිරීම සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකය දැනටමත් අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති පසුවිපරම් කරනු ලැබීය. පහත සඳහන් ව්‍යාපෘති පසුවිපරම් කිරීම, ද්වි මාසික රැස්වීම් සහ ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් නොකඩවා සිදු කරනු ලැබීය.

වගුව 4.4 2015 වසර තුලදී පසුවිපරම් කරන ලද ව්‍යාපෘති පහත දැක්වේ.

1	කොළඹ පිටත වටරවුම් මහා මාර්ග ව්‍යාපෘතිය (අදියර I, II සහ III)
2	මාතර - කතරගම, දුම්රිය මාර්ගය දිර්ඝ කිරීමේ ව්‍යාපෘතිය අදියර I (මාතර - බෙලිඅත්ත දක්වා)
3	උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
4	මොරගහකන්ද සහ කළු ගඟ කෘෂිකර්ම ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය

5	දොළුව කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතිය
6	“බ්‍රෝඩ්ලන්ඩ්” ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය, ගිණිගත්හෙන
7	හෝටල් ව්‍යාපෘතිය, කොග්ගල
8	‘ජැනට් වැලි’ කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය, නාවලපිටිය
9	නාය ගහ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය, දැරණියගල
10	කෙහෙල්ගමු ඔය කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය අදියර II
11	යෝජිත ඉමල්ෂන් ස්ථෝටික (පුපුරන ද්‍රව්‍ය) කර්මාන්තය, ඔයාමඩුව, මහවිලච්චිය, අනුරාධපුරය
12	තුල්හිරිය “MAS Fabric Park” හි “ETP” බොර පිලිස්සීමේ ව්‍යාපෘතිය
13	මොරාන ජලාශ ව්‍යාපෘතිය, බදුල්ල
14	බදුල්ල, හාලිඇල සහ ඇල්ල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
15	මහනුවර නගර සභාව සඳහා යෝජිත
16	කැළණි සිටි පාලමේ එළඹුම් මාර්ගය සැකසීම, කැළණිමුල්ල-මුල්ලේරියාව-කොස්වත්ත පාර
17	යෝජිත නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය, 51/2, ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවත, මහනුවර
18	යෝජිත මහනුවර අපද්‍රව්‍ය ව්‍යාපෘතිය
19	මාතර සිට මත්තල දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය

4.1.2 පරිසර බලපෑම් ඇගයීම්/ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

පරිසර බලපෑම් ඇගයීම් පුහුණු වැඩසටහන්

(අ) පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියේ ඇගයීම් කටයුතුවලදී, කැණීම් ව්‍යාපෘතිවලට අදාලව කටයුතු සිදු කරන ආකාරය පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වූ වැඩමුළුව

මෙම වැඩමුළුව පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් මානව සම්පත් කළමනාකරණ ඒකකයේ ද සහය ඇතිව සංවිධානය කරන ලදි. දෙදින වැඩමුළුවක් වූ මෙහි පළමු දින දේශන ඇසුරින් ද දෙවන දින බෝගල මිනිරන් පතල ආශ්‍රිතව ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් ද සිදු කරන ලදි. මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් 50 ක් පමණ සහභාගී විය.

(ආ) අප ජලය ප්‍රතිකර්ම කිරීම හා සුදුසු ලෙස බැහැර කිරීම පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වූ වැඩමුළුව.

පරිසර බලපෑම් ඇගයීම් ඒකකය, මානව සම්පත් කළමනාකරණ ඒකකයේද සහාය ඇතිව මෙම වැඩමුළුව සංවිධානය කරන ලදි. මේ සඳහා පළාත් කාර්යාලවල ද ඇතුළුව මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් 62 ක් පමණ සහභාගී විය. සම්පත්දායකයින් ලෙස මොරටුව විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් දායකත්වය ලබාදුනි. මෙහි දෙවන කොටස ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව 2016 ජනවාරි මස පවත්වනු ලැබේ.

මීට අමතරව රජරට විශ්ව විද්‍යාලයේ සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ උපාධි අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් 2 ක් පැවැත්විණි

4.1.3 පරිසර බලපෑම් ඇගයීම් රෙගුලාසි සංශෝධනය කිරීම

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරියේ නීති උපදේශකවරයා සමග පැවති සාකච්ඡාවලින් අනතුරුව පරිසර බලපෑම් ඇගයීම් ඒකකය, පරිසර බලපෑම් ඇගයීම් නියෝග, නියමිත ව්‍යාපෘති ලයිස්තුව සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන ලයිස්තුව සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදි. අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති විධිමත් ලෙස පසුවිපරම් කිරීම සඳහා ව්‍යාපෘති යෝජකගෙන් පරිසර කළමනාකරණ සැලැස්මක් ලබා ගැනීමේ නව නියෝගයන්ද පරිසර බලපෑම් ඇගයීම් නියෝගයන්ට ඇතුළත් කිරීමට කටයුතු කරන ලදි. අදාල පාර්ශවකරුවන් සහ මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාලවල නිලධාරීන් සම්බන්ධ වී නියමිත ව්‍යාපෘති ලයිස්තුව සහ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන ලයිස්තුව නැවත සකස් කරන ලදි. මෙම සියලුම ලේඛන ප්‍රකාශයට පත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නීති අංශය වෙත යොමු කරන ලදි.

4.1.4 පාරිසරික ප්‍රවාහ පිළිබඳ අධ්‍යයනය

කුඩා ජල විදුලි බලාගාර ඇතුලු ලංකාවේ ජල සම්පත් ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතීන්හි වැඩිවීමේ ප්‍රවණතාවයක් ඇත. එබැවින්, ගංගා ආදියෙහි ජල ප්‍රවාහ රටාවන්හි වෙනස්කමක් සිදුවන සංවර්ධන හෝ කළමනාකරණ කටයුතු සිදු කිරීමෙදී ඊට පහලින් වූ පාරිසරික පද්ධතිය සහ ජලය භාවිත කරන්නන්ගේ අවශ්‍යතාවලට හානිකර නොවන ලෙස සිදු කිරීමේ අවශ්‍යතාවය මෑත කාලයේදී අවබෝධ කරගෙන ඇත.

එබැවින් සමාජීය, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතා සලකා බලා එසෙ පවත්වාගත යුතු "පාරිසරික ජල ප්‍රවාහ" නිර්ණය කිරීම සඳහා වූ අධ්‍යයනයක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආරම්භ කරන ලදි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ "පාරිසරික ප්‍රවාහ" නිර්ණය කිරීමේ අරමුණුගත නිර්නායක සහ මාර්ගෝපදේශ සකස් කිරීමයි.

මෙම අධ්‍යයනය මහාචාර්ය දේවක වීරකෝන් ඇතුලු විශේෂඥ කණ්ඩායමකට පැවරූ අතර, ඔවුන් විසින් එම අධ්‍යයනයේ අවසන් වාර්තාව පාර්ශවකරුවන් සඳහා ඉදිරිපත් කරන ලද අතර අධ්‍යයනය සාර්ථකව අවසන් විය.

4.1.5 උපාය මාර්ගික පරිසර ඇගයීම් ක්‍රියාත්මක කිරීම

- උපාය මාර්ගික පාරිසරික ඇගයීම හා අදාල නීති ඇතුළත් වන පරිදි ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම

  මේ සඳහා අවශ්‍ය වන්නා වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කර පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

- උතුරු පළාත සඳහා සිදු කරනු ලැබූ උපාය මාර්ගික පාරිසරික ඇගයීම

  උතුරු පළාත සඳහා වූ උපාය මාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාව ප්‍රකාශයට පත් කළ අතර, අදාල පාර්ශවකරුවන් අතරෙහි බෙදා දෙන ලදි. මෙම වාර්තාව සහ සිතියම් මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවියෙන් ද ලබාගත හැක.

- බස්නාහිර පළාත් මහ නගර සැලසුම් සඳහා සිදුකරනු ලබන උපාය මාර්ගික පාරිසරික ඇගයීම

  මධ්‍යම පරිසර අධිකාරිය බස්නාහිර පළාත් මහ නගර සැලසුම් ව්‍යාපෘතිය සමග එකතුව මෙම ඇගයීම සිදු කරනු ලැබේ.

  පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මෙම අධ්‍යයනයේ නිර්නේය විෂයයන් (ToR) කෙටුම්පත් කිරීම සඳහා සහයෝගය දක්වන ලදි. මෙම ඇගයීමේ පාර්ශවකරුවන් සඳහා වූ රැස්වීම් සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් සහභාගී වූ අතර, ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදි.

4.1.6 අනෙකුත් ක්‍රියාකාරකම්

ඉහත ක්‍රියාකාරකම්වලට අමතරව ව්‍යාපෘතීන්හි විවිධාකාර ගැටලු විසඳීම සඳහා පහත දක්වා ඇති රැස්වීම්/ ක්ෂේත්‍ර පරික්ෂණ සඳහා ද 2015 වර්ෂයේදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ සහභාගීත්වය ලබාදෙන ලදී.

අග්‍රාමාත්‍ය කාර්යාල කමිටුව විසින් පවත්වනු ලැබූ වරාය නගර සමාලෝචක කමිටු රැස්වීම්

- මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය මගින් පවත්වනු ලැබූ උමාඔය සමාලෝචන කමිටු රැස්වීම්.
- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් පවත්වනු ලැබූ යෝජිත දොළුව ආයුර්වේද කෘෂිකර්ම ඉඩම් සංවර්ධන ව්‍යාපෘතියේ රැස්වීම.
- මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන්හි සම්බන්ධීකරණ කමිටු රැස්වීම.
- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන කාලිංග නුවර, අංගමැඩිල්ල ජල යෝජනාක්‍රමයට අදාල රැස්වීම.
- උතුරු පළාතෙහි ජල සම්පත් සංවර්ධනයට අදාල සම්බන්ධීකරණ කමිටු රැස්වීම.

4.2. ස්වභාවික සම්පත් කළමනාකරණ හා පසුවිපරම් ඒකකය

මහජනතාවගේ සහ අදාල අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණයෙන් දේශයේ ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ වගකීම දරනු ලබන ආයතනය මධ්‍යම පරිසර අධිකාරියයි.

ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලව මධ්‍යම පරිසර අධිකාරිය විසින් රෙගුලාසි සකස් කිරීම, ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාල ගුරු උපදෙස් සකස් කිරීම, ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ආරක්ෂක ප්‍රදේශ තුල අනුමත භාවිතයන්ට අදාල ව්‍යාපෘති අනුමත කිරීම, ජාතික තෙත්බිම් ප්‍රතිපත්තියෙහි සඳහන් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම, ස්වභාවික සම්පත් කළමනාකරණය, පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය සහ තෙත්බිම් සංරක්ෂණය සම්බන්ධව අදාල තොරතුරු ප්‍රකාශන සකස් කිරීම යන කටයුතු සිදු කරනු ලැබේ. ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලව 2015 වර්ෂයේ පහත සඳහන් කටයුතු සිදු කරන ලදී.

4.2.1 ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා වන අන්තර් ආයතනික කමිටුව.

ස්වභාවික සම්පත් කළමනාකරණය සම්බන්ධව කටයුතු සිදු කරන රාජ්‍ය ආයතන සමග 2015 වර්ෂය තුලදී රැස්වීම් 4 ක් පවත්වන ලදී. මෙම කමිටු රැස්වීම් වලදී ප්‍රධාන වශයෙන්ම ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය, පාංශු සංරක්ෂණයට අදාල ගුරු උපදෙස් සකස් කිරීම, බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ගැසට් නිවේදනය සංශෝධනය කිරීම යන තීරණය ගනු ලැබිණි. ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණයට අදාලව බදුල්ල දිස්ත්‍රික්කයේ තේ වතු තුල පිහිටි සියලු ජල පෝෂක ප්‍රදේශ ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට තීරණය විය.

4.2.2 ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලව ගුරු උපදෙස්, තොරතුරු ප්‍රකාශන අත්පත්‍රිකා, පොත් පිංච යනාදිය සකස් කිරීම.

ජනතාව, පාසැල් සිසුන් සහ අදාල ආයතන වල ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ දැනුම වර්ධනය පිණිස මෙම තොරතුරු පත්‍රිකා, පොත් පිංච යනාදිය සකස් කරන ලදී. මේ අනුව පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් මාර්ග දෙපස, ගෙවතු හා නාගරික ප්‍රදේශ වල රුක් රෝපණය නඩත්තුව, කළමනාකරණය යනාදිය සඳහා දැනුවත් කිරීමේ තොරතුරු ප්‍රකාශන සකස් කරන ලදී.

ඛණිජ කැනීම් සිදුකර අතහැර දමන ලද ස්ථාන නැවත පුනරුත්ථාපනය කිරීම පිණිස ගුරු උපදෙස් සකස් කිරීම මොරටුව විශ්ව විද්‍යාලයේ විශෙෂඥයන්ගේ සහාය ඇතිව ආරම්භ කරන ලදී. දිවයිනේ ඛණිජ කැණීම් කටයුතු වලට අදාලව මෙම ගුරු උපදෙස් සකස් කිරීම කාලීන අවශ්‍යතාවයකි.







රූපය 4.1. ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාල ප්‍රකාශන

4.2.3 දැනුවත් කිරීමේ වැඩසටහන්

වැලි ගොඩදැමීමේ කාර්යය තිරසාර ලෙස සිදුකිරීම පිළිබඳ දැනුවත් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ මෙම පළාත් කාර්යාල වල සහයෝගයෙන්, කුරුණෑගල, කෑගල්ල, ගාල්ල, බදුල්ල සහ මාතර යන දිස්ත්‍රික්ක පහෙ සිදුකරන ලදී. දැනුවත් කිරීමේ වැඩසටහන් පහක් ජල සම්පත් හා ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුළු අදාල නිලධාරීන්ට පවත්වන ලදී.

ඉඩම් සංවර්ධනය හා ඉඩම් ගොඩකිරීම පිළිබඳ වර්තමාන අනුමැතිය ලබාගත යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් බදුල්ල, මොණරාගල, ගාල්ල, හම්බන්තොට, මාතර, කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික් කාර්යාල වල නිලධාරීන්ට සිදුකරන ලදී.

4.2.4 ශ්‍රී ලංකාවේ පාරිසරික හා ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථාන හා වෘක්ෂ සංරක්ෂණය.

මෙම වැඩසටහන 2011 සිට ක්‍රියාත්මක වේ. 2015 වර්ෂය කාලය තුල පහත සඳහන් ස්ථාන වල නාම පුවරු සවි කිරීම සිදු කරන ලදී.

වගුව 4.5 දැන්වීම් පුවරු සවිකළ ස්ථාන

පළාත	දිස්ත්‍රික්කය	ග්‍රාම නිලධාරී කොට්ඨාශය හා ග්‍රාමය	ස්ථානය
බස්නාහිර	කළුතර	691/ඒ, අළුබෝමුල්ල බටහිර (අළුබෝමුල්ල ගම)	• පැරණි නා ගස අවුරුදු 200 කට වඩා පැරණියි. මානව ක්‍රියාකාරකම් නිසා තර්ජනයට ලක් වී ඇත.

පළාත	දිස්ත්‍රික්කය	ග්‍රාම නිලධාරි කොට්ඨාශය හා ග්‍රාමය	ස්ථානය
උතුර	බදුල්ල	මල්වත්තගම (ඉඩමේගම)	• යෝධ බුළු ශාකය අවුරුදු 150 – 200 පමණ පැරණිය. මීටර් 35 ට වඩා උසය. භූමියෙන් 20 පර්වස් ප්‍රදේශයක පැතිර පවතී. වට ප්‍රමාණය 5 m වඩා වැඩිය. ස්වදේශිය ඖෂධීය ශාකයක් ලෙස වැදගත් වේ.
උතුර	මොණරාගල	හම්බේගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාශය(හම්බේගමුව පන්සල වත්ත/ භූමිය)	• මදාරා ගස අවුරුදු 70 ක් පමණ පැරණිය. ඖෂධීය ශාකයක් ලෙස වැදගත් වේ.

රූපය 4.2. ශ්‍රී ලංකාවේ පාරිසරික හා ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථාන හා වෘක්ෂ

4.2.5 ජල මූලාශ්‍ර හා ජලාධාර ප්‍රදේශ සංරක්ෂණය කිරීම

4.2.5.1 ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය.

උක්ත ජාතික ප්‍රතිපත්තිය පාදක කරගනිමින් ජල පෝෂක ප්‍රදේශ හඳුනාගෙන ඒ පිළිබඳ රැස්කරගත් තොරතුරු භාවිතයෙන් වාර්තා පිළියෙල කිරීමට හා එම ප්‍ර දේශ ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන මත සංරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය මුලිකත්වයෙන් කටයුතු සිදු කරමින් පවතී.

4.2.5.2 හොරණ හා ඉංගිරිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාශවල ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම

හොරණ හා ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි හඳුනාගත් ජලමාර්ග, ජලාශ හා ඒවායේ ජලමූලාශ්‍ර ප්‍රදේශ සඳහා කළමණාකරන සැලසුම් පිලියෙල කිරීම වෙනුවෙන් අදාල පාර්ශව ආයතන සමඟ සාකච්ඡා වට 02ක් පවත්වන ලදී. එහිදී ජල මූලාශ්‍ර සංරක්ෂණයට හා කළමණාකරනය

කිරීම සඳහා මෙහෙයුම් කමිටු 02ක් හොරණ හා ඉංගිරිය ප්‍ර දේශීය ලේකම්වරුන්ගේ සභාපතිත්වයෙන් පිහිටුවන ලදී. එම කමිටු පිහිටුවා ගැනීම සඳහා මෙන්ම, එහි කාර්යයන් පිළිබඳවත් හඳුනාගත් ජල මූලාශ්‍ර සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම සඳහා ගුරු උපදෙස් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට ලබා දෙන ලදී.

මෙම කමිටු පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වුයේ මෙම කොට්ඨාශ දෙකෙහි හඳුනාගත් ජල මූලාශ්‍ර හා ඒවායේ රක්ෂිතයන් අනාගතය සඳහා ආරක්ෂා කිරීමයි. එසෙම මෙම ආයතනික ක්‍රියාමාර්ගය නියමු ව්‍යාපෘතියක් ලෙස උක්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආරම්භ කලද එහි සාර්ථකත්වය පදනම් කරගනිමින් වඩා පුළුල් සැලසුමක් දිවයිනේ අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහාද ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

4.2.5.3 බදුල්ල දිස්ත්‍රික්කයේ ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම.

බදුල්ල දිස්ත්‍රික්කයේ තේ වගාබිම් වල පිහිටා ඇති ජල පෝෂක ප්‍රදේශ තර්ජනයට ලක් වීමේ ප්‍රවණතාවයක් පවතින අතර ඒ සම්බන්ධව සිදු කළ අධ්‍යනයකදී සංරක්ෂණය කළ යුතු ජල පෝෂක ප්‍රදේශ හෙක්. 1148 (ඉඩම් කැබලි 1675) හඳුනාගෙන ඇත. එසෙ හඳුනාගත් ප්‍රදේශ ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන අනුව පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදාල ආයතන සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී. ඒ අනුව හඳුනාගත් ජලපෝෂක ප්‍රදේශ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රකාශයට පත් කිරීම සුදුසු බව තීරණය කළ අතර එහි ප්‍රථම අදියර ලෙස හාලි ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ජල පෝෂක ප්‍රදේශ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතී.

4.2.6 දියඇළි සංරක්ෂණය කිරීම

දිවයින පුරා විසිරි ඇති දියඇලි අවහිර කොට ඉදිකරනු ලබන කුඩා පරිමාණ ජලවිදුලි ව්‍යාපෘති හේතුවෙන් මෙම වටිනා ස්වභාවික සම්පතට සිදුවන නොයෙකුත් හානි හා වක්‍ර බලපෑම් අධ්‍යනය කළ මධ්‍යම පරිසර අධිකාරිය 2011 වසරේදී තවදුරටත් මෙවැනි ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා නොදීමට ප්‍රතිපත්තිමය තීරණයට එළඹෙන ලදී. මෙහිදී මේ සම්බන්ධව පවතින දත්ත ඌනතාවය හඳුනා ගත් මෙම ඒකකය මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වල නිළධාරීන්ගේ ශ්‍රම දායකත්වයෙන් දියඇලි සංගණනයක් සිදුකළ අතර, දියඇලි 512ක් එමගින් හඳුනාගන්නා ලදී. මෙම දත්ත තහවුරු කරගැනීම සඳහා අදාල නිළධාරීන් සමඟ රැස්වීම් වාර 07ක් පවත්වන ලදී. එහිදී ලබාගත් තීරණ අනුව ඉදිරියේදී සංරක්ෂණය කළයුතු දියඇලි හඳුනාගෙන ඒවා ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

මෙම ඒකකයේ නිලධාරීන් විවිධ ආයතනයන් විසින් පවත්වනු ලබන කමිටු, රැස්වීම් සහ වැඩමුළු වලට මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරමින් සහභාගී වන අතර ස්වභාවික සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් තාක්ෂණික සහාය එම ආයතන වෙත ලබා දේ. මෙම කමිටු අතර; නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ජාතික ජලජීවී සංවර්ධන අධිකාරිය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යන ආයතන විසින් පවත්වනු ලබන සැලසුම් කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු ප්‍රධාන වේ.

එමෙන්ම, ජාතික විද්‍යා පදනමේ පවත්වනු ලබන මිනිසා සහ පෙව ගෝලය පිළිබඳ කමිටුව, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව වැනි කමිටු වලට ද අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමට කටයුතු ඒ අනුව 2015 වසර තුල මෙවැනි රැස්වීම් 150 ට

අධික සංඛ්‍යාවක් සඳහා මෙම ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත. මීට අමතරව පරිසර විෂය සම්බන්ධයෙන් විවිධ අමාත්‍යාංශ/ආයතන මගින් යොමු කරනු ලබන අමාත්‍යමණ්ඩල පත්‍රිකා, වාර්තා, කළමනාකරණ සැලසුම් සඳහා අදහස් හා නිරීක්ෂණ එම ආයතන වෙත ලබා දීමට කටයුතු කර ඇත.

වගුව 4.6 සමීක්ෂණය මගින් හඳුනාගත් දියඇලි

පලාත	දිස්ත්‍රික්කය	දියඇලි ගණන
දකුණු පලාත	ගාල්ල	30
	මාතර	16
	හම්බන්තොට	4
බස්නාහිර පලාත	කොළඹ	5
	කළුතර	21
	ගම්පහ	2
මධ්‍යම පලාත	මාතලේ	22
	මහනුවර	38
	නුවරඑලිය	156
සබරගමුව පලාත	කෑගල්ල	40
	රත්නපුර	171
ඌව	බදුල්ල	32
	මොනරාගල	10
වයඹ පලාත	කුරුනෑගල	1

4.2.7 ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහා තාක්ෂණික මාර්ගෝපදේශකත්වය සැපයීම.

2015 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරිය, ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව, භූවිද්‍යා පතල් කැණීම් කාර්යාංශය, ජාතික ජල සම්පත් මණ්ඩලය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, ජාතික විද්‍යා පදනමේ මිනිසා සහ පෙව ගෝල කමිටුව, පාර්ලිමේන්තු උපදේශන කාරක සභාව ආදී ආයතනවල සැලසුම් කමිටු / තාක්ෂණික ඇගයීම් කමිටු නියෝජනය කරමින් මෙම ඒකකයේ නිලධාරීන් සඳහා ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ තාක්ෂණික සහය ලබා දෙන ලදී. තවද, විවිධ අමාත්‍යාංශ / ආයතන විසින් පාරිසරික කටයුතු පිළිබඳව අප අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකා, වාර්තා හා කළමනාකරණ සැලසුම් පිළිබඳ අදහස් / නිරීක්ෂණයන් ලබාදීම ද සිදුකරන ලදී.

පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම සහ කළමනාකරණය

වගුව 4.7 ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය හා පසුවිපරම් කටයුතු සිදු කිරීම.

	පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	2015 වසර අවසානයේ ප්‍රගතිය
1.	බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය (2009.12.30 දිනැති අංක 1634/23 දරණ ගැසට් පත්‍රය)	ගැසට් නිවේදනයේ සංශෝධනයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී. මෙම ආරක්ෂක ප්‍රදේශයේ මායිම් හඳුනාගෙන සලකුණු කිරීමේ වැඩසටහන යටතේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මායිම් සලකුණු කිරීමේ කටයුතු 95% ප්‍රමාණයක් නිමකරන ලදී.

	පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	2015 වසර අවසානයේ ප්‍රගතිය
		බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් වූ ගැසට් නිවේදනය පිළිබඳව එම ප්‍රදේශයේ සෙවය කරන රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රජා මූලික සංවිධාන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලද අතර ගැසට් නිවේදනයේ සඳහන් අවසරලත් භාවිතයන්ට අනුකූල වූ ව්‍යාපෘතින් දහයක් සඳහා අවසර ලබා දුන් අතර එක් ව්‍යාපෘතියක් සඳහා අවසර ලබාදීම ප්‍රතික්ෂෙප විය. නීතිමය ක්‍රියාමාර්ග - අධිකරණ නඩු 4 ක් විභාග කරන ලදී.
2.	මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය (2006.10.13 දිනැති අංක 1466/26 දරණ ගැසට් පත්‍රය)	දැනුවත් කිරීමේ කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන පරිදි අත්පත්‍රිකාවක් මුද්‍රණය කිරීම සිදුකරන ලදී.
3.	තලංගම වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය (2007.03.05 දිනැති අංක 1487/10 දරණ ගැසට් පත්‍රය)	දැනුවත් කිරීමේ වැඩසටහනක් පාර්ශවකරු ආයතන වල නිලධාරීන් සඳහා පවත්වන ලද අතර තලංගම වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ කළමනාකරණ සැලසුමේ සංශෝධන කටයුතු නිම කරන ලදී.
4.	ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය (2007.03.05 දිනැති අංක 1487/10 දරණ ගැසට් පත්‍රය)	2015 වසරේ අප්‍රේල් මස වසන්ත සමය ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ඒ හා සමගාමීව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ශවකරු ආයතන සඳහා රැස්වීම් දෙකක් පවත්වන ලදී. හෝටල් කරුවන්, පාසල් සිසුන්, පරිසර නියමු හට සමාජිකයන්, ග්‍රෙගරි වැව භාවිතා කරන්නන් සඳහා ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ වැදගත්ම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. නුවරඑළිය නගර සභාව සමග ඒකාබද්ධව “වසන්ත උදානය” සැණකෙලිය වැඩසටහන යටතේ ආරක්ෂක ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ කටයුතු සිදු කරන ලදී. උත්සව සමය තුලදී සියලුම පාර්ශව ආයතනයන්ගේ සහභාගීත්වයෙන් පසුවිපරම් ක්ෂෙත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී. දැනුවත් කිරීමේ පත්‍රිකා 90,000 ට වඩා දේශීය හා විදේශීය සංචාරකයන් අතර බෙදා හරින ලදී. පාරිසරික ආරක්ෂක ප්‍රදේශය කළමනාකරණය හා උත්සව සමයේ පරිසර වැඩසටහන සම්බන්ධව සංචාරකයන්ගේ අදහස් ලබා ගැනීම පිණිස පරීක්ෂණයක් සිදුකරන ලදී.

	පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	2015 වසර අවසානයේ ප්‍රගතිය
		2015 වසරේ උත්සව සමයේ පරිසර වැඩසටහනේ අත්දැකීම් හා අඩුලුහුඩු කම් පිළිබඳ සාකච්ඡා කිරීම සහ ඊළඟ වසරේ වැඩසටහන වැඩිදියුණු කිරීම සඳහා පශ්චාත් ඇගයීම් රැස්වීමක් සියලුම පාර්ශ්වකරුවන් සහභාගීත්වයෙන් පවත්වන ලදී.
5.	හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය කඳුවැටිය (2010.02.17 දිනැති අංක 1641/28 දරණ ගැසට් පත්‍රය)	ගැසට් නිවේදනය සංශෝධනය කරමින් පවතී. හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී. පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සඳහා කළමනාකරණ සැලැස්මක් සකස් කරන ලදී. පරිපාලන හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය කළමනාකරණය උදෙසා තාක්ෂණික සහ පරිපාලන මාර්ගෝපදේශ ප්‍රතිශෝධනය කරන ලදී. ව්‍යාපෘති 87 ක් අනුමත කරන ලද අතර ඉල්ලුම්පත් 32 ක් ප්‍රතික්ෂේප කරන ලදී. අනවසර ක්‍රියා 12 ක් සඳහා නීතිමය කටයුතු ආරම්භ කරන ලදී.
6.	මරගල කඳුවැටිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශය (2008.08.01 දිනැති අංක 1560/26 දරණ ගැසට් පත්‍රය)	පසුවිපරම් රැස්වීම් 2 ක් පවත්වන ලද අතර පසු විපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ 02 ක් සිදු කරන ලදී. මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටුව සඳහා තාක්ෂණික සහ පරිපාලන මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලදී. ජලාධාර ප්‍රදේශ වල පාර්ශ්ව ආයතන වල සහභාගීත්වයෙන් රුක් රෝපණ වැඩසටහනක් පවත්වන ලදී.

වගුව 4.8 යෝජිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වල වර්තමාන ප්‍රගතිය

1.	යෝජිත පන්සලාතැන්න පාරිසරික ආරක්ෂක ප්‍රදේශය පිහිටීම - මාතලේ දිස්ත්‍රික්කය උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	රැස්වීම් දෙකකදී ගැසට් නිවේදනයේ කෙටුම්පත අදාල පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර තවදුරටත් ඔවුන්ගේ අදහස්/යෝජනා ලබා ගැනීම සිදුකරන ලදී. එම අදහස්/යෝජනා ඇතුලත් කර සකස් කරන ලද සංශෝධිත ගැසට් නිවේදනය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතියට යවන ලදී.
2.	වරාතැන්න හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය මහනුවර	ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීම සඳහා උපදේශක රැස්වීමක් සහ අදාල පාර්ශවකරුවන් සමග රැස්වීමක් පවත්වන ලදී. ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව, එම කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතියට යවන ලදී.
3.	නුවරඑළිය තුරහ තරහ පිටිය තෙත්බිම් පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	අදාල පාර්ශවකරුවන් සමග රැස්වීම් වාර දෙකක් පවත්වා ගැසට් නිවේදනය කෙටුම්පත් කරන ලදී.

4.	යෝජිත ගිං ඔය පාරිසරික ආරක්ෂක ප්‍රදේශය (වෙන්නප්පුව)	ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීම සඳහා අදාල පාර්ශවකරුවන්ගේ උපදේශකත්වය ලබා ගැනීමට රැස්වීම් වාර දෙකක් පවත්වා, කෙටුම්පත පිළියෙල කරන ලදී.
5.	යෝජිත දැඩිගමුව කන්ද පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	කෙටුම්පත් කරන ලද ගැසට් නිවේදනය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම පිණිස එම දෙපාර්තමේන්තුවට යවන ලදී.
6.	ප්‍රකාශයට පත් කිරීම සඳහා අලුතින් ස්ථාන හඳුනාගැනීම	පල කරන ලද පුවත්පත් දැන්වීමට අනුව ස්ථාන 500 කට ආසන්න ප්‍රදේශයක් පරිසර සංවේදී ප්‍රදේශ ලෙස හඳුනාගන්නා ලදී. එම සියලුම තොරතුරු පළාත් මට්ටමින් වගුගත කර වැඩිදුර අධ්‍යනය සිදුකරමින් පවතී.

4.2.9 තෙත්බිම් කළමනාකරණය

- ජාතික තෙත්බිම් කළමනාකරණ මෙහෙයුම් කමිටුවේ රැස්වීම්

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙහෙයුම් කමිටු රැස්වීම් වාර දෙකක් පැවැත්වුණි. එහිදි ජාතික තෙත්බිම් ප්‍රතිපත්තිය හා උපාය මාර්ග වලට අනුකූලව තෙත්බිම් කළමනාකරණය හා සංරක්ෂණය උදෙසා වැදගත් තීරණ කිහිපයක් ගැණිනි. පවත්නා ජාතික තෙත්බිම් ප්‍රතිපත්තිය හා උපායමාර්ග සංශෝධනය කිරීම පෙව විවිධත්ව ලේකම් කාර්යාල වෙත පැවරුණි. කොළඹ හා ආශ්‍රිත ප්‍රදේශය සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සකස් කරන ලද තෙත්බිම් සඳහා උපායමාර්ගික සැලැස්ම ද මෙහි දී අනුමත කෙරිණි.

- **තෙත්බිම් අසිරිය අත්පොත**

තෙත්බිම් අසිරිය අත්පොත සංශෝධනය කර නව තොරතුරුද ඇතුලත් කොට නැවත මුද්‍රණය කරනු ලැබිණි. මෙය පාසල් ශිෂ්‍යයන් සඳහා සුදුසු අතිරේක කියවීම් පොතක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත.

4.2.9.1 ලෝක තෙත්බිම් දිනය

පෙබරවාරි මස 02 වන දිනට යෙදෙන රැම්සා සම්මුතිය යටතේ 1997 දී ප්‍රකාශයට පත්කෙරුණු ලෝක තෙත්බිම් දිනය "**අපගේ අනාගතය උදෙසා තෙත්බිම්**" යන තේමාව යටතේ මෙම වසරේදී සමරනු ලැබිණි. වනජීවී දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙය සංවිධානය කෙරුණු අතර තෙත්බිම් ඇසුරින් හරස්පද ප්‍රහේලිකා තරඟයක් හා දීප ව්‍යාප්ත චිත්‍ර තරඟයක් ද පවත්වනු ලැබිණි. මේ සඳහා සීමාසහිත විජය පුවත්පත් සමාගම අනුග්‍රහය දැක්වූ අතර සිංහල හා දෙමළ භාෂා මාධ්‍ය වලින් තරඟය පැවැත්විණි.

මෙහි ජයග්‍රාහකයන් සඳහා මුදල් සහ දෙමාපියන් සමග වනජීවී දෙපාර්තමේන්තුවට අයත් වනෝද්‍යානයක සංචාරක බංගලාවක දින දෙකක නිවාඩුවක් ගත කිරීමේ අවස්ථාව ඇතුළු වටිනා ත්‍යාග හා සහතිකපත් ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පම්බල, කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘති පරිශ්‍රයේදී පිරිනැමුණි. මීට අමතරව ලෝක තෙත්බිම් දිනය සැමරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල විසින් පළාත් මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් සැමරුම් වැඩසටහන් 48 ක් පැවැත්විණි.

4.2 පර්යේෂණ හා සංවර්ධන ඒකකය

මෙම ඒකකයේ මූලික මෙහෙවර වනුයේ ජාතික පාරිසරික පනත සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය අදාල පාරිසරික පර්යේෂණ අධ්‍යයන හා / සමීක්ෂණකිරීම" ප්‍රවර්ධනය සහ තිරසාර පරිසර කළමනාකරණය සඳහා උපමාන ගොඩ නැංවීම එවැනි තොරතුරු ප්‍රචාරණය කිරීම සහ ඊට අවශ්‍ය පහසුකම් සැපයීමත් හා භූගෝලීය තොරතුරු හා දුරස්ථ සංවේදන තාක්ෂණය භාවිතය තුලින් ඊට අවශ්‍ය දායකත්වයසැපයීමත්ය.

4.3.1 මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය භාරයට අදාලව සිදුකර ඇති පර්යේෂණ සම්බන්ධයෙන්පර්යේෂණ දත්ත පද්ධතියක් ගොඩනැංවීම

මේ සම්බන්ධයෙන් සාකච්ඡා වට කිහිපයක් COSTI ආයතනය සමඟ පැවති අතර දැනටමත් ශ්‍රී ලංකාවේ පර්යේෂණ ක්ෂේත්‍රයට අදාලව සකසා ඇති දත්ත පද්ධතියක් ලෙස විද්‍යා තාක්ෂණික හා නව නිපැයුම් සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය මඟින් ගොඩනංවා ඇති ශ්‍රී ලංකා Dashboard නැමති වෙබ් පිටුවට පරිසර ක්ෂේත්‍රය අදාල දත්ත සඳහා වෙනම Web Portal එකක් ඇති කිරීම මෙහිදී මූලික වශයෙන් සාකච්ඡා කරන ලදී.



රූපය 4.3 ම.ප.අ අදාල පර්යේෂණ දත්තපදනම

1.3.2 පරිසර ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ සිදුකිරීම, සම්බන්ධීකරණය හා ප්‍රවර්ධනය

01) මධ්‍යම පරිසර අධිකාරියේ සෙවා සංවිධාන ක්‍රියාකාරීත්වය හා ඵලදායීතාව පිළිබඳ කාර්යය මණ්ඩල මත විමසුම.

මේ සම්බන්ධයෙන් සමීක්ෂණයක් 2015/05/08 හා 11 දෙදින සිදු කරන ලද අතර ප්‍රධාන කාර්යාලයේ සමස්ථ කාර්යය මණ්ඩලය වෙත ප්‍රශ්නාවලියක් ලබාදී ඔවුන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව සමීක්ෂණ වාර්තාවක් පිළියෙල කරන ලදී. එම

සමීක්ෂණ වාර්තාවට අනුව අධිකාරියේ කළමනාකාරිත්වය විසින් තීන්දු තීරණ කිහිපයක් ගන්නා ලද අතර ඒවා ක්‍රියාත්මක කරමින් පවතී.

02) දුරස්ථ සංවේදනය හා භූගෝලීය තොරතුරු තාක්ෂණය ආශ්‍රයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ භූමි

භායනයට ලක්වූ ස්ථාන හඳුනා ගැනීම.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාරිසරික ගැටළු අතරින් පාංශු ඛාදනයප්‍රමුක ස්ථානයක් ගන්නා අතර මධ්‍ය කඳුකරයේ ඉතා විශාල භූමි ප්‍රමාණයක් අක්‍රමවත් භූමි පරිභෝජනය නිසා දරුණු ලෙස පාංශු භායනයට ලක්වී තිබේ. මේ සඳහා විවිධ සාධක විවිධ මට්ටමින් බලපෑම් සිදුකරයි. ශ්‍රී ලංකාවේ 2002 වර්ෂයේදී එළි දැක් වූ කාන්තාරකරණය හා භූමි භායනය ජාතික වාර්තාවට අනුව භූමි භායනයේ ප්‍රධාන දර්ශක ලෙස පාංශු ක්ෂය වීම, අවසාදනය, බෝග අස්වැන්න අඩුවීම, ලවණතාවය වැඩිවීම, නායයාම්, වන විනාශය හා භූමි භායනය දක්වා ඇත. මෙම ගැටළුව තවදුරටත් උග්‍ර වීමට ඉඩ නොදී භායනයට ලක් වූ භූමීන් හඳුනාගෙන නිසි කළමනාකරණයක් සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟී ඇත.

සීඝ්‍ර ජනගහන වර්ධනය හේතුවෙන් මේ වන විට ඒක පුද්ගල භූමි පරිභෝජනය හෙක්ටයාර 0.3 දක්වා පහත වැටී ඇති අතර ඉදිරියේදී භූමි අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා පාරිසරික සංවේදී ස්ථානභාවිතය නොවැළැක්විය හැකිය.මෙම තත්ත්වය මහහරවා ගැනීමසඳහා කඩිනම් වැඩපිළිවෙලක අවශ්‍යතාවය පැන නැඟී ඇත.

මූලික අරමුණ

මහනුවර දිස්ත්‍රික්කයේ භූමි භායනයට ලක් වූ ප්‍රදේශ හා මුඩුබිම් හඳුනාගෙන එම ඉඩම් සංරක්ෂණය සඳහා වූ ක්‍රියාමාර්ගයන්ට යොමුකිරීම .

පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය මඟින් මහනුවර දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් භූමි භායනයට ලක් වූ ප්‍රදේශ හඳුනාගැනීම සඳහා චන්ද්‍රිකා ඡායාරූප, වර්ෂාපතන දත්ත, පාංශු සාධක, ජනගහන හා සාමාජීය තොරතුරු භාවිතා කරන ලදී. මේ යටතේ භූ ගෝලීය තොරතුරු තාක්ෂණය, දුරස්ථ සංවේදනය සහ නවීන චන්ද්‍රිකා ඡායාරූප තාක්ෂණය භාවිතා කොට පාංශු ක්ෂයවීම, ශාක වැස්ම හා පස මතුපිටින් ජලය ගලායාම යන කරුණු තුන විශ්ලේෂණයෙන් මහනුවර දිස්ත්‍රික්කයට අදාල භූමි භායනයට ලක්වූ ප්‍රදේශ හා ස්ථාන සිතියම් ගත කරන ලදී.මෙම සිතියම් GPSතාක්ෂණය භාවිතා කොට ලබාගත් කේෂ්ත්‍ර දත්ත (120) අනුසාරයෙන් නිරවද්‍යතාව තහවුරු කරන ලදී.

පර්යේෂණ සොයාගැනීම්

සකස් කරන ලද භූමි භායන සිතියමට අනුරූපව මහනුවර දිස්ත්‍රික්කයේ අධික වශයෙන් පාංශු භායනය සිදුවන ප්‍රදේශ ලෙස වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ අභය භූමි, හන්තාන හා නකල්ස් කඳුකර කලාපය, ගලහ දොළුව දෙල්තොට හා නාවලපිටිය ප්‍රදේශ හඳුනාගන්නා ලදී. ප්‍රධාන වශයෙන් උස් කඳුකර බිම් ආශ්‍රිත මුඩුබිම්, ලඳු කැලෑ හා තණ බිම් උග්‍ර භායනයට ලක් වී ඇත.



රූපය 4.4. මහනුවර දිස්ත්‍රික්කයේ භූමි භායනය දැක්වෙන සිතියම

03) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ භූමි පරිබෝග රටාවේ වෙනස්වීම් සහ ඒ ආශ්‍රිත සමාජ,ආර්ථික

භාපාරිසරික ගැටළුසම්බන්ධයෙන් පර්යේෂණ ලිපියක් සැකසීම.

මෙහිදී 1972 සිට 2015 දක්වා කාලයක් තුල භූමි පරිභෝග රටාවෙසිදුවූ වෙනස්වීම්පිළිබඳව මෙහිදී අධ්‍යනය සිදුකරන ලද අතර එහිදී වැඩි අවධානයක් යොමු කරන ලද්දේ වනාන්තර, ජනාවාස සහ කුඹුරුඉඩම් වල වෙනස්කම් සඳහාය.

මෙහිදී මිනින්දොරු දෙපාර්තමේන්තුව විසින් සකසන ලද අහලේ සිතියම් 1972 වර්ෂය සඳහාත් 1985 හා 2001 සඳහා පිළිවෙලින් 1:50,000 හා 1:10,000 සිතියම් භාවිතා කරන ලද අතර 2015 සඳහා ගූගල් වන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර සිතියම් සකසා ගන්නා ලදී.

එහිදී 1972 සිට 1981 දක්වා වනාන්තර වල අඩුවීමක් පෙන්නුම් කල ද 2001 වන විට නැවත එම ප්‍රමාණයේවර්ධනයක් දක්නට ලැබුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු සාධකය වුයේ ඒ ප්‍රදේශයේ වසර 30 පුරා පැවති යුද්ධයයි. ඉන් අනතුරුව 2015 වන විට නැවත වනාන්තර ඝනත්වය අඩුවීමේ ප්‍රවනතාවක් දක්නට ලැබුණු අතර උතුරු සංවර්ධන කටයුතු මීට හේතුවී තිබේ.

තවද ජනාවාස භූමි ප්‍රමාණයේ හා කුඹුරු ඉඩම් ප්‍රමාණය 1972 සිට 2015 දක්වා ක්‍රමාණුකූලව වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මේ සම්බන්ධයෙන් සකසන ලද සිතියම් පහත දැක්වේ.



රූපය 4.5. වර්ෂ 1972 සිට 2015 දක්වා වන භූමි ව්‍යාප්තියේ වෙනස්කම්



රූපය 4.6. වර්ෂ 1972 සිට 2015 දක්වා ජනාවාස ව්‍යාප්තියේ වෙනස්කම්



රූපය 4.7. වර්ෂ 1972 සිට 2015 දක්වා කුඹුරු ඉඩම් වල ව්‍යාප්තියේ වෙනස්කම්

4.3.3 පාරිසරික කළමනාකරණය හා සැළසුම්කරණය සඳහා වූ අන්තර්ජාතික සම්මන්ත්‍රණය

මධ්‍යම පරිසර අධිකාරිය සතුව පවතින බලතල ක්‍රියාවෙහි යෙදවීමේදී පාරිසරික නව නිපැයුම් හා ඒවායේ සාර්ථකත්වයන් තුලින් පාරිසරික සංරක්ෂණය මූලික වූ තිරසාර සංවර්ධනයක් කරා ලඟාවිය හැක.

එම මූලික අරමුණ පෙරදැරිකොට මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රථම වරට පරිසර කළමනාකරණ හා සැලසුම්කරණය යන තේමාව යටතේ 2015 පෙබරවාරි 23 හා 24 යන දෙදින තුලඅන්තර්ජාතික පාරිසරික සම්මන්ත්‍රණයක් බත්තරමුල්ලේ වෝටර්ස් ඒජ් හිදී සාර්ථකව පවත්වන ලදී.

එහිදී අන්තර් ජාතික හා ජාතික මට්ටමින් තෝරාගන්නා ලද පර්යේෂණ පත්‍රිකා 43ක් හා

මුද්‍රිත පෝස්ටර් 11 ක් ප්‍රධාන තේමාවන් 06ක්

යටතේ ඉදිරිපත් කරන ලදී.

01) පාරිසරික නව නිපැයුම්

02) ස්වභාවික සම්පත් කළමනාකරණය

03) පරිසර දූෂණය

04) පරිසරය හා තිරසාර සංවර්ධනය

05) භූ සංඥාපන තොරතුරු භාවිත පාරිසරික පර්යේෂණ

06) පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම

මෙම තේමාවන් 06 යටතේ විශෙෂඥ දැනුම සහිත අන්තර්ජාතික හා ජාතික තලයේ විද්වතුන් විසින් ප්‍රධාන දේශනය කරන ලද අතර ඉන් අනතුරුව පර්යේෂණ කතෘවරුන්විසින් තම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

රූපය 4.8. පර්යේෂණ පත්‍රිකාවල සාරාංශ ඇතුලත් පොතෙහි කවරය.



2015 පෙබරවාරි 23දිනසමුළුවේ සමාරම්භක උළෙල සඳහා ආරාධිත අමුත්තන් ඇතුළු මධ්‍යම පරිසර අධිකාරියේ නිළධාරීන් 110 ක් සහභාගිවූ අතර 2015 පෙබරවාරි 24 දින තාක්ෂණික සැසිවාරයන් 06 සඳහා පාරිසරික අධ්‍යාපන ආයතන දෙපාර්තමේන්තු හා අනුබද්ධිත නිළධාරීන් 250 කගේ සහභාගීත්වයකින් සමුළුවේ වැඩකටයුතු සිදුකරන ලදී.

4.3.4 ශ්‍රී ලංකාවේ මදුරු තර්ජනය පාලනය සඳහා නව විකල්ප ක්‍රමවේදයක් හඳුනාගැනීම

පසුගිය දශක දෙකක කාලයක් තුල ශ්‍රී ලංකාවේ මදුරු උවදුර හේතුවෙන් සෞඛ්‍යමය හා ආර්ථිකමය වශයෙන් ගැටළු රාශියකට මුහුණදීමට සිදුවිය. මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මේ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මෙම කේෂ්ත්‍රයට අදාල පාර්ශවකරුවන්,

විද්‍යාඥයන්, විශේෂඥයන් හා පර්යේෂකයින් සම්බන්ධ කර විද්වත් සභාවක් සංවිධානය කරන ලදී. මෙහිදී වැඩි අවධානයක් යොමු කරන ලද්දේ මදුරු පාලනය සඳහා නව ජීව විද්‍යාත්මක ක්‍රමවේද සම්බන්ධයෙනි. එහිදී එක් ක්‍රමවේදයක් ලෙස වොල්බැචියා බැක්ටීරියාව භාවිතය පිළිබඳ අවධානය යොමු විය.

මෙහිදී මූලික බාධකයලෙස ස්වාභාවිකව කෘමීන් තුල ඇති මෙම බැක්ටීරියාව වෙන් කර ලබා ගැනීම සඳහා වන පර්යේෂණ සඳහාවසර 3-5 කාලයක් ගතවන බව හඳුනාගන්නා ලදී. මේ සම්බන්ධයෙන් මූලික සම්බන්ධීකරණ කටයුතු සිදුකළ පරිසර අධිකාරිය ඕස්ට්‍රෙලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලයේ ආචාර්ය පීටර් රයන් මහතා සම්බන්ධීකරණයෙන් මේ සම්බන්ධව ඔවුන් විසින් විවිධ රටවල (ඕස්ට්‍රෙලියාව/ බ්‍රසීලය/ කොලොම්බියාව/ ඉන්දුනීසියාව හා වියට්නාමය) මෙම නව විකල්ප ක්‍රමවේදය භාවිතයෙන් සාර්ථකව මදුරු මර්දනය කර ඇති බවට තොරතුරු ලබාගන්නා ලදී.

මේ සම්බන්ධයෙන් කේෂ්ත්‍රයට අදාළ විද්වතුන්ගේ සහ මොනෑෂ් විශ්ව විද්‍යාලයේ සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් වැඩමුළුවක් 2015.03.03 දින තලවතුගොඩ, මොනෑෂ් හෝටලයේදී පැවති අතර සහභාගි වූ විද්වතුන්ගෙන් 90% ක්ම මෙම ක්‍රමවේදය භාවිතයෙන් මදුරු මර්දනය කිරීම සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කර තිබුණි.

මේ වන විට මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ලෙස ව්‍යාපෘති සැලසුම්කරණ රැස්වීමක්සහ ක්ෂේත්‍ර අධ්‍යනයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පරිසර අධිකාරියේ හා පරිසර අමාත්‍යාංශයේ ඉහල කළමනාකාරීත්වය සහභාගීත්වයෙන් 2016 වර්ෂයේදී ඕස්ට්‍රෙලියාවේදී පැවැත්වීමට කටයුතු කරමින් පවතී.

මූලික ව්‍යාපෘතියක් ලෙස මදුරු කීට උගුල් වල කාර්යක්ෂමතාව නිර්ණය කිරීම

මාවතගම මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් නිර්මාණය කරන ලද මදුරු කීට උගුලේ කාර්යක්ෂමතාව නිර්ණය සඳහා පරිසර අධිකාරි පරිශ්‍රයේ නියමු ව්‍යාපෘතියක් ලෙස අත්හදා බැලීමක් සිදුකරන ලදී.

ඒ අනුව කීට උගුල් 08 ක් ස්ථාපනය කර මාස 02 ක කාලයක් තුල දිනපතා නිරීක්ෂණය කරන ලදී. මෙහිදී හඳුනාගන්නා ලද ගැටළු හා උගුලේ පැවති දුර්වලතා නිර්මාණකරුවා වෙත දන්වන ලද අතර වැඩිදුර වැඩිදියුණු කරගත යුතු අංශ කෙරෙහි ඔහුගේ අවධානය යොමු කරන ලදී.

4.3.5 අවකාශීය දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම

අධිකාරියේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ යුතු කර්මාන්ත සම්බන්ධයෙන් ගොඩනංවා ඇති දත්ත පද්ධතිය මාසිකව යාවත්කාලීන කරන ලද අතර 2015 වර්ෂය අවසාන වන විට 'අ' කාණ්ඩයට අයත් කර්මාන්ත 10,441 ක්ද, 'ආ' කාණ්ඩයට අයත් කර්මාන්ත 10,442 හඳුනාගෙන දත්ත යාවත්කාලීන කරන ලදී. පරිසර කළමනාකරණයේදී පරිසර දූෂණ පාලනය සඳහාමෙම තොරතුරු ඉතා වැදගත් වන අතර නව කර්මාන්ත ස්ථාපනයේදී මෙම දත්ත බෙහෙවින් වැදගත් වේ.



රූපය 4.9. 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ කර්මාන්ත වල ව්‍යාප්තිය දිස්ත්‍රික් මට්ටමින්

වගුව 4.9 දිස්ත්‍රික්ක මට්ටමේ කර්මාන්ත දත්ත පදනමේ අවසාන සාරාංශය

	පළාත	දිස්ත්‍රික්කය	මුළු කර්මාන්ත	"අ" කාණ්ඩයට අයත් කර්මාන්ත	"ආ" කාණ්ඩයට අයත් කර්මාන්ත	"ඇ" කාණ්ඩයට අයත් කර්මාන්ත	ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත
1	බස්නාහිර	කොළඹ	5561	1988	1470	1835	268
		ගම්පහ	5108	1565	1347	1876	320
		කළුතර	2583	666	647	1138	132
2	දකුණ	ගාල්ල	2420	467	804	1113	36
		මාතර	2118	371	508	1218	21
		හම්බන්තොට	2237	308	293	1608	28
3	නැගෙනහිර	ත්‍රිකුණාමලය	757	211	187	340	19
		අම්පාර	2036	300	402	1318	16
		මඩකලපුව	1127	187	332	596	12
4	ඌව	බදුල්ල	1766	351	289	1117	9
		මොණරාගල	1926	281	218	1415	12

	පළාත	දිස්ත්‍රික්කය	මුළු කර්මාන්ත	"අ" කාණ්ඩයට අයත් කර්මාන්ත	"ආ" කාණ්ඩයට අයත් කර්මාන්ත	"ඇ" කාණ්ඩයට අයත් කර්මාන්ත	ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත
5	මධ්‍යම	මහනුවර	3584	674	571	2290	49
		මාතලේ	1235	290	256	667	22
		නුවරඑළිය	664	147	131	370	16
6	උතුරු මැද	අනුරාධපුරය	2384	550	446	1363	25
		පොලොන්නරුව	846	201	267	365	13
7	සබරගමුව	රත්නපුරය	2816	530	646	1618	22
		කෑගල්ල	2197	491	645	1038	23
8	උතුර	යාපනය	1775	327	308	1136	4
		මන්නාරම	360	89	82	187	2
		වව්නියාව	392	122	76	186	8
		කිලිනොච්චිය	489	50	164	273	2
		මුලතිව්	398	71	106	221	0
9	වයඹ	කුරුණෑගල	355	150	205	0	0
		පුත්තලම	96	54	42	0	0
	මුළු එකතුව		45,230	10,441	10,442	23,288	1,059
	ප්‍රතිශතය			23	23	51	2

4.3.6 දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ

ශ්‍රී ලංකාවේ භූගෝලීය හා දුරස්ථ සංවේදන (GIS & Remote sensing) දත්ත විශ්ලේෂණයේදී පාරිසරික වශයෙන් වැදගත් මූලික දත්ත වන පාරිසරික තොරතුරු (ජල,වන, වනජීවී, භූමි සම්පත් ආදී) සාමාජීය හා ආර්ථික තොරතුරු නොමැතිකම විශාල අඩුපාඩුවක් සෙ සලකන අතර එම අඩුව පිරවීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන ඒකකය මඟින් පාරිසරික දත්ත පද්ධතියක් ගොඩ නංවමින් පවති.

මෙම දත්ත භාවිතයෙන් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සකසන ලද සිතියම් අඩංගු දිස්ත්‍රික් පාරිසරික පැතිකඩයන් ගාල්ල,මාතර,පොලොන්නරුව හා නුවර එළිය දිස්ත්‍රික්ක සඳහා සකස් කර සංයුක්ත තැටි නිර්මාණය කරන ලදී.



රූපය 4.10. ගාල්ල පොළොන්නරුව හා නුවර එළිය දිස්ත්‍රික්ක සඳහා සකස් කරන ලද සංයුක්ත,මාතර, තැටිවල මුල්පිටු

4.3.7 පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ, ප්‍රධාන කාර්යාලයේ, පළාත් හා දිස්ත්‍රික් කාර්යාලවලනිළධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්

I. පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ නිළධාරීන් දෙදෙනෙකු සඳහා ArcGIS මෘදුකාංගයේ භාවිතයසම්බන්ධයෙන් දින 05 ක මූලික පුහුණුවක් ලබාදීම.

II. ප්‍රධාන කාර්යාලයේ සහගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ නිළධාරීන් සඳහා GPS නාක්ෂණය, GoogleEarth Pro සහ භූගොලීය පරිසර තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පවත්වන ලදී.

4.3.7.1 වාණිජමය වශයෙන් සපයන ලද භූගෝලීය තොරතුරු සෙවාවන්

වගුව 4.10 වාණිජමය වශයෙන් සපයන ලද භූගෝලීය තොරතුරු සෙවාවන්

වාර්ෂික ඉපයීම - 2015			
	ආයතනය/ දෙපාර්තුමේන්තුව	**විස්තරය**	**ඉපයීම්**
1	ලලානි රබර් (පුද්) සමාගම	ශ්‍රී ලංකාවේ කර්මාන්ත 2895 ක දත්ත	65,554.38
2	කැලණිය විශ්වවිද්‍යාලය	ගාල්ල දිස්ත්‍රික්කයේ මාඋ ගහ මෝය ප්‍රදේශයේ භූමි පරිහරණ සිතියම	4,245.75
3	සමන්ගි හෙවගේ මහත්මිය	සංවේදී කලාප සිතියම	5,944.05
4	කැලණිය විශ්වවිද්‍යාලය	සංවේදී කලාප සංයුක්ත තැටි හා දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ	900.00
5	රුහුණු විශ්වවිද්‍යාලය	සංවේදී කලාප සංයුක්ත තැටි හා දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ	1,100.00
6	ඒකාබද්ධ කළමනාකරණ (පුද්) සමාගම	දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ	200.00
7	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	සංවේදී කලාප සංයුක්ත තැටි හා දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ	700.00
8	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	සංවේදී කලාප සංයුක්ත තැටි හා දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ - 08	2,100.00
9	ආනන්ද රනවක මහතා	ඝන අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථාන දැක්වෙන සිතියම	666.00
10	ආචාර්ය සිංහකුමාර මහතා	දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ - 04	800.00
11	සම්පත් සංවර්ධනය හා උපදේශනය	සංවේදී කලාප සංයුක්ත තැටි	500.00
12	එස්.අයි.එස්. සුබසිංහ මහතා	සංවේදී කලාප සංයුක්ත තැටි	500.00
13	Ceywater(පුද්) සමාගම	දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ - ගම්පහ දිස්ත්‍රික්කය	200.00
14	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	බියගම ආයෝජන කලාපය අවට පිහිටි කර්මාන්ත වල තොරතුරු	12,298.80
15	ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	මාදිවෙල නැගෙනහිර ජල හැරවීමේ යෝජනා ක්‍රමය - 1 වන අදියර	5,944.05
16	කැලණිය විශ්වවිද්‍යාලය	දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ	200.00
17	ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	කාලිංගනුවරඅංගමැඩිල්ල ජල පොම්ප සංකීර්ණ ව්‍යාපෘතිය	16,983.00
18	IKON Kestral කෘෂි සෙවාව	සංවේදී කලාප සිතියම - හම්බන්තොට අක්කර 50 ක භූමි ප්‍රදේශයක් සඳහා	3,679.65
19	සම්පත් සංවර්ධන හා උපදේශනය	සංවේදී කලාප සංයුක්ත තැටි හා දිස්ත්‍රික් පාරිසරික සම්පත් පැතිකඩ	700.00

වාර්ෂික ඉපයීම් - 2015			
	ආයතනය/ දෙපාර්තුමේන්තුව	**විස්තරය**	**ඉපයීම්**
20	EML උපදේශන(පුද්) සමාගම	සංවේදී කලාප සංයුක්ත තැටි	500.00
21	ලංකා නිපොන් තීන්ත (පුද්) සමාගම	සංවේදී කලාප සංයුක්ත තැටි	500.00
එකතුව			**124,216.00**

4.3.7.2 අධිකාරියේ අනෙකුත් අංශ සඳහා සපයන ලද භූගෝලීය තොරතුරු සෙවාවන්

පහත දැක්වෙන සෙවාවන් ඉල්ලීම් පරිදි සපයන ලදී.

- එක් එක් ව්‍යාපෘති සඳහා පරිසර සංවේදී කලාපයන්ට අයත් වන්නේ දැයි නිර්ණය කිරීම හා ඒවායේ භූමි පරිභෝග රටාවන් පිලිබඳ සිතියම් සැකසීම
- එක් එක් නිරපේක්ෂ පිහිටීම් සඳහා පරිසර සංවේදී කලාප සිතියම් සැකසීම
- භූමි භාවිතය හා පරිබෝග රටාවන් පිළිබඳ සිතියම් සැකසීම
- වන්ද්‍රිකා ඡායාරූප විශ්ලේශණය
- නිරපේක්ෂ ස්ථානීය දක්ත ලබාදීම
- සිතියම් අංකනය සහ වර්ගීකරණය
- සිතියම්මුද්‍රණය හා Scanning

5.0 නීති ඒකකය

"අප එකිනෙකාගේ පැවැත්ම උදෙසා නීතිමය යාන්ත්‍රණය බලාත්මක කිරීම තුළින් පරිසරය සංවර්ධනය කිරීමෙන් ද දැනුම ලබාදීමෙන් ද පරිසරයේ සුවදායී පැවැත්ම තහවුරු කරමු."

ජාතික පාරිසරික පනත යටතේ ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ බලාත්මක වන නීති හා රෙගුලාසි ඔස්සෙ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ 2015 වසර තුළ නීති අංශය මගින් සිදුකරන ලද නෛතික කාර්යයන් පහත පරිදි වේ.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ගොනු කොට පවත්වාගෙන යනු ලබන සහ අවසන් කරන ලද නඩු කටයුතු රාශියකි. ඒ අතර, 2015 වසර තුළදී මෙම අධිකාරිය විසින් ගොනු කරන ලද සහ මෙම අධිකාරියට එරෙහිව පවත්වාගෙන යන ලද නඩු සංඛ්‍යාව දෙසිය අනූ තුන (293) ක් වන අතර, මෙම අධිකාරිය විසින් නඩු පනස්හතර (54) ක් 2015 වර්ෂය තුල අලුතින් පවරා ඇත.

එකී නඩුකරයන් මගින් 2015 වර්ෂයේ දඩ මුදල් ලෙස අයකරගෙන ඇති මුළු මුදල රු.326,999.00 කි.

බස්නාහිර පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

2015 වර්ෂය තුලදී බස්නාහිර පළාත තුළ පවරා පවත්වාගෙන යන ලද නඩු සංඛ්‍යාව එකසිය විසි දෙක (122) ක් පමණ වේ.

කොළඹ දිස්ත්‍රික්කය තුල නඩු අනූ එක (91) ක් පවරා පවත්වාගෙන ගොස් ඇති අතර, ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු නවය (09) ක් ද, අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එකොළහ (11) ක් ද, කැස්බෑව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු දාහත (17) ක් ද, ගංගොඩවිල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පහ (05) ක්ද, මොරටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03) ක් ද, කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු දාහත (17) ක් ද, හෝමාගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03) ක් ද, මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු දෙක (02) ක් හා කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු විසිහතර (24) ක් ද වශයෙන් පවරා පවත්වාගෙන ගොස් ඇත. ඉන් නඩු තිස්හත (37) ක් 2015 වසර තුලදී අවසන් කරන ලදි.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ නඩු දහසය (16) ක් පවත්වාගෙන ගිය අතර, ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු දෙක (02) ක් ද, මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පහ (05) ක්ද, අත්තනගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් ද, මහර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු හත (07) ක් හා මිනුවන්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් ද ලෙස පවත්වාගෙන ගොස් ඇත. 2015 වසර තුලදී එකී නඩුවලින් හත (07) ක් අවසන් කර ඇත.

කළුතර දිස්ත්‍රික්කයේ නඩු පහළොව (15) ක් පවත්වාගෙන ගොස් ඇති අතර, එකී නඩු කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු දෙක (02) ක් ද, මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03) ක් ද, පානදුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු හත (07) ක් ද, හොරණ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03) ක් ද ලෙස පවත්වාගෙන ගොස් ඇත. 2015 වසර තුලදී එකී නඩුවලින් හය (06) ක් අවසන් කර ඇත.

මධ්‍යම පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය.

මධ්‍යම පළාත තුළ පසුගිය වසරේ නඩු පනස් එක (51) ක් පවත්වාගෙන ගිය අතර, මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු දාහත (17) ක් ද, මාතලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් ද, ගම්පොළ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු හතර (04) ක් ද, ගලගෙදර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් ද , නාවලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03) ක් ද, තෙල්දෙණිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු දහය (10) ක් ද, හැටන් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් ද, වලපනේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු හය (06) ක් ද, හෙල්බොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පහ (05) ක් ද, පන්විල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු දෙක (02) ක් ද, සහ සීගිරිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් වශයෙන් නඩු පවත්වාගෙන ගිය අතර, ඉන් විසිදෙක (22) ක් අළුතින් පවරන ලද අතර,මුළු නඩු සංඛ්‍යාවෙන් විසි එක (21) ක් පසුගිය වසර තුළ අවසන් කරන ලද ඒවා වේ.

ඌව පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

ඌව පළාත තුළ නඩු අට (08) ක් පවරා පවත්වාගෙන යන ලදි. ඒ අතරින් නඩු පහ (05) ක් අළුතින් ගොනු කර තිබෙන අතර, 2015 වර්ෂයේ අධිකරණ කටයුතු පහ (05) ක් අවසන් කර ඇත. වැලිමඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් ද, බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් හා වැල්ලවාය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් ද ලෙස පවරා පවත්වාගෙන යන ඒවා වේ.

දකුණු පළාත් තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

දකුණු පළාත තුළ නඩු එකොළහ (11) ක් පවත්වාගෙන ගිය අතර, එකී නඩු බලපිටිය, හම්බන්තොට, ගාල්ල, මාතර යන මහෙස්ත්‍රාත් අධිකරණවල පවත්වාගෙන යන ලදි. 2015 වසර තුළ අළුතින් පවරන ලද නඩු සංඛ්‍යාව හය (06) ක් වන අතර, ඉන් තුන (03) ක් 2015 වසර තුලදී අවසන් කර ඇත.

නැගෙනහිර පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

නැගෙනහිර පළාත තුළ මධ්‍යම පරිසර අධිකාරිය විසින් අක්කරෙයිපත්තුව සහ ත්‍රිකුණාමලය යන අධිකරණවල නඩු දෙක (02) ක් 2015 වර්ෂයේ දී පවරා පවත්වාගෙන යන ලදි.

සබරගමුව පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

සබරගමුව පළාත තුළ නඩු කටයුතු විසිහය (26) ක් පවත්වාගෙන ගිය අතර, ඉන් දහය (10) ක් 2015 වසර තුළ දී අලුතින් පවරන ලද ඒවා වේ. එම නඩු කටයුතු අතර, මාවතගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් ද, ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු හතර (04) ක් ද, කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු හතර (04) ක් ද, රුවන්වැල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03) ක් ද, රත්නපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01) ක් සහ අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03) ක් ද වශයෙන් පවත්වාගෙන යන ලද අතර, නඩු අතරින් පහළොව (15) ක් එම වසර තුළ අවසන් කරන ලද නඩු වේ.

උතුරු මැද පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

උතුරු මැද පළාත තුළ අනුරාධපුරය, මැදවච්චිය, තඹුත්තේගම යන අධිකරණවල පවරා පවත්වාගෙන ගිය නඩු සංඛ්‍යාව දහය (10) කි. ඉන් පහ (05) ක් අවසන් වී ඇත.

වයඹ පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

වයඹ පළාත තුළ නිකවැරටිය, පුත්තලම හා කුලියාපිටිය යන මහෙස්ත්‍රාත් අධිකරණවල පවරා පවත්වාගෙන ගිය මුළු නඩු සංඛ්‍යාව තුන (03) කි.

මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පවරන ලද නඩු

මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව නඩු හැට (60) ක් 2015 වර්ෂයේ දී පවත්වාගෙන ගිය අතර, ඒවා මහෙස්ත්‍රාත් අධිකරණ, දිසා අධිකරණ, මහාධිකරණ, ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණයන්හී පවරන ලද නඩු ද වේ.

නීති ඒකකයට අනුයුක්තව සෙවය කරනු ලබන නිලධාරීන් මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ, දිසා අධිකරණයේ හා මහෙස්ත්‍රාත් අධිකරණවල පවරන ලද නඩු කටයුතුවලට සම්බන්ධව කටයුතු කරන ලදි.

තවද, නීති ඒකකයට අනුයුක්ත නීති නිලධාරීන් විසින් අධිකරණයේ ගොනු කරනු ලබන ලේඛන කෙටුම්පත් කිරීම හා උපදේශන සාකච්ඡාවලට ද සහභාගී වේ.

ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.

නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සමහර කර්මාන්තශාලා මධ්‍යම පරිසර අධිකාරියේ ජාතික පාරිසරික පනතට අනුකූලව අපජලය පිරිපහදු පද්ධති සකස් කිරීමෙන් ද, සමහර කර්මාන්තශාලා ජාතික පාරිසරික පනතේ ප්‍රකාශිත ප්‍රමිති හා උපමානවලට අනුකූලව ශබ්දය පාලනය කිරීමෙන් ද සහ අනෙකුත් නෛතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් ද අනතුරුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදෙන ලදි.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම / අත්හිටුවීම / නිකුත් කිරීම ප්‍රතික්ෂෙප කිරීම

කර්මාන්තශාලාවල සිදුවන පරිසර දූෂණය සලකා බලා නිකුත් කොට ඇති පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම සඳහා කර්මාන්තශාලා විසිනවය (29) ක් වෙත ද, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂෙප කරමින් කර්මාන්තශාලා අසූනවය (89) ක් වෙත ද ලිපි යවා ඇත.

තවද, කර්මාන්තශාලා සම්බන්ධව නඩු පැවරීමට අදාළ පියවර ගැනීම සඳහා ශබ්ද මට්ටම් වාර්තා, අපදියර විශ්ලේෂණ වාර්තා හා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා කැඳවීම සඳහා ලිපිගොනු ගණනාවක් පරිසර දූෂණ පාලන අංශය සහ අදාළ පළාත් කාර්යාල වෙත සහ අධිකාරියේ රසායනාගාර වෙත යොමු කොට ඇත.

ජාතික පාරිසරික පනතේ 24(ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන විධානයන්

2015 වර්ෂයේ නීති ඒකකය මගින් ජාතික පාරිසරික පනතේ 24(ආ) වගන්තිය යටතේ විධාන අට (08) ක් නිකුත් කර ඇත.

පරිසර ආරක්ෂණ බලපත්‍ර කොන්දේසි

නව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ දී එහි කොන්දේසි මධ්‍යම පරිසර අධිකාරියේ නීති ඒකකයේ නිලධාරීන් සහ පළාත් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති සහකාර නීති නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලබයි.

අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ බලපත්‍ර නිකුත් කිරීමේදී ඊට අදාළ පරීක්ෂා කිරීම් ප්‍රධාන කාර්යාලයේ නීති ඒකකයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

ජාතික පාරිසරික පනත යටතේ ඉදිරිපත් කර ඇති අභියාචනා (පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය)

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අභියාචනා විභාග

කිරීම් සම්බන්ධයෙන් නීති ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත.

නොතාරිස් කටයුතු

මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් ඉටු කිරීමේදී විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ගොඩනැගිලි බදුදීම් හා සෙවා ලබා ගැනීම සඳහා බාහිර අංශ සමඟ එළඹෙන්නා වූ එකඟතා සහ ගිවිසුම් පත්‍ර පිළියෙල කිරීම 19 ක් සිදු කිරීම සහ එකී ගිවිසුම් පත්‍ර සඳහා අනුමැතිය ලබාදීම සිදු කෙරිණ.

රැස්වීම්

පාරිසරික ගැටළු සම්බන්ධ රැස්වීම් බොහෝ ප්‍රමාණයකට නීති ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත.

පැමිණිලි

පරිසර දූෂණය, පීඩාව සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ වෙනත් ආයතන වලින් යොමු කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් පියවර ගෙන ඇත.

සාකච්ඡාවලට සහභාගීවීම

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරන ලද නඩු සහ මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව අධිකරණයේ ගොනුකර ඇති නඩු සම්බන්ධයෙන් විරෝධනා, උත්තර, ලිඛිතදේශන සැකසීම සහ විභාග නඩු සම්බන්ධයෙන් උපදේශන සාකච්ඡා අසූ හත (87) ක් සඳහා නීති ඒකකයේ නිලධාරීන් සහභාගී වීඇත.

රෙගුලාසි

අංක 1895/43 සහ 2015.01.02 දිනැති ජාතික පාරිසරික (වායු විමෝචන, ඉන්ධන, වාහන ආනයන ප්‍රමිති නියෝග පිළිබඳ (සංශෝධන) නිවේදනය ප්‍රකාශයට පත්කර ඇත.

උපදෙස්

ලිපිගොනු හැටනවය (69) ක් සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය උපදෙස් 2015 වර්ෂයේ දී ලබාදී ඇත.

නීති නිවේදන

පරිසර දූෂණකාරී කර්මාන්ත එකසිය අසූ දෙක (182) කට එරෙහිව නීති නිවේදන යවා ඇත.

ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා

අධිකරණ නියෝගවලට අදාළව අධිකරණයට ඉදිරිපත් කිරීම සහ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉදිරියේ පවත්වනු ලබන අභියාචන විභාගවලට ඉදිරිපත් කිරීමට නියමිත නිලධාරීන් විසින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා සඳහා නීති අංශයේ අනුමැතිය ලබාදී ඇත.

දැනුවත් කිරීම

නීති අංශයේ නිලධාරීන් විසින් ජාතික පාරිසරික පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළව දේශන පහළොව (15) ක් වෙනත් ආයතනවල නිලධාරීන් සඳහා පවත්වා ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා වැඩමුළු සඳහා සම්පත් දායකයින් ලෙස සහභාගී වී ඇත.

තවද, නීති ශිෂ්‍යයන් සහ අනෙකුත් විශ්ව විද්‍යාල සිසු සිසුවියන්ගේ ඉල්ලීම් අනුව, පරිසර නීතිය හා පාරිසරික නියෝගයන් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලදි.

මානව හිමිකම් කොමිෂන් සභාවේ විමසීම්

මානව හිමිකම් කොමිෂම මගින් කරනු ලබන පරිසරයට අදාළ කාරණා දොළහ (12) කට හා සෙවක ගැටළු සම්බන්ධ විමසීම් කිහිපයකට නීති අංශයේ නිලධාරීන් සහභාගීවී ඇති අතර, අවශ්‍ය අනුමැතීන් මත වාර්තා පිළියෙල කිරීම සහ නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම්

“Polluter Pays” වැනි මූලධර්ම ඇතුලත් කරමින් තෙත්බිම් සහ උපද්‍රවකාරී අපද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිපාදන ජාතික පාරිසරික පනතට හඳුන්වාදීමේ අරමුණින් පවතින අඩුපාඩු මහහැරීමේ අරමුණින් පවතින දඩ මුදල් සංශෝධනය කිරීමේ අරමුණින් ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමට පියවරගෙන ඇත.

මෙයට අදාළ යෝජිත නව සංශෝධන ඇතුළත් කැබිනට් පත්‍රිකාව මේ වනවිට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත.

6.0 පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය

1984 වර්ෂයේ සිට මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය පරිසරයේ යහපැවැත්ම උදෙසා ශ්‍රී ලංකාවේ බිම් මට්ටමේ විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා බහුවිධ වැඩසටහන් හා ක්‍රියාවන් දියත් කරනු ලබයි.

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශයේ දැනුවත් කිරීම් වැඩසටහන්, පරිසරය සුරැකීම සඳහා මහත් සෙ උපකාරී වේ.

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශයේ වගකීම වන්නේ මහජනතාවට පරිසරය පිළිබඳ දැනුම හා පරිසර අධ්‍යාපනය ලබා දීමයි. එය මුදුන් පමුණුවා ගැනීම සඳහා පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මගින් ඉලක්කගත කණ්ඩායම් සඳහා විවිධ දැනුවත් කිරීම් වැඩසටහන් දියත් කරමින් ඔවුන්ගේ ක්‍රියාශීලී සහභාගිත්වය පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය සඳහා ලබා ගනී.

2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් අමාත්‍යාංශ හා භාණ්ඩාගාර අරමුදල් භාවිත කරමින් පහත දැක්වෙන වැඩසටහන් සමාජයේ විවිධ කණ්ඩායම් සඳහා දියත් කරන ලදී. අමතරව වෙනත් අරමුදල් භාවිත කරමින් අමතර වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

6.1 භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

6.1.1 පරිසර පුවත්පත මුද්‍රණය

මාධ්‍යය ඒකකය විසින් මාස 6කට වරක් පරිසර නියමු පුවත්පත ජාතික මට්ටමින් මුද්‍රණය කරනු ලබයි. ඒවා අදාළ ආයතනවලට යොමු කිරීම ද මේ යටතේ සිදු කරනු ලබයි. 2015 වර්ෂයේ දී මාධ්‍යය ඒකකය විසින් වෙළුම් 2ක් පළ කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ මාධ්‍යය ඒකකය විසින් සමාජයට අධිකාරියේ පාරිසරික තොරතුරු සමාජගත කිරීම සිදුවේ. පරිසර පුවත්පත මඟින් මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව ලබා දෙන අතර පරිසරය හා සම්බන්ධ සමහර වාර්තා ද ඇතුළත්ය.

6.1.2 රාජ්‍ය නිලධාරීන්, ග්‍රාම සෙවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, සංස්කෘතික නිලධාරීන්, පළාත් පාලන ආයතනවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීම් වැඩසටහන්.

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් ඉලක්කගත කණ්ඩායම් සඳහා කාලීන වැඩසටහන පවත්වනු ලබයි. මෙම වැඩසටහන් ඉලක්කගත කණ්ඩායම් සඳහා පරිසරය පිළිබඳ සංවේදී බව වැඩිදියුණු කිරීමට දියත් කරන ලදී. 2015 වර්ෂයේ දී මධ්‍යම පළාතේ පොලිස් නිලධාරීන් 200 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා පාරිසරික නීති හා රෙගුලාසි පිළිබඳව දැනුවත් කිරීම් වැඩසටහනක් පවත්වන ලදී.

6.1.3 ප්‍රවර්ධන ප්‍රදර්ශන දියත් කිරීම.

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් විවිධ ස්ථානවල පැවැත්වූ ප්‍රදර්ශන සඳහා සහභාගි විය. මෙම ක්‍රියාකාරකමේදී පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මහජනතාව දැනුවත් කිරීම මෙයින් බලාපොරොත්තු වේ. ප්‍රදර්ශන ආකෘති, පෝස්ටර්ස් සහ පත්‍රිකා පාරිසරික ගැටලු ආමන්ත්‍රණය කිරීමට ඉතාමත් ප්‍රබල මාධ්‍යයක් වන්නේය. පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මෙම ක්‍රියාකාරකම යටතේ පත්‍රිකා, පෝස්ටර්ස්, පාසල්, කාර්යාල, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා නිකුත් කරනු ලබයි. 2015 වර්ෂයේ දී පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් පහත දැක්වෙන ප්‍රදර්ශන සඳහා ක්‍රියාකාරීව සහභාගි වන ලදී, කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ මහනගර සභාව, පොලිස් ස්ථානය, මහබාගේ කාර්මික විද්‍යාලය, ගම්පහ, තක්ෂිලා විද්‍යාලය, හොරණ මලියදේව විදයාලය, කුරුණෑගල ධර්මපාල විදයාලය, පන්නිපිටිය සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය, නුගේගොඩ විහාරමහා දේවි විද්‍යාලය, ගම්පහ ශාන්ත තෝමස් විද්‍යාලය, ගල්කිස්ස ශාන්ත ජෝන් විද්‍යාලය, නුගේගොඩ ආනන්ද මෛත්‍රී මහා විද්‍යාලය, බලංගොඩ මැදිරිගිරිය ජාතික පාසල, පොළොන්නරුව සුමංගල බාලිකා විද්‍යාලය, පානදුර.

6.1.3.1 සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානවල ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීම

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් ස්වභාවික පරිසරය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් කාර්තු වශයෙන් විවිධ පාරිසරික ක්‍රියාකාරකම් දියත් කිරීම සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන සඳහා ප්‍රතිපාදන ලබා දෙනු ලබයි. එමෙන්ම පුස්තකාල හරහා දැනුම බෙදා දීම සහ වැඩසටහන් මඟින් විවිධ ඉලක්කගත කණ්ඩායම්වල දැනුම වර්ධනය කිරීම සඳහා කටයුතු කරනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරිය යටතේ සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 4ක් විවිධ පළාත්වල පළාත් කාර්යාල යටතේ පිහිටුවා ඇත.

වගුව 6.1 සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන තුල සිදුකෙරුන වැඩසටහන්

අ.අ	සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානය	පළාත් කාර්යාලය
1.	රූමස්සල	දකුණු පළාත් කාර්යාලය
2.	කුණ්ඩසාලේ	මධ්‍යම පළාත් කාර්යාලය
3.	කෑගල්ල	සබරගමු පළාත් කාර්යාලය
4.	අත්තිඩිය	මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය

සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානවලදී විවිධ මාතෘකා යටතේ දැනුවත් කිරීම්, දේශන, රුක් රෝපණ වැඩසටහන්, ක්ෂේත්‍ර අධ්‍යයන, නායකත්ව පුහුණු වැඩසටහන්, පදක්කම් පරීක්ෂණ හා අනෙකුත් පරිසර නියමු වැඩසටහන් සම්බන්ධ ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ. පර්යේෂණ වැඩසටහන් සඳහා ද අමතර පහසුකම් සපයා දෙනු ලැබේ.

6.1.3.2 කාලීන ගැටලු පිළිබඳ අධ්‍යාපන හා දැනුවත් කිරීම් වැඩසටහන් දියත් කිරීම - මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරය

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් කාලීන ගැටලු පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහන් පාසල් ළමුන් හා විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේ දී පවත්වනු ලබයි. මෙම ක්‍රියාකාරකම් විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා පරිසරය පිළිබඳ අවධානය වැඩිදියුණු කිරීමට ඉවහල් වේ. මෙම වැඩසටහන සඳහා ප්‍රධාන ලෙස පාසල් ළමුන් සහභාගි විය. කාලීන අධ්‍යාපන දැනුවත් කිරීම් වැඩසටහන් සඳහා දේශන 4ක්, එක් විඩියෝ දර්ශනයක් හා ක්ෂේත්‍ර ක්‍රියාකාරමක් ද ඇතුළත්ය. මෙම දේශනවල මාතෘකා ඍජුවම පරිසරය හා සම්බන්ධවන අතර පාසල් විෂය මාලාවට ගැලපෙන ලෙස සකසා ඇත. ස්වභාවික සම්පත් කළමනාකරණය, අපද්‍රව්‍ය කළමනාකරණය, රුක් රෝපණය, ජෛව විවිධත්වය, තෙත්බිම්, පරිසර හිතකාමී කෘෂිකර්මය, පරිසර පද්ධතිවල විවිධත්වය, කර්මාන්ත අපද්‍රව්‍ය කළමනාකරණය, පරිසර නියමු වැඩසටහන, කොම්පෝස්ට් සකස් කිරීම, ඕසෝන් වියන, සමනලයින්, කඩොලාන, පාරිසරික සංරක්ෂණය, ජල සංරක්ෂණය, සතුන් දේශගුණික විපර්යාසයන්, කුරුල්ලන්, සෞඛ්‍යය හා පරිසරය සංරක්ෂණය, ගෝලීය උණුසුම, ගෝලීය පාරිසරික ගැටලු, තෙත්බිම් කළමනාකරණය, ශ්‍රී ලංකාවේ පුරාණ වාර්මාර්ග පද්ධති, සොබාදහමේ සමතුලිතතාවය යන මාතෘකා යටතේ පාසල් සිසුන් ආමන්ත්‍රණය කරනු ලබයි. මෙම වැඩසටහනේ දී අදාළ විෂය හා සම්බන්ධ පත්‍රිකා කට්ටලයක් බෙදා දෙනු ලබයි.

මේ යටතේ 2015 වර්ෂයේ දී මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් වැඩසටහන් 15ක් පවත්වන ලදී.

1. සහභාගි වූ පාසල් සංඛ්‍යාව 28
2. සහභාගි වූ සිසුන් සංඛ්‍යාව 1274

6.1.4 කාලීන ගැටළුවලට අදාළ දැනුවත් කිරීම් වැඩසටහන් - ඩෙංගු

ඩෙංගු පරිසරය සම්බන්ධ ප්‍රධාන සෞඛ්‍යමය ගැටළුවකි. පරිසරය කළමනාකරණය කිරීමෙන් ඩෙංගු පාලනය කළ හැක. මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් ඩෙංගු මර්දන වැඩසටහන් බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, රොබට් ගුණවර්ධන මාවත ආශ්‍රිතව සහ විවිධ දිස්ත්‍රික්කවල විවිධ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය.

2015 වර්ෂයේ දී මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් ඩෙංගු මර්දන වැඩසටහන් 09ක් බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, රොබට් ගුණවර්ධන මාවත ආශ්‍රිතව පවත්වන ලදී.

6.1.5 පාරිසරික අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් ඉලක්කගත කණ්ඩායම් සඳහා විවිධ මාතෘකා යටතේ දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වන ලදී. ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජාත්‍යන්තර පාරිසරික අධ්‍යාපන මධ්‍යස්ථානයක් පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය යටතේ ස්ථාපිත කරන ලද අතර විවිධ මාතෘකා ඔස්සෙ වැඩසටහන් හා විවිධ කණ්ඩායම්වල අවශ්‍යතාවලට අනුව සහතිකපත්‍ර පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම වැඩසටහන්වල පරමාර්ථය වන්නේ මහජනතාව පරිසරයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම සහ රටේ තිරසර සංවර්ධනය වෙනුවෙන් පරිසර ආරක්ෂණය හා සංරක්ෂණය සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය ලබා ගැනීම සඳහා දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම වේ. පාඨමාලා කාලය සතියකට එක් දිනයක් බැගින් දින 10කි.

මෙම වැඩසටහන යටතේ විවිධ මාතෘකා ඔස්සෙ සහතික පාඨමාලාවන් පවත්වන ලදී. විවිධ මාතෘකා යටතේ තෝරා ගන්නා ලද මාතෘකා 30ක දේශන විවිධ වෙනත් ආයතන, විශ්ව විද්‍යාලවල සම්පත් දායකයින් හා මධ්‍යම පරිසර අධිකාරියේ සුදුසුකම් ලත් සම්පත් දායකයින් විසින් පවත්වන ලදී. ක්ෂේත්‍ර චාරිකා 3ක් මෙම පාඨමාලාවට ඇතුළත් වූ අතර යෝග්‍යතාව, ලිඛිත පැවරුමක් මඟින් සිදු කිරීම කරනු ලැබිණි. වැඩසටහන අවසානයේ සහතික පත්‍රයක් පිරිනමන ලදී. 2015 වර්ෂයේ එක් පාඨමාලාවක් පවත්වන ලද අතර එය පහත පරිදි වේ.

වගුව 6.2 පරිසර වැඩසටහන් සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ සිදුකල වැඩසටහන්

අ.අ	ආරම්භක දිනය	තේමාව	සහභාගි වූ සංඛ්‍යාව
1.	2015.05.09	පරිසර දූෂණ පාලනය හා පාරිසරික කළමනාකරණය	37

සංස්කෘතික දින සඳහා පරිසර දැනුවත් කිරීම් වැඩසටහන්

අනුරාධපුර වැඩසටහන

මහනුවර වැඩසටහන

පරිසර නියමුවන් විසින් සංස්කෘතික අවස්ථාවන් සඳහා සහභාගිවන්නන් සඳහා පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පරිසර හිතකාමී ලෙස සන අපද්‍රව්‍ය බැහැරකරලීම පිළිබඳ විශෙෂ අවධානය යොමු කරමින් දැනුවත් කිරීම සිදුකරනු ලබයි. 2015 වර්ෂයේ දී පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් තලවිල ශාන්ත ආනා දේවාස්ථානය, මහනුවර ඇසළ පෙරහැර, කතරගම ඇසළ පෙරහැර සහ අනුරාධපුර පොසොන් උත්සවය සඳහා මූල්‍ය දායකත්වය ලබා දෙන ලදී.

6.1.6 ලෝක පරිසර දිනය

ලෝක පරිසර දින තේමාව යටතේ විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී. 2015 වර්ෂයේ දී අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසෙන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පොළොන්නරුව, වටදාගේ පරිශ්‍රයේදී ජුනි 05 දින “තිරසර භාවිතය - සුරැකී මිහිතලය” තේමාව යටතේ ලෝක පරිසර දින ප්‍රධාන වැඩසටහන පවත්වන ලදී. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් මෙම වැඩසටහන මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගය ඇතිව සිදු කරන ලදී. මෙම වැඩසටහනේදී පහත ක්‍රියාකාරකම් දියත් කරන ලදී.

1. පොළොන්නරු දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් අතරේ පැළ 1000 ක් බෙදා දීම.
2. මැදිරිගිරිය ජාතික පාසලේ දී ප්‍රදර්ශනයක් පැවැත්වීම.
3. සහභාගිවන්නන් සඳහා පාරිසරික ලිපිගොනු බෙදා දීම.
4. අධ්‍යාපන අමාත්‍යාංශය හරහා පරිසර නියමුවන්ගේ සහභාගිත්වය ලබා ගැනීමට කටයුතු කිරීම.

6.1.7 ජාතික රුක් රෝපණ වැඩසටහන

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් පිරිසිදු හරිත පරිසරක් උදෙසා ජාතික රුක් රෝපණ වැඩසටහන දියත් කරන ලදී. 2015 වර්ෂයේ දී ජාතික රුක් රෝපණ වැඩසටහන් නව ආරකින් විවිධ මාතෘකා යටතේ විවිධ ක්‍රියාකාරකම් මාසයක් තුළ න්‍යාය පත්‍රයකට අනුව පවත්වන ලදී. එම මාසය "වනරෝපා - රුක් රෝපණ මාසය ලෙස නම් කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ "තුරු කැපකරු - අපි නිරතුරු" තේමාව යටතේ "වන අරණට - සිසු අරණ" පාසල් රුක් රෝපණ වැඩසටහන් පවත්වන ලදී. ඉහත තේමාව යටතේ පහත සඳහන් වැඩසටහන් 3 ක්‍රියාත්මක විය.

- දිවයිනේ සියලු පාසල් තුළ පළතරු පැළ 03ක් බැගින් රෝපණය කරන ලදී. මෙම වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මධ්‍යම පරිසර අධිකාරිය තාක්ෂණික උපදෙස් ඇතිව ක්‍රියාත්මක කරන ලදී.
- සෑම දිස්ත්‍රික්කයකට එක් පාසලක වනාන්තර වැස්ම වැඩි කිරීමේ අරමුණින් පැළ 50ක් රෝපණය කරන ලදී.
- පොළොන්නරුවේ මැදිරිගිරිය ජාතික පාසලේ අක්කරයක වනාන්තර වැස්මක් ඇති කිරීමේ අරමුණින් පැළ 400ක් රෝපණය ලදී.

6.1.8 විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඵලදායි ලෙස භාවිතා කිරීම (මාධ්‍යය ඒකකය)

මාධ්‍ය, පරිසරය හා සම්බන්ධ තොරතුරු ප්‍රචාරය කිරීමට ඇති ප්‍රබල මාධ්‍යයකි. එබැවින් මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය යටතේ වෙනම ඒකකයක් ලෙස මාධ්‍යය ඒකකය පිහිටුවන ලදී. මාධ්‍යය ඒකකය විසින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යය ඵලදායි ලෙස භාවිත කරන ලදී. 2015 වර්ෂයේ මාධ්‍යය ඒකකයේ ප්‍රගතිය පහත දක්වා ඇත.

6.1.8.1 ගුවන්විදුලි වැඩසටහන

සොබාකෙත ගුවන්විදුලි වැඩසටහන - පාරිසරික ගැටළු පිළිබඳව මහජනයාට දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මඟින් එෆ්. එම්. 94.3/ එෆ් එම් 94.8 ඔස්සෙ සොබාකෙත ගුවන්විදුලි වැඩසටහන සෑම බ්‍රහස්පතින්දා දිනකම සවස 6.30ට ප්‍රචාරය කරන ලදී. නරඹන්නන්ගෙන් පරිසරය හා සම්බන්ධ ප්‍රශ්න ඇසීමෙන් මෙ වැඩසටහනේ ප්‍රගතිය විමසීම සිදුකරයි. සෑම සතියකම ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා ත්‍යාග ලබා දෙයි. ප්‍රජාවගෙන් ලැබෙන ප්‍රතිචාරවලට අනුව, මෙම වැඩසටහන අසන්නන් අතර වඩාත් ජනප්‍රිය

වැඩසටහනකි. 2015 වර්ෂයේ දීසොබාකෙත ගුවන් විදුලි වැඩසටහන් 40ක් විසුරුවා හරින ලදී.

6.1.8.2 මිස්ටර් ග්‍රීන් නැවත නිෂ්පාදනය

2015 වර්ෂයේ දී මිස්ටර් ග්‍රීන් සීවීඩී තැටි 800ක් නැවත නිෂ්පාදනය කරන ලද අතර ඒවායින් 438ක් බෙදාහරින ලදී.

6.1.8.3 මාධ්‍යය ආවරණය

ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය විශෙෂ ව්‍යාපෘති, වැඩසටහන් සහ අවස්ථා ආවරණය කරමින් මධ්‍යම පරිසර අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමට දායක වේ. 2015 වර්ෂයේ මෙවැනි වැඩසටහන් 59ක් ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය විසින් ආවරණය කරන ලදී.

6.1.8.4 දිනපතා පුවත්පත්වල පළ වන පාරිසරික ගැටළු

මෙය මාධ්‍යය ඒකකය මඟින් ක්‍රියාත්මක කරන තවත් එක් ක්‍රියාකාරකමක් වේ. දිනපතා පුවත්පත්වල පළවන පරිසරය හා සම්බන්ධ ගැටළු අදාළ දෙපාර්තමේන්තු හා ආයතන වෙත යොමු කරනු ලැබේ.

6.1.8.5 ප්‍රවෘත්ති හා මාධ්‍යය නිවේදන

මාධ්‍යය මඟින් සමාජයේ පුළුල් පරාසයන් දැනුවත් කළ හැකිය. එබැවින් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රවෘත්ති හා ක්‍රියාකාරකම්, ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත් හා වෙබ් අඩවිය මඟින් බෙදා හරිනු ලබයි.

වගුව 6.3 ප්‍රවෘත්ති හා මාධ්‍යය නිවේදන

පුවත්පත් නිවේදන සංඛ්‍යාව	මාධ්‍යය ආවරණය	වෙබ් අඩවියට යාවත්කාලීන කිරීම
56	-	54

6.1.8.6 රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය

මාධ්‍යය ඒකකය විසින් කරන ලද තවත් එක් කාර්යභාරයක් වන්නේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය කිරීමයි. 2015 වර්ෂයේ දී රාජ්‍ය නොවන සංවිධාන 21ක් ලියාපදිංචි කරන ලදී.

6.1.8.7 “විරිඳු තැටි” බෙදාහැරීම.

2014 වර්ෂයේ දී මාධ්‍යය ඒකකය විසින් පාරිසරික විරිඳු සංයුක්ත හා සංගත තැටි එළිදක්වන ලදී. 2015 වර්ෂයේ දී සංගත හා සංයුක්ත තැටි 957 ක් පොදු ජනතාව, පෞද්ගලික ආයතන, පාසල් සහ ඉල්ලීම් ලැබුණු අනෙකුත් පාර්ශවයන් අතර බෙදා හරින ලදී.

6.1.8.8 “සංහිත” පොත බෙදාහැරීම.

2014 වර්ෂයේ මාධ්‍යය ඒකකය විසින් සංහිත කවි, සංහිත කෙටිකතා සහ සංහිත පෝස්ටර්ස්, පොත් මුද්‍රණය කරන ලදී. 2015 වර්ෂයේ මෙම පොත් රාජ්‍ය යතන, පෞද්ගලික ආයතන, පාසල් සඳහා සහ මාධ්‍යය ඒකකය විසින් පවත්වන ලද තරඟවල ජයගාහකයන් අතරේ බෙදා දෙන ලදී. පාරිසරික පණිවුඩය සමාජගත කිරීම සඳහා සංහිත පෝස්ටර්ස් පොත් 748ක් සංහිත කවි පොත් 930ක් සංහිත කෙටිකතා පොත් 900ක් බෙදා හරින ලදී.

6.1.8.9 "නිල්වන පෙත" සහ "සොබාකෙත ඩිවිඩි තැටි" බෙදා හැරීම.



රූපය 6.1. සොබාකෙත ඩිවිඩි තැටි

රූපය 6.2 නිල්වන පෙත ඩිවිඩි

6.1.9 ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය

ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ පාරිසරික තොරතුරු ලබාදෙන ප්‍රධාන මධ්‍යස්ථානය වේ. මෙම මධ්‍යස්ථානයේ අරමුණු නම්,

- පාරිසරික තොරතුරු මූලාශ්‍ර ඇති කිරීම මගින් පාඨකයින්ගේ පාරිසරික තොරතුරු අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම.
- පාරිසරික තොරතුරු විශ්ලේෂණය සහ සම්පිණ්ඩනය කිරීම.
- දේශීය, විදේශීය තොරතුරු මධ්‍යස්ථාන හා පුස්තකාල සමග තොරතුරු හුවමාරුව, බෙදාහැරීම හා සම්බන්ධීකරණය.

2014 වර්ෂයේ දී නිල්වනපෙත පාරිසරික සංගීත වැඩසටහන දියත් කරන ලදී. 2015 වර්ෂයේ ගීත අඩංගු සංගත තැටි ඉල්ලුම්කරන ලද පාර්ශවන්, පාසල්, පළාත් දිස්ත්‍රික් කාර්යාල, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා බෙදා හරින ලදී.

නිල් වනපෙත සංගත තැටි 150ක් සහ සොබාකෙත ඩිවිඩි සංගත තැටි 520ක් බෙදා හරින ලදී.

2015 වර්ෂයේ පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රගතිය.

01. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ පාරිසරික තොරතුරු ලබාදෙන නාහික මධ්‍යස්ථානය වේ. මෙම මධ්‍යස්ථානයේ අරමුණු නම්,

- පාරිසරික තොරතුරු මූලාශ්‍ර සංවිධානය කිරීම මගින් පාඨකයින්ගේ පාරිසරික තොරතුරු අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම.
- පාරිසරික තොරතුරු විශ්ලේෂණය සහ සම්පිණ්ඩනය කිරීම.
- දේශීය, විදේශීය තොරතුරු මධ්‍යස්ථාන හා පුස්තකාල සමග තොරතුරු හුවමාරුව, බෙදාහැරීම හා සම්බන්ධීකරණය.

2015 වර්ෂයේ පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රගතිය පහත පරිදි වේ.

6.1.9.1 පුස්තකාල තුල පරිසර පාසැල් තොරතුරු අංශය සංවර්ධනය කිරීම

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය මගින් ක්‍රියාත්මක කෙරෙන, පාරිසරික නියමු වැඩසටහනේ 05 අවුරුදු සැලැස්ම යටතේ ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය විසින් දිවයින පුරා දිස්ත්‍රික්ක 25 හි පාසැල් පුස්තකාලතුල පාරිසරික අංශය සංවර්ධනය කිරීම වෙනුවෙන් වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.

මෙම වැඩසටහන යටතේ අඩු පහසුකම් සහිත පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක වන පාසැල් 05ක් තෝරා ගත් අතර රු.ලක්ෂ 15ක් වටිනා පොත් හා පුස්තකාල උපකරණ ඔවුන්ගේ පාසැල් පුස්තකාල සංවර්ධනය කිරීම සඳහා පරිත්‍යාග කරන ලදී.

යාපනය දිස්ත්‍රික්කය - වෙලනයි මධ්‍ය මහා විද්‍යාලය

හුණුමුල්ල මහා විද්‍යාලයේ පොත් ප්‍රදානෝත්සවය

2015 ජූලි ,16,17 ,27සහ සැප්,18 . 29දිනයන්හි අදාළ පාසැල් පරිශ්‍රයේදී පිරිනැමීමේ වැඩසටහන සිදු කරන ලදී.

6.1.9.2 පුස්තකාල එකතුව ගොඩනැගීම.

පාරිසරික පොත් 71 ක් සහ සහරා 14 ක් මිලදී ගෙන ඇත. පොත් 225 ක් ප්‍රතිග්‍රහණය හා වර්ගීකරණය කර සහ දත්ත පදනමට ඇතුළත් කර ඇත. සහරා 260 ක් පුස්තකාල එකතුවට ඇතුළත් කර ඇත.

6.1.9.3 ප්‍රලේඛන සෙවා හා පුස්තකාල පිරිසැකසුම්කරණය.

6.1.9.3.1 ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ පහත සඳහන් දත්ත පදනම් 04ක් පවත්වාගෙන යනු ලබන අතර එයට දත්ත 5,410 ක් ඇතුළත් කර ඇත.

- CEA දත්ත පදනම - පුස්තකාල පොත් පිළිබඳව
- IND දත්ත පදනම - පුවත්පත් ලිපි හා සහරා ලිපි පිළිබඳව
- අනුරාධපුර දිස්ත්‍රික්කය - කලත්තෑව මහා විද්‍යාලය, කුරුන්දන්කුලම
- ගම්පහ දිස්ත්‍රික්කය - හුණුමුල්ල මහා විද්‍යාලය
- මාතලේ දිස්ත්‍රික්කය - ඕවිලිකන්ද මහා විද්‍යාලය
- බදුල්ල දිස්ත්‍රික්කය - දඹාන කණිෂ්ඨ විද්‍යාලය

- EIA / IEE දත්ත පදනම් - පාරිසරික බලපෑම් ඇඟයීම් වාර්තා /මූලික පාරිසරික සමීක්ෂණ වාර්තා පිළිබඳව
- E Repository දත්ත පදනම - පරිසර අධිකාරියේ ප්‍රකාශන

6.1.9.3.2 පුස්තකාල පොත් සඳහා තීරු සංකේත ක්‍රමයක් නිර්මාණය කිරීම.

- තීරු සංකේත කියවනය ක්‍රියාත්මක කිරීම හා නව සාමාජිකපත් 41 ක් නිකුත් කිරීම.

6.1.9.4 පුස්තකාල ප්‍රකාශන

සහරා පටුන පිටු ඇතුළත් "සහරා ප්‍රවර්තනය" කලාප 06 ක් සහ "පාරිසරික පුවත්පත් ලිපි හා සහරා ලිපි අනුක්‍රමණිකාව" කලාප 04 ක් 2015 වර්ෂය සඳහා සම්පාදනය කර ඊ-මේල් මගින් බෙදා හැර ඇත.

6.1.9.5 පාරිසරික තොරතුරු හුවමාරු කිරීම

- ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයෙන් පාඨකයින් 7,180 ක් සඳහා පාරිසරික තොරතුරු ලබා ගැනීමට පහසුකම් ලබා දී ඇත.
- දේශීය, විදේශීය පුස්තකාල හා වෙනත් සංවිධාන අතර තොරතුරු හුවමාරු කර ගැනීම් - 865

- සොබාකෙත මධ්‍යස්ථාන වෙතින් පහත අයුරින් තොරතුරු ලබාදී ඇත.

අත්තිඩිය - 1788, රූමස්සල - 1943

- මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත පොත් සහ සඟරා බැහැරදීම 4805 ක් සිදුකර ඇත.

- පොත් 33 ක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට පරිත්‍යාග කිරීම.

6.1.9.6 පුස්තකාල ජාල ක්‍රියාකාරකම්

- HELLIS / SLLA / SLSTIC/AGRINET තොරතුරු ජාලවලට අවශ්‍ය තොරතුරු ලබාදීම.
- පුස්තකාල ජාල රැස්වීම් හා වැඩමුළු වලට සහභාගිවීම - 10
- AGRINET පුස්තකාල ජාලයට හා ජාතික පුස්තකාලයේ UCAT දත්ත පදනම සඳහාද දත්ත යවා ඇත.

6.1.9.7 අනිකුත් ක්‍රියකාරකම්

බ්‍රිතාන්‍ය කවුන්සිල් පුස්තකාලයේ සාමාජිකත්වය 2015/2016 ට ලබාගැනීම හා සාමාජිකපත් කාර්යාල මණ්ඩලයට බෙදාහැරීම.

මැදිරිගිරිය , වටදාගෙය පරිශ්‍රයේදී ලෝක පරිසර දිනය 2015 සැමරීමේ වැඩ කටයුතු

පාරිසරික කලමනාකරණ සහ සැලසුම් කිරීමේ සමුළුවේ වැඩකටයුතු කිරීම.

ප්‍රගති වාර්තා, මාසික හා කාර්තු වශයෙන් සකස්කිරීම.

නවකතා හා සාමාන්‍ය කියවීම් 140 ක් නාමාවලියට ඇතුළත් කිරීම හා රාක්කගත කිරීම.

පුස්තකාල එකතුවට නව පුවත්පත් කැපුම් සංඛ්‍යාව - 1913

හරිත සම්මාන 2015 උළල සහ පරිසර නියමු ජනාධිපති පදක්කම් උත්සවය සඳහා සහයෝගය ලබා දීම.

ජාතික පුස්තකාලය හා ජාතික ලේඛනාගාරයට, පරිසර අධිකාරියේ ප්‍රකාශන පිටපත් යැවීම.

මිලදී ගැනීම් හා පරිත්‍යාග වශයෙන් ලැබූ පොත් ලයිස්තු මුදල් අංශයට යැවීම.

6.1.9.8 ආදායම

- පාරිසරික ප්‍රකාශන විකිණීම - 99 - රු. 17,315.00 (පොත්, පෝස්ටර්, අත්පත්‍රිකා සහ CDs)
- ඡායා පිටපත් ගැනීම - පිටපත් 14,980 - රු. 74,900.00
- CD පිටපත් කිරීම - (EIA වාර්තා 11) - රු .5,750.00

වෙනත් වැඩසටහන්

6.1.9.9 විශ්ව විද්‍යාල සිසුන් සඳහා පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් වැඩසටහන්.

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් විශ්ව විද්‍යාල සිසුන් සඳහා දිනක පුහුණු වැඩසටහනක් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු පීඨයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අභ්‍යාසලාභීන් 80 දෙනකු සහභාගි විය.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ අභ්‍යාසලාභීන් සඳහා දැනුවත් කිරීම් වැඩසටහනක් පැවැත්වීම **(SLIIT)**

7.0 සැලසුම් හා පසුවිපම් ඒකකය

ජාතික පාරිසරික පනත යටතෙහි පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිම සැකසීම සඳහා අවශ්‍ය ඒ ඒ අංශ ඒකකයන්හි, හා පළාත් කාර්යයන්හි අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි අවශ්‍ය සැලසුම් සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කරවීම සැලසුම් හා පසුවිපරම් ඒකකයෙහි ප්‍රධාන වගකීම වේ.

රජයෙහි පාරිසරික ප්‍රතිපත්ති වලට අදාලව ප්‍රමුඛතාවයන් හඳුනා ගැනීම වාර්ෂික මහ භාණ්ඩාගාරයෙන්, සපයන්නා වූ ප්‍රතිපාදන එම ප්‍රමුඛතාවයන් සඳහාම යෙදවීම පරිසර අංශය තුළ ඇති පෞද්ගලික අංශයට අදාල ප්‍රමුඛතාවයන් හඳුනා ගැනීම සහ විදේශ ආධාර කාර්යක්ෂම ලෙස සංවර්ධන ක්‍රියාවලිය සඳහා යොමු කිරීම මෙම ඒකකය මඟින් නිසි පරිදි සිදු කෙරේ.

පරිසර අංශයන්හි ප්‍රමුඛ ක්ෂේත්‍ර සඳහා සම්පාදනය කරන ලද ක්‍රියාකාරී සැලසුම් මධ්‍යම රජයේ ආයතනයන් ලෙස ප්‍රධාන කාර්යාලය මඟින්ද, ප්‍රාදේශීය වශයෙන් ප්‍රාදේශීය කාර්යාල හරහා ද සාර්ථක ලෙස ක්‍රියාත්මක කෙරේ.

2014-2018 වර්ෂයන්ට අදාලව මධ්‍යම පරිසර අධිකාරියෙහි සංයුක්ත සැලැස්මට අනුව, විවිධ ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණ සැලසුම්, කාලීන ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය සහ ඒවා සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සිදු කරනු ලැබූ අතර විවිධ ආයතනයන්ට අවශ්‍ය ප්‍රගති වාර්තා නියමිත දිනට සකසා ඉදිරිපත් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

අධිකාරිය මඟින් සිදු කරන ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව සම්බන්ධීකරණය අධීක්ෂණය ඒ ඒ විෂයානුබද්ධ සහ ප්‍රාදේශීය වශයෙන් පවතින ගැටළු සාකච්ඡා කිරීම සඳහා කළමණාකාරිත්වය සහ ප්‍රාදේශීය කාර්යාල සමඟ මාසික රැස්වීම් සංවිධානය කිරීම මඟින් සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ක්‍රියාකාරී රාමුව සැකසීම මෙම අංශය මඟින් සිදු කරයි. ඒ අනුව,

7.1 පළාත් කාර්යාල සමඟ සම්බන්ධීකරණය

මධ්‍යම පරිසර අධිකාරියෙහි කටයුතු වඩා විමධ්‍යගත කරනු වස් පළාත් කාර්යාල පිහිටුවා වන ලද අතර ඒ සඳහා අවශ්‍ය වන්නා වූ විධිමත් සම්බන්ධීකරණ කටයුතු සහ පළාත් කාර්යාල සඳහා අවශ්‍ය ආයතන පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ දාමය ශක්තිමත් කිරීම වස් සුවිශෙෂී මෙහෙයක් සැලසුම් හා පසුවිපරම් ඒකකය මඟින් සිදු කරයි.මෙයට අමතරව අදාල අංශය මඟින් ක්‍රියාත්මක සැලසුම් ප්‍රතිපාදනය, පරිසරයට අදාල ව්‍යාපෘති යෝජනා සැලසීම ඒවා ක්‍රියාත්මක කිරීම සහ ඒවා සම්බන්ධීකරණය මෙම අංශය මඟින් සිදුකරයි.

දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යවසායකයින් සඳහා වඩා විධිමත් සෙවා පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා 2015 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය යටතෙහි තෝරාගත් දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය කාර්යාල 15ක් පිහිටුවා ඇති අතර එම කාර්යාල ගම්පහ, කළුතර, මාතර, මහ්බන්තොට, නුවරඑළිය, මාතලේ, මොණරාගල, බුත්තල, රත්නපුර, පොලොන්නරුව, මඩකලපුව, අම්පාර, කිලිනොච්චිය, වව්නියාව, මුලතිව් සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි පිහිටුවා ඇත.

7.2 පාර්ලිමේන්තු උපදේශන කමිටුව

මේ යටතේ මධ්‍යම පරිසර අධිකාරිය වෙත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් විවිධ අවස්ථා වල ගෙන එන පරිසරයට අදාල පැමිණිලි විමර්ශනය කිරීම සඳහා වූ විශෙෂ ව්‍යාපෘති වාර්තා සැලසුම් හා පසුවිපරම් ඒකකය මඟින් සකස් කරයි. එලෙස

සකස් කරන ලද වාර්තා පාර්ලිමේන්තු උපදේශන කමිටුව වෙත පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හරහා යොමු කරනු ලබන අතර, එම වාර්තා පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා මූලික වූ පාර්ලිමේන්තු උපදේශන කමිටුවක් හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එක්ව අදාල ගැටළු හා වාර්තාව පිළිබඳ සාකච්ඡා කරනු ලබයි.

7.3. "ආ" කාණ්ඩයෙහි කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම.

ජාතික පරිසර පනත යටතෙහි විශෙෂ ගැසට් ප්‍රකාශයෙහි අංක 1533/16 දරණ 25 16/01/ දින පනත යටතේ 2008 කර්මාන්ත ශාලා හිමියන් විසින් අනිවාර්යයෙන්ම පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම අනිනාර්යය වෙයි. පරිසර පනත යටතෙහි "අ" කාණ්ඩය ලෙස පරිසරයට වැඩි වශයෙන් අපද්‍රව්‍ය මුදාහරින කර්මාන්ත ශාලා ද "ආ" කාණ්ඩය යටතේ, මධ්‍යම ප්‍රමාණයෙන් පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින කර්මාන්ත ද, "ඇ" කාණ්ඩය යටතේ සුළු වශයෙන් පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින කර්මාන්ත ලෙස වර්ගීකරණය කොට ඇත.

මධ්‍යම පරිසර අධිකාරියෙහි පරිසර දූෂණ පාලන ඒකකය මින් කාණ්ඩයට අයත් කර්මාන්ත "අ" ශාලා සඳහා වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් .කිරීම සම්බන්ධ වූ දත්ත පද්ධතිය පවත්වාගෙන යයි කාණ්ඩය යටතෙහි ද එවැනි දත්ත "ආ" නමුත් .පද්ධතියක් පවත්වාගෙන යාම ඉතා වැදගත් වෙයි කාණ්ඩයෙහි කර්මා "ආ" ඒ යටතෙහින්ත සහා මධ්‍යම පරිසර අධිකාරිය සහ ප්‍රාදේශීය කාර්යාල මින් නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍ර පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම මාසිකව සැලසුම් හා පසුවිපරම් අංශය මින් සිදුකරනු ලබයි. මෙලෙස දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම තුලින් ඉදිරියේ දී එවැනි කර්මාන්ත සහා පරිසර ආරක්ෂණ බලපත්‍ර (EPL) අළුත් කිරීම මෙන්ම පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ දී සහ අළුත් කිරීමේ දී වැදගත් වෙයි. 2015 වර්ෂය අවසන් වන විට පරිසර ආරක්ෂණ බලපත්‍ර 2866 ක් දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට හැකි විය. ඒ අනුව මුළු දත්ත සංඛ්‍යාව 10ල174ක් විය.

7.4 තීරණ ගැනීමේ කමිටුව

පරිසර පනත අනුව මධ්‍යම පරිසර අධිකාරිය වෙත නෛතිකව පරිසර බලපෑම් තක්සේරු කිරීමෙහි වාර්තාව (EIA) හා පරිසර ආරක්ෂෂණ බලපත්‍ර (EPL) කර්මාන්තකරුවන් සඳහා නිකුත් කිරීමෙහි බලය පවරා දී ඇත. මීට අමතරව පරිසර ආරක්ෂෂණ බලපත්‍රය (EPL) හා පරිසර බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව ලබා ගැනීම අනිවාර්ය නොවන නව කර්මාන්ත ස්ථානගත කිරීම සහ ස්වභාවික සම්පත් සම්බන්ධ ව්‍යාපෘති සඳහා නව පිහිටීම නිර්දේශ කිරීමේ ක්‍රියා පටිපාටියක් ද පවති.

පරිසර බලපෑම් තක්සේරු කිරීමෙහි ක්‍රියාවලිය (EIA)සහ පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) නිකුත් කරන සහ අ කාණ්ඩයේ කර්මාන්ත හැර ඉහත සඳහන් කළ අනිකුත් ක්‍රියාකාරකම් සඳහා පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල මඟින් කටයුතු කරනු ලබයි.

පරිසර පනත යටතේ සපයා ඇති උපදෙස් මත මෙම ක්‍රියාවලියෙහිදි ප්‍රාදේශිය/ දිස්ත්‍රික් කාර්යාල මෙන්ම ප්‍රධාන කාර්යාල ද පොදු එක ආකෘතියක් භාවිතා කිරීමත් අදාල ආකෘති පරික්ෂාව සඳහා එකඳු කලයක් යොදා ගැනීමත් අදාල ව්‍යාපෘති යෝජකයා ගෙවිය යුතු සහ ගෙවීමට නියමිත මුදල එක හා සමාන ගස්තුවකට යටත් වීමත් ඉතා වැදගත්වේ.

මෙම අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ ප්‍රධාන අපේක්ෂාව යටතේ මෙම තීරණ ගැනාමේ කමිටුව මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පිහිටුවා ලද අතර එම කමිටුවෙහි මූලිකත්වය අප පරිසර අධිකාරියේ

සභාපතිවරයාද, අධ්‍යක්ෂ ජනරාල්වරයාද, පරිසර දූෂණ පාලන ඒකකයෙහි (EPC) හා පරිසර කළමණාකරණ හා ඇගයීම් අංශයෙහි නායෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් ද පරිසර දූෂණ පාලන ඒකකයෙහි (EPC) නීති අංශයෙහි සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශයෙහි අධ්‍යක්ෂවරුන්ද, ඌව, උතුරු මැද සහ උතුරු දිස්ත්‍රික්කයන්හි ස්ථානභාර නිලධාරීන්ගෙන් සමන්විත වූ කමිටුවක් යටතේ ක්‍රියාත්මක වෙයි.

මෙම කමිටුව සෑම සති දෙකකට වරක් රැස්වන අතර එහි දී පරිසර බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා (EIA) හා ආරම්භක පරිසර බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා (IEE) “අ” කාණ්ඩයෙහි වන ව්‍යාපාර සඳහා බලපත්‍රයක් ද “අ” කාණ්ඩයෙහි කර්මාන්ත සඳහා බලපත්‍රයක් ද, BOI කර්මාන්තශාලා සඳහා නව පරිසර ආරක්ෂණ බලපත්‍ර සඳහා හා නව කර්මාන්තශාලා ස්ථානගත කිරීම සඳහා අවශ්‍ය ස්ථාන අනුමැතිය සඳහා එකඟතාවයන් ද මෙම කමිටුව සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාල අධ්‍යක්ෂවරුන්ගේ අවසාන අනුමැතියට යැවීමට පෙර මෙම කමිටුව වෙත යොමු කරනු ලබයි.

පසුගිය වසර තුල මෙවැනි රැස්වීම් 12 ක් සාර්ථක ලෙස පැවැත්වීම සඳහා සැලසුම් හා පසුවිපරම් ඒකකය මඟින් සම්බන්ධීකරණ සහ ලේඛන කටයුතු සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

7.5. රැස්වීම්

සැලසුම් හා පසුවිපරම් ඒකකය මඟින් විවිධ වූ රැස්වීම් සම්බන්ධීකරණයෙන් ඉතා සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

7.6. ව්‍යාපෘති සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම.

මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සහ විදේශ ආධාර නිසි පරිදි භාවිතා කිරීම හා ඉන් බලාපොරොත්තු වූ ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත ව්‍යාපෘති වැඩ සටහන් සැලසුම්කරණය හා සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ.

7.6.1. මහා භාණ්ඩාගාර අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති.

- පිළිසරු ව්‍යාපෘතිය (රු. මිලියන 279)
- පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය (රු. මිලියන 50)
- මධ්‍යම පරිසර අධිකාරියෙහි විද්‍යාගාර නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (රු. මිලියන 30)
- පරිසර නියමු ව්‍යාපෘතිය රු. මිලියන (රු. මිලියන 30)

7.6.2. විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- ප්‍රධාන ජලාශ වල ජල තත්ව පසුවිපරම් කිරීමේ ව්‍යාපෘතිය (JICA) (මිලියන 26.5 ක් විදේශීය සහ මිලියන 5 ක් දේශීය)
- ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල යටතේ ක්‍රියාත්මක EDCF ව්‍යාපෘතිය (විදේශ රු. මිලියන 300, දේශීය රු.මිලියන 92)

8.0 පැමිණිලි ඒකකය

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉටුකරන ලද කාර්යයක් හෝ ප්‍රමාණාත්මකව ඉටු නොකරන ලද කාර්යයක් හෝ සෙවා ප්‍රමිති වලට අනුකූලව ඉටු නොකරන කාර්යයක් හෝ සම්බන්ධව පුරවැසියකුගේ විරමණය ලිඛිත හෝ වාචිකව දැක්වීමත් මහජන පැමිණිල්ලක් යන දැක්ම තුල සිටිමින් පාරිසරික පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් කටයුතු කර ඇත.

පැමිණිලි විසඳුම් ක්‍රියාවලියේ ඵලදායිතාව හා ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා, පැමිණිලි මෘදුකාංග පද්ධතියේ පවතින ගැටළු පිළිබඳ 2015 වසරේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් අධ්‍යයනය කරන ලද අතර එම ගැටළු වලක්වා ගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳව එහිදී විශෙෂයෙන් සලකා බලන ලදි. එම අධ්‍යයනයේ ප්‍රතිඵල සැලකිල්ලට ගෙන මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබෙන මහජන පැමිණිලි කළමනාකරණය සඳහා ජාලගත පහසුකම් සහිත මෘදුකාංග පද්ධතියක් සකස් කිරීමට අධිකාරිය විසින් තීරණය කරන ලදි. පැමිණිලි කළමනාකරණයේ ශක්නුතාව ඉහළ නැංවීම, පැමිණිලි විසඳුම් ක්‍රියාවලියේ ඵලදායිතාව ඉහල නැංවීම හා පුනරුදය ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන 2016 – 2018 සඳහා මනා දායකත්වයක් ලබාදීම නව මෘදුකාංග පද්ධතියේ මූලික අරමුණු අතර පවතී. ඊට අමතරව, මහජන පැමිණිලි විශ්ලේෂණය මගින් ලබාගන්නා තොරතුරු පරිසර අධිකාරියේ කළමනාකරණ හා සැලසුම් ක්‍රියාවලිය සඳහා පිටුවහලක් ලබාගැනීමද මෙමගින් අපේක්ෂා කෙරේ.

මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල, පළාත් කාර්යාල, ඒකක හා අංශ විසින් ගන්නා ලද සාමූහික උත්සාහයේ හා කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස 2015 වසර පුරා අධිකාරිය වෙත ලැබුණු පැමිණිලි 2722 න් 1747 එනම් 64% ක් සම්පූර්ණයෙන් විසඳා අවසන් කිරීමට සමත් වූ අතර ඉතිරි පැමිණිලි විසඳීමට අදාල කටයුතු සිදුවෙමින් පවතී.

පැමිණිලි කළමනාකරණය කිරීමේ ප්‍රගතිය පහත වගුව හා ප්‍රස්ථාර මගින් සාරාංශගත කොට දන්වා ඇත.

වගුව 8.1 2015 වසරේදී මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි අංශ, ඒකක, පළාත් හා දිස්ත්‍රික් කාර්යාල අතර බෙදී යාම.

	ඒකකය / කාර්යාලය		ලැබී ඇති පැමිණිලි		විසඳා අවසන් කර ඇති පැමිණිලි	
			සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1.	බස්නාහිර පළාත	කොළඹ දිස්ත්‍රිකය	496	45.9	262	52.8
		ගම්පහ දිස්ත්‍රික්කය	362		182	50.2
		කළුතර දිස්ත්‍රික්කය	393		242	61.5
2.	දකුණු පළාත	ගාල්ල දිස්ත්‍රික්කය	151	10.5	136	90.0
		මාතර දිස්ත්‍රික්කය	79		50	63.2
		හම්බන්තොට දිස්ත්‍රික්කය	57		38	66.7
3.	ඌව පළාත	බදුල්ල දිස්ත්‍රික්කය	75	5.3	54	72.0
		මොණරාගල දිස්ත්‍රික්කය	68		48	70.6
4.	වයඹ පළාත		152	5.6	88	57.9
5.	සබරගමුව පළාත	රත්නපුර දිස්ත්‍රික්කය	278	18.3	232	83.4
		කෑගල්ල දිස්ත්‍රික්කය	218		170	78.0

	ඒකකය / කාර්යාලය		ලැබී ඇති පැමිණිලි		විසඳා අවසන් කර ඇති පැමිණිලි	
			සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
6.	උතුරු මැද පළාත	අනුරාධපුර දිස්ත්‍රික්කය	62	3.7	50	80.6
		පොළොන්නරුව දිස්ත්‍රික්කය	39		19	48.7
7.	මධ්‍යම පළාත		137	5.0	87	63.5
8.	නැගෙනහිර පළාත	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය	6	1.1	4	66.7
		අම්පාර දිස්ත්‍රික්කය	11		7	63.6
		මඩකලපුව දිස්ත්‍රික්කය	15		6	40.0
9.	උතුරු පළාත		27	1.0	17	63.0
10.	පරිසර දූෂණ පාලන ඒකකය		44	1.6	26	59.1
11.	අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය		13	0.5	7	53.8
12.	පරිසර බලපෑම් හා ඇගයීම් ඒකකය		30	1.1	17	56.7
13.	ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය		9	0.3	5	55.6
	එකතුව		**2,722**	**100.0**	**1,747**	**64.2**

2015වසරේ ඒකක හා පළාත් කාර්යාල අතර පැමිණිලි බෙදී යාම .



සටහන -

1. ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව : **2722**
2. ප්‍රතිශත අගයන් ආසන්න පූර්ණ සංඛ්‍යාවට ගනනය කර ඇත .
3. මධ්‍යම පරිසර අධිකාරියේ ඒකක ,පළාත් හා දිස්ත්‍රික් කාර්යාල විසින් 2016.01.18දිනට යාවත්කාලීන කරන ලද මෘදුකාංග පද්ධතියේ ඇතුලත් දත්ත ඉහත වෘත ප්‍රස්ථාරය සඳහා භාවිතා කර ඇත .

සුදිය;

WP : බස්නාහිර පළාත

SUP : දකුණු පළාත

EPC : පරිසර දූෂණ පාලන ඒකකය

WM : අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය

NCP : උතුරු මැද පළාත
NW : වයඹ පළාත
SAP : සබරගමුව පළාත
EP : නැගෙනහිර පළාත
NRM :ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය
EIA : පරිසර බලපෑම් ඇගයීම් ඒකකය
CP : මධ්‍යම පළාත
NP : උතුරු පළාත

රූපය 8.1. ඒකක සහ පලාත් කාර්යාල අතර පැමිණිලි බෙදීයන ආකාරය



රූපය 8.2. 2015 වසරේ මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි ප්‍රමාණය හා විසඳා අවසන් කර ඇති පැමිණිලි ප්‍රතිශතය.

2015 වසරේ එක් එක් ඒකක හා පළාත් කාර්යාල වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව විසඳා අවසන් කර ඇති පැමිණිලි ප්‍රතිශතය හා විසඳමින් පවතින පැමිණිලි ප්‍රතිශතය.






Received
Resolved
In progress
160
140
120
100
80
60
40
20
0
143
71%
29%
pogress of complaints -Uva Province


Received
Resolved
In progress
160
140
120
100
80
60
40
20
0
152
58%
42%
progress of complaints -North Western Province


Received
Resolved
In progress
600
500
400
300
200
100
0
496
81%
19%
progres of complaints -Sabaragamuwa Province


Received
Resolved
In progress
120
100
80
60
40
20
0
101
68%
32%
progress of complaints -North Central Province


Received
Resolved
In progress
150
100
50
0
137
64%
36%
progres of complaints - Central Province


Received
Resolved
In progress
35
30
25
20
15
10
5
0
32
53%
47%
progress of complaints -Eastern Province


Received
Rsolved
In progress
30
25
20
15
10
5
0
27
63%
37%
progress of complaints -Nothern Province


Received
Resolved
In progress
50
40
30
20
10
0
44
59%
41%
progress of complaints -Environmental Pollution Control unit


Received
Resolved
In progress
35
30
25
20
15
10
5
0
30
57%
43%
progress of complaints -Environmental Impact Assessment unit


Received
Resolved
In progress
14
12
10
8
6
4
2
0
13
54%
46%
progress of complaints -Waste Management unit


Received
Resolved
In progress
10
8
6
4
2
0
9
56%
44%
progress of complaints -Natural Resources Mgt. unit

9.0 තොරතුරු තාක්ෂණ ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය, විද්‍යුත් තැපැල් සෙවා, අභ්‍යන්තර පරිගණක ජාලය, දත්ත ගබඩාවන්, පරිගණක දෘඩාංග හා මෘදුකාංග ආදී තොරතුරු තාක්ෂණික මූලාශ්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සහ පවත්වාගෙන යාම තොරතුරු තාක්ෂණ ඒකකයේ වගකීම වේ.

ක්‍රියාකාරකම්

- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, ප්‍රධාන පරිගණක හා පරිගණක ජාල පද්ධති කළමනාකරණය
- පරිගණකය සහ ජාල සම්බන්ධ ආරක්ෂාව කළමනාකරණය
- මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය යාවත්කාල කිරීම සහ පවත්වාගෙන යාම
- පරිගණක මෘදුකාංග නිපැයුම් පද්ධති, ආයතනයට අනුගත ආකාරයෙන් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම
- පරිගණක දෘඩාංග සහ මෘදුකාං සැපයුම්කරුවන් සමග සම්බන්ධීකරණය සහ තොරතුරු තාක්ෂණය සම්බන්ධ ව්‍යාපෘති කළමනාකරණය
- අධිකාරියේ ව්‍යවසායික ඊමේල් සෙවාව පවත්වාගෙන යාම
- අධිකාරියේ පරිගණක සඳහා දෘඩාංග සහ මෘදුකාංග සෙවා සැපයීම සහ යාවත්කාල කිරීම
- අධිකාරියේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණයට අදාල පරිගණක මෘදුකාංග පද්ධති පිළිබඳව වැඩමුළු සහ සම්මන්ත්‍රණ මෙහෙයවීම.

ජයග්‍රහණ

- අධිකාරියේ කටයුතු කාර්යක්ෂම කර ගැනීමට අභ්‍යන්තර භාවිතය සඳහා පරිගණක ඒකකය මඟින් පරිගණක දත්ත පද්ධති හා මෘදුකාංගයන් නිර්මාණය කිරීම, පවත්වා ගෙන යාම හා ඒ ආශ්‍රිතව පැන නගින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා සහය වීම. (දුරකතන මාර්ග හරහා හෝ අදාල ස්ථානයට ගොස්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම)
- අධිකාරියේ නිලධාරීන්ගේ වෛද්‍ය රක්ෂණ ආවරණ පිළිබඳ මෘදුකාංගය
- අධිකාරියේ ඉහළ නිලධාරීන්ගේ දුරකතන ගෙවුම් ආශ්‍රිත මෘදුකාංගය
- පාරිසරික බලපෑම් ඇගැයීම් ආශ්‍රිත මෘදුකාංගය
- පරිසර ආරක්ෂණ බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාල මෘදුකාංගය
- අධිකාරියේ නිලධාරීන්ගේ වෛද්‍ය රක්ෂණ ආවරණ පිළිබඳ මෘදුකාංගය (Medical Insurance Claiming System)

අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල වල සෙවයේ නියුතු සියළුම නිලධාරීන් හට සපයන වෛද්‍ය රක්ෂණ ආවරණ පිළිබඳ උසස් සෙවයක් ලබා දීම හා එම කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාම මෙම මෘදුකාංගය නිර්මාණය කිරීමේ අරමුණ වශයෙන් දක්විය හැක. මෙමඟින් සියළුම නිලධාරීන් හට සිය වෛද්‍ය රක්ෂණ ආවරණ පිළිබඳ විස්තරයන් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ලබා ගැනීමේ හැකියාවද පවතී.

අධිකාරියේ ඉහළ නිලධාරීන්ගේ දුරකතන ගෙවුම් ආශ්‍රිත මෘදුකාංගය (Officers Telephone Payment System)

අධිකාරියේ ඉහළ නිලධාරීන්ගේ දුරකතන ගෙවීම් කටයුතු පහසුකර ගැනීම සඳහා මෙම මෘදුකාංගය නිර්මාණය කර ඇත.

- පාරිසරික බලපෑම් ඇගැයීම් ආශ්‍රිත මෘදුකාංගය (EIASYS : Environmental Impacts Assessment System)

ජාතික පරිසර පනත යටතේ පාරිසරික බලපෑම් ඇගැයීම ක්‍රියාත්මක කිරීම පහසු කර ගැනීමේ අරමුණින් පාරිසරික බලපෑම් ඇගැයීම ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රියාවලිය ආශ්‍රය කරගනිමින් මෙම මෘදුකාංගය නිර්මාණය කර ඇත.

- පරිසර ආරක්ෂණ බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාල මෘදුකාංගය (EPL SYSTEM – Environmental Protection License System)

පරිසර දූෂණය වැළැක්වීම හා ඒ සම්බන්ධ ගැටළු පාලනය කිරීමේ අරමුණින් පරිසර ආරක්ෂණ බලපත් නිකුත් කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන අතර, එම කටයුතු පහසු කර ගැනීමේ අරමුණින් මෙම මෘදුකාංගය නිර්මාණය කර ඇත.

- අප ඒකකය මගින් සකස් කර හදුන්වා දෙන ලද මෘදුකාංග පද්ධති අවශ්‍ය වූ විට යාවත්කාලීන කිරීම හා පළාත් / ප්‍රාදේශිය කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩමුලු පැවැත්වීම.
- වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. (වෙබ් අඩවියේ පළවන පුවත් හා ආයතයට සම්බන්ධ වැඩසටහන් පිළිබඳව තොරතුරු හා අනෙකුත් විස්තර ඇතුලත් කිරීම.)
- අධිකාරියේ විද්‍යුත් තැපැල(Email) ස්ථාපිත කිරීම හා එය පවත්වාගෙන යාම.
- පරිගණක, ලැප්ටොප් හා මුද්‍රණ යන්ත්‍ර ජාලයට සම්බන්ධ කිරීම හා මුද්‍රණ කටයුතු ජාලය තුලින් ලබාගැනීමට සකස් කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ හා පලාත් කාර්යාලවල පරිගණක භාවිතා කරන්නන් විසින් භාවිතයේදී ඇතිවන දෝෂ විසඳීම.
- (දුරකතන මාර්ග හරහා හෝ අදාල ස්ථානයට ගොස්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම)
- පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර හා ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු කිරීම. නව පරිගණක හා ලැප්ටොප් සඳහා මෘදුකාංග ස්ථාපිත කිරීම.

10.0 අභ්‍යන්තර විගණන ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති යටතේ ස්ථාපිත අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්ය හා විෂය පථය අධිකාරියේ සභාපති විසින් තීරණය කරනු ලබයි. අභ්‍යන්තර විගණන ඒකක විසින් සිදු කරනු ලබන මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන හා මෙහෙයුම් පිළිබඳව විගණන පරීක්ෂා කිරීම් මඟින් සොයා ගැනීම් හා නිරීක්ෂණ සභාපති වෙත සෘජුවම වාර්තා කරනු ලබන අතර එහි කටයුතුවල පූර්ණ අධීක්ෂණයක් සභාපති මගින් සිදුකෙරේ.

අභ්‍යන්තර විගණක ඒකකයේ කාර්ය හා විෂය පථය

ගණකාධිකරණ හා අභ්‍යන්තර පාලන ක්‍රියා පිළිවෙල පිළිබඳව සමාලෝචනය.

මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු විමර්ෂණය කිරීම.

ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ආර්ථික බව, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පිළිබඳව මූල්‍ය

හා මූල්‍ය නොවන පාලනයන් පිළිබඳ සමාලෝචනය කිරීම.

ආයතනයේ අභ්‍යන්තර හා භාහිර නීති රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති හා මඟ පෙන්වීම්

ක්‍රියාත්මක කෙරේදැයි පරීක්ෂා කිරීම.

කළමනාකරණය විසින් අවස්ථානුකූලව පවරන ලද විශෙෂ විමර්ෂන.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

1999 නොවැම්බර් මස 19 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ පී.එෆ්./පී.ඊ.3 අනුව මධ්‍යම පරිසර අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. කාර්තුමය වශයෙන් කමිටුව රැස්වන අතර, විගණන කමිටුවේ සභාපති ධුරය දරනු ලබන්නේ භාණ්ඩාගාර නියෝජිතය.

2015 මුදල් වර්ෂය තුළ අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂිකා අනුෂියානාදන් මහත්මියගේ සභාපතීත්වයෙන් පවත්වන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්, පරිපාලන හා මුදල්), අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂිකා (මෙහෙයුම් හා සැළසුම්) සකච්ඡා කෙරෙන විෂයයට අදාල අධ්‍යක්ෂවරුන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරි සහ පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණනද සහභාගි විය. මධ්‍යම පරිසර අධිකාරියේ අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ කැඳවුම්කරු ලෙස ක්‍රියාකරයි. විගණන හා කළමනාකරණ කමිටුවේ නිරීක්ෂණ හා තීරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය තීරණ සඳහා යොමු කරන ලදී.

11.0 මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ පිළිවෙල

11.1 මධ්‍යම පරිසර අධිකාරියේ බලය පලාත් කාර්යාල වෙත විමධ්‍යගතකරණය කිරීම.

මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රධාන කාර්යාලය වශයෙන්, ජාතික ප්‍රමිතීන්, මිනුම් දඬු ප්‍රකාශයට පත් කිරීම හා අවශ්‍ය මාර්ගෝපදේශ පිළියෙල කිරීම ජාතික වශයෙන් සිදු කරන අතර ප්‍රාදේශීය වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ඉලතල ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වසරේ දී මධ්‍යම හා දකුණු පළාත සඳහා ප්‍රාදේශීය කාර්යාල දෙකක් පිහිටුවිය.

2002 වසරේ එසෙ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමෙන් ලබා ගන්නා ලද අත්දැකීම මත එම වැඩ පිළිවෙල මුළු දිවයින පුරා ව්‍යාප්ත කරන ලද අතර, 2007 වසර වන විට සියළුම පළාත් පාදක කොට ගෙන පළාත් කාර්යාල පිහිටුවා, පරිසර කළමනාකරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාවට නංවා ඇත.

ඒ අනුව, ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල වලින් කොටසක් මෙම පළාත් කාර්යාල ප්‍රධානීන් වෙත මධ්‍යම පරිසර අධිකාරිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පවරන ලදි.

11.2. පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම

උප ප්‍රාදේශීය මට්ටමෙන් මධ්‍යම පරිසර අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය පවරාදීමේ වගන්ති ජාතික පාරිසරික පනත මඟින් සම්පාදනය කොට ඇත.

ඒ අනුව, එකී පනතේ 26 වන වගන්තිය අනුව, මධ්‍යම පරිසර අධිකාරිය සතු බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට හෝ රජයේ යම් නිලධාරියෙකුට පවරා දෙනු ලැබිය හැකිය. 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් පවරා ඇති බලතල අනුව අනුව, අධිකාරියේ කටයුතු ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

මේ වගන්තිය අනුව, 1993 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරියේ බලතල වලින් යම් කොටසක් පළාත් පාලන ආයතන වලට පවරා දීමේ මූලික කටයුතු සිදු කරන ලද අතර, 1994.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි සුළු පරිමාණ කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල හා තවත් කටයුතු 12 ක් සඳහා බලතල පළාත් පාලන ආයතන වෙත එනම්, මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා වෙත පවරන ලදි.
1993 වසරේ දී සුළු පරිමාණ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා විමධ්‍යගත කරන ලද බලතල නැවත පවරාගෙන 2000 අංක 53 දරන සංශෝධිත පවතින් ප්‍රකාශයට පත් කරන ලද, 1159/22 දරන ගැසට් නිවේදනයට අනුව, එම ගැසට් නිවේදනයේ 'ආ' කාණ්ඩයට අයත් කර්මාන්ත / කටයුතු 45 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල එම පළාත් පාලන ආයතන වෙත පවරා දෙන ලදි.

ඉන්පසු නැවතත්, අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නියමිත කටයුතු 'අ' , 'ආ' සහ 'ඇ' වශයෙන් කාණ්ඩ තුනක් යටතේ ප්‍රකාශයට පත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 2008 පෙබරවාරි 14 දින පළාත් පාලන ආයතන වෙතපවරා තිබූ බලතල නැවතත් මධ්‍යම පරිසර අධිකාරියට පවරා ගන්නා ලද අතර, 2008.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත ගැසට්

නිවේදනයේ 'ආ' කාණ්ඩයට අයත් නියමිත කටයුතු සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල නැවතත්, පළාත් පාලන ආයතන වලට පවරා දෙන ලද අතර, එම ආයතන ඒ අනුව කටයුතු කරන ලදි.

11.3 දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීම් කමිටුව (DELEC)

- 1995 වසරේ දී දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීමේ කමිටුව නමින්, කමිටු සෑම දිස්ත්‍රික්කයක් පාසාම පිහිටුවීමේ පරිපාලනමය ක්‍රියාවට නංවන අතර, මෙම කමිටුවේ සභාපති වශයෙන් අදාල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කටයුතු කරයි.
- මෙම කමිටුවේ අනිකුත් සාමාජිකයන් වනුයේ;
- සෞඛ්‍ය සෙවා පළාත් අධ්‍යක්ෂ
- ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
- දිසා වන නිලධාරී
- පළාත් පාලන සහකාර කොමසාරිස්
- වන ජීවී දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ප්‍රධානී
- දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන්
- එම පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්
- එම පරිපාලන දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්

මෙම කමිටුවේ ලේකම් වශයෙන් ප්‍රාදේශීය පරිසර නිලධාරියෙක් කටයුතු කරනු ඇත.

එසෙම අවශ්‍යතාවය මත මෙම කමිටුව සඳහා වෙනත් සාමාජිකයන් හා නියෝජිතයන් පත් කළ හැකිය.

මෙම කමිටුවේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික වැරදි හෝ අක්‍රමිකතා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කර, ඊට අදාල ක්‍රියාත්මක කළ යුතු නිර්දේශයන් අදාල ආයතන වන පොලීසිය, සෞඛ්‍ය සෙවා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ පළාත් ආයතන ලවා සිදුකරවීමය.

මෙම කමිටුවේ මූලික කර්තව්‍යය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමය.

මෙම කමිටු රැස්වීම් සෑම මසකම, සෑම දිස්ත්‍රික්කයකම, දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබයි.

12.0 මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩ පිළිවෙල

12.1. හැඳින්වීම

පරිසර ආරක්ෂණය සඳහා පළාත් කාර්යාල වෙත පවරා ඇති බලතල අතරින් ප්‍රධානතම නෛතික ක්‍රියාවලිය වනුයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේ. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී ජාතික වශයෙන් පනවා ඇති, අපද්‍රව්‍ය පිට කිරීම සඳහා වූ ප්‍රමිතීන් හා උපමාන, වායු විමෝචන හා ශබ්ද මට්ටම් අනුව ක්‍රියාත්මක කිරීම තුලින් පාරිසරික ආරක්ෂාව මෙම බලපත්‍ර ක්‍රමය තුලින් තහවරු කෙරේ. ශ්‍රී ලංකාවේ වර්තමානය දෙස බැලීමේ දී පෙනී යන්නේ මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමට ප්‍රථම එනම්, මීට දශක දෙකකට හෝ තුනකට පෙර ස්ථානගත කරන ලද කර්මාන්ත වලින් විශාල වශයෙන් පාරිසරික ගැටළු ඇති වී තිබෙන බවය.

කාර්මික අපද්‍රව්‍යන්ද (පිලියම් කල හෝ නොකළ) ආසන්නතම ජල ප්‍රවාහ වන ගංඟා, වැව් සහ මුහුදු වැනි නිදහස් පරිසරයට මුදාහැරීම සාමාන්‍යයෙන් සිදු වේ. ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය විසින් පොදු මහජනතාවගේ ඉල්ලුම් සඳහා අවශ්‍ය වන ජලය සපයා ගනු ලබන්නේ ගංඟා වලිනි. එහෙයින් අපද්‍රව්‍ය ජල මූලාශ්‍ර වලට මුදා හැරීම විශාල ප්‍රශ්නයක් වී ඇත. පොදු ජනතාවගේ පානීය ජල ප්‍රභව අපවිත්‍ර වීම කෙරෙහි මතුපිට ජල දූෂණයට අමතරව භූගත ජල දූෂණය ද බලපානු ලබයි.

පරිසරයට අපද්‍රව්‍ය මුදා හැරීම සම්බන්ධව වර්තමානයේ පවතින ප්‍රමිතීන් මඟින් භූගත ජලය නැවත පිරීම සහ එහි ආරක්ෂාව යන කරුණු ආවරණය නොවේ.

නෛතිකව බැඳී පවතින නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍රයන්හි නිර්දේශිත ක්‍රියාකාරකම් අඩංගු වී ඇත. එහෙයින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තුලින් නිකුත් කරන්නා වූ කොන්දේසි කඩකිරීම ජාතික පාරිසරික පනත අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. නිර්දේශිත ක්‍රියාකාරකම් වලින් වැඩි සංඛ්‍යාවක් බස්නාහිර පළාත තුල පිහිටා ඇත. මධ්‍යම පරිසර අධිකාරිය සතුව ඇති දත්ත අනුව මහා පරිමාන හා මධ්‍යම පරිමානයෙන් පරිසර දූෂණයට දායක වන කර්මාන්තශාලා වලින් 37% ක් බස්නාහිර පළාත තුල පිහිටා ඇත. මධ්‍යම පළාතේ එම අගය 10% ක් වන අතර සහ දකුණු පළාතේ එම අගය 13% සහ 40% ක් වන ඉතිරිය අනකුත් පළාත් වන සබරගමුව, නැගෙනහිර, උතුරු මැද, ඌව, උතුර සහ වයඹ පළාත් වල පිහිටා ඇත. මෙම කර්මාන්ත සමීක්ෂණය අදාල පළාත් වල පරිසර නිලධාරීන් විසින් කරන ලද අතර, ඒ සඳහා මහ පෙන්වීම් පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් ලබාදෙන ලදි.

නිර්දේශිත ක්‍රියාකාරකම් සඳහා නිකුත් කරන පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අළුත් කළ යුතු වේ. එමෙන්ම, යම් කර්මාන්ත කරුවෙක් තම බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට පටහැනි ලෙස ක්‍රියාකර ඇති බව ඔප්පු වුවහොත් එම බලපත්‍ර අවලංගු කිරීමේ බලතල ද අධිකාරිය සතු වේ. එම අවලංගු කිරීමකින් පසු යම් කෙනෙක් අභියාචනාවක් ඉදිරිපත් කරන්නේ නම්, පාරිසරික අමාත්‍යාංශයේ ලේකම්වරයාට එය ඉදිරිපත් කළ යුතු අතර, එතුමාගේ තීරණය ඒ සම්බන්ධයෙන් වූ අවසාන තීරණය වේ.

12.2 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය

2015 වර්ෂයේ දී "අ" කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 1,549 ක් සහ "ආ" කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 1,274 ක් අලුතින් නිකුත් කර ඇති අතර "අ" කාණ්යේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 4,637 ක් සහ "ආ" වර්ගයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 1,114ක් අළුත් කරන ලදී.

වගුව 12.1 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය පලාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම

පලාත	දිස්ත්‍රික්කය	නිකුත්කල බලපත්‍ර සංඛ්‍යාව						අළුත්කල බලපත්‍ර සංඛ්‍යාව					
		2013		2014		2015		2013		2014		2015	
		"A"	"B"	"A"	"B"	"A"	"B"	"A"	"B"	"A"	"B"	"A"	"B"
බස්නාහිර	කොළඹ	123	91	525	341	311	218	530	116	932	226	834	181
	ගම්පහ	88	82	305	315	231	161	208	94	407	40	716	115
	කළුතර	42	43	168	112	147	91	230	57	350	102	282	65
මධ්‍යම	නුවර	86	60	195	146	80	44	132	38	186	66	404	71
	මාතලේ	25	41	118	29	46	24	102	29	77	20	204	52
	නුවරඑලිය	12	0	25	38	06	10	12	2	54	9	41	04
දකුණ	ගාල්ල	42	55	125	135	50	60	114	73	178	56	161	74
	මාතර	49	40	131	77	15	17	110	49	156	36	167	101
	හම්බන්තොට	36	30	95	68	19	36	79	16	92	26	184	30
සබරගමුව	කෑගල්ල	65	46	108	202	109	101	124	51	76	50	348	95
	රත්නපුර	88	46	141	199	107	99	120	32	61	49	267	73
වයඹ	අනුරාධපුරය	90	59	169	51	119	16	129	62	167	62	181	19
	පොලොන්නරුව	9	32	119	105	09	08	36	11	26	8	99	14
නැගෙනහිර	ත්‍රිකුණාමලය	49	34	104	45	08	22	71	41	29	11	127	49
	අම්පාර	66	88	170	140	10	15	67	61	25	39	110	54
	මඩකලපුව	26	102	116	117	13	19	42	41	27	26	98	42
	වවුනියාව	16	10	57	15	0	0	15	0	33	11	0	0
	මන්නාරම	1	1	67	106	59	80	1	0	3	1	31	05
ඌව	බදුල්ල	31	23	145	50	21	31	29	8	62	19	151	34
	මොනරාගල	22	26	90	74	14	19	10	7	35	17	99	23
උතුර	යාපනය	30	18	138	76	25	11	22	5	73	30	106	11
	කිලිනොච්චිය	1	7	27	125	16	14	0	0	1	0	15	0

	මුලතිවු	9	4	31	40	0	18	5	0	11	0	11	0
ඔයිඩ	කුරුණෑගල			5	7	107	136			0		0	01
	පුත්තලම			1	2	27	24			0		01	01
එකතුව		1006	938	3175	2615	1549	1274	2188	793	3061	904	4637	1114

12.3 නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

යම් ස්ථානයක නව කර්මාන්තයක් ස්ථානගත කිරීමට ප්‍රථම අධිකාරියේ නිර්දේශය ලබා ගැනීම මූලික අවශ්‍යතාවන් වන අතර එමඟින් එම කර්මාන්තය නුසුදුසු ප්‍රදේශයක ස්ථානගත වීම වැළැක් වේ .මෙම පාරිසරික නිර්දේශ නිකුත් කිරීම තුලින් නුසුදුසු ස්ථානයන් හි නුදුසු කර්මාන්ත ස්ථානගත කිරීම වළක්වාගත හැකි වී තිබෙන අතර මේ නිසා කර්මාන්තකරුවන්ට නියම ස්ථානයේ නියම කර්මාන්තය අදාල පරිසර දූෂණ පාලන පිරිවිතරයන් අනුගමනය කිරීම තුලින් ස්ථානගත කිරීමට හැකියාව ලැබී ඇති නිසා ඔවුන්ටද විශාල වශයෙන් ප්‍රතිලාභ අත් වී තිබේ .එමෙන්ම සුදුසු ස්ථානයන්හි සුදුසු කර්මාන්ත ස්ථානගත කිරීම තුලින් අසල්වාසීන්ටද පරිසර දූෂණයෙන් හෝ මහජන පීඩාවන්ගෙන් තොරව වාසය කිරීමේ හැකියාව ලැබී ඇත .කෙසෙ වෙතත් 2000 වර්ෂයේ දී නව කර්මාන්ත 80 ක් පමණ වන ක්‍රියාකාරකම් සඳහා නිර්දේශ නිකුත් කලද එය 2015 වසර වන විට සම්පූර්ණ නිර්දේශ කිරීම සඳහා ඉල්ලීම්1877 ක් ඉදිරිපත් වුව ද එයින් අනුමාන කිරීම් 1,278 ක් ද ප්‍රතික්ෂෙප කිරීම් 45 ක්ද වාර්ථාකල හැක .මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල ස්ථාපනය කිරීමෙන් පසු නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ ලබා දීම එම කාර්යාල මඟින් සිදු කරනු ලැබේ.නව කර්මාන්ත පිහිටුවීම සඳහා නිර්දේශ ලබා ගැනීම

12.2 නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

පලාත	දිස්ත්‍රික්කය	ලැබුන අයදුම්පත් ගණන			අනුමත කරන ලද ප්‍රමාණය			ප්‍රතික්ෂෙප කළ ප්‍රමාණය		
		2013	2014	2015	2013	2014	2015	2013	2014	2015
බස්නාහිර	කොළඹ	144	141	163	125	94	175	0	0	0
	ගම්පහ	149	199	176	12	11	45	1	0	01
	කළුතර	97	97	169	69	72	82	4	4	06
මධ්‍යම	නුවර	126	76	86	57	49	46	11	6	04
	මාතලේ	69	51	81	74	54	48	3	3	0

	නුවරඑලිය	19	12	05	7	9	03	1	0	0
ද	ගාල්ල	68	98	76	56	75	67	3	6	06
	මාතර	70	65	40	55	64	29	3	8	07
	හම්බන්තොට	34	35	33	19	20	17	0	0	03
සබරගමු	කෑගල්ල	78	73	98	57	60	59	0	1	01
	රත්නපුර	67	40	77	45	53	44	1	0	0
ව	අනුරාධපුරය	105	78	79	78	25	26	0	4	01
	පොලොන්නරුව	28	34	29	6	9	13	0	0	0
නැගෙනහිර	ත්‍රිකුණාමලය	74	18	14	62	17	14	0	3	0
	අම්පාර	67	18	33	51	23	38	4	5	01
	මඩකලපුව	118	69	72	109	82	49	0	0	02
	මන්නාරම	12	17	16	6	16	16	0	0	0
	වවුනියාව	28	40	34	8	27	17	0	1	0
උඩ	බදුල්ල	92	63	37	58	32	32	19	7	05
	මොනරාගල	52	32	42	37	28	25	0	0	01
ව	යාපනය	81	72	74	72	47	35	2	0	02
	කිලිනොච්චිය	97	66	124	87	60	110	1	0	04
	මුලතිවු	100	145	67	68	136	66	0	0	0
බයඹ	කුරුණෑගල	14	23	214	4	10	194	3	0	01
	පුත්තලම	12	22	38	2	7	28	0	0	0
එකතුව		2217	1584	1877	1395	1080	1278	128	48	45

12.4. පරිසර දූෂණය, ඉන් ඇතිවන පීඩාව සහ ස්වාභාවික සම්පත් අධිපරිභෝජනය සම්බන්ධ මහජන පැමිණිලි විසඳීම.

2015වසරේ දී කර්මාන්ත වලින් සිදුවන්නා වූ දූෂණයට අදාල පැමිණිලි 1,802 ක් සහ ස්වාභාවික සම්පත් අනිසි ලෙස පරිහරණය කිරීමට අදාල පැමිණිලි 589 ක් වශයෙන් පැමිණිලි 2,391 ක් පළාත් කාර්යාල මඟින් හසුරුවා ඇත.

ඒ ඒ පළාත් කාර්යාල බල ප්‍රදේශය තුල සිටින්නා වූ මහජනායාගෙන් ලැබෙන පාරිසරික පැමිණිලි සම්බන්ධයෙන් එනම්, කර්මාන්තයක් පවත්වාගෙන යාමෙන් ඇති වන්නා වූ පාරිසරික දූෂණ හෝ වෙනත් යම් කටයුත්තක් පවත්වාගෙන යාමෙන් ඇතිවන්නා වූ පාරිසරික දූෂණ හෝ ස්වාභාවික සම්පත් අනිසි ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් ලැබෙන්නා වූ මහජන පැමිණිලි සම්බන්ධයෙන් පළාත් කාර්යාල විසින් කටයුතු කරනු ලැබේ. මෙසෙ ලැබෙන පාරිසරික පැමිණිලි බෝහෝ විට සුදුසු පියවර ගැනීම සඳහා අදාළ ආයතනවලට යොමු කරන ලද අතර, මධ්‍යම පරිසර අධිකාරියට ඒ සම්බන්ධව පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය යැයි හැඟේ නම්, ඒ පිළිබඳව සිදු කරන්නා වූ ස්ථානීය පරීක්ෂණයකින් පසු අදාල පරිසර දූෂණය හෝ මහජන පීඩාව අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.

වගුව 12.3 2015 වසර තුලදී හසුරුවන ලද පැමිණිලි

දිස්ත්‍රික්කය	ලැබුන පැමිණිලි ප්‍රමාණය		විසඳන ලද පැමිණිලි ප්‍රමාණය		වෙනත් ආයතන සඳහා යොමුකල පැමිණිලි ප්‍රමාණය
	EPC	NRM	EPC	NRM	
කොළඹ	453	42	7	3	0
ගම්පහ	281	60	9	1	15
කළුතර	286	44	3	1	42
නුවර	88	52	31	25	37
මාතලේ	16	6	6	0	1
නුවරඑලිය	3	1	2	0	10
ගාල්ල	79	93	34	29	23
මාතර	65	27	1	0	10
හම්බන්තොට	40	6	9	1	3
කෑගල්ල	113	66	59	39	2
රත්නපුර	49	77	12	33	5
අනුරාධපුරය	64	1	11	0	1
පොලොන්නරුව	6	0	0	0	0
ත්‍රිකුණාමලය	6	0	0	0	0
අම්පාර	1	0	0	0	0
මඩකලපුව	11	0	9	0	0
මන්නාරම	0	1	0	1	0
වවුනියාව	0	0	0	0	0
බදුල්ල	37	44	1	0	3
මොනරාගල	26	26	8	4	1
යාපනය	22	2	18	1	7
කිලිනොච්චිය	10	7	6	0	9
මුලතිව්	2	0	2	0	0
කුරුණෑගල	94	15	47	5	2
පුත්තලම	50	19	31	8	0

දිස්ත්‍රික්කය	ලැබුන පැමිණිලි ප්‍රමාණය		විසඳන ලද පැමිණිලි ප්‍රමාණය		වෙනත් ආයතන සඳහා යොමුකල පැමිණිලි ප්‍රමාණය
	EPC	NRM	EPC	NRM	
එකතුව	1802	589	306	150	180

12.5. ISO 14000 තත්ත්ව සහතිකකරණය පිළිබඳ බස්නාහිර පළාත් කාර්යාලයේ දායකත්වය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ලබාදෙන ISO 14000 ප්‍රමිති සහතිකය කර්මාන්තශාලා සඳහා ලබාදීම පිණිස, මධ්‍යම පරිසර අධිකාරියේ බස්නාහිර පළාත් කාර්යාලය තාක්ෂණික හා නීතිමය ගැටළු වලදී විශෙෂඥ දැනුම ලබාදෙයි.

12.6. පරිසර කළමනාකරණය

12.6.1. මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය (IEE)

1993 වසරේ සිට සියළු ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියකට යටත්විය යුතුය. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති, කර්මාන්ත, උද්‍යාන වැඩි දියුණු කිරීම ආදී මහා පරිමාණ නියමිත කටයුතු මෙම ක්‍රියාවලියට අයත් වේ. පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියේ දී මහා පරිමාණ ව්‍යාපෘතීන් පරිසර බලපෑම් මුල් අවධියේ ම හඳුනාගෙන එම බලපෑම් අවම කිරීමේ අවශ්‍ය නිර්දේශ සපයනු ලැබේ. මේ නිසා ව්‍යාපෘති යෝජකට ව්‍යාපෘතියේ මුල් අදියරේම පරිසර බලපෑම් අවම කර ගැනීමට හැකි වේ.

පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට හෝ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියකට යටත් ව්‍යාපෘති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම පළාත් කාර්යාල මඟින් සිදු කරනු ලැබේ .

පහත දැක්වෙන්නේ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියට භාජනය වීමට යෝජනා වූ ව්‍යාපෘතීන් පිළිබඳ විස්තරය.

වගුව 12.4 මූලික පාරිසරික පරීක්ෂණ) IEE / (පරිසර බලපෑම් ඇගයීම) EIA (නියමයන්ට අනුකූලව201 5 වසර තුළදී අනුමත වූ ව්‍යාපෘති ලැයිස්තුව.

පලාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන			අනුමත කල ගණන			ප්‍රතික්ෂෙප කළ		
		2013	2014	2015	2013	2014	2015	2013	2014	2015
බස්නාහිර	කොළඹ	0	1	03	0	0	0	0		0
	ගම්පහ	1	0	38	0	0	04	0		01
	කළුතර	6	3	19	2	2	02	0		0
දකුණ	ගාල්ල	6	10	04	0	2	07	0	1	01
	මාතර	0	0	02	0	4	02	0		0
	හම්බන්තොට	8	1	03	0	2	03	0		0
වයඹ	කුරුණෑගල	89	81	78	73	70	67	2	5	02
	මාතලේ	3	7	5	7	15	14	0		0
	පුත්තලම	51	78	64	153	89	76	4		17

පලාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන			අනුමත කල ගණන			ප්‍රතික්ෂෙප කළ		
		2013	2014	2015	2013	2014	2015	2013	2014	2015
සබරගමු	කෑගල්ල	6	7	1	4	4	06	0		0
	රත්නපුර	3	4	4	3	3	04	0		0
ඌව	බදුල්ල	18	99	103	37	69	135	0		02
	මොනරාගල	5	6	02	1	5	02	0		0
නැගෙනහිර	ත්‍රිකුණාමලය	51	8	0	13	9	02	0		0
	අම්පාර	10	0	1	2	0	0	0		0
	මඩකලපුව	8	0	4	1	0	02	0		0
	මන්නාරම	3	0	0	0	0	0	0		0
	වවුනියාව	1	0	0	0	0	0	0		0
උතුරුමැද	අනුරාධපුරය	5	2	3	0	0	0	0		0
	පොලොන්නරුව	2	2	6	0	0	0	0		0
උතුර	යාපනය	1	0	2	0	0	02	0		0
	කිලිනොච්චි	0	0	0	0	0	0	0		0
	මුලතිවු	3	0	0	0	0	0	0		0
එකතුව		338	309	342	342	272	328	15	6	23

2015 වසර තුල දී අයදුම්පත් 342ක් ලැබුණු අතර ඉන් 328ක් සඳහා අනුමැතිය ලබාදුන් අතර අපේක්ෂිත තත්වයේ නොවන හෙයින් අයදුම්පත් 23ක් (2014 වසරේ අයදුම්පත් ද ඇතුළුව) ප්‍රතික්ෂෙප කරන ලදි.

12.6.2 ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම.

ඒ ඒ ව්‍යාපෘති යෝජකයන් විසින් ඉදිරිපත් කරන්නා වූ ඉල්ලුම් පත්‍ර අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් පරිසරයට සිදු වන්නා වූ අහිතකර බලපෑම් අවම කිරීමට අදාල කොන්දේසි සමඟ මෙම පාරිසරික නිර්දේශ නිකුත් කරනු ලැබේ. ඒ අනුව, ගත වූ වසර තුල හෝටල්, දැව හෙළීම්, විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම් හා ඉඩම් කට්ටි කිරීම ආදී වශයෙන් වූ ව්‍යාපෘතීන් 5,276 (පසුගිය වසරේ අයදුම්පත් ද ඇතුළුව) ක් සඳහා පහත දැක්වෙන පරිදි පාරිසරික නිර්දේශ පළාත් කාර්යාල විසින් නිකුත් කරන ලදි. සංවර්ධිත ක්‍රියාවලියේ මූලික සැලසුම් අවධියේ ම පාරිසරික බලපෑම් හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදවීමට ඉහත සඳහන් ක්‍රියාවලිය පහසුකම් සලසයි.

වගුව 12.5 2015 වසරේදී ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා ලබාදුන් පාරිසරික නිර්දේශ ලැයිස්තුව

පලාත	දිස්ත්‍රික්කය	ලැබුන අයදුම්පත් ගණන	අනුමත කරන ලද	ප්‍රතික්ෂෙප කළ	පැමිණිලි පසුවිපරම්
බස්නාහිර	කොළඹ	102	105	02	0
	ගම්පහ	351	243	05	0
	කළුතර	404	403	14	0
දකුණ	ගාල්ල	73	95	03	08
	මාතර	49	69	03	03
	හම්බන්තොට	47	47	03	02
වයඹ	කුරුණෑගල	304	564	01	22
	පුත්තලම	164	620	0	0

පලාත	දිස්ත්‍රික්කය	ලැබුන අයදුම්පත් ගණන	අනුමත කරන ලද	ප්‍රතික්ෂෙප කළ	පැමිණිලි පසුවිපරම්
	නුවරඑලිය	58	135	0	03
සබරගමුව	කෑගල්ල	0	149	02	05
	රත්නපුර	0	304	0	0
ඌව	බදුල්ල	516	517	0	01
	මොනරාගල	517	370	01	03
නැගෙනහිර	ත්‍රිකුණාමලය	380	380	0	0
	අම්පාර	102	114	0	0
	මඩකලපුව	118	185	0	09
	මන්නාරම	0	163	04	01
	වවුනියාව	0	33	0	0
වයඹ	අනුරාධපුරය	164	75	01	06
	පොලොන්නරුව	18	32	0	0
උතුර	යාපනය	06	20	0	03
	කිලිනොච්චිය	20	13	0	0
	මුලතිවු	192	164	0	0
බස්නාහිර	කුරුනෑගල	80	328	04	03
	පත්තලම	25	148	02	03
එකතුව		3690	5276	45	72

13.0 මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශෙෂ ව්‍යාපෘති.

13.1 "පිළිසරු" ජාතික සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

13.1.1 හැඳින්වීම

අක්‍රමවත් සන අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රී ලංකාවේ විශාලතම සහ ප්‍රධානතම පාරිසරික ගැටළුවක් බවට පත් වී ඇත. කසළ එකතු කිරීමේ, කසළ ප්‍රවාහනය කිරීමේ, අතරමැදි ප්‍රතිකර්ම යෙදීමේ ක්‍රමවේදයක් සහ සුදුසු අවසාන බැහැරලීමේ ක්‍රමවේදයක් නොමැති වීම ශ්‍රීලංකාව තුල සන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළු තවත් උග්‍රකරවීමට හේතු වී ඇත. ශ්‍රී ලංකාව තුල වර්තමානයේ පවතින අක්‍රමවත් කසළ බැහැරලීමේ ක්‍රියාකාරකම් මගින් මහජනයා වෙත විවිධ වූ පාරිසරික ගැටළු මෙන්ම විවිධ පීඩාකාරී තත්ත්ව උද්ගත කර ඇත. මෙම ක්‍රියාකාරකම් වල අවසාන ප්‍රතිඵලය වනුයේ සමාජය විවිධ වූ සෞඛ්‍යමය, සමාජමය, ආර්ථිකමය සහ සංස්කෘතිකමය ගැටළු රැසකට අඛණ්ඩව මුහුණ දීමට සිදුවීමයි.

දිවයිනේ බොහෝමයක් ප්‍රදේශ තුළ කසළ එකතු කිරීම සහ බැහැරලීම සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් සහ සම්පත් නොමැති වීමෙන් පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ වලද කිසිදු පාලනයකින් තොරව කසළ බැහැරලීම සහ විසිරීම සිදු කරනු ලැබේ. බොහෝ ප්‍රදේශවල ගෘහස්ථ සහ කර්මාන්ත ශාලා වලින් නිපදවන බොහොමයක් කසළ අවසාන බැහැරලීම සඳහා ක්‍රමවත් පහසුකම් නොමැත. මෙලෙස අක්‍රමවත් ලෙස බැහැරලන කසළ මගින් කාණු පද්ධතිවල ජලය ගලා යෑම අවහිර වන අතර, රෝග වාහකයින් එනම්, මැස්සන්, මදුරුවන් සහ මීයන් සඳහා අභිජනන ස්ථාන සපයයි. ස්වභාවික ස්ථාන වල සිදුවන විවෘත කසල බැහැරලීම එමගින් මතුපිට හා භූගත ජලය අපිරිසිදු වීම සිදුවන අතර, අනවසර ලෙස ඉඩම් අත්පත්කර ගැනීමටද එමගින් අවස්ථාව උදාවේ. අඩු උෂ්ණත්ව තත්ත්ව යටතේ කසළ විවෘත දහනයද විශාල වශයෙන් පැතිර පවතී. එමගින් වායු දූෂණය හා විවිධ වූ භයානක සෞඛ්‍යමය ගැටළු උද්ගත කරයි.

අදාළ අණපනත් මගින් ශ්‍රී ලංකාව තුළ සන අපද්‍රව්‍ය කළමනාකරණයේ සම්පූර්ණ වගකීම පැවරී ඇත්තේ පළාත් පාලන ආයතන වලට වේ. මහ නගර සභා ආඥා පනත, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත් මගින් සන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල සම්පූර්ණ වගකීම අදාල පළාත් පාලන ආයතන වෙත පවරා ඇති නමුත් ඔවුන්ගේ දැක්ම තුළ වැඩිමනත් අවධානය යොමු කර ඇත්තේ භෞතික සම්පත් දියුණු කිරීම කෙරෙහි වන අතර සන අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි දැක්වෙන උනන්දුව සාපේක්ෂ වශයෙන් අවම තත්වයක පවති. මෙනිසා සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය සම්පත් ප්‍රමාණයද සාපේක්ෂව අඩු තත්වයක පවති.

13.1.2 පිළිසරු ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම.

ශ්‍රී ලංකාවේ බොහෝමයක් ප්‍රදේශ වල පළාත් පාලන ආයතන කසළ කළමනාකරණය කෙරෙහි සාපේක්ෂ වශයෙන් දක්වන අඩු උනන්දුව හේතුවෙන් සාමාන්‍ය ජනතාව මත සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විවිධ වූ ගැටළු සහගත තත්ත්වයන් උද්ගත වී තිබූ අතර පසුගිය වසර කිහිපය තුළ පළාත් පාලන ආයතන මෙම ගැටළු සහගත තත්ත්වය විසඳීම සඳහා ගෙන ඇති පියවරයන් සාපේක්ෂ ලෙස අඩුවී ඇත. මෙම හේතුව මත මධ්‍යම පරිසර අධිකාරිය සහ එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය වෙත පළාත් පාලන ආයතන වලට එරෙහිව නිරන්තරයෙන් මහජන පැමිණිලි යොමු වෙමින් පැවතිණ.

මෙම හේතූන් මත උක්ත ගැටළුව සම්බන්ධයෙන් විසඳුම් ලබාදීම සඳහා එවකට පැවති පරිසර හා

ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගේ මග පෙන්වීම මත ''පිළිසරු" නමින් ජාතික සන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ මග පෙන්වීම මත අනෙකුත් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ සහභාගිත්වයෙන් පිහිටුවන ලදී.

පිළිසරු යන වචනයේ අර්ථය වනුයේ නැවත සම්පතක් කර ගැනීම වේ. මෙය මෙම වැඩසටහනේ ප්‍රධාන අභිප්‍රාය වේ. මෙම වැඩසටහනේ සංකල්පය වනුයේ කසළ ලෙස ඉවත දමන ද්‍රව්‍ය උපරිම ලෙස නැවත ප්‍රයෝජනයට ගැනීම සහ අවශෙෂ කසළ පරිසර හිතකාමී ලෙස අවසාන බැහැරලීම සිදු කිරීමයි.

මෙම ගැටළුව කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම මත ජාතික වශයෙන් සම්බන්ධීකරණයක් ලබාදීම සඳහා එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් පිළිසරු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඒ සඳහා 2007 ජූලි 25 දින න්‍යායාත්මක වශයෙන් අවසර ලබා දෙන ලදි.

මෙම වැඩසටහනේ පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුලත් වේ.

- ජාතික කසළ කළමනාකරණ ප්‍රතිපත්තියක් සැකසීම.
- කසළ කළමනාකරණය කෙරෙහි නිරත වී සිටින පිරිස් සඳහා ධාරිතා වර්ධනය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පළාත් පාලන ආයතන වල පවතින කසළ කළමනාකරණ වැඩසටහන් වැඩි දියුණු කිරීමට සහ නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කරන තාක්ෂණික සහය සහ අනෙකුත් සම්පත් ලබා දීම.
- සම්පත් හුවමාරුව සහ උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම තුලින් කසළ කළමනාකරණ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම.
- කසළ කළමනාකරණ වැඩසටහන් අධීක්ෂණය කිරීම.
- දීර්ඝ කාලීන යොමුවක් වශයෙන් වගකිවයුතු පාර්ශවයන් අදාල කාර්යයන් නිසි පරිදි සිදු නොකරන්නේ නම්, ඊට එරෙහිව නීතිමය පියවර ගැනීම.

''ශ්‍රී ලංකාව තුළ සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රවේශයක් " පිළිසරු ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම යන මැයෙන් එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට 2007 දෙසැම්බර් මස 19 වන දින ලැබුණු අනුමැතිය අනුව 2008 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පිළිසරු ව්‍යාපෘතිය මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපිත කෙරිණ.

පිළිසරු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සම්පූර්ණ මග පෙන්වීම ලබා දෙනුයේ සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ උසස් මට්ටමේ ජාතික කමිටුවක් මගින් වන අතර, මෙහි සම සභාපතිත්වය පරිසර අමාත්‍යාංශයේ සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරුන් විසින් උසුලනු ලබයි.

පිළිසරු වැඩසටහන, පිළිසරු ව්‍යාපෘතිය වශයෙන් 2008 ජනවාරි මස සිට මූලිකව අවුරුදු 3ක කාලයක් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපිතව ක්‍රියාත්මක කෙරිණ. මූල්‍යමය ප්‍රතිපාදන ලෙස රුපියල් බිලියන 5.675ක මුදලක් ලබා ගැනීමට බලාපොරොත්තු වූ අතර එම මුදල ප්‍රධාන වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට අපේක්ෂිත විය.

පිළිසරු වැඩසටහන මගින් 2008 - 2010 අතර කාල සීමාව තුළ සිදු කිරීමට යෝජිත කාර්යභාරයේ

විශාලත්වය අවබෝධ කර ගත් එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් පිළිසරු වැඩසටහන ව්‍යාපෘතියක් ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපිත කරන ලද අතර පිළිසරු වැඩසටහනට අදාලව ව්‍යාපෘති වාර්තාවේ ඇතුලත් ව්‍යාපෘති ක්‍රියාකාරකම් කාලානුරූපව ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා විශෙෂිත වූ වගකීම් පවරන ලද ව්‍යාපෘති නිලධාරීන් පිරිසක් යොදවා ඇත.

ව්‍යාපෘතියේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් සහ කාලීන අවශ්‍යතාවය මත තවත් ඉදිරි වසර 3ක් සඳහා එනම් 2011 ජනවාරි 01 දින සිට ඉදිරි වසර 3 සඳහා මෙම ව්‍යාපෘතියේ කාල සීමාව දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ඒ අනුව 2011-2013 තෙවසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර එහිදී විශෙෂයෙන්ම මෙතෙක් නිම කිරීමට නොහැකි වූ ක්‍රියාකාරකම් මෙම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරන ලදි.

2013 ජූලි 21 දින ගන්නා ලද කැබිනට් තීරණ අනුව 2014 සිට 2018 දක්වා පිළිසරු අදියර - II ලෙස වසර 5කට දීර්ඝ කරන ලදී. නව ක්‍රියාකාරකම් සහ පසුගිය කාලයේදී ඉටු කළ නොහැකි වූ ක්‍රියාකාරකම් ඇතුලත් වැඩ සටහන් සැලැස්මක් 2014 වසර සඳහා සකස් කෙරිණි.

13.1.3 ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය

පිළිසරු වැඩ සටහනේ එක් ආරම්භයක් වශයෙන් පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් 2007 ඔක්තෝම්බර් මාසයේදී කෙටුම්පත් කරන ලදි. එසෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ඝන අපද්‍රව කළමනාකරණ උපාය මාර්ගයන් කෙටුම්පත් කරන ලදි. අදාල ප්‍රදේශ වල තිරසාර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා පළාත් පාලන ආයතන වල පූර්ණ සහයෝගය ලබාගැනීම සඳහා උක්ත උපාය මාර්ග ක්‍රියාවෙහි නැංවීම වර්තමානයේ ඉතා අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත. පිළිසරු වැඩ සටහන මෙම උපාය මාර්ග ක්‍රියාවෙහි යෙදවීමේ අභියෝගය මනාව හඳුනාගෙන ඇත.

13.1.4 අරමුණු

පිළිසරු වැඩ සටහනේ ප්‍රධාන අරමුණු පහකි.

- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික උපාය මාර්ග සැකසීම
- සියළුම පාර්ශවයන් සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව ඵලදායී අධ්‍යාපනයන් හා දැනුමක් ලබාදීම. මේ සඳහා පුහුණු කිරීම් හා ධාරිතා වර්ධනය ඇතුලත් වේ.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ව්‍යාපෘති සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන වලට පහසුකම් සැපයීම
- කාර්යක්ෂම ලෙස අණපනත් ක්‍රියාත්මක කිරීම සඳහා පවතින නීති රාමුව සවිබල ගැන්වීම

ඉහත අරමුණු ගොඩනංවා ඇත්තේ ඝන අපද්‍රව්‍ය හා සබැඳිව පවතින ගැටළු සහ ඝන අපද්‍රව්‍ය හා සබැඳිව විවිධ පාර්ශවයන් විසින් මුහුණපාන ගැටළු සැලකීම තුලින් සහ දිවයින තුල පූර්ණ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීමට විශෙෂයෙන් ප්‍රබල ගැටළු ලෙස සැලකෙන අතරමැදි ප්‍රතිකර්ම යෙදීම සහ අවශෙෂ කසළ පරිසර හිතකාමී ලෙස අවසාන බැහැරලීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම පදනම් කරගෙනය.

13.1.5 විෂය පථය

මෙහිදී සන අපද්‍රව්‍ය ලෙස ගෘහස්ථ කසළ, නාගරික කසළ , වාණිජ කසළ, ආයතනික කසළ සහ සමහරක් කර්මාන්තශාලා කසළ මෙන්ම පළාත් පාලන ආයතන සහ පොදු ස්ථාන වලින් බැහැරලන කසළ අයත් වේ. පිළිසරු ව්‍යාපෘතියේ දැක්ම තුළ පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් ඇතුලත් වේ.

(i) පළාත් පාලන ආයතන වලින් සන අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධව තොරතුරු රැස් කිරීම

පළාත් පාලන ආයතන මගින් වර්තමානයේ සිදුකරන කසළ බැහැරලන ක්‍රමවේදයන්, දැනට ක්‍රියාත්මක කර අතහැර දමා ඇති ව්‍යාපෘති සහ සැලසුම් කටයුතු සඳහා දැනට ඇති සම්පත් පිළිබඳ දත්ත එක්රැස් කිරීම මේ යටතේ සිදු කෙරේ. දත්ත එක්රැස් කිරීමේ දී මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල ජාලය හරහා ප්‍රාදේශිය පරිසර නිලධාරීන්ගේ සහාය ලබා ගැනේ.

(ii) ව්‍යාපෘති වාර්තා විශ්ලේෂණය කිරීම

පළාත් පාලන ආයතන මගින් ඉදිරිපත්කරනු ලබන ව්‍යාපෘති වාර්තා විශ්ලේෂණය කිරීම සහ එමගින් අදාල ව්‍යාපෘති බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබාදෙනු ලැබේ. එම ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත විශ්ලේෂණ ක්‍රමවේදය ගොඩනගා ඇති අතර, ක්ෂෙත්‍රයේ විවිධ තාක්ෂණික විශෙෂඥයන්ගේ සහාය මේ සඳහා ලබාගනු ඇත.

(iii) අපද්‍රව්‍ය වෙන් කිරීම සහ පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම පිළිබඳව පත්‍රිකා ,පුවත්පත්,ගුවන් විදුලිය සහ රූපවාහිනී මාධ්‍ය මඟින් පළාත් පාලන ආයතන මට්ටමින් අධ්‍යාපන හා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම.

(iv) තාක්ෂණික සහාය, ආයතනික ශක්තිය සහ ධාරිතා වර්ධනය

(v) ලෝහ, ප්ලාස්ටික්, විදුරු සහ කඩදාසි කසළ සඳහා එකතු කිරීමේ ජාලයන් ඇති කිරීම තුලින් ප්‍රතිවක්‍රීරණය ශක්තිමත් කිරීම

ඉවතලන ප්ලාස්ටික්, ලෝහ, විදුරු සහ කඩදාසි ප්‍රතිවක්‍රීරණය සඳහා යෝග්‍ය ද්‍රව්‍ය වේ. පෞද්ගලික අංශයේ විවිධ ආයතන, ප්ලාස්ටික් සහ අනෙකුත් ප්‍රතිවක්‍රීරණය කසළ එකතු කිරීම සඳහා යොමු වන ප්‍රවණතාවය වැඩි වෙමින් පවතී. විශෙෂයෙන්ම පාසල් ප්‍රජා සංවිධාන කාන්තා සංවිධාන සහ පළාත් පාලන ආයතන සඳහා විශෙෂිත වූ අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම තුලින් ඉහත කසළ ප්‍රතිවක්‍රීරණය ධෙර්යමත් කිරීම සිදු කරනු ලැබේ.

(vi) පළාත් පාලන ආයතන මට්ටමින් කොම්පෝස්ට් අංගන ඉදිකිරීම

විවෘත භූමි වලට සහ ජලාශ්‍රීත ප්‍රදේශ වලට අවධිමත් ලෙස කසළ බැහැරලීමේ ගැටළුවට විද්‍යාත්මක ලෙස පිළිගත හැකි විසඳුමක් ලබාදීමේ උත්සාහයේ දී පිළිසරු ව්‍යාපෘතිය විසින් පළාත් පාලන ආයතන සඳහා කොම්පෝස්ට් අංගන ඉදිකිරීම මෙන්ම පරිසර හිතකාමී ලෙස කසළ බැහැරලීම සඳහා පහසුකම් සැපයීම ට අවශ්‍ය කරන පියවර සලසා දෙනු ලැබේ. මෙහිදී සුදුසු තාක්ෂණික ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් සන අපද්‍රව්‍ය

කළමනාකරණය සඳහා වූ ජාතික ව්‍යුහය මගින් ස්ථාපිත කරන ලද විශෙෂඥ දැනුමෙන් පරිපූර්ණ වූ තාක්ෂණික කමිටුවේ සාමාජිකයින්ගේ සහාය ලබාගනු ලැබේ.

(vii) අවශෙෂ කසළ බැහැරලීම සඳහා අඩු වියදම් සනීපාරක්ෂක කසළ රඳවන ඉදිකිරීම

සනීපාරක්ෂක කසළ රඳවන සැලසුම් කෙරෙනුයේ පරිසර හිතකාමී ලෙස අවශෙෂ කසළ බැහැරලීම සඳහාය. මෙම සැලසුම තුළ අපදියර සහ වායු පාලනය සිදු කිරීම කසළ මත දෛනිකව පස්

ආවරණයක් යෙදීම, මතුපිට ජලය ගලායෑම පාලනය කිරීම තුලින් මතුපිට සහ භූගත ජලය අපිරිසිදු වීම අවම කිරීම සිදු කෙරේ. පිළිසරු ව්‍යාපෘතිය තුලින් මෙවැනි වූ සනීපාරක්ෂක කසළ රැඳවුම් කිහිපයක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, එමගින් පොකුරු ක්‍රමය යටතේ පළාත් පාලන ආයතනවලට සිය අවශෙෂ කසළ මෙම සනීපාරක්ෂක කසළ රඳවන වලට බැහැර කිරීමට අවස්ථාව සැලසෙ.

(viii) ගෘහස්ථ කොම්පෝස්ට්කරණය ප්‍රචලිත කිරීම

ගෘහස්ථ කොම්පෝස්ට්වලට අයත් වනුයේ මුළුතැන්ගෙයින් සහ ගෙවත්තෙන් ඉවතලන සාපේක්ෂ වශයෙන් කුඩා ප්‍රමාණයක් වූ කාබනික ද්‍රව්‍ය වේ. විවෘත කුඩා අට්ටි මගින් හානි වන උෂ්ණත්වය හා තෙතමනය කොම්පෝස්ට් බදුනක් හෝ වලක් භාවිතා කිරීම තුලින් රඳවා ගැනීමට හැකියාව ලැබේ. මෙවැනි වූ බඳුනක් භාවිතා කිරීම තුලින් අවට අශෝභන වීම අවම වීම සිදුවීම වාසියක් වන බැවින්, ජනාකීර්ණ ප්‍රදේශවලට මෙවැනි කොම්පෝස්ට් බදුන් භාවිතය ඉතා සුදුසු වේ. එබැවින්, පිළිසරු ව්‍යාපෘතිය විසින් පළාත් පාලන ආයතන සඳහා සහන මිලකට කොම්පෝස්ට් බදුන් ලබාදීම තුලින් ගෘහස්ථ කොම්පෝස්ට්කරණය ප්‍රචලිත කිරීමට පියවර ගැනීම සිදු කෙරේ.

(ix) පසුවිපරම් කිරීම හා නිසි ලෙස ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නොකරන පළාත් පාලන ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගැනීම.

පිළිසරු ව්‍යාපෘතිය විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි සිදු නොකරන පළාත් පාලන ආයතනවලට එරෙහිව අවසානයේ දී නීතිමය පියවර ගැනීම මේ යටතේ සිදු කෙරේ. ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගෙන් සහ පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මාර්ගයෙන් පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන් නිරන්තරයෙන් පසුවිපරම් කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කෙරේ.

13.1.6 පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම

පිළිසරු ව්‍යාපෘතියේ 2008-2010 සහ 2011-2013 වර්ෂ සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මවලට අමතරව, අදාල වර්ෂ සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම්වල ද සකස් කර ඇත. ඒ අනුව 2014 වසර සඳහා පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත්තේ අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කල යුතු ප්‍රමාණ හඳුනාගෙන ඇති ආකාරය අනුවය. මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී කාලයෙන් කාලයට හඳුනා ගන්නා ලද ක්‍රියාකාරකම් වලට අනුකූලව වරින් වර විවිධ වූ සංශෝධන වලට ලක් කරන ලදි.

මේ ආකාරයෙන්ම සමහරක් ක්‍රියාකාරකම් සඳහා වර්ෂ ආරම්භයේ වෙන් කිරීමට සැලසුම් කරන ලද ප්‍රතිපාදන ක්‍රියාකාරී අවදියේදී අවශ්‍යතා අනුව විවිධ වූ වෙනස්වීම් වලට ලක් කරන ලද අතර විශෙෂයෙන්ම පිළිසරු ව්‍යාපෘතියේ පාලනයෙන් ස්වායීනව විවිධ අවස්ථාවල පැන නැගුණු විවිධ වූ ගැටළුකාරී තත්ත්වයන්ට අනුව එකී සැලැස්ම වෙනස් කිරීම් වලට භාජනය කිරීමට සිදු විය. අවශ්‍ය අවස්ථාවල මෙලෙස ක්‍රියාකාරී සැලැස්මේ සිදු කරන ලද වෙනස්වීම් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදි.

13.1.7 පිළිසරු ව්‍යාපෘතියේ ප්‍රගතිය

පහසුව සහ පැහැදිලි බව සඳහා පිළිසරු ව්‍යාපෘතියේ ප්‍රගතිය දක්වා ඇත්තේ 2014 වසර ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති සියළු ක්‍රියාකාරකම් වලට අනුකූල වන පරිදිය. කෙසෙ වෙතත් විශෙෂයෙන් සඳහන් කළ යුත්තේ සමහරක් ක්‍රිකාරකම් වල ඉතා අල්ප හෝ කුඩා ප්‍රගතියක් පෙන්වා ඇති අතර සමහරක් ක්‍රියාකාරම් සඳහා කිසිදු ප්‍රගතියක් නොපෙන්වූ අවස්ථා ද ඇති බවය. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඇතැම් අංශ සඳහා නිලධාරීන්ගේ

පුරප්පාඩු පැවැත්වීම වන අතර ඉංජිනේරු අංශය සඳහා 2014 ජුනි මාසයෙන් පසුවද බඳවා ගැනීම් සිදු කරන ලදි.

මේ ආකාරයෙන්ම පිළිසරු ව්‍යාපෘතිය විසින් ක්‍රියාකාරී සැලැස්මේ නොමැති එහෙත් ජාතික වශයෙන් වැදගත් වූ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා මිනිස් ශ්‍රමය මගින් මෙන්ම මූල්‍යමය වශයෙන් සහයෝගය ලබා දෙන ලදි.

13.1.7.1 ක්‍රමවත් අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සැලසීම - පළාත් පාලන බල ප්‍රදේශවල කොම්පෝස්ට් අංගන ඉදි කිරීම.

අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සඳහා තාක්ෂණික හා මූල්‍ය අධාර ඉල්ලා පළාත් පාලන ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන විසින් සිදු කරන ඉල්ලීම් පිළිසරු ව්‍යාපෘතිය විසින් ඇගයීමට ලක් කරනු ලබයි. අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ හා සකස් කිරීමේ අතරමැදි ක්‍රමයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදිකිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිසරු ව්‍යාපෘතියේ මූලික ක්‍රියාමාර්ගයකි.

කොම්පෝස්ට් ව්‍යාපෘති සඳහා මූල්‍යමය ප්‍රතිපාදන ලබා දීමට ප්‍රථම එම ව්‍යාපෘති වල තාක්ෂණික අනුකූලතාවය සහ උපයෝගිතාවය තහවුරු කිරීම සඳහා තාක්ෂණික විශ්ලේෂණ ක්‍රම වේදයක් අනුගමනය කරනු ලැබේ. මෙම විශ්ලේෂණ ක්‍රම වේදය ආරම්භ කරනුයේ පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරින් විසින් ව්‍යාපෘති භූමියේ ප්‍රාථමික හඳුනා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව පිළිසරු ජාතික ව්‍යුහය මගින් පත් කරන ලද විශෙෂඥ කමිටුවක් (තාක්ෂණික උප කණ්ඩායම නම් වූ) මගින් ව්‍යාපෘති වාර්තාව තියුණු තාක්ෂණික විශ්ලේෂණයකට භාජනය කිරීමෙනි.

මේ ආකාරයට පිළිසරු ව්‍යාපෘතිය මඟින් වර්ෂ 2008 සිට 2015 හි ආරම්භය දක්වා කාලය තුළ පළාත් පාලන ආයතන 136 ක් සහ වෙනත් රාජ්‍ය ආයතන (හමුදා කඳවුරු සහ අධ්‍යාපන ආයතන) ආවරණය වන ලෙස කොම්පෝස්ට් අංගන 126 ක් ඉදි කර ඇත. ඇතැම් කොම්පෝස්ට් අංගනවල ඉදිකිරීම් 2009,2010, සහ 2012 වසරවල ආරම්භ කර තිබූ බැවින් ඒවා නඩත්තු කිරීම හෝ පහසුකම් වැඩිදියුණු කිරීම් සඳහා තාක්ෂණික හා මූල්‍යාධාර සැපයීම් පිළිසරු ව්‍යාපෘතිය මගින් 2015 වසර තුල සිදු කරනු ලැබිය.

13.1.7.2 වර්ෂ 2015 දෙසැම්බර් 31 වන විට සියලුම කොම්පෝස්ට් අංගනවල තත්වය

ඉහත සියලුම කොම්පෝස්ට් අංගන 2015 වසරේ ආරම්භය සහ අවසානයේදී ක්‍රියාත්මක වූ තත්ව දර්ශනය වන පහත සඳහන් පසු විපරම් සටහනෙහි දැක්වෙන ආකාරයට වර්ගීකරණය කරන ලදී. මෙය කොම්පෝස්ට් නිශ්පාදනය සිදු කළ අංගන වල තත්වය සතුටුදායක කිරීමටත් ගැටළු සහිත අංගනවල ගැටළු නිරාකරණය කිරීමට උපකාර කිරීම සහ ධෛර්යමත් කිරීමටත් පිළිසරු කාර්ය මණ්ඩලය සිදු කළ කාර්යයන්ගේ ප්‍රතිඵලයකි.

වගුව 13.1 වගුව 01 - කොම්පෝස්ට් අංගන පසු විපරම් සටහන 2015

[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	එකතුව
ව	අනුරාධපුරය	2015 වර්ෂය අරම්භයේදී	2	6	4	4	1	17
		2015 වර්ෂය අවසානයේදී	7	2	4	3	1	17
	පොළොන්නරුව	2015 වර්ෂය අරම්භයේදී		1				1
		2015 වර්ෂය අවසානයේදී	1			1		2
ද	ගාල්ල	2015 වර්ෂය අරම්භයේදී	5	3		1		9
		2015 වර්ෂය අවසානයේදී	6	3				9
	මාතර	2015 වර්ෂය අරම්භයේදී	6	1				7
		2015 වර්ෂය අවසානයේදී	7		1	1		9
	හම්බන්තොට	2015 වර්ෂය අරම්භයේදී	6		1	1		8
		2015 වර්ෂය අවසානයේදී	7			2		9
බ ම බ	නුවර එළිය	2015 වර්ෂය අරම්භයේදී	1	1				2
		2015 වර්ෂය අවසානයේදී	1	1				2
	මහනුවර	2015 වර්ෂය අරම්භයේදී	2	1				3
		2015 වර්ෂය අවසානයේදී	2	2				4
	මාතලේ	2015 වර්ෂය අරම්භයේදී	4					4
		2015 වර්ෂය අවසානයේදී	4					4
සබරගමු	රත්නපුරය	2015 වර්ෂය අරම්භයේදී	1				1	2
		2015 වර්ෂය අවසානයේදී	1			2	1	4
	කෑගල්ල	2015 වර්ෂය අරම්භයේදී	4	1		1		6
		2015 වර්ෂය අවසානයේදී	5	1				6
බස්නා	කොළඹ	2015 වර්ෂය අරම්භයේදී	2	3				5
		2015 වර්ෂය අවසානයේදී	4				1	5
	ගම්පහ	2015 වර්ෂය අරම්භයේදී	3	4		1		8
		2015 වර්ෂය අවසානයේදී	8		1			9
	කළුතර	2015 වර්ෂය අරම්භයේදී	5	2				7
ඌව	බදුල්ල	2015 වර්ෂය අරම්භයේදී	3	1		1		5
		2015 වර්ෂය අවසානයේදී	3	1		1		5
	මොනරාගල	2015 වර්ෂය අරම්භයේදී		1	1			2
		2015 වර්ෂය අවසානයේදී	1		1			2
නැගෙනහිර	අම්පාර	2015 වර්ෂය අරම්භයේදී		3	1			4
		2015 වර්ෂය අවසානයේදී	3	1		2		6
	මඩකලපුව	2015 වර්ෂය අරම්භයේදී		1				1
		2015 වර්ෂය අවසානයේදී	1					1
	ත්‍රිකුණාමලය	2015 වර්ෂය අරම්භයේදී						0

		2015 වර්ෂය අවසානයේදී				1		1
ඛ	කුරුණෑගල	2015 වර්ෂය අරම්භයේදී	8	7	1			16
		2015 වර්ෂය අවසානයේදී	12	4				16
	පුත්තලම	2015 වර්ෂය අරම්භයේදී	2	2		1		5
		2015 වර්ෂය අවසානයේදී	3	1		1		5
ග	යාපනය	2015 වර්ෂය අරම්භයේදී		1	1	1		3
		2015 වර්ෂය අවසානයේදී	2		1			3
මුළු ප්‍රගතිය		2015 වර්ෂය අරම්භයේදී	**54**	**39**	**9**	**11**	**2**	**115**
		2015 වර්ෂය අවසානයේදී	**85**	**16**	**8**	**14**	**3**	**126**

වර්ෂයේ 2015 ආරම්භයේ සහ අවසානයේදී කොම්පෝස්ට් අංගනවල තත්වය සංසන්දනාත්මකව ඉහත සටහනයෙහි අවසානයට දක්වා ඇති සමස්ථ ප්‍රගතිය මඟින් පැහැදිලිව දක්වා ඇත. මෙම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරි කළමනාකාරිත්වය ආශිර්වාදය සහ මඟ පෙන්වීම ඇතිව “පිළිසරු” ව්‍යාපෘති සෙවකයන් ක්‍රමෝපායන් ගණනාවක් අනුගමනය කරන ලදි. නිසි කලට පවත්වන රැස්වීම්,කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ නොකල හෝ කොම්පෝස්ට් අංගනවලට ඉදිකිරීම් අවසන් නොවූ පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් සහ ලේකම්වරුන්ට නිරන්තර සිහි කැඳවීම් සහ ලිපි යැවීම මඟින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට යොමු කිරීම සහ ඉදිකිරීම් අවසන් කර කොම්පෝස්ට්කරණය ආරම්භ කිරීම ඔවුන් දිරි ගැන්වීම වැනි කරුණු ප්‍රධාන මුලෝපායන් අතර වේ. තවද ඉදිකිරීම් සඳහා ගෙවීම් නොකරන ලද සහ ගෙවීම් ප්‍රමාද වී ඇති කොම්පෝස්ට් අංගනයන්හි ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර ගෙවීම් කඩිනම් කිරීමට ද සිදු කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශිය පරිසර නිලධාරින්ද පිළිසරු ව්‍යාපෘති නිලධාරින් සමඟ සම්බන්ධීකරණය වෙමින් ලබා දුන් සහයෝගය සහ උත්සාහයද ඉහත ආකාරයට කොම්පෝස්ට් අංගන ක්‍රමවත් කර ගැනීම සාර්ථක වීමට පිටිවහලක් වූ බව විශෙෂයෙන් සඳහන් කළ යුතුයි.

7.2 මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතියෙහි මූලාධාර මත දිවයින පුරා පිහිටි පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රමවත් කිරීම පිළිබඳ සාකච්ජාව.

වර්ෂ 2015 අගෝස්තු 11 වන දින පැවති සාකච්ජාව සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසෙන මැතිතුමා සහභාගී වූ අතර ජාතික මැදිහත් කමක් සෙ සළකා කොම්පෝස්ට් ව්‍යාපෘති ක්‍රමවත්ව ක්‍රියාත්මක මට්ටමේ පවත්වා ගැනීම සඳහා ක්‍රමවේදය සකසන ලෙස උපදෙස් ලබා ලදී. එහිදි පළාත් පාලන ආයතන වල ලේකම්වරු/කොමසාරිස්වරු ඉදිරිපත් කළ ප්‍රායෝගික ගැටළු කිපයක් සඳහා විසඳුම් ලබා දිය හැකි විය. මෙම ක්‍රමවත් කිරීමේ සාකච්ජාව සඳහා සහභාගීත්වය පහත පරිදි විය.

වගුව 13.2 දිස්ත්‍රික් මට්ටමින් ක්‍රමවත් සැසිවාර පිළිබඳ විස්තර

අංක	අමාත්‍යාංශය/ආයතනය/ පළාත/දිස්ත්‍රික්කය	සහභාගී වූ පළාත් පාලන ආයතනය	සහභාගීවූවන්ගේ වර්ගීකරණය	සහභාගී වූ ගණන
1	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	--	ලේකම්, අතිරේක ලේකම් (පාලන හා ප්‍රවර්ධන) අතිරේක ලේකම් (ස්වාභාවික සම්පත්) අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා සැලසුම්)	4
2	මධ්‍යම පරිසර අධිකාරිය	--	සභාපති අධ්‍යක්ෂ ජනරාල් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත් සංවර්ධන,පරිපාලන හා මුදල්) , නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර දූෂණ පාලන), නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ස්වාභාවික සම්පත් කළමනාකරණ හා පසු විපරම්), නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම්) ව්‍යාපෘති අධ්‍යක්ෂ (පිළිසරු ව්‍යාපෘතිය), අධ්‍යක්ෂ (සැලසුම් හා පසු විපරම් ඒකකය), ව්‍යාපෘති අධ්‍යක්ෂ (අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය), ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්ලාස්ටික් ව්‍යාපෘතිය), ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඝන අපද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය), කළමනාකරු මෙහෙයුම් (සනීපාරක්ෂක කසළ රඳවන කළමනාකරණ ව්‍යාපෘතිය) ව්‍යාපෘති සෙවක මණ්ඩලය (පිළිසරු ව්‍යාපෘතිය)	35
3	පළාත් පාලන දෙපාර්තමේන්තු	--	කොමසාරිස් (බස්නාහිර පළාත්), කොමසාරිස් (දකුණු පළාත්), කොමසාරිස් (සබරගමු පළාත), සහකාර කොමසාරිස් (මධ්‍යම පළාත), කොමසාරිස් (උතුරු මැද පළාත), කොමසාරිස් (වයඹ පළාත), කොමසාරිස් (ඌව පළාත), කොමසාරිස්(නැගෙනහිර පළාත),	08

අංක	අමාත්‍යාංශය/ආයතනය/ පළාත/දිස්ත්‍රික්කය	සහභාගී වූ පළාත් පාලන ආයතනය	සහභාගීවූවන්ගේ වර්ගීකරණය	සහභාගී වූ ගණන
4	දකුණ/ ගාල්ල, මාතර, හම්බන්තොට	ඇල්පිටිය ප්‍රාදේශීය සභාව කරන්දෙණිය ප්‍රාදේශීය සභාව මාතර මහ නගර සභාව පිටබැද්දර ප්‍රාදේශීය සභාව හම්බන්තොට ප්‍රාදේශීය සභාව ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව	කොමසාරිස් ලේකම් තාක්ෂණික නිලධාරී කොම්පෝස්ට් අංගන භාර නිලධාරී මහජන සෞඛ්‍ය පරීක්ෂක පරිසර නිලධාරී සංවර්ධන නිලධාරී	17
5	බස්නාහිර/කොළඹ , ගම්පහ	කොළොන්නාව නගර සභාව ජා ඇල නගර සභාව	ලේකම් සෞඛ්‍ය පරිපාලක මහජන සෞඛ්‍ය පරීක්ෂක කොම්පෝස්ට් අංගන භාර නිලධාරී	05
6	සබරගමුව / රත්නපුරය	කලවාන ප්‍රාදේශීය සභාව බුලත්කොහුවුපිටිය ප්‍රාදේශීය සභාව	ලේකම් මහජන සෞඛ්‍ය පරීක්ෂක කොම්පෝස්ට් අංගන භාර නිලධාරී	06
7	මධ්‍යම පළාත/ මහනුවර , මාතලේ, නුවරඑළිය	තලවකැලේ- ලිදුල ප්‍රාදේශීය සභාව රත්තොට ප්‍රාදේශීය සභාව උඩුනුවර ප්‍රාදේශීය සභාව	ලේකම් මහජන සෞඛ්‍ය පරීක්ෂක කොම්පෝස්ට් අංගන භාර නිලධාරී	08
8	උතුරු මැද පළාත/ අනුරාධාපුරය පොළොන්නරුව	ගල්නෑව ප්‍රාදේශීය සභාව පදවිය ප්‍රාදේශීය සභාවහොරවිපතාන ප්‍රාදේශීය සභාව රාජාංගනය ප්‍රාදේශීය සභාව ඉපලෝගම ප්‍රාදේශීය සභාව තළාව ප්‍රාදේශීය සභාව මැදවච්චිය ප්‍රාදේශීය සභාව රඹෑව ප්‍රාදේශීය සභාව තිරප්පනේ ප්‍රාදේශීය සභාව කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව ගලෙන්බිදුණුවැව ප්‍රාදේශීය සභාව ලංකාපුර ප්‍රාදේශීය සභාව	ලේකම් සංවර්ධන නිලධාරී තාක්ෂණික නිලධාරී මහජන සෞඛ්‍ය පරීක්ෂක කොම්පෝස්ට් අංගන භාර නිලධාරී	36

අංක	අමාත්‍යාංශය/ආයතනය/ පළාත/දිස්ත්‍රික්කය	සහභාගී වූ පළාත් පාලන ආයතනය	සහභාගීවූවන්ගේ වර්ගීකරණය	සහභාගී වූ ගණන
9	වයඹ පළා.ත/ කුරුණෑගල, පුත්තලම	මහව ප්‍රාදේශීය සභාව නිකවැරටිය ප්‍රාදේශීය සභාව මාවතගම ප්‍රාදේශීය සභාව පොල්පතිගම ප්‍රාදේශීය සභාව පුත්තලම ප්‍රාදේශීය සභාව පුත්තලම නගර සභාව වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව	ලේකම් සංවර්ධන නිලධාරී තාක්ෂණික නිලධාරී මහජන සෞඛ්‍ය පරීක්ෂක කොම්පෝස්ට් අංගන භාර නිලධාරී කම්ටු සංවර්ධන නිලධාරී	21
10	ඌව පළාත/ බදුල්ල, මොනරාගල	ඇල්ල ප්‍රාදේශීය සභාව තණමල්විල ප්‍රාදේශීය සභාව	ලේකම් මහජන සෞඛ්‍ය පරීක්ෂක කොම්පෝස්ට් අංගන භාර නිලධාරී	06
11	උතුරු පළාත / යාපනය	වාවකච්චේරිය නගර සභාව යාපනය නගර සභාව	කොමාසාරිස් ලේකම් මහජන සෞඛ්‍ය පරීක්ෂක කොම්පෝස්ට් අංගන භාර නිලධාරී	06
12	නැගෙනහිර පළාත/ මඩකලපුව අම්පාර	කාත්න්කුඩිය නගර සභාව පදියතළාව ප්‍රාදේශීය සභාව මහඔය ප්‍රාදේශීය සභාව සමන්තුරෙයි ප්‍රාදේශීය සභාව දමන ප්‍රාදේශීය සභාව නාමල්ඔය	ලේකම් මහජන සෞඛ්‍ය පරීක්ෂක කොම්පෝස්ට් අංගන භාර නිලධාරී	18
13	ශ්‍රී ලංකා ගුවන් හමුදාව /	ඒකල කටුනායක දියතළාව	Group captain Wing Commander	02

13.1.7.3 දිස්ත්‍රික් මට්ටමින් කොම්පෝස්ට් අංගන ක්‍රමවත් කිරීමේ සැසිවාර

ඇතැම් කොම්පෝස්ට් අංගන සාර්ථකවත් ඇතැම් කොම්පෝස්ට් නිපදවීමට අවැසි මට්ටමින් ක්‍රියාත්මක නොවීමත් වැනි විවිධාකාර තත්ව යටතේ ක්‍රියාත්මක වීම තුළ ඉහත වගුව අනුව පැහැදිලිව පෙනී යනුයේ කොම්පෝස්ට් අංගන ක්‍රමවත් භාවයට පත් කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් වන බවයි. අවශ්‍ය ප්‍රමාණයට සෙවකයන් නොමැති වීම, යටිතල පහසුකම් සහ උපකරණ නොමැතිවීම වැනි කරුණු මෙවැනි තත්ව ඇතිවීමට හේතු වේ. වර්ෂ 2015 ක්‍රියාකාරී සැලැස්ම තුළ,පවතින කොම්පෝස්ට් අංගනවල අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා අමතර මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබූ බැවින් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන කොම්පෝස්ට් අංගන වල ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වා ඒවා ක්‍රමවත් කිරීම තුළින් ඵලදායී කොම්පෝස්ට් නිශ්පාදනයක් ඇති කිරීමට තීරණය කරන ලදී. මෙම ප්‍රගති සමාලෝචන රැස්වීම් අදාළ පළාතේ පළාත් පාලන කොමාසාරිස් මහින් සංවිධානය කළ අතර පළාත්

පාලන ආයතන සභාපති,ලේකම් සහ කොම්පෝස්ට් අංගන භාරකරු ඒ සඳහා සහභාගී වුහ. සෑම කොම්පෝස්ට් අංගනයක් පිළිබඳව සාකච්ඡා කිරීමේදී අදාළ පළාත් පාලන ආයතන නියෝජ්‍ය කරමින් සහභාගී වුවන් කොම්පෝස්ට් නිශ්පාදනය සහ අලෙවිකරණය සම්බන්ධව ඔවුන්ගේ ප්‍රගතිය,ගැටළු සහ ලබා ගත් අත්දැකීම් පිළිබඳව පැහැදිලි කළහ. සිදු කරනු ලබන සියලුම ඉල්ලීම් අදාළ පළාත් පාලන කොමසාරිස්වරයා හරහා ඔහුගේ අත්සනින් පිළිසරු ව්‍යාපෘතිය වෙත හැකි ඉක්මනින් ලැබීමට සැලැස්විය යුතු බවට සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත් කෙරිණි. දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද කොම්පෝස්ට් අංගන ක්‍රමවත් කිරීමේ සමාලෝචන සැසිවාර පිළිබඳ තොරතුරු පහත වගුවෙහි දක්වා ඇත.

වගුව 13.3 දිස්ත්‍රික් මට්ටමින් ක්‍රමවත් කිරීමේ සැසිවාර පිළිබඳ විස්තර

අංක	පළාත/ දිස්ත්‍රික්කය	සහභාගීවූ පළාත් පාලන ආයතන		පැවැති දිනය	සහභාගීවූවන්ගේ වර්ගීකරණය	සහභාවූවන්ගේ ප්‍රමාණය
1	වයඹ / කුරුණෑගල	බිංගිරිය ප්‍රා.ස පන්නල ප්‍රා.ස පොල්ගහවෙල ප්‍රා.ස උඩුබද්දාව ප්‍රා.ස නාරම්මල ප්‍රා.ස ගල්ගමුව ප්‍රා.ස වාරියපොළ ප්‍රා.ස කොබෙයිගනේ ප්‍රා.ස	මාවතගම ප්‍රාදේශීය සභාව රිදීගම ප්‍රා.ස මහව ප්‍රා.ස නිකවැරටිය ප්‍රා.ස අලව්ව ප්‍රා.ස පොල්පතිගම ප්‍රා.ස කුරුණෑගල ප්‍රා.ස කුරුණෑගල මහ නගර සභාව (සුන්දාරාපොළ) කුලියාපිටිය නගර සභාව	2015.08.13	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	102
2	බස්නාහිර / ගම්පහ සහ කොළඹ	මීරිගම ප්‍රා.ස කැලණිය ප්‍රා.ස අත්නගල්ල ප්‍රා.ස සීතාවක ප්‍රා.ස කැලණිය විශ්ව විද්‍යාලය දොම්පේ ප්‍රාස වෛද්‍ය පියය -රා.	ශ්‍රී ලංකා ගුවන් හමුදා - ඒකල ජා ඇළ නගර සභාව , ශ්‍රී ලංකා ගුවන් හමුදාව - කටුනායක	2015.11.05	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	42

අංක	පළාත/ දිස්ත්‍රික්කය	සහභාගීවූ පළාත් පාලන ආයතන		පැවැති දිනය	සහභාගීවූවන්ගේ වර්ගීකරණය	සහභාවූවන්ගේ ප්‍රමාණය
	කළුතර	කළුතර ප්‍රා.ස අගලවත්ත ප්‍රා.ස බණ්ඩාරගම ප්‍රා.ස	බුලත්සිංහල ප්‍රා.ස හොරණ ප්‍රා.ස වලල්ලාවිට ප්‍රා.ස මතුගම ප්‍රා.ස පාලින්දනුවර ප්‍රා.ස	2015.10.30	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	34
3	දකුණ/ ගාල්ල සහ මාතර	හබරාදුව ප්‍රා.ස නාගොඩ ප්‍රා.ස රජගම ප්‍රා.ස යක්කලමුල්ල ප්‍රා.ස කරන්දෙණිය ප්‍රා.ස නියාගම ප්‍රා.ස බද්දේගම ප්‍රා.ස ඇල්පිටිය ප්‍රා.ස	කිරින්ද පුහුල් වැල්ල ප්‍රා.ස කොටපොල ප්‍රා. වැලිගම නගර සභාව මාලිම්බව ප්‍රා.ස මාතර ප්‍රා.ස මුලටියන ප්‍රා.ස මාතර මහා නගර සභාව තිහගොඩ ප්‍රා.ස	2015.07.28 & 2015.07.30	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	92
	හම්බන්තොට	තිස්සමහාරාමය ප්‍රා.ස හම්බන්තොට ප්‍රා.ස අම්බලන්තොට ප්‍රා.ස බෙලිඅත්ත ප්‍රා.ස කටුවන ප්‍රා.ස	තංගල්ල ප්‍රා.ස ලුණුගම්වෙහෙර ප්‍රා.ස වීරකැටිය ප්‍රා.ස අඟුණකොළපැලැස්ස ප්‍රා.ස	2015.08.25	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	44
4	සබරගමුව /රත්නපුරය කෑගල්ල	නීතිවිගල ප්‍රා.ස කුරුවිට ප්‍රා.ස කලවාන ප්‍රා.ස බලන්ගොඩ නගර ස මානවනැල්ල ප්‍රා.ස	කෑගල්ල නගර සභාව රඹුක්කන ප්‍රා.ස යටියන්තොට ප්‍රා.ස බුලත්කොහුපිටිය ප්‍රා.ස රුවන්වැල්ල ප්‍රා.ස	2015.07.18	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	49

අංක	පළාත/ දිස්ත්‍රික්කය	සහභාගීවූ පළාත් පාලන ආයතන	පැවැති දිනය	සහභාගීවූවන්ගේ වර්ගීකරණය	සහභාවූවන්ගේ ප්‍රමාණය
5	මධ්‍යම පළාත මහනුවර//මාතලේ/ නුවරඑළිය	අකුරණ ප්‍රා.ස අඹගමුව ප්‍රා.ස පහතහෙවාහැට ප්‍රා.ස නාවලපිටිය ප්‍රා.ස උඩුනුවර ප්‍රා.ස තලවකැලේ ලිදුල නගර සභාව මාතලේ ප්‍රා.ස මාතලේ මහ නගර සභාව රත්තොට ප්‍රා.ස උකුවෙල ප්‍රා.ස	2015.09.18	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	35
6	උතුරු මැද පළාත අනුරාධාපුරය /පොළොන්නරුව	ගලෙන්බිදුණුවැව ප්‍රා.ස ගල්නෑව ප්‍රා.ස ඉපලෝගම ප්‍රා.ස කහටගස්දීගිලිය ප්‍රා.ස මැදවච්චිය ප්‍රා.ස රජංගනය ප්‍රා.ස රඹෑව ප්‍රා.ස තිරප්පනේ ප්‍රා.ස හොරවිපතාන ප්‍රා.ස කැබිතිගොල්ලෑව ප්‍රා.ස පදවිය ප්‍රා.ස තළාව ප්‍රා.ස තළාව තඹුත්තේගම සිවිල් ආරක්ෂක බලකා කඳවුරු - ගල්කිරියාගම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 6 වන බලකාය - මහකනදරාව සන්නද්ධ බලකා පුහුණු මධ්‍යස්ථානය නුවරගම්පළාත නැගෙනහිර ප්‍රා.ස (සහ අනුරාධාපුරය මහා නගර සභාව) මැදිරිගිරිය ප්‍රා.ස (සහ හිඟුරක්ගොඩ ප්‍රා.ස) ලංකාපුර ප්‍රා.ස	2015.09.19 සහ 2015.10.11	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	40
7	නැගෙනහිර අම්පාර/ මඩකලුපව	මහඔය ප්‍රා.ස පදියතළාව ප්‍රා.ස දමන ප්‍රා.ස නාමල්ඔය ප්‍රා.ස සමන්තුරෙයි ප්‍රා.ස කාතන්කුඩිය ප්‍රා.ස	2015.06.09	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	33

අංක	පළාත/ දිස්ත්‍රික්කය	සහභාගීවූ පළාත් පාලන ආයතන	පැවැති දිනය	සහභාගීවූවන්ගේ වර්ගීකරණය	සහභාවූවන්ගේ ප්‍රමාණය
8	උතුරු පළාත යාපනය	යාපනය මහ නගර සභාව වාවකච්චේරිය නගර සභාව වැලිකාමම දකුණු ප්‍රා.ස	2015.05.27	ලේකම් , අධීක්ෂණ නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණික නිලධාරී	39

කොම්පෝස්ට් අංගන ක්‍රමවත් කිරීමේ වැඩමුළුව වැලිගම

කොම්පෝස්ට් අංගන ක්‍රමවත් කිරීමේ වැඩමුළුව දොම්පේ

13.1.7.4 පවතින සුළු පරිමාණ කොම්පෝසට් අංගන සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් ලබා දීම.

වර්ෂ 2008 සිට පිළසරු ව්‍යාපෘතියේ ආධාර මත ආරම්භ කර තිබූ කොම්පෝස්ට් අංගනවල කොම්පෝස්ට් නිශ්පාදනය නියමාකාරව සිදු කිරීම සඳහා අවැසි යටිතල පහසුකම්වල යම් වැඩිදියුණු කිරීම් සඳහා සහයෝගය සහ මූල්‍ය දායකත්වය සඳහා වූ ඉල්ලීම් 2015 වසරේ සිට පළාත්ආයතන විසින් පිළිසරු ව්‍යාපෘතිය වෙත යොමු කරමින් පවතුනි. මෙම කරුණු හේතුවෙන් 2015ක්‍රියාකාරී සැලැස්ම යටතේ අමතරව ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටි අතර ඒ අනුව රුපියල් මිලියන 2975.5 ක් ලබා දෙන ලදී. ඉහත සඳහන් කළ ආකාරයට අවශ්‍ය තත්ව සමාලෝචනය සඳහා පළාත් පාලන කොමසාරිස් මඟින් පළාත් පාලන ආයතන කැඳවා දිස්ත්‍රික් මට්ටමින් සමාලෝචන සැසිවාර පැවැතිවිය. පහත සඳහන් වගුවෙහි දක්වෙන ආකාරයට පළාත් ආවරණය වන ලෙස පළාත් පාලන කොමසාරිස් සහ පළාත් ඉංජිනේරුවරයාගේ අත්සනින් යුතු ඉල්ලීම් සහ ප්‍රමාණ පත්‍ර ඉදිරිපත් වී ඇත. පිළිසරු ව්‍යාපෘතියේ ඉංජිනේරු කණ්ඩායම සහ අදාළ ව්‍යාපෘති නිලධාරියා විසින් ක්ෂේත්‍ර පර්ක්ෂාවක් සිදු කර කොම්පෝස්ට් නිශ්පාදනය සාර්ථක කර ගැනීමට වඩාත් සුදුසු අවශ්‍යතාවය නිර්දේශ කර ඇත. පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් සවිස්තරාත්මක සිදු කරන ඇගයීමකින් පසු අනුමත කරනු ලබන වැඩිදියුණු කිරීම් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇත. මෙම ක්‍රියාදාමය අනුගමනය

කිරීමෙන් පසු රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාදාමයට අනුකූලව කොන්ත්‍රාත්කරුවකු තෝරා අදාළ වැඩිදියුණු කිරීම නිශ්චිත කාල පරාසය තුළ අවසන් කිරීමේ අරමුණ ඇතිව මධයම පරිසර අධිකාරිය සහ පළාත් පාලන ආයතන අතර ගිවිසුමක් අත්සන් කර ඇත. පහත වගුවේහි දක්වා ඇති පරිදි 2015 වසරේ අග භාගයේදී කොම්පෝස්ට් අංගන වැඩිදියුණු කිරීම් සඳහා ඉදිරිපත් වූ ඉල්ලීම් සඳහා 20% ක ආරම්භයක අත්තිකාරම් මුදල් ගෙවා ඇත.

වගුව 13.4 පවතින කොම්පෝස්ට් අංගනවල වැඩිදියුණු කිරීම් සඳහා සහයෝගය ලබා දීමේ විස්තර

අංක	පළාත	දිස්ත්‍රික්කය	පළාත් පාලන ආයතනය	ඇස්තමේන්තු මුදල	වියදම් කළ මුදල
1	වයඹ	කුරුණෑගල	ගල්ගමුව 11	150,328.00	150,328.00
2	දකුණ	ගාල්ල	බද්දේගම ප්‍රා.ස	1,243,062.00	1,072,827.59
3	දකුණ	මාතර	කිරින්ද පුහුල්වැල්ල ප්‍රා.ස	2,009,518.88	1,226,663.16
4	මධ්‍යම	මාතර	මාතලේ ප්‍රා.ස	899,672.60	776,442.09
5	නැගෙනහිර	අම්පාර	නාමල්ඔය ප්‍රා.ස	512,486.45	102,497.29
6	මධ්‍යම	මතාලේ	මාතලේ මහ නගර සභාව	10,250,000.00	3,216,535.87
7	වයඹ	කුරුණෑගල	කොබෙයිගනේ ප්‍රා.ස	1,789,440.67	1,620,841.65
8	දකුණ	හම්බන්තොට	බෙලිඅත්ත ප්‍රා.ස	999,368.34	871,942.67
9	මධ්‍යම	නුවරඑළිය	අඹගමුව ප්‍රා.ස	2,349,823.60	1,370,276.42
එකතුව				**20,203,700.54**	**10,408,354.74**

13.1.7.5 2015 වසර තුළ ස්ථාපිත කරන ලද නව කොම්පෝස්ට් අංගන සහ අනෙකුත් සන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම්.

ඉඩම්,පාරිසරික බලපත්‍ර,පළාත් පාලන ආයතන කළමනාකාරිත්වයෙහි දායකත්වය වැනි අවශ්‍යතාවයන් සහ 2014 වසර ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රතිපාදන වෙන් වී ඇති ආකාරය සලකා නව කොම්පෝස්ට් අංගන ස්ථාපිත කිරීම සඳහා පළාත් පාලන ආයතනවල ඉල්ලීම මත සහ වෙනත් ආයතනවල ඉල්ලීම් සළකා බලා නව කොම්පෝස්ට් අංගන 09 ක්, පිව වායු ඒකක 06 ක් සහ ජංගම සම්පත් පියසි මධ්‍යස්ථාන දක්වා ඇත. නව කොම්පෝස්ට් අංගන සඳහා රුපියල් මිලියන 1.8 ක් ජංගම සම්පත් පියසි මධ්‍යස්ථාන සඳහා රුපියල් මිලියන 3.75 ක් සහ කසළ දාහකය සඳහා රුපියල් මිලියන 0.82 ක් ආදී වශයෙන් එකතුව රුපියල් මිලියන 21.16 ක් බිල්පත් ගෙවීම් සහ ආරම්භක අත්තිකාරම් ලෙස පිළිසරු ව්‍යාපෘතිය විසින් ගෙවීම් කර ඇත.

වගුව 13.5 2015 වර්ෂයේදී සිදු කළ නව ව්‍යාපෘති පිළිබඳ විස්තර

සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා පහසුකම්	**ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල (රු.)**	**වැය කරන ලද මුදල (රු.)**
කොම්පෝස්ට් ව්‍යාපෘතිය		
0 කැලණිය විශ්ව විද්‍යාලය	1,845,830.00	1,465,748.85
0 රුහුණු විශ්ව විද්‍යාලය	3,122,903.67	2,631,856.16
0 පිටබැද්දර ප්‍රාදේශීය සභාව	6,129,701.81	1,225,940.36
0 යුධ හමුදා කඳවුර - පනාගොඩ	3,571,538.33	714,307.67
0 පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව	6,092,080.80	1,218,416.16
0 කටුවන ප්‍රාදේශීය සභාව	5,342,134.65	1,068,426.93
0 ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව	7,272,973.54	3,576,043.65
0 කුච්චවේලි ප්‍රාදේශීය සභාව	5,036,930.05	1,007,386.01
0 උහන ප්‍රාදේශීය සභාව	8,949,534.05	1,789,906.81
කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා පහසුකම් සැලසුම් මුළු මුදල	**47,363,626.90**	**14,698,032.60**
ජිව වායු ඒකක		
0 ශ්‍රී ලංකා නාවික හමුදා කඳවුර - තලෙයිමන්නාරම	4,200,102.40	840,020.48
0 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - හොරකැලේ ගොවිපල	1,056,225.00	211,245.00
0 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - මහාබෙරිය ගොවිපල	1,056,225.00	211,245.00
0 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - මාර්ටින් ගොවිපල	1,056,225.00	211,245.00
0 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - වැලිසර ගොවිපල	1,056,225.00	211,245.00
0 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - නිරාවිය ගොවිපල	1,056,225.00	211,245.00
පහසුකම් සැලසීමට යෙදවූ මුළු මුදල	**9,481,227.40**	**1,896,245.48**
සම්පත් පියසි		
0 පළාත් සෞඛ්‍ය කාර්යාලය - බස්නාහිර පළාත	**18,750,000.00**	**3,750,000.00**
කසළ දාහකය		
0 මාතලේ ප්‍රා.ස	**4,080,698.00**	**816,139.60**
එකතුව	**79,681,552.30**	**21,160,417.68**

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව කොම්පෝස්ට් අංගනය

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

කැලණිය විශ්ව විද්‍යාලය කොම්පෝස්ට් අංගනය

රුහුණු විශ්ව විද්‍යාලය

වැලිසර නාවික හමුදා කඳවුර ජීව වායු ඒකකය

13.1.7.6 පවතින කොම්පෝස්ට් අංගන වෙත අතරඳවුම් මුදල් නිදහස් කිරීම.

වර්ෂ 2015 ට පෙර ස්ථාපිත කළ කොම්පෝස්ට් අංගන සඳහා වූ අත රැඳවුම් මුදල් ද පළාත් පාලන ආයතන වෙත මුදා හැරිය යුතු ගෙවීමකි. මෙම මුදල බොහෝ විට ගිවිසුම්ගත මුදලින් 5% ක් වන අතර පහත වගු අංක 06 හි දැක්වෙන පළාත් පාලන ආයතන,අවසන් කිරීමේ සහතික සහ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සම්බන්ධ වාර්තා යනාදිය ඉදිරිපත් කරමින් තම අතරැඳවුම් මුදල් ලබා ගැනීම සඳහා පිළිසරු ව්‍යාපෘතිය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි. වර්ෂ 2015 ක්‍රියාකාරී සැලැස්මෙහි පවතින කොම්පෝස්ට් අංගන සඳහා කළ යුතු ගෙවීම් (Commitments) වලට අමතරව ප්‍රතිපාදනයක් ලෙස මෙම අත රැඳවුම් මුදල් නිදහස් කිරීමට අවශ්‍ය මුදල් ලැබුණි. පිළිසරු ව්‍යාපෘතියේ එක් ඉංජිනේරුවරයකු සහ ප්‍රමාණ සමීක්ෂකයකු පමණක් සිටිය බැවින් අත රැඳවුම් මුදල් නිදහස් කිරීමට පෙර කොම්පෝස්ට් අංගන සියල්ල ඔවුන් විසින් පරීක්ෂා කළ යුතු වීම ව්‍යාපෘතිය මුහුණ දුන් ප්‍රධාන අභියෝගයකි. අවසානයේ බාහිර වරලත් ඉංජිනේරුවරයකුගේ සහ ප්‍රමාණ සමීක්ෂකවරයකුගෙන් සැදුම්ලත් කණ්ඩායම් දෙකක සෙවය ලබා ගෙන මෙම ගෙවීම් සිදු කිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව තීරණය කෙරිණි. මෙම සියලු කොම්පෝස්ට් අංගන ඉහත සඳහන් ආකාරයට සෙවය ලබා ගන්නා ලද ඉංජිනේරු කණ්ඩායම් දෙක මගින් පරීක්ෂා කර සාර්ථකව ඉදිකිරීම් අවසන් කළ අංගන පිළිබඳව නිර්දේශ කරන ලදී.

වගුව 13.6 අත රැඳවුම් මුදල් නිදහස් කළ පළාත් පාලන ආයතන

අංක	පළාත් පාලන ආයතනය	ඇස්තමේන්තුගත මුදල රු.	නිදහස් කරන ලද රැඳවුම්
1	ජා ඇල නගර සභාව	8,539,326.48	426,966.32
2	තිස්සමහාරාමය ප්‍රා.ස	4,303,379.42	215,168.97
3	කුරුවිට ප්‍රා.ස	2,932,546.92	146,627.35
4	පොල්ගහවෙල ප්‍රා.ස	6,650,479.89	332,523.99
5	රිදිගම ප්‍රා.ස	4,034,531.09	201,726.55
6	මහඔය ප්‍රා.ස	3,871,132.56	193,556.63
7	මාතලේ ප්‍රා.ස	2,680,943.12	132,478.59
8	යුධ හමුදාවේ පුහුණු මධ්‍යස්ථානය	1,726,373.78	86,318.69
9	පන්නල ප්‍රා.ස	4,061,129.62	23,416.56
10	පොල්පතිගම ප්‍රා.ස	584,066.20	29,203.31
11	අලව්ව ප්‍රා.ස	1,722,618.78	88,630.94
12	රිදිගම ප්‍රා.ස		201,726.55
එකතුව		**38,799,842.88**	**1,758,783.65**

13.1.7.7 අපද්‍රව්‍ය ප්‍රවාහනය කරන රථවාහන සැපයීම

නිවාස වලින්,ව්‍යාපාරික ස්ථාන වලින් සහ පොදු ස්ථානවලින් අපද්‍රව්‍ය එකතු කිරීම අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව පළාත් පාලන ආයතන සතු වගකීම්වලින් එකකි. අපද්‍රව්‍ය ප්‍රවාහනය කරන රථ වාහන නොමැති වීම වහා නිවැරදි කළ හැකි ගැටළුවකි. පසුගිය 2015 වසර අවසානයේදී පිළිසරු ව්‍යාපෘතිය විසින් ට්‍රැක්ටර් රථ 03 ක්,ට්‍රේලර් 03 ක් ,ස්කිඩ් සිටියර් ලෝඩර් රථ 01 ක් සහ කම්පැක්ටර් රථ 02 ක් පහත සඳහන් පළාත් පාලන ආයතන අතර බෙදා දෙන ලදී.

13.1.7.8 කොම්පෝස්ට් අංගන සඳහා උපකරණ ලබාදීම.

කොම්පෝස්ට් හලන යන්ත්‍ර ලබා ගැනීම සඳහා කර තිබූ ඉල්ලීම් සලකා බලා යන්ත්‍ර 21 ක් 2014 ක්‍රියාකාරී සැලැස්ම යටතේ සාදවා බෙදා හරින ලදී. ලබා දුන් පළාත් පාලන ආයතන පහත පරිදි වේ.

වගුව 13.7 පළාත් පාලන ආයතන වෙත හලන යන්ත්‍ර ලබාදීම - 2015

අංක	පළාත් පාලන ආයතනය	යන්ත්‍ර ප්‍රමාණය
1	යක්කමුල්ල ප්‍රාදේශිය සභාව	1
2	පැල්ලමඩුල්ල ප්‍රාදේශිය සභාව	1
3	දමන ප්‍රාදේශිය සභාව	1
4	තිස්සමහාරාමය ප්‍රාදේශිය සභාව	1
5	පදියතලාව ප්‍රාදේශිය සභාව	1
6	බුලත්කොහුපිටිය ප්‍රාදේශිය සභාව	1
7	දෙහිඔවිට ප්‍රාදේශිය සභාව	1
8	රඹෑව ප්‍රාදේශිය සභාව	1
9	පදවිය ප්‍රාදේශිය සභාව	1
10	සමන්තුරේ ප්‍රාදේශිය සභාව	1

අංක	පළාත් පාලන ආයතනය	යන්ත්‍ර ප්‍රමාණය
11	ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව	1
	එකතුව	**11**

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව වෙත ලබා දුන් කොම්පෝස්ට් හලන යන්ත්‍රය

13.1.7.9 සම්පත් මධ්‍යස්ථාන

සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වුයේ නාගරික ඝන අපද්‍රව්‍ය අඩංගු ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කොටස් නිසි පරිදි එකතු කර ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන තුරු ගබඩා කර තැබීමයි. පිළිසරු ව්‍යාපෘතිය බස්නාහිර පළාත් සෞඛ්‍ය සෙවා අධ්‍යක්ෂකගේ සහයෝගය ඇතිව, කොළඹ දිස්ත්‍රික්කය සඳහා සම්පත් පියසි මධ්‍යස්ථාන 50 ක් ගම්පහ සඳහා 60 ක් සහ කළුතර දිස්ත්‍රික්කය සඳහා 15ක් ආදී වශයෙන් සම්පත් මධ්‍යස්ථාන 125 ක් ස්ථාපිත කිරීම සඳහා සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 18.75 ක් ඇස්තමේන්තු කර ඇති අතර ආරම්භක අත්තිකාරම ලෙස රු.3.75 ක් ගෙවා ඇත. සම්පත් මධ්‍යස්ථාන 125 ක් ස්ථාපිත කිරීමට 2016.02.29 වන විට අවසන් කිරීමට නියමිතය.

ආදර්ශ ජංගම සම්පත් මධ්‍යස්ථානයක්

13.1.8 ප්‍රාදේශීයව නිපදවන කොම්පෝස්ට් භාවිතා කර දෙමුහුම් පොහොර නිපදවීමේ ව්‍යාපෘතිය

නාගරික ඝන අපද්‍රව්‍ය භාවිතා කර නිපදවන කොම්පෝස්ට් පොහොර අලෙවිය සම්බන්ධව පිළිසරු ව්‍යාපෘතිය මෙන්ම පළාත් පාලන ආයතනද දිගු කලක සිට ගැටළුකාරී තත්වයකට මුහුණදී තිබුණි. භාවිතා කරන නාගරික ඝන අපද්‍රව්‍යවල ස්වභාවය අනුව එම නිසා නිපදවන කොම්පෝස්ට්වල තත්වයද වෙනස්වන බැවින් එම කොම්පෝස්ට්වල තත්ව පාලනය කිරීම ගැටළුවකි. එබැවින් එම කොම්පෝස්ට් සඳහා ගොවීන්ගේ අඩු ඉල්ලුමක් ඇත. දෙමුහුම් පොහාර නිපදවීම සම්බන්ධව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව (SLLR&DC) ඉදිරිපත් ව්‍යාපෘති යෝජනාව තුළ කොම්පෝස්ට් අලෙවිය හා එහි තත්ව පාලන ගැටළු වලට විසඳුම් ලබා දී තිබුණි. ශක්‍යතා අධ්‍යයනය සඳහා රුපියල් මිලියන 24.25 ක් හා නියමු ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 17.3 ක් යනාදී වශයෙන් මුළු ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුව රුපියල් මිලියන 44.55 ක් විය. 2016 දෙසැම්බර් අවසන් කිරීමටත් දෙමුහුම් පොහොර නිපදවීමටත් බලාපොරොත්තු වේ.

13.1.9 ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළුව සම්බන්ධව අධ්‍යයනය.

ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ගැටළු සහ ඒ සඳහා විසඳුම් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා කැලණිය විශ්ව විද්‍යාලයීය විද්‍යා පීඨයේ සමාජ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය, පිළිසරු ව්‍යාපෘති මගින් තෝරා ගෙන ඇත. එහි පළමු කෙටුම්පත 2015.12.15 දින ව්‍යාපෘතියට භාර දී ඇත. එහි පළමු කෙටුම්පත 2015.12.15 දින ව්‍යාපෘතියට භාර දී ඇත. මෙම අධ්‍යයනයේ මූලික අරමුණු වූයේ පවතින කොම්පෝස්ට් අංගනවල කාර්යක්ෂමතාව උපරිම කිරීම පවතින, වෙළඳපල වැඩිදියුණු කිරීම, භාවිතා කරන්නන් අතර කොම්පෝස්ට් ප්‍රචලිත කිරීම, කොම්පෝස්ට්කරණයේ අවශෙෂ අපද්‍රව්‍ය සඳහා විකල්ප විසඳුම් ලබාදීම පිළිබඳ ක්‍රමෝපාය සොයා බැලීමයි. පළාත් පාලන ආයතන 21 ක් ආවරණය වන පරිදි නියැදි පරීක්ෂාවක් කළ අතර එය මූලික නිගමන පහත පරිදි විය.

1. සත්ව ආහාර සහ ජීව බල ශක්ති නිශ්පාදිත ඉන්ධන වැනි යොමු විය හැකි විකල්ප නිශ්පාදන සිදු කිරීමේ හැකියාව සොයා බැලීම . තවද පෛව තාක්ෂණික , පරිසර හිතකාමී, පිරිවැසුම්දායක ක්‍රමවේදයක් වන වේගවත් දේශීය ක්ෂුද්‍ර ජෛවීය පැසවීම අඩංගු පාරිසරික ප්‍රතිචක්‍රීකරණ පද්ධති යෝජනා කරයි.
2. අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට කම්කරුවන් නොමැති වීමේ කඩිනමින් විසඳීම හෝ පාරිසරික ප්‍රතිචක්‍රීයකරණ පද්ධති (SER) වැනි නව පද්ධති හඳුන්වා දිය යුතුය.
3. කොම්පෝස්ට්කරණ ක්‍රියාවලියෙන් පසු එකතුවන අවශෙෂ කසළ සඳහා විසඳුමක් ලබා දිය යුතුය.
4. කොම්පෝස්ට් නිශ්පාදනය ප්‍රාදේශීයට හෝ වියළි කාලයට සීමා කළ යුතුය.
5. කොම්පෝස්ට් නිශ්පාදන කාර්යය සඳහා ගතවන කාලය අඩු කිරීම හෝ වැඩි භූමි ප්‍රමාණයක් ලබා දිය යුතුය.
6. දුර්ගන්ධය අඩු කිරීමට නව තාක්ෂණයන් හඳුන්වා දිය යුතුය.
7. කොම්පෝස්ට් නිශ්පාදනය පරිසර හිතකාමී ලෙස පවත්වාගෙන යා යුතුය.
8. දේශපාලන නායකත්වය සහ අදාළ ආයතන පිළිසරු ව්‍යාපෘතිය කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතුය.
9. මහා පරිමාණ කෘෂිකාර්මික ගොවීන් අතර කොම්පෝස්ට් ප්‍රචලිත කළ යුතුය.

10. මධ්‍යගත අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථාන ස්ථාපිත කළ යුතුය.

13.1.10 අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2015 ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රමුඛ කාර්යක් ලෙස කිරීම හඳුනාගෙන තිබූ අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

1. මහනුවර ඇසළ උත්සවයට සමගාමීව පවත්වනු ලබන දළදා සත්කාරය වැනි විශාල ලෙස මහජනයා රැස්වන විශෙෂ අවස්ථාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම විශෙෂ දැනුවත් කිරීමේ නිලධාරීන් ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සහභාගී වීම, බැතිතුමන් විසින් බැහැරලන අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා බැරල් භාග ස්ථානගත කිරීම පොලිතීන් ප්ලාස්ටික් ඉවතලැමෙන් තොරව පරිසරය පිරිසිදුව තබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු ප්‍රදර්ශනය කිරීම සිදු කරන ලදී.

මහනුවර ඇසළ උත්සවය වෙනුවෙන් සංවිධානය කළ දළදා සත්කාරය වැඩසටහන

2. එක්සත් ජාතීන්ගේ ලෝක ජනාවාස දිනයට සමගාමීව ජනතාව දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ලෙස දීප ව්‍යාප්ත පාසල් මට්ටමෙන් කාටුන් තරගාවලියක් සංවිධානය කරන ලදී. පිළිගත් විනිසුරු මඩුල්ලක් මගින් දිස්ත්‍රික් , පළාත් හා ජාතික මට්ටමේ ජයග්‍රහකයන් තෝරන ලද අතර තෝරාගත් කාටුන් එකත් කර පොතක් මුද්‍රණය කරන ලදී. කාටුන් තරගාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවය “ වන රෝපා” ජාතික රුක් රෝපණ වැඩසටහනෙහි අංගයක් ලෙස පොළොන්නරුව මැදිරිගිරිය ජාතික පාසලේදී පැවැත්විය.

“වනරෝපා” ජාතික රුක් රෝපණ වැඩසටහන මැදිරිගිරිය ජාතික පාසල, පොළොන්නරුව

03. එක්සත් ජාතීන්ගේ ලෝක ජනාවාස දිනයට සමගාමීව ජනතාව දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ලෙස රූපවාහිනී සහ ගුවන්විදුලි තිර පිටපත් රචනා තරගයක් සංවිධානය කරන ලදී. පිළිගත් විනිසුරු

මඩුල්ලක් මගින් ජාතික මට්ටමේ ජයග්‍රහකයන් තෝරා ගත් අතර ජයග්‍රහණය කළ තිර පිටපත් භාවිතා කර විනාඩි 12 ක රූපවාහිනී වැඩසටහනක් තත්පර 10 රූපවාහිනී දැන්වීම් සහ තත්පර 10 ගුවන් විදුලි දැන්වීම් සැකසිණි

04. මිහිකත දිනය සැමරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්ත ප්‍රාදේශීය පරිසර නිලධාරීන් හරහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විනි.

05. අපද්‍රව්‍ය වෙන්කිරීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක් ව්‍යාප්තව පළාත් පාලන ආයතන මට්ටමින් ලෝක පරිසර දිනයේදී පැවැත්විනි . සිංහල සහ දමිල බසින් බැනර් 419 ක් ද අත්පත්‍රිකා 90350 ක්ද මුද්‍රණය කළ අපද්‍රව්‍ය වෙන් කිරීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම සඳහා මූල්‍යමය දායකත්වය සමග පළාත් පාලන ආයතන 322 කට ලබා දෙන ලදී.

ලෝක පරිසර දිනය

06. පොසොන් උත්සවය වැඩසටහනක් මැදිරිගිරිය,අනුරාධපුරය සහ සෝමාවතියේදී පැවැත් වූ අතර අපද්‍රව්‍ය රැස්කරන බඳුන් ලබා දෙන ලදී. ආනාමඩුව පන්සලේ පැවති පොසොන් උත්සවය සඳහා රෙදි බෑග් 250 ක් ලබා දුනි.

07. ජනතාව අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ දැනුවත් කිරීම සඳහා මිටියාවත ගුවන්විදුලි වැඩසටහන ප්‍රචාරය කෙරිණි. වැඩසටහනක පොළොන්නරුව,නුවර, කුරුණෑගල සහ කතරගම ප්‍රදේශ වලදී පටිගත කරන ලද අතර ලංකාව පුරා විකාශය කෙරිණි. එදිනෙදා පාරිසරික ගැටළු සහ ඒවාට විසඳුම් මෙම වැඩසටහනෙහි සාකච්ජාවට බඳුන් විය. මෙම වැඩසටහනේ තේමාව වුයේ “යහපත් රටක් සහ යහපත් හෙටක්” යන්න වූ අතර විනාඩි 30 ජනතාවට ඵලදායී වැඩසටහනක් ප්‍රචාරය විය.

13.1.11 නිවාස කොම්පෝස්ට් සඳහා බඳුන් නිපදවීම

කොම්පෝස්ට් කරණ බඳුන් මගින් මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය පරිසර හිතකාමී සහ පහසුවෙන් කළමනාකරණය කළ හැක. රටේ පවතින ඉහළ නිෂ්පාදන පිරිවැය සහ ප්‍රවාහන ගාස්තුව නිසා වෙළඳපලෙහි අධික මිලක් මත කොම්පෝස්ට් බඳුනු මිලදී ගැනීමට ජනතාව හෝ පළාත් පාලන ආයතන උනන්දු කරවීමට නොහෙකි වී තිබුණි.මෙයට පිළියමක් ලෙස 2014 ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රතිපාදන අනුව පිළිසරු ව්‍යාපෘතිය මගින් කොම්පෝස්ට් බඳුන් නිපදවීමේ මධ්‍යස්ථානයක් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කෙරුණි. කොම්පෝස්ට් බඳුන් නිපදවීමට සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව සෙවකයන් දෙදෙනෙකු බදවා ගෙන ඇත, මෙම

මධ්‍යස්ථානය මගින් නිපදවන කොම්පෝස්ට් බදුන් නිෂ්පාදනය පිරිවැය පමණක් ආවරණය වන ලෙස පළාත් පාලන ආයතන හරහා සාමාන්‍ය ජනතාවට දැරිය හැකි මිලකට ලබා දී ඇත පිළිසරු ව්‍යාපෘතියේ ඉල්ලීම සහ පලිබෝධ පාලකගේ අනුමැතිය මත පිරිසිදු හා නිස් රාසායන ද්‍රව්‍ය බහාලූ බැරල් (ලීටර් 200) පරිසර අධිකාරියට නොමිලේ ලබාදිය හැකි රාසායන ද්‍රව්‍ය නිපදවීමේ සමාගම් කීපයක් පවති. මෙම බදුන් සඳහා පළාත් පාලන ආයතන සහ විවිධාකාර පාර්ශවයන්ගෙන් විශාල බල්ලුමක් පවතින අතර 2014 දෙසැම්බර් 31 වන විට තත්වය දැක්වෙන පහත වගුවෙන් එය පිළිබිඹු වේ.

වගුව 13.8 2015 වර්ෂයේ කොම්පෝස්ට් බදුන් බෙදා දීම

පළාත් පාලන ආයතනයේ නම/ආයතනය/පෞද්ගලික	නිදහස් කළ දිනය	නිදහස් කළ ප්‍රමාණය	කොම්පෝස්ට් බදුනක මිල	මුළු මුදල
විදේශ කටයුතු අමාත්‍යාංශය	2015.01.21	01	500.00	500.00
දිවුලපිටිය ප්‍රාදේශීය සභාව	2015.02.10	200	500.00	100,000.00
රාජසිංහ පෙර පාසල	2015.02.13	04	500.00	Free
ජා ඇල ප්‍රාදේශීය සභාව	2015.01.23	102	500.00	51,000.00
වැලිසර නාවික හමුදා කඳවුර	2015.03.18	03	500.00	1,500.00
මහවැලි අධිකාරිය	2015.06.04	25	500.00	Free
පේරාදෙණිය විශ්ව විද්‍යාලය	2015.06.17	06	500.00	Free
ශ්‍රී ලංකා ගුවන් හමුදාව - රත්මලාන	2015.08.04	02	500.00	Free
වෛද්‍ය නිලධාරි කාර්යාලය , රත්මලාන	2015.09.16	01	500.00	Free
බස්නාහිර පළාත් කාර්යාලය	2015.10.01	12	500.00	Free
කටුබැද්ද හමුදා කඳවුර	2015.11.04	10	500.00	Free
Individual purposes		53	500.00	26,500.00
එකතුව		**419**		**179,500.00**

13.1.12 අවශෙෂ අපද්‍රව්‍ය බැහරලිම සඳහා සනිපාරක්ෂක කසළ රැදවීම ස්ථාපිත කිරීමට සහය වීම.

13.1.12.1 මොන්රෝවියාවත්ත තාවකාලික බිම් පිරවුම

මොන්රෝවියාවත්ත කොම්පෝස්ට් අංගනය එන නාගරික ඝන අපද්‍රව්‍ය අර්ධ යන්ත්‍රික ක්‍රමයක් මගින් වෙන් කිරීමට ලක් කරන අතර කාබනික කොටස කොම්පෝස්ට් පොහොර ලෙස සකස් කෙරේ. කාබනික නොවන කොටස නැවත වෙන් කර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය අලෙවිකරණය සිදු කරන තුරු ගබඩා කර තබා ගනී. ඉන් ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය පාරිසරිකව ආරක්ෂිත ක්‍රමයකට බැහැරලීම අත්‍යවශ්‍ය කරුණකි. (EDCF) ව්‍යාපෘතියෙහි තාක්ෂණික හා මූල්‍යාධාර මත සනීපාරක්ෂක බිම් පිරවුමක් අදාළ ක්ෂෙත්‍රයෙහිම ඉදිකිරීමට යෝජනා වී ඇත. කෙසෙ වුවද එහි ඉදි කිරීම් අවසන් කිරීමට වසර කිපයක් ගතවන බැවින් අවශෙෂ කසළ බැහැර කිරීම සඳහා සුදුසු ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලෙස රජ්ගම ප්‍රාදේශීය සභාව මධ්‍යම පරිසර අධිකාරියේ ඉල්ලීම් කර තිබුණි.

දකුණු පළාත් ප්‍රධාන ආමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති විශෙෂ රැස්වීමකදී සාමුහික දායකත්වයෙන් මොන්රෝවියාවත්ත කොම්පෝස්ට්

අංගනය සඳහා තාවකාලික බිම් පිරවුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන පාර්ශවකරුවන් එකඟ විය. කොම්පෝස්ට් අංගනය අවට වාසය කළ ජනතාව පාරිසරික ගැටළු විසඳීම සඳහා මෙම බිම් පිරවුම සකස් කිරීමට රුපියල් මිලියන 4 ක් ලබාදීමට පිළිසරු ව්‍යාපෘතිය එකඟ විය. දකුණු පළාත් සභාව අදාළ සැලසුම් කිරීම සහ ප්‍රසම්පාදන කටයුතු කළ අතර කොන්ත්‍රාත්කරුවක් තෝරා ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී.

රූපය 14.1 මොන්රෝවියාවත්ත තාවකාලික බිම් පිරවුම

13.1.12.2 මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශිය පරිසර නිලධාරීන් මඟින් කොම්පෝස්ට් අංගන පසු විපරම් කිරීම

දිවයින පුරා පිහිටි කොම්පෝස්ට් අංගන 126 පිළිබඳ පසු විපරම් කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාලවල ප්‍රාදේශිය පරිසර නිලධාරීන් 16 දෙනෙකුගේ සහය සහ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගෙන ඇත. ප්‍රධාන කාර්යාලයේදී පවත්වනු ලබන අතර එහිදී මෙම ප්‍රගතිය වාර්තා කරන ලදී. පිළිසරු ව්‍යාපෘති නිලධාරීන් සමඟ කොම්පෝස්ට් අංගනවල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර ව්‍යාපෘති නිලධාරීන් සමඟ කොම්පෝස්ට් අංගනවල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර ව්‍යාපෘතියට වාර්තා කරමින් අංගනවල නඩත්තු සහ මෙහෙයුම් පිළිබඳ ගැටළු විසඳීමට පළාත් පාලන ආයතන දිරිමත් කිරීම තුලින් කොම්පෝස්ට් අංගන යාවත් කාලීන කිරීම සඳහා ඔවුන් සිදු කරන කාර්ය භාරය ඉතා ඵලදායී වී ඇත.

වගුව 13.9 අපද්‍රව්‍ය වෙන් කිරීම දැනුවත් කිරීමේ වැඩසටහන

අංක	දිනය	සහභාගීවුවන්ගේ වර්ගීකරණය	පළාත් පාලන ආයතනය		සහභාගීවුවන් ගේ ප්‍රමාණය
1	2015.08.13	කොමසාරිස් අධීක්ෂණ නිලධාරී ලේකම් සංවර්ධන නිලධාරී මහජන සෞඛ්‍ය පරීක්ෂක	බිංගිරිය ප්‍රා.ස පන්නල ප්‍රා.ස පොල්ගහවෙල ප්‍රා.ස උඩුබද්දාව ප්‍රා.ස නාරම්මල ප්‍රා.ස ගල්ගමුව ප්‍රා.ස වාරියපොළ ප්‍රා.ස කොබෙයිගනේ ප්‍රා.ස	මාවතගම ප්‍රා.ස රිදිගම ප්‍රා.ස මඔය ප්‍රා.ස නිකවැරටිය ප්‍රා.ස අලව්ව ප්‍රා.ස පොල්පිතිගම ප්‍රා.ස කුරුණෑගල ප්‍රා.ස කුරුණෑගල මහ නගර සභා (සුන්දරාපොළ) කුලියාපිටිය නගර සභාව	100

අංක	දිනය	සහභාගීවුවන්ගේ වර්ගීකරණය	පළාත් පාලන ආයතනය		සහභාගීවුවන් ගේ ප්‍රමාණය
2	2015.07.06	කොමසාරිස් අධීක්ෂණ නිලධාරී ලේකම් සංවර්ධන නිලධාරී මහජන සෞඛ්‍ය පරීක්ෂක	බලන්ගොඩ නගර සභාව මාවනැල්ල ප්‍රා.ස නිතිවිගල ප්‍රා.ස කුරුවිට ප්‍රා.ස	රඹුක්කන ප්‍රා.ස කලවාන ප්‍රා.ස කෑගල්ල න.ස රුවන්වැල්ල ප්‍රා.ස යටින්තොට ප්‍රා.ස බුලත්කොහුපිටිය ප්‍රා.ස	43
3	2015.06.09	කොමසාරිස් ලේකම් සංවර්ධන නිලධාරී පරිසර නිලධාරී තාක්ෂණික නිලධාරී අධීක්ෂණ නිලධාරී	සමන්තුරේයි ප්‍රා.ස ඔහඹය ප්‍රා.ස දමන ප්‍රා.ස පදියතළාව ප්‍රා.ස නමල්ඔය ප්‍රා.ස කාතන්කුඩිය න.ස		33
4	2015.03.23	කොමසාරිස් අධීක්ෂණ නිලධාරී ලේකම් සංවර්ධන නිලධාරී මහජන සෞඛ්‍ය පරීක්ෂක Doctor Navy officer	යාපනය රෝහල යාපනය මහ නගර සභාව වැලිකාමම දකුණ ප්‍රා.ස වවාකච්චේරිය ප්‍රා.ස උතුරු හමුදා කඳවුර -		35
5	2015.03.19	කොමසාරිස් සභාපති ලෙක්ම් අධීක්ෂණ නිලධාරී සංවර්ධන නිලධාරී පරිසරනිලධාරී තාක්ෂණික නිලධාරී	මාලිම්බඩ ප්‍රා.ස කිරින්ද පුහුල්වැල්ල ප්‍රා.ස කොටපල ප්‍රා.ස මාතර ප්‍රා.ස වැලිගම න.ස මුලටියන ප්‍රා.ස යක්කලමුල්ල ප්‍රා.ස වීරකැටිය ප්‍රා.ස අම්බලන්තොට ප්‍රා.ස නියාගම ප්‍රා.ස හම්බන්තොට ප්‍රා.ස	රජ්ගම ප්‍රා.ස නාගොඩ ප්‍රා.ස ඇල්පිටිය ප්‍රා.ස කරන්දෙණිය ප්‍රා.ස බෙලිඅත්ත ප්‍රා.ස තිස්සමහාරාමය ප්‍රා.ස තංගල්ල ප්‍රා.ස අගුණකොළපැලස්ස ප්‍රා.ස බද්දේගම ප්‍රා.ස හබරාදුව ප්‍රා.ස මාතර ප්‍රා.ස ලුණුගම්වෙහර ප්‍රා.ස	78
6	2015.03.16	කොමසාරිස් සභාපති ලේකම් අධීක්ෂණ නිලධාරී සංවර්ධන නිලධාරී පරිසර නිලධාරී තාක්ෂණික නිලධාරී	උඩුනුවර ප්‍රා.ස නාවලපිටිය න.ස මාතලේ න.ස රත්තොට ප්‍රා.ස අරකුණ ප්‍රා.ස උකුවෙල ප්‍රා.ස මාතලේ ප්‍රා.ස තලවකැලේ ලිඳුල නගර සභාව පහතහෙවාහැට ප්‍රා.ස		42

අංක	දිනය	සහභාගීවුවන්ගේ වර්ගීකරණය	පළාත් පාලන ආයතනය	සහභාගීවුවන් ගේ ප්‍රමාණය
7	2015.03.13	කොමසාරිස් සභාපති ලේක්ම් අධික්ෂණ නිලධාරී සංවර්ධන නිලධාරී පරිසර නිලධාරී	දිවුලපිටිය ප්‍රා.ස මීරිගම ප්‍රා.ස මීගමුව ප්‍රා.ස කැලණිය ප්‍රා.ස බණ්ඩාරගම ප්‍රා.ස සීතාවක ප්‍රා.ස බුලත්සිංහල ප්‍රා.ස ජා ඇල න.ස අධිකාරිය කැලණිය විශ්ව විද්‍යාලය හොරණ ප්‍රා.ස ජා ඇල ප්‍රා.ස මතුගම ප්‍රා.ස කළුතර ප්‍රා.ස වනාතවිල්ලුව ප්‍රා.ස අත්නගල්ල ප්‍රා.ස කටාන ප්‍රා.ස අපද්‍රව්‍ය කළ.	70
8	2015.03.09	කොමසාරිස් මහජන සෞඛ්‍ය පරීක්ෂක ලේකම් අධික්ෂණ නිලධාරී සංවර්ධන නිලධාරී පරිසර නිලධාරී තාක්ෂණික නිලධාරී ව්‍යාපෘති නිලධාරී	බදුල්ල මහ නගර සභාව බණ්ඩාරවෙල මහ නගර සභාව හාලි ඇල ප්‍රාදේශීය සභාව ඇල්ල ප්‍රා.ස තණමල්විල ප්‍රා.ස පළාත් පාලන දෙපාර්මේන්තුව - ඌව	35
9	2015.02.23	කොමසාරිස් මහජන සෞඛ්‍ය පරීක්ෂක සභාපති ලේකම් අධික්ෂණ නිලධාරී සංවර්ධන නිලධාරී පරිසර නිලධාරී තාක්ෂණික නිලධාරී	ගලෙන්බිඳුනුවැව ප්‍රා.ස ගල්නෑව ප්‍රා.ස ඉපලෝගම ප්‍රා.ස කහටගස්දිගිලීය ප්‍රා.ස මැදවච්චිය ප්‍රා.ස රාජාංගනය ප්‍රා.ස රඹෑව ප්‍රා.ස තිරප්පනේ ප්‍රා.ස හොරව්පාතාන ප්‍රා.ස පදවිය ප්‍රා.ස තළාව ප්‍රා.ස මැදිරිගිය ප්‍රා.ස නිගුරක්ගොඩ ප්‍රා.ස ලංකාපුර ප්‍රා.ස අනුරාධපුරය මහ නගර සභාව	52

13.1.13 විශාල සහ මධ්‍යම පරිමාණ කොම්පෝස්ට් අංගන වල නිලධාරීන් සහ කම්කරු මහතුන් සඳහා ඒවායේ නඩත්තු හා මෙහෙයුම් පිළිබඳ පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

කොම්පෝස්ට් අංගන ඉදි කිරීම සඳහා පිළිසරු ව්‍යාපෘතිය මඟින් ආධාර කර ඇති පළාත් පාලන ආයතනවල සෙවකයින් පුහුණු කිරීම සඳහා 2015වසර තුළ පිළිසරු ව්‍යාපෘතිය මගින් පුහුණු වැඩ සටහන් රැසක් ආරම්භ කර ඇත. කොම්පෝස්ට්කරණය සම්බන්ධ න්‍යාත්මක මෙන්ම ප්‍රයෝගික දැනුම ද ලැබෙන ලෙස පුහුණු වැඩ සටහන් වල විෂය නිර්දේශය සකස් කර ඇත.

පළාත් පාලන ආයතන කොම්පෝස්ට්කරණය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම.

13.1.14 ව්‍යාපෘතිය සම්බන්ධීකරණය මෙහෙයුම් හා කළමනාකරණය.

ගරු පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ මගපෙන්වීම යටතේ සියලු පාර්ශවකරුවන්ගේ උපදෙස් මත නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සැලැස්මක් සකස් කරන ලදී.

පිළිසරු ව්‍යාපෘතියේ දෙවන අදියර ඇරඹීම සඳහා 2015වසර තුළ නව කාර්ය මණ්ඩලය බඳවාගන්නා ලදී. වර්ෂ 2015 දෙසැම්බර් වන විට පහත සඳහන් පරිදි කාර්ය මණ්ඩලයක් බඳවාගෙන තිබූ අතර ඇතම් අතයවශ්‍ය තනතුරු පුරප්පාඩුවී දිර්ඝ කාලයක් පැවතුණි. වර්ෂ 2015 ට පෙර පිහිටුවන ලද කොම්පෝස්ට් අංගනවල බිල්පත් පියවීම සහ 2015 වසර තුළ නව අංගනයක් පිහිටුවීමේදි ඉංජිනේරු , තාක්ෂණික සහ ව්‍යාපෘති සැලසුම් අංගයන්හි නිශ්චිත කාර්ය මණ්ඩලය නෙමැතිවීම දැඩිව බලපෑවේය . කේසෙ වුවද ඉංජිනේරු , තාක්ෂණික සහ ව්‍යාපෘති සැලසුම් අංගවල අත්‍යවශය තනතුරු සඳහා 2015 වර්ෂයේ අප්‍රේලේ මස බඳවාගැනිම් සිදුකළ ද එය පුමාණවත් නොවූ අතර බිල්පත් ගෙවිමේදී ඇතම් ඉංජීනේරු කාර්යන් පමණක් කළමණාකරණය කරගත හැකිවිය.

වගුව 13.10 2015වසර තුළ පැවති තනතුරු හා පත්කිරීම්

තනතුර	අනුමත කාර්ය මණ්ඩල ප්‍රමාණය	බඳවා ගන්නා ලද ප්‍රමාණය	බඳවා ගන්නා ලද අවුරුද්ද සහ මාසය	පවත්නා තනතුරු සංඛ්‍යාව
අධ්‍යක්ෂ	01	01	නොවැම්බර් 2014	--
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01	--	-	01
නියෝජ්‍ය කළමනාකරු	01	01	ජුලි 2014	--
ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු	01	--	--	01
ගණකාධිකාරී	01	01	ජනවාරි 2015	--
ව්‍යාපෘති නිලධාරී	04	01	ජුලි 2014	01
		01	අප්‍රේල් 2015	
		01	දෙසැම්බර් 2015	
පරිපාලන නිලධාරී	01	01	මාර්තු 2014	--
ප්‍රමාණ සමීක්ෂක	01	01	ජුලි 2014	--
ව්‍යාපෘති ඉංජිනේරු	02	01	ඔක්තෝම්බර් 2015	01

තනතුර	අනුමත කාර්ය මණ්ඩල ප්‍රමාණය	බඳවා ගන්නා ලද ප්‍රමාණය	බඳවා ගන්නා ලද අවුරුද්ද සහ මාසය	පවත්නා තනතුරු සංඛ්‍යාව
ව්‍යාපෘති සහකාර	04	01	සැප්තැම්බර් r 2014	--
		01	අප්‍රේල් 2015	--
		01	අප්‍රේල් 2015	--
		01	අප්‍රේල් 2015	--
ව්‍යාපෘති ලේකම්	01	01	අප්‍රේල් 2015	--
සැලසුම් ශිල්පී	01	01	අප්‍රේල් 2015	--
ප්‍රසම්පාදන නිලධාරී	01	01	මාර්තු 2014	--
ප්‍රසම්පාදන සහායක	01	01	මාර්තු 2014	--
නීති සහකාර	01	01	ජුලි 2014	--
ගිණුම් සහකාර	01	01	ජනවාරි 2015	--
ලිපිකරු	05	01	දෙසැම්බර් 2013	--
		01	දෙසැම්බර් 2013	--
		01	December 2013	--
		01	අප්‍රේල් 2015	--
		01	අප්‍රේල් 2015	--
කාර්යාලය සහායක	02	01	නොවැම්බර් 2013	01
Total	**30**	**25**		**05**

13.1.15 මූල්‍ය ප්‍රගතිය

2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මුලිකව රුපියල් මිලියන 297.5 ක් වෙන් කර තිබුණි. එම වසර ඇතුළත් දොම්පේ ව්‍යාපෘතියෙහි මාර්ගය සකස් කිරීම සඳහා රුපියල් මිලියන් 18.025 ක් KOIKA ව්‍යාපෘතියට ලබා දෙන ලදී. ඒ අනුව 2015 වසර සඳහා සත්‍ය වශයෙන් වෙන් කළ මුදල වූයේ රුපියල් මිලියන 279.48 කි. 2015 වසර තුළ 62% ක ප්‍රගතියකි ලබා ගනිමින් රුපියල් මිලියන 173.22 ක් වැය කිරීමට පිළිසරු ව්‍යාපෘතියට හැකි විය මූල්‍ය ප්‍රගතිය ක්‍රියාකාරකම් අනුව 16.1 වගුවේ දක්වා ඇත.

වගුව 13.11 ක්‍රියාකාරකම් මට්ටමේ මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය

ක්‍රියාකාරකම්	මූල්‍ය ප්‍රගතිය රු.මිලි	අරමුදල් භාවිතය රු.මිලි
1. නිසි අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ දැනුවත් කිරීම	**10,100**	0,581.63
1.1 රූපවාහිනී හා ගුවන් විදුලි දැන්වීම් මගින් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ මහා පරිමාණ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	7,000	8,837.16
1.2 ඉලක්ක ගත කාණ්ඩයම් සඳහා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම.	2,000	1,744.47
1.3 අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ පාසල් විෂය නිර්දේශයට ඇතුලත් කිරීම.	1,100	-
2. නාගරික අපද්‍රව්‍ය ප්‍රවාහයට එකතුවන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම.	**5,660**	5,632.53
2.1 නිවාස මට්ටමින් අපද්‍රව්‍ය කළමනාකරණය සහ කොම්පෝස්ට්කරණය සහ ජනනය වන ස්ථානයේදීම වෙන් කිරීම දිරිමත් කිරීම	5,560	5,632.53

2.2 නිශ්පාදනයේදී අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම පිළිබඳ මහා පරිමාණ නිශ්පාදකයන් දිරිමත් කිරීම	100	-
3. නිසා අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සැපයීම් සඳහා	**181,340**	123,972.74
3.1 පවතින කොම්පෝස්ට් අංගන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් පසු විපරම් කිරීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් ප්‍රාදේශීය පරිසර නිලධාරීන් හා ප්‍රාදේශීය කාර්යාල සඳහා පහසුකම් සැලසීම.	320	258.98
3.2 ගැටළු උග්‍රව පවතින තෝරා ගත් ප්‍රදේශ සඳහා සුළු හා මධ්‍යම පරිමාණ කොම්පෝස්ට් අංගන ස්ථාපිත කිරීම (පාරිසරිකව සංවේදී, ජන ඝනත්වය වැඩි , නාගරික ප්‍රදේශ සඳහා)	45,500	26,532.81
3.3 තෝරාගත් ස්ථාන සඳහා කසළ දාහක ස්ථාපිත කිරීම.	6,000	816.14
3.4 ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතන වෙත උපකරණ සහ පහසුකම් සැලසීම	62,320	33,007.72
3.5 පවතින කොම්පෝස්ට් අංගන සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් ලබාදීම	12,200	10,579.19
3.6 පවතින කොම්පෝස්ට් අංගන සඳහා කළ යුතු ගෙවීම් සිදු කිරීම.	53,000	52,777.90
3.7 දොම්පේ සනීපාරක්ෂක කසළ පිරවුම සඳහා නඩත්තු වියදම්.	2,000	-
4. ආයතනික වහ්‍යුහය ශක්තිමත් කිරීම.	**3,900**	3,622.06
4.1 තෝරාගත් සුළු හා මධ්‍යම පරිමාණ කොම්පෝස්ට් අංගන සඳහා රාජ්‍ය පුද්ගලික සහභාගීත්වය පිළිබඳ පළාත් පාලන ආයතන සහ පළාත් පාලන කොමසාරිස් කාර්යාල ශක්තිමත් කිරීම.	1,260	-
4.3 ජාතික ඝන පහසුකම්වල ආර්ථික තිරසාර බව වැඩිදියුණු කිරීම.	2,640	3,622.06
5. අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් වල ආර්ථික තිරසාර බව වැඩිදියුණු කිරීම.	**1,000**	800.00
5.1 අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති වල මූල්‍ය විශ්ලේශන, කොම්පෝස්ට් සඳහා වෙළඳ පල වැඩි දියුණු කිරීම, අපද්‍රව්‍ය එකතු කිරීම සහ බැහැර කිරීමේ ගාස්තු පිළිබඳ ආදර්ශ සකස් කිරීම, සහ පර්යේෂණ වැඩිදියුණු කිරීම.	500	600.00
5.2 කොම්පෝසට් තත්වය වැඩිදියුණු කිරීමට පළාත් පාලන ආයතන සඳහා පහසුකම් සැලසීම	500	-
6. ප්‍රතිපත්ති, නියාමනය සහ පසු විපරම පිළිබඳ වැඩිදියුණු කිරීම.	**3,200**	2,559.16
6.1 අදාළ රාජ්‍ය ආයතන සමඟ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති, නියාමනය සහ පසු විපරම් පිළිබඳ ශක්තිමත් කිරීම.	200	173.92
6.2 අදාළ රාජ්‍ය ආයතන සමඟ සමෝධානික සහ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සම්බන්ධීකරණය , ක්‍රියාත්මක කිරීම හා පසු විපරම	3,000	2,385.24
7. දැයට කිරල 2015	**62,000**	
8. ව්‍යාපෘති සම්බන්ධීකරණය මෙහෙයුම් හා කළමනාකරණය	**30,300**	**26,049.88**
8.1 **ව්‍යාපෘති සම්බන්ධීකරණය මෙහෙයුම් හා කළමනාකරණය**	30,300	26,049.88
9. Koika ව්‍යාපෘතිය සඳහා අරමුදල පැවරීම - FR66 *		**18,025.00**
එකතුව	**297,500**	**191,243.00**

13.2 පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාව තුළ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කොට හරිත පරිසරයක් රට තුළ නිර්මාණය කිරීමේ අරමුණින් 2007 වර්ෂයේ පරිසර අමාත්‍යාංශය විසින් මධ්‍යම පරිසර අධිකාරියේ අධීක්ෂණය මත පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ආරම්භයේ සිටම මෙම ව්‍යාපෘතිය මූලික ක්‍රියාකාරකම් 3 ක් ඔස්සෙ ක්‍රියාත්මක විය.

01. ප්‍රාදේශිය ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වාදීම හා සංවර්ධනය කිරීම.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ජාලයක් ඇති කිරීම.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැරලීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.

මෙම ප්‍රධාන ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලාංකික ජනතාව තුළ ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීමේ යහපත් ආකල්පමය වෙනසක් ඇතිකිරීමෙන්, වඩාත් නිවැරදි ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීමේ චර්යාත්මක වෙනසක් ඇති කර පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කරා යොමු කිරීමට බලාපොරොත්තු වේ. ඒ තුළින් පරිසරයට එකතුවන ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීමත් ප්‍රතිචක්‍රීයකරණය සංවර්ධනය වීම තුළින් විදේශ රටවලින් ආනයනය කරන අමුද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම මෙන්ම ඒ ඔස්සෙ විදේශ විනිමය ඉතිරි කිරීමත් අරමුණු කර ඇත.

ඒ අනුව 2015 වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ලද මුල්‍ය ප්‍රතිපාදන භාවිතා කරමින් ව්‍යාපෘතිය විසින් විවිධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

13.2.1 ආදර්ශ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථාන ඉදිකිරීම

ව්‍යාපෘතිය විසින් දිස්ත්‍රික් මට්ටමින් ශක්‍යතාවය සහිත දිස්ත්‍රික්කයේ ප්‍රධාන පළාත් පාලන ආයතන තෝරාගෙන ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ආදර්ශ මධ්‍යස්ථාන ඉදිකිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. ප්‍රථමයෙන්ම බලංගොඩ නගර සභාව සහ කුරුණෑගල මහා නගර සභාව යන පළාත් පාලන ආයතන දෙක ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ හා ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ආදර්ශ නියමු මධ්‍යස්ථාන ලෙස ආරම්භ කරන ලදී. එහි සාර්ථකත්වය මත අනුරාධපුර මහා නගර සභාව, මාතර මහා නගර සභාව, කඩුවෙල මහා නගර සභාව යන පළාත් පාලන ආයතනවල මෙම මධ්‍යස්ථාන ඇති කරන ලදී.

2015 වර්ෂය තුළදී, මහනුවර මහා නගර සභාවේ ගුහාගොඩ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකරන ලද ආදර්ශ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය විවෘත කිරීම - මහනුවර මහා නගර සභාව

2015 වර්ෂය තුළ සැලසුම් කර පරිදි නුවරඑළිය මහා නගර සභාවේ සඳහැන්න අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකරන ලද ආදර්ශ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර යාපනය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීමට සැලසුම් කරන ලද ආදර්ශ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් 90% කට ආසන්නව අවසන් කිරීමට හැකි විය. මෙම මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය ප්ලාස්ටික් කැබලි කිරීමේ යන්ත්‍රයක් (Plastic Crusher) හා පොලිතීන් කැබලි කිරීමේ යන්ත්‍රයක් (Polythene Compactor) බැඟින් ලබා දීමට කටයුතු කර ඇත. 2016 වර්ෂයේ පළමු කාර්තුව තුළ මෙම මධ්‍යස්ථාන දෙකෙහිම ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය නිල වශයෙන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ආදර්ශ මධ්‍යස්ථානයේ ඉදිකිරීම්
නුවරඑළිය මහා නගර සභාව

ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ
ආදර්ශ මධ්‍යස්ථානයේ ඉදිකිරීම්
- යාපනය මහා නගර සභාව

13.2.2 ප්ලාස්ටික් ඇතුළු ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි අපද්‍රව්‍ය ගබඩා මධ්‍යස්ථාන ඇති කිරීම.

ප්‍රාදේශිය වශයෙන් නිවාස හා ආයතන මට්ටමින් ජනනය වන ප්ලාස්ටික් ඇතුළු ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි අපද්‍රව්‍ය විධිමත් ලෙස එක්රැස් කර ප්‍රතිචක්‍රීයකරණයතෙක් ගබඩා කර තබාගැනීම සඳහා විධිමත් ගබඩා පහසුකම් නොමැතිවීම පළාත් පාලන ආයතන මුහුණදෙන ප්‍රධාන ගැටළුවකි. එමෙන්ම, මහජනතාව විශාල වශයෙන් එක්රැස් වන ආගමික මධ්‍යස්ථාන වල එකතුවන

ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි අපද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා විධිමත් ගබඩා පහසුකම් නොමැතිවීම ද එම ස්ථානවල අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙදි මුහුණදෙන ගැටළුවකි. එම ගැටළුවට විසඳුම් ලෙස ව්‍යාපෘතිය ශ්‍රී පාදස්ථානය ආශ්‍රිත අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන වඩාත් විධිමත් කිරීම සඳහා අඹගමුව ප්‍රාදේශිය සභාවේද සහයෝගය ඇතිව ශ්‍රී පාදස්ථානයේ නල්ලතන්නිය අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකර ඇත.

පළාත් පාලන ආයතන වලට ශක්තියක් වෙමින් පළාත් පාලන ආයතන වල ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් ඉදිකිරීම ගල්ගමුව ප්‍රාදේශිය සභාව පදනම් කරගෙන ආරම්භ කරන ලදී. අද වන විට වාරියපොළ ප්‍රාදේශිය සභාව හා තමන්කඩුව ප්‍රාදේශිය සභාව යන පළාත් පාලන ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන වල මෙම ගබඩා පහසුකම් ඉදිකර ඇත. 2015 වර්ෂයේ ඉපලෝගම ප්‍රාදේශිය සභාවේ මෙම ගබඩා මධ්‍යස්ථානයක් ඉදිකර මේ වන විට එහි අපද්‍රව්‍ය එක්රැස් කිරීම හා ගබඩා කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මෙම වැඩසටහන ප්ලාස්ටික් ඇතුළු ප්‍රතිචක්‍රීයකරණ අපද්‍රව්‍ය කළමනාකරණයේදී ඉතා වැදගත් පහසුකමක් මෙන්ම ඒ අශ්‍රිත අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ වැඩසටහන ඉතා වැදගත් වැඩසටහනක් ලෙස හඳුනාගෙන ඇත.

විශෙෂයෙන් ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි අපද්‍රව්‍ය ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීමේ පහසුව සඳහා බේල් යන්ත්‍ර දෙකක් ආරම්භක පියවරක් ලෙස ජා ඇල නගර සභාව හා කැලණිය ප්‍රදේශිය සභාව වෙත ප්‍රදානය කර ඇත.

ප්‍රතිචක්‍රීයකරණ කළ හැකි අපද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානය - ඉපලෝගම ප්‍රාදේශිය

තෝරාගත් පළාත් පාලන ආයතනයන්ට බෙදා දෙන ලද ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි අපද්‍රව්‍ය බේල් කිරීමේ යන්ත්‍රය

13.2.3 පෞද්ගලික අංශයේ ප්‍රතිචක්‍රීයකරණ කර්මාන්තකරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන

පළාත් පාලන ආයතන හා සම්බන්ධිත අනෙකුත් ආයතන වලට අමතරව ප්ලාස්ටික් එක්රැස් කිරීමේ හා ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස් කර ගැනීමේ හා ප්‍රතිචක්‍රීයකරණ කර්මාන්තකරුවන් ඒකරාශිකර ගනිමින් ව්‍යාපෘතිය තුළ ලියාපදිංචි කර ඔවුන් සඳහා හැඳුනුම්පතක් හා සහතික පත්‍රයක් පිරිනමා ඇති අතර ඒ තුළින් ඔවුන්ට අනන්‍යතාවයක් ලැබී ඇත.

ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා කොළඹ, ගම්පහ හා කළුතර යන දිස්ත්‍රික්ක තුනෙහි ප්‍රධාන ප්‍රතිචක්‍රීයකරණ කර්මාන්තකරුවන්

තිදෙනෙකු තෝරා ඔවුන්ට මහා පරිමාණ පොලිතීන් අපද්‍රව්‍ය සෙදුම් යන්ත්‍ර සංකිර්ණයක් බැඟින් ලබා දී ඇත. වර්තමානය වන විට මෙම කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ධාරිතාවය කිපගුණයකින් ඉහළ ගොස් ඇති අතර සමස්ථයක් ලෙස ගත්කළ එය රටේ ප්ලාස්ටික් ප්‍රතිචකීයකරණ කර්මාන්තයේ සංවර්ධනයට හේතු වී ඇත. මේ අනුව ඉදිරියට යමින් ව්‍යාපෘතිය විසින් පෞද්ගලික අංශයේ ප්‍රතිවක්‍රීයකරණ කර්මාන්තකරුවන් දිරිගැන්වීමේ අරමුණින් තෝරාගත් ප්‍රතිවක්‍රීයකරණ කර්මාන්තකරුවන් 7 දෙනෙකුට ලබාදීම සඳහා ප්ලාස්ටික් කැබලි කිරීමේ යන්ත්‍ර (Plastic Crusher) 07 ක් මිල දී ගෙන ඇති අතර 2016 වර්ෂයේ මුල් කාර්තුව තුලදී එම ප්‍රතිවක්‍රීයකරණ කර්මාන්ත කරුවන් සඳහා යන්ත්‍ර ප්‍රදානය කිරීමට අපේක්ෂිත අතර ඒ තුළින් ප්‍රතිවක්‍රීයකරණ කර්මාන්තයේ වැඩිදියුණු වීමක් බලාපොරොත්තු වේ.

තෝරාගත් ප්ලාස්ටික් ප්‍රතිවක්‍රීයකරණය කරන්නන් සඳහා බෙදා දීමට නියමිත ප්ලාස්ටික් කැබලි කිරීමේ යන්ත්‍රයක්

13.2.4 පුහුණු සංවර්ධන හා දැනුවත් කිරීමේ වැඩසටහන.

ව්‍යාපෘතිය ආරම්භයේ පටන්ම ජනතාවගේ දැනුම වර්ධනය කිරීම තුළින් ආකල්පමය හා චර්යාත්මක වෙනසක් සිදුකිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. පාසල් සිසුන්, ගුරු භවතුන්, පෙරපාසල් ගුරුභවතුන්, රාජ්‍ය නිලධාරින්, පළාත් පාලන ආයතන වල කාර්ය මණ්ඩලය, රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජාමූල සංවිධාන සාමාජිකයන් නිවාස හා වෙළඳසැල් හිමියන් මෙන්ම මේ පිළිබඳ විශෙෂ උනන්දුවක් දක්වන කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් දැනුවත්කිරීමේ වැඩසටහන්, වැඩමුළු හා නේවාසික වැඩසටහන්, ප්‍රායෝගික පුහුණු වැඩමුළු ආදිය පවත්වයි. 2015 වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් එවැනි විවිධ වූ පුහුණු හා දැනුවත්කිරීමේ වැඩසටහන් 72 ට ආසන්න ප්‍රමාණයක් පවත්වා ඇත.

පලාස්ටික් එකතු කරන්නන් සහ ප්‍රතිචක්‍රීයකරණය කරනන්නන් සඳහා පවතිවන ලද දැනුවත් කිරීමේ වැඩසටහන

වගුව 13.12 2015 වර්ෂයේ පවත් වන ලද දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන්

ඉලක්ක කණ්ඩායම	**වැඩසටහන් සංඛ්‍යාව**
පාසල් සිසුන් හා ගුරුභවතුන්	25
පෙරපාසල් ගුරුභවතුන්	04
ප්ලාස්ටික් එක් රැස් කරන හා ප්‍රතිචක්‍රීයකරණ කර්මාන්තකරුවන්	02
රාජ්‍ය නිලධාරින්	17
පළාත් පාලන ආයතන ප්‍රධානින් හා කාර්ය මණ්ඩලය	03
රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා සංවිධාන සාමාජිකයන්, නිවෙස් හිමියන් හා වෙළඳසැල් හිමියන් හා අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශව	21
මුළු වැඩසටහන් සංඛ්‍යාව	72

පෙරපාසල් ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩමුළුව

පාසල් සිසුන් හා ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩසටහන

තෝරාගත් පළාත් පාලන ආයතනවල නිලධාරින් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු නේවාසික වැඩමුළුව

තෝරාගත් පළාත් පාලන ආයතනවල නිලධාරින් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු නේවාසික වැඩමුළුව

මෙම වැඩසටහන්වලදී සහභාගීවන කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා අත්පත්රිකා ,අපද්රව්ය කළමනාකරණය පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපිගොණු කවර ,පෝස්ටර් ආදිය බෙදාදීම සිදුකරන ලදී.

ලිපිගොනු කවර

අත්පත්‍රිකා



පෝස්ටර්

14.2. බෙදාහරිනලද ලිපිගොනු කවර, අත්පත්‍රිකා, පෝස්ටර්

13.2.5 ප්‍රවර්ධන වැඩසටහන්

මෙම ව්‍යාපෘතියේ අරමුණු සාර්ථක කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. විශෙෂ ආගමික වැඩසටහන් ජාතික උත්සව හා ප්‍රාදේශිය විශෙෂ වැඩසටහන් වලදී විවිධ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම, අපද්‍රව්‍ය වෙන්කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා බඳුන් හා මළු බෙදාදීම, බැනර් ප්‍රදර්ශනය, සමරු කලාපවල දැන්වීම් පලකිරීම ආදී ප්‍රවර්ධන කටයුතු රාශියක් සිදුකර ඇත.

13.2.6 විශෙෂ ආගමික උත්සව අවස්ථාවල ප්‍රවර්ධන වැසටහන් ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී පාදස්ථානය ආශ්‍රිත අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ශ්‍රමදාන වැඩසටහන

විශෙෂ ආගමික උත්සව අවස්ථා වල සහභාගි වන ජනතාව බැහැර කරන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැරකිරීමේ ක්‍රමවේදයන් සකස් කර ඒ පිළිබඳව ජනතාව දැනුවත් කරන ආකාරයේ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදුකරන ලදී. ශ්‍රී පාදස්ථානය, තලවිල මංගල්‍යය, කතරගම ඇසළ පෙරහැර, ශ්‍රී දළදා මාලිගාවේ ඇසළ පෙරහැරආදී ආගමික උත්සව අවස්ථා වලදී ව්‍යාපෘතිය විසින් මෙම වැඩසහන ක්‍රියාත්මක කර ඇත.

මුන්නේශ්වරම් කෝවිල ආශ්‍රිතව අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ශ්‍රමදාන වැඩසටහ

තලවිල ශාන්ත අනා දේවස්ථානයේ මංගල්‍ය අවස්ථාවේ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ශ්‍රමදාන වැඩසටහන

13.2.7 අපද්‍රව්‍ය වෙන වෙන්න බැහැරලීමේ බඳුන් කට්ටල මලු ලබාදීම.

මෙම වැඩසටහන යටතේ ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ එක්ව දුම්රිය ස්ථාන භාවිතා කරන ජනතාවට අපද්‍රව්‍ය වෙන් වෙන්ව බැහැරලීමේ ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා මෙම බඳුන් කට්ටල බෙදා දෙන ලදී. 2015 වර්ෂය තුළ දී මෙහි ආරම්භයක් ලෙස කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ සිට මහනුවර දුම්රිය ස්ථානය දක්වා වූ සියළුම දුම්රිය ස්ථාන වලට බඳුන් ලබා දෙන ලදී. මේවායේ එක්රැස් වන ප්ලාස්ටික් ඇතුළු ප්‍රතිචක්‍රීයකරණය කර හැකි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කරා යොමුකිරීමේ වැඩ පිළිවෙලක් ද මෙයට සමගාමීව ක්‍රියාත්මක වේ.

දුම්රිය මධ්‍යස්ථාන සඳහා අපද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් බැහැරලීමේ බඳුන් ප්‍රදානය කිරීම

මීට අමතරව රජයේ කාර්යාල විශෙෂයෙන් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කයේ වල සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වලට වෙන් වෙන් වශයෙන් අපද්‍රව්‍ය බැහැරළිමේ බඳුන් ලබාදීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී. එසෙම අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට ද අපද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් බැහැරලීමේ බඳුන් කට්ටල ලබා දෙන ලදී.

මෙයට අමතරව විශේෂයෙන් පළාත් පාලන ආයතන සඳහා ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැරළිමේ මලු ලබාදීම සිදුකරන ලදී. එසෙම ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් හා ප්‍රතිචක්‍රීයකරණය කර්මාන්ත සඳහා මලු ලබාදීම ද සිදු කර ඇත.

මෙම සියලු ක්‍රියාකාරකම් තුළින් ව්‍යාපෘතිය බලාපොරොත්තු වූ ඉලක්කය වන්නේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණයට යොමු කිරීමයි. 2015 වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම් වලින් මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා විශාල සහනයක් ලැබුණු බව පෙනියයි.

14.3 පාසල් පරිසර නියමු වැඩසටහන

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව පාසල් සිසුන්, පරිසර සංරක්ෂණ ක්‍රියාවලියට දායක කර ගැනීම සඳහා පරිසර නියමු වැඩසටහන පාසල් පද්ධතිය තුළ හඳුන්වා දී ඇත. පරිසර නියමු වැඩසටහන පරිසර ආරක්ෂණය හා සංරක්ෂණය සඳහා ප්‍රධාන ප්‍රවාහකයක් ලෙස පාසල් සිසුන් යොදා ගන්නා අතර අවශ්‍ය පුහුණුව ද ලබා දෙයි. පරිසර නියමු වැඩසටහන මඟින් පරිසර සංරක්ෂණය හා ආරක්ෂණය සඳහා අවශ්‍ය පරිසර දැනුම වැඩි දියුණු කිරීම, කුසලතා සංවර්ධනය හා ආකල්ප වෙනස් කිරීම සිදුකරනු ලබයි.

පරිසර නියමුවන්ගේ ආකල්පමය හා චර්යාත්මක වෙනස්කම් සිදුවීම තුළින් අනාගතයේ පරිසර හිතකාමී සමාජයක් ඇති කිරීමට බලාපොරොත්තු වේ. මෙම වැඩසටහන යටතේ පරිසරය පිළිබඳව මහජනතාවගේ ආකල්පමය චර්යාත්මක වෙනසක් ඇති කිරීමේ ප්‍රධාන වැඩකොටසකට නායකත්වය ලබා දීම පරිසර නියමුවන්ගෙන් බලාපොරොත්තු වේ. පාසල් සිසුන්ගේ දැනුම, කුසලතා වර්ධනය තුළින් ඔවුන්ගේ පරිසරය පිළිබඳ ආකල්පවල වෙනසක් ඇති කිරීමට සමත්ව ඇත. විශෙෂයෙන් ඔවුන් අනාගතයේ වැඩිහිටි පුරවැසියන් බවට පත් වූ පසු පරිසරය පිළිබඳ සාධාරණ තීරණ ගැනීමට පෙළඹේ. එමඟින් රටේ තිරසර සංවර්ධනයක් ස්ථාපිත වේ.

දිවයින පුරා සෑම පාසලකම පරිසර නියමු වැඩසටහන ව්‍යාප්ත කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද 2015-2019 පස් අවුරුදු සැලැස්මේ ව්‍යාපෘති වාර්තාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

පස් අවුරුදු සැලැස්මට අනුව 2015 වර්ෂයේ දී ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව 13.13 දිවයිනේ මුළු පාසල් සංඛ්‍යාව 10,012 (සිංහල හා දෙමළ)

වැඩසටහන	මාධ්‍යය	පවතින පාසල් සංඛ්‍යාව	2015 වර්ෂයේ ආරම්භ කරන ලද සංඛ්‍යාව	මුළු පාසල් සංඛ්‍යාව
ළමා සමාජ වැඩසටහන	සිංහල	784	609	1357
	දෙමළ	588	303	891
පරිසර නියමු වැඩසටහන	සිංහල	1932	544	2476
	දෙමළ	717	31	748

පරිසර නියමු වැඩසටහන ශක්තිමත් කිරීම වෙනුවෙන් 2015 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

13.3.1 ප්‍රාථමික පාසල් ගුරුභවතුන් සඳහා පුහුණු වැඩසටහන්

පරිසර නියමු වැඩසටහන වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීමේ අරමුණින් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම වැදගත් ය. එබැවින් අධ්‍යාපන කලාප මට්ටමින් ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

2015 වර්ෂයේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් ප්‍රාථමික පාසල් ගුරුභවතුන් පුහුණු වැඩසටහන් 10ක් රත්නපුර, කෑගල්ල, අනුරාධපුර,

පොළොන්නරුව, මුලතිව්, යාපනය, මන්නාරම, ගාල්ල, මාතර, නුවරඑළිය දිස්ත්‍රික්කවල දියත් කරන ලදී.

වගුව 13.14 ප්‍රාථමික පාසල් ගුරුභවතුන් සඳහා පුහුණු වැඩසටහන්

අ.අ.	දිනය	ස්ථානය	සහභාගි වූ සංඛ්‍යාව
1.	2015.05.15	කෑගල්ල	75
2.	2015.05.19	මන්නාරම	75
3.	2015.05.21	මාතර	75
4.	2015.05.22	අනුරාධපුර	75
5.	2015.05.29	රත්නපුර	75
6.	2015.06.09	මුලතිව්	81
7.	2015.06.12	යාපනය	67
8.	2015.07.28	නුවරඑළිය	75
9.	2015.10.23	පොළොන්නරුව	75
10.	2015.11.18	ගාල්ල	75
	එකතුව		748

13.3.2 තෝරාගත් පාසල් සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන්

පරිසර නියමුවන්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කිරීම සඳහා තෝරාගත් පරිසර නියමු නායකයන්ට නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. අනාගතයේ සුවදායී පරිසරයක් ඇති කිරීම සඳහා පරිසර හිතකාමී නිවැරදි තීරණ ගන්නා නායකයන් බිහිකිරීම මෙවැනි වැඩසටහන් මඟින් අපේක්ෂා කෙරේ.

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් 2015 වර්ෂයේ නායකත්ව පුහුණු වැඩසටහන් 05ක් දකුණු, මධ්‍යම, උතුරුමැද, ඌව සහ නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක කරන ලදි.

වගුව 13.15 නායකත්ව පුහුණු වැඩසටහන්

අ.අ.	දිනය	ස්ථානය	සහභාගි වූ සංඛ්‍යාව
1.	2015.05.30	ත්‍රිකුණාමලය	72
2.	2015.06.19	අනුරාධපුරය	100
3.	2015.07.09	ගාල්ල	100
4.	2015.07.03	මාතලේ	100
5.	2015.07.24	බදුල්ල	100

අ.අ.	දිනය	ස්ථානය	සහභාගි වූ සංඛ්‍යාව
	එකතුව		**472**

13.3.3 පෙර පාසල් ගුරුභවතුන් සඳහා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් පුහුණු වැඩසටහන්

විවිධ පාරිසරික කරුණු පිළිබඳව පෙර පාසල් සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා පෙර පාසල් අධ්‍යාපන වැඩසටහන දියත් කරන ලදී. එබැවින් දිවයින පුරා පෙර පාසල් ගුරු අත්පොත මුද්‍රණය කර පෙර පාසල් අතරේ බෙදා හරින ලදී. පෙර පාසල් ගුරුභවතුන් පුහුණු කිරීමේ විශෙෂ කරුණක් වන අතර පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් ප්‍රාදේශිය පරිසර නිලධාරින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් ගුරු අත්පොත භාවිත කරමින් සිදු කරන ලදී. පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ පෙර පාසල් ගුරුභවතුන් සඳහා පුහුණු වැඩසටහන් පළාත් මට්ටමින් ප්‍රාදේශිය පරිසර නිලධාරින් මඟින් ක්‍රියාත්මක කරන ලදී.

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් 2015 වර්ෂයේ පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහන් 10ක් මාතලේ, නුවරඑළිය, ත්‍රිකුණාමලය, කිළිනොච්චිය, ගම්පහ, කළුතර, කුරුණෑගල, පුත්තලම, මොණරාගල, රත්නපුර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලදී.

වගුව 13.16 පෙර පාසල් ගුරුභවතුන් සඳහා වූ පුහුණු වැඩසටහන්

අ.අ	දිනය	ස්ථානය	සහභාගි වූ සංඛ්‍යාව
1.	2015.03.10	කිළිනොච්චි	60
2.	2015.05.08	රත්නපුර	55
3.	2015.05.25	මොණරාගල	47
4.	2015.05.26	ගම්පහ	55
5.	2015.07.09	කළුතර	55
6.	2015.07.14	කුරුණෑගල	55
7.	2015.07.23	ත්‍රිකුණාමලය	55
8.	2015.07.23	පුත්තලම	55
9.	2015.07.24	මාතලේ	55
10.	2015.07.24	නුවරඑළිය	55
	එකතුව		**547**

13.3.4 කලාප මට්ටමින් පරිසර නියමු ගුරු පුහුණු වැඩසටහන්

2015 වර්ෂයේ පරිසර නියමු ගුරු පුහුණු වැඩසටහන් 10ක් මොණරාගල (විශෙෂ වැඩසටහනක් ද ඇතුළුව), මන්නාරම, කුරුණෑගල, අනුරාධපුරය,

බදුල්ල, ත්‍රිකුණාමලය, වව්නියාව, කිළිනොච්චි, මහනුවර (ගම්පොළ), මහනුවර දිස්ත්‍රික්කවල පවත්වන ලදී.

වගුව 13.17 වර්ෂයේ පරිසර නියමු ගුරු පුහුණු වැඩසටහන්

අ.අ	දිනය	ස්ථානය	සහභාගි වූ සංඛ්‍යාව
1.	2015.02.18 (තෙදින)	මොණරාගල (විශෙෂ වැඩසටහනක්)	100
2.	2015.04.28	මන්නාරම	75
3.	2015.05.12	කුරුණෑගල	100
4.	2015.05.14	අනුරාධපුරය	100
5.	2015.05.14	ත්‍රිකුණාමලය	75
6.	2015.05.20	බදුල්ල	100
7.	2015.05.29	වව්නියාව	56
8.	2015.05.30	කිළිනොච්චි	68
9.	2015.06.29	මහනුවර (ගම්පොළ)	100
10.	2015.07.10	මහනුවර	100
11.	2015.09.04	මොණරාගල	100
	එකතුව		**974**

13.3.5 කලාප මට්ටමින් විදුහල්පති පුහුණු වැඩසටහන්

2015 වර්ෂයේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මඟින් කලාප මට්ටමින් විදුහල්පති පුහුණු වැඩසටහන් 5ක් බස්නාහිර, මධ්‍යම, ඌව, උතුරුමැද සහ උතුරු පළාත්වල සාර්ථකව පවත්වන ලදී.

වගුව 13.18 විදුහල්පති පුහුණු වැඩසටහන්

අ.අ	දිනය	ස්ථානය	සහභාගි වූ සංඛ්‍යාව
1.	2015.03.16	මන්නාරම	104
2.	2015.05.07	අනුරාධපුරය	100
3.	2015.05.19	බදුල්ල	100
4.	2015.07.17	මාතලේ	100

අ.අ	දිනය	ස්ථානය	සහභාගි වූ සංඛ්‍යාව
5.	2015.10.13	කොළඹ	100
	එකතුව		**504**

13.3.6 පරිසර නියමු සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා දෙදින නේවාසික පුහුණු වැඩසටහන

2015 වර්ෂයේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් පරිසර නියමු සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් 2015 සැප්තැම්බර් 17, 18 හා 19 යන දිනවලදී පස්සර, ඌව කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ දී පවත්වන ලදී.

13.3.7 පරිසර නියමු කොමසාරිස්වරුන් සඳහා තෙදින නේවාසික පුහුණු වැඩසටහන

2015 වර්ෂයේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් 2015 ඔක්තෝම්බර් 01,02 හා 03 දිනවලදී දෙමළ මාධ්‍යය පරිසර නියමු කොමසාරිස්වරුන් පුහුණු කිරීමේ තෙදින නේවාසික වැඩසටහනක් පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ දී පවත්වන ලදී.

13.3.8 පරිසර නියමු වැඩසටහනේ විශිෂ්ට සෙවාවන් සිදුකරන ලද ගුරුවරුන් සඳහා තෙදින නේවාසික පුහුණු වැඩසටහන.

2015 වර්ෂයේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් පරිසර නියමු වැඩසටහනෙහි විශිෂ්ට සෙවාවන් සිදුකරන ලද ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහනක් 2015 අප්‍රේල් 01, 02 හා 03 දිනයන් හිදී කලාවැව ජාතික මිරිදිය ධීවර හා ජලජීවී වගා පුහුණු ආයතනයේ දී විශිෂ්ට සෙවා ගුරුවරුන් 42 දෙනෙක් සඳහා පවත්වන ලදී.

13.3.9 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවත්වන ලද වැඩසටහන්

2015 වර්ෂයේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ගුරු අභ්‍යාසලාභීන් සඳහා පුහුණු වැඩසටහන් 6ක් පවැත්වීමට සැලසුම් කරන ලද අතර වැඩසටහන් 8ක් නිම කිරීමට හැකි විය. එම වැඩසටහන් පහත පරිදි වේ.

වගුව 13.18 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවත්වන ලද වැඩසටහන්

අ.අ	දිනය	ස්ථානය	සහභාගි වූ සංඛ්‍යාව
1.	2015.02.28	ඌව, බණ්ඩාරවෙල ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය	185
2.	2015.03.22	පොළොන්නරුව, පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය	182
3.	2015.03.28	රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය	160
4.	2015.04.26	පොල්ගොල්ල ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය	218
5.	2015.07.18	නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය	197
6.	2015.07.25	වව්නියාව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය	185
7.	2015.08.05	නුවරඑළිය, ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය	183
8.	2015.08.17	මහරගම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය	372
	එකතුව		**1682**

13.3.10 පරිසර නියමු වැඩසටහනට අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය

2015 වර්ෂයේ පරිසර නියමු ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

වගුව 13.19 පරිසර නියමු වැඩසටහනට අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය

අ.අ	ද්‍රව්‍ය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	ඉංග්‍රීසි මාධ්‍යය
1.	පරිසර නියමු සටහන් පොත	2700	6500	-
2.	පරිසර නියමු හිස්වැසුම්	2700	6500	-
3.	පරිසර නියමු පදක්කම්	2700	6500	-
4.	හරිත සහතික	8000	2000	-
5.	හරිත පදක්කම්	8000	2000	-
6.	රජත සහතික	6000	1000	-
7.	රජත පදක්කම්	6000	1000	-
8.	ස්වර්ණ සහතික	1800	200	-
9.	ස්වර්ණ පදක්කම්	1800	200	-
10.	පරිසර නියමු ගුරු අත්පොත	3000	1500	500

අ.අ	ද්‍රව්‍ය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	ඉංග්‍රීසි මාධ්‍යය
11.	පරිසර කොඩි	1000		

නව පරිසර නියමු කණ්ඩායම් ලියාපදිංචිය සඳහා ලැබුණු අතර පදක්කම් සඳහා ලකුණු ලේඛන පළාත්/ දිස්ත්‍රික් කාර්යාලවලින් එවන ලදී. එමෙන්ම පළාත් කාර්යාලවලින් පරිසර නියමු ද්‍රව්‍ය බෙදාදීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

13.3.11 පරිසර ළමා සමාජ ද්‍රව්‍ය බෙදා දීම

පිරිසිදු හා හරිත පරිසරයක් ඇති කිරීම වෙනුවෙන් ප්‍රාථමික අංශයේ 1 සිට 5 ශ්‍රේණිය දක්වා සිසුන්ගේ චර්යා හා ආකල්ප වැඩිදියුණු කිරීම වෙනුවෙන් පරිසර ළමා සමාජ වැඩසටහන හඳුන්වා දී ඇත. මෙවැනි ක්‍රියාකාරකම් නිසා ප්‍රාථමික සිසුන් කුඩා කාලයේ දී පටන් පරිසර හිතකාමී ලෙස හැඩගැසෙනවා මෙන්ම 6 වන ශ්‍රේණිය සිට ඔවුන් පරිසර නියමු වැඩසටහන සඳහා සම්බන්ධ කර ගැනීමට ඉඩ සලසා දෙනු ලබයි.

මේ යටතේ පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

පරිසර ළමා සමාජ ලියාපදිංචිය

පදක්කම් සහ සහතික නිෂ්පාදනය හා බෙදා හැරීම.

පරිසර ළමා සමාජ වැඩසටහන ඇගයීම.

ගුරුවරුන් සහ ප්‍රාදේශිය පරිසර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

පරිසර ළමා සමාජ ගුරු අත්පොත බෙදා දීම.

2015 වර්ෂයේ දී පරිසර ළමා සමාජ ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වාර්තා විය.

වගුව 13.20 2015 වර්ෂයේ දී පරිසර ළමා සමාජ ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රගතිය

අ.අ	ද්‍රව්‍ය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය
1.	සොඛා පදක්කම	11000	3000
2.	තුරුලතා සහතික	25000	5000
3.	විහඟ සහතික	25000	5000
4.	සොඛා සහතික	11000	3000
5.	පරිසර ළමා සමාජ ගුරු අත්පොත	7000	2000

13.3.12 පෙර පාසල් ගුරු අත්පොත මුද්‍රණය

2015 වර්ෂයේ දී පෙර පාසල් ගුරු අත්පොත නිෂ්පාදනයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

වගුව 13.21 පෙර පාසල් ගුරු අත්පොත මුද්‍රණය

අ.අ	ද්‍රව්‍ය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය
1.	පෙර පාසල් ගුරු අත්පොත	1500	500

13.3.13 දිස්ත්‍රික් පරිසර නියමු පුවත්පත මුද්‍රණය (එක් දිස්ත්‍රික්කයකින් පරිසර නියමු පුවත්පතක් බැගින්)

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් පාඨකයින් දැනුවත් කිරීම සඳහා පරිසර නියමු වැඩසටහනේ ක්‍රියාකාරකම් ප්‍රකාශයට පත් කිරීමට දිස්ත්‍රික් පරිසර නියමු පුවත්පත මුද්‍රණය කරන ලදී. මෙම පරිසර නියමු පුවත්පත ප්‍රකාශයට පත් කිරීම එම වැඩසටහන හා සම්බන්ධ වන පාර්ශවයන් අතර අත්දැකීම් හා දැනුම ලබාගැනීම හා බෙදා දීම ද බලාපොරොත්තු වේ. 2015 වර්ෂයේ දී පරිසර නියමු දිස්ත්‍රික් පුවත්පත දිස්ත්‍රික් 25ක (එක් දිස්ත්‍රික්කයකට පිටපත් 2000 බැගින්) මුද්‍රණය කර බෙදා හරින ලදී.

13.3.14 දිස්ත්‍රික් පරිසර නියමු කඳවුරු පැවැත්වීම.

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් වාර්ෂිකව ජාතික පරිසර නියමු කඳවුර සංවිධාන කර පවත්වනු ලබන අතර එම කඳවුරේදී පරිසර නියමුවන් ඔවුන්ගේ අත්දැකීම් හා දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාවක් උදා වේ. 2015 වර්ෂයේ ජාතික පරිසර නියමු කඳවුරක් වෙනුවට දිස්ත්‍රික් පරිසර නියමු කඳවුරු 10ක් පැවැත්වීමට ප්‍රතිපාදන ලබා දෙන ලදී. 2015 වර්ෂයේ දී දෙදින දිස්ත්‍රික් පරිසර නියමු කඳවුරු නුවරඑළිය, කෑගල්ල, පොළොන්නරුව, ගම්පහ, බදුල්ල, ගාල්ල, මඩකලපුව, මාතර, මොණරාගල, වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි දී පවත්වන ලදී. එක් පරිසර නියමු දිස්ත්‍රික් කඳවුරු සඳහා පරිසර නියමුවන් 125 දෙනෙකු බැගින් සහභාගි විය.

13.3.15 ජනාධිපති පදක්කම් ප්‍රදානය

පරිසර නියමු වැඩසටහනේ ඉහළම පදක්කම ජනාධිපති පදක්කම වේ. තෝරා ගන්නා ලද විනිශ්චය මණ්ඩල 05ක් මඟින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මඟින් පරිසර නියමු සිසුන් සඳහා මෙම පදක්කම ලබා ගැනීමට අවස්ථාව උදා වේ. 2015 වර්ෂයේ දී ජනාධිපති පදක්කම් ප්‍රදානෝත්සවය අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසෙන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2015 ඔක්තෝබර් 22 වෙනි දින කොළඹ, ජනාධිපති මන්දිරයේදී පවත්වන ලදී. පරිසර නියමු ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලද පරිසර නියමුවන් 71 දෙනෙකු සඳහා ජනාධිපති පදක්කම් ප්‍රදානය කරන ලදී. විදුහල්පතිවරුන් 33 දෙනෙකු, ගුරුවරුන් 33 දෙනෙකු හා පළාත් මට්ටමේ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශිය පරිසර නිලධාරීන් ජනාධිපති පදක්කම් ප්‍රදානෝත්සවයට සහභාගි විය.

13.3.16 පිරිසිදු හා හරිත පරිසරයක් යුත් හොඳම පාසල තේරීම (සුවසර තක්සලාව වැඩසටහන)

මෙම තරඟයේදී පාසල් සිසුන් පරිසර ක්‍රියාකාරකම් සඳහා යොමු කරනු ලබයි. මෙහිදී, සුවදායි හරිත පරිසරයකින් යුත් පාසල් තෝරා ගැනීම සිදු කරනු ලබයි. 2015 වර්ෂයේ දී දිවයින පුරා පාසල් අතරින්

එක් දිස්ත්‍රික්කයකින් හොඳම හරිත පරිසරයකින් යුත් පාසල් තුනක් බැගින් දිස්ත්‍රික් 25 සඳහා තෝරා ගන්නා ලදී. ඒ අනුව දිවයින පුරා පාසල් 75ක් සඳහා මුදල් ත්‍යාග පිරිනමනු ලැබිය.

13.3.7 පරිසර නියමු කොමසාරිස්වරුන් සහ ප්‍රාදේශිය පරිසර නිලධාරින් සමඟ පළාත් මට්ටමින් ප්‍රගති සමාලෝචන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2015 වර්ෂයේ දී පරිසර නියමු වැඩසටහනේ ලබාදුන් ඉලක්කවල ප්‍රගතිය අධීක්ෂණය සඳහා පළාත් 9 හි ප්‍රගති සමාලෝචන සහ ඇගයීම් වැඩසටහන් 9ක් පවත්වන ලදී.

13.3.18 පරිසර නියමු කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් උපදේශකවරුන් සඳහා ගමන් වියදම් දීමනාව ලබාදීම.

2015 වර්ෂය සඳහා පරිසර නියමු කොමසාරිස්වරුන් හා දිස්ත්‍රික් උපදේශකවරුන් 47 දෙනෙකු සඳහා ගමන් වියදම් දීමනාව ලබා දෙන ලදී.

13.3.19 ඉහළ කුසලතා දැක්වූ පාසල් සඳහා පුස්තකාල ද්‍රව්‍යයන් සැපයීම.

2015 වර්ෂයේදී ගම්පහ, මාතලේ, බදුල්ල, අනුරාධපුර සහ යාපනය යන දිස්ත්‍රික්කවල පරිසර නියමු වැඩසටහනේ ඉහළ කුසලතා දැක්වූ පාසල් 5ක් සඳහා පුස්තකාල ද්‍රව්‍ය (පොත්, සඟරා, පෝස්ටර්ස්, පත්‍රිකා සහ වෙනත් ද්‍රව්‍යයන්) බෙදා දෙන ලදී.

1. මාතලේ - ඕවිලිකන්ද ම.වි, මාතලේ

2. බදුල්ල - දබාන ක.වි, බදුල්ල

3. යාපනය - වේලනයි ම.ම.වි, යාපනය

4. ගම්පහ - හුණුමල්ල ම.වි

5. අනුරාධපුර - කලත්තෑව ම.වි

13.3.20 පළාත් කාර්යාල සඳහා පරිසර නියමු දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා පරිගණක යන්ත්‍ර 9ක් ලබාදීම.

2015 වර්ෂයේ දී පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් පරිසර නියමු වැඩසටහනේ දත්ත පද්ධතිය පවත්වා ගෙන යාම සඳහා පළාත් මට්ටමින් පරිගණක යන්ත්‍ර 9ක් බෙදා දෙන ලදී.

13.3.21 ඉහළ දක්ෂතා දැක්වූ ජනාධිපති පදක්කම් ලාභීන් සඳහා විදේශ අත්දැකීම් හා පුහුණුව ලබා දීම.

2015 වර්ෂයේ පස් අවුරුදු සැලැස්ම යටතේ විශිෂ්ට කුසලතාවයක් දැක්වූ ජනාධිපති පදක්කම්ලාභී සිසුන් විශිෂ්ට කුසලතාවයන් දැක්වූ කාර්යභාර ගුරුභවතුන්, මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරිනියක් සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශිය පරිසර නිලධාරින්, පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශයේ නිලධාරීන් සඳහා ඉන්දියාවේ කෙටි අධ්‍යයන චාරිකාවක් සංවිධානය කරන ලදී. විදේශ රටවල ක්‍රියාත්මක වන පරිසරය සුරැකීමේ සහ දැනුවත් කිරීමේ ක්‍රමවේද දැන හඳුනා ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට විදේශ පුහුණුව ලබා දීම මෙම වැඩසටහනේ අරමුණ වේ. එමඟින් මෙම වැඩසටහන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. 2015 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරිනියක්, පරිසර නියමු කාර්යභාර ගුරු භවතුන් 4 දෙනෙකු, පළාත් හා දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරින් 5 දෙනෙකු, මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ නිලධාරින් 4 දෙනෙකු සහ ඉහළ කුසලතාවයන් දැක්වූ ජනාධිපති පදක්කම් ලාභීන් 16 දෙනෙකු නවදිල්ලියේ විද්‍යාව හා පරිසරය පිළිබඳ ආයතනයේදී (Center for Science &Environment) 2015 නොවැම්බර් 28

දින සිට දෙසැම්බර් 04 දක්වා පැවති පුහුණු වැඩසටහනට සහභාගි විය.

13.3.22 ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම.

2004වර්ෂයේ දී කරන ලද ස්වායත්ත ඇගයීමට අනුව පරිසර නියමු වැඩසටහන මහින් පාසල් සිසුන් හට පරිසර අධ්‍යාපනය හා දැනුවත් භාවය ලබාදීම සැලකිය යුතු සාර්ථකත්වයක් දක්නට ඇති නමුත් මෙහි නියම බලපෑම ආයතනික හා සංවිධානාත්මකබවේ ගැටලු නිසා එල දරා නැත . එබැවින් මෙම වාර්තාවේ යෝජනාවකට අනුව ජාතික පරිසර නියමු මෙහෙයුම් කමිටුවක් පිහිටුවීමට තීරණය කරන ලදී 2015 .වර්ෂයේ දී ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමක් හා අනුකමිටු රැස්වීමක් පවත්වන ලදී.

13.4 මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරයන් බල ගැන්වීම සහ එමගින් දිවයින පුරා සිදු කරනු ලබන පසු විපරම් ක්‍රියාවලියේ ශක්‍යතාවය ප්‍රවර්ධනය කිරීම

2014 වර්ෂයේ දී දකුණ, ඌව,උතුරු, උතුරු මැද, සබරගමුව සහ වයඹ යන පළාත් සඳහා පළාත් රසායනාගාර හයක් සහ ගම්පහ දිස්ත්‍රික්කය සඳහා එක් දිස්ත්‍රික් රසායනාගාරයක් ද වන පරිදි රසායනාගාර ස්ථාපිත කිරීමට පරිසර අධිකාරිය මගින් සැලසුම් කරන ලදී. එම රසායනාගාර සඳහා අවශ්‍ය කරන රසායනාගාර උපකරණ,විදුරු උපකරණ සහ රසායනික ද්‍රව්‍ය මිල දී ගන්නා ලදී.

2015 වර්ෂය තුල දී 2014 වර්ෂය තුල දී මිල දී නොගත් රසායනාගාර උපකරණ, විදුරු උපකරණ සහ රසායනික ද්‍රව්‍ය ආදියේ ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කිරීමටත් රසායනාගාර වල කටයුතු ආරම්භ කිරීමටත්හැකි විය.

මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරයන් බල ගැන්වීම සඳහා රුපියල් මිලියන 30 ක මුදලක් යොදවන ලදී. රුපියල් මිලියන 7 ක මුදලක් 2015 වර්ෂය තුල දී නිම කරන ලද, 2014 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා වැය විය. මෙහිදී රසායනාගාර උපකරණ ප්‍රසම්පාදනය සඳහා පමණක් රුපියල් මිලියන 17 කට ආසන්න මුදලක් වැය විය. විදුරු උපකරණ සහ රසායනික ද්‍රව්‍ය ප්‍රසම්පාදනයටත් සියලුම රසායනාගාර සඳහා අනෙකුත් යටිතල පහසුකම් සැපයීම සඳහාත් ආසන්න වශයෙන් රුපියල් මිලියන 4 ක මුදලක් යොදවන ලදී.

නව රසායනාගාරයන්හි විශ්ලේෂණ කටයුතු ආරම්භ කරන ලද අතර ක්‍රමයෙන් එමකටයුතු දියුණු කෙරෙයි.කාර්ය මණ්ඩලය නොමැති බැවින් සබරගමු පළාත් රසායනාගාරයේ කටයුතු ආරම්භ නොවුන අතර සුදුසු ස්ථානයක් නොමැති බැවින් ගම්පහ රසායනාගාරයේ කටයුතු 2016 වර්ෂයේ දී දොම්පේ සනීපාරක්ෂක කසල රඳවන භූමියේ (ග්‍රීන් පාර්ක්) දී ආරම්භ කෙරේ.

වගුව 13.22 2015වර්ෂය තුල ජල තත්ත්ව පසුවිපරම් කටයුතු සිදු කිරීමේ ප්‍රගතිය

පළාත්රසායනාගාරය	පරිසර ආරක්ෂණ [illegible]		[illegible]	[illegible]		[illegible]
මධ්‍යම රසායනාගාරය	181	123	127	51	128	395
දකුණු පළාත් රසායනාගාරය	41	07	39	-	-	-
උතුරු පළාත් රසායනාගාරය		01	73		40	
නැගෙනහිර පළාත් රසායනාගාරය	4	6	78	1		
වයඹ පළාත් රසායනාගාරය	21	2	12	0	0	1
උතුරු මැද පළාත් රසායනාගාරය	62	-	07	-	-	-

පළාත්රසායනාගාරය	පරිසර ආරක්ෂණ බලපත්‍ර					
ඌව පළාත් රසායනාගාරය	-	-	49	-	19	-
මධ්‍යම පළාත් රසායනාගාරය	176	1	6	2	77	-

මධ්‍යම පළාත් රසායනාගාරය මගින් පරිසර ආරක්ෂණ බලපත්‍ර සඳහා විශ්ලේෂණය කරන ලද නියැදි මුදලට සිදුකරඇත.

මතු පිට ජලයේ තත්ත්වය පසු විපරම් කිරීමේ වැඩසටහන

මතු පිට ජලය පසු විපරමට ලක් කිරීමේ වැඩසටහන් කිහිපයක්ම මධ්‍යම පරිසර අධිකාරියේ මධ්‍යම රසායනාගාරය මගින් ක්‍රියාත්මක කරන ලදී.මහ ඔය,දඬුගම් ඔය,බෙන්තොට ගඟ මීට අයත්වේ.එහි දී සාමාන්‍ය පරිදි 2015 වසරේදී ද පෙර නිර්ණය කරනලද නියදි රැස් කිරීමේ ස්ථාන වලින් මාසිකව මතු පිට ජල නියදි ලබා ගෙන ඒවායේ භෞතික,රසායනික සහ ක්ෂුද්‍ර ජෛව විද්‍යාත්මක පරාමිතීන් පසු විපරමට ලක් කරන ලදී.

වගුව 13.23 2015 වසර තුලදීපසු විපරමට ලක් කළ ජල ප්‍රභව

ජල ප්‍රභවයේ නම	රැස් කළ නියදි ගණන
මහ ඔය	74
දඬුගම් ඔය	71
බෙන්තොට ගඟ	70

13.4.1 2015 වසර තුල දී මහ ඔයේ ජලයේ තත්ත්වය පසු විපරමට ලක් කිරීම

2015 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ දී තෝරා ගත් නියදි රැස් කිරීමේ ස්ථාන අටකට දී මහ ඔයේ ජලය භෞතික,රසායනික සහ ක්ෂුද්‍ර ජෛව විද්‍යාත්මක පරාමිතීන් යටතේ ඇගයීමට ලක් කරන ලදී. නමුත් අයහපත් කාලගුණය හේතුවෙන් සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාස දෙකෙහි දී ජල නියැදි ලබා ගත නොහැකි විය.

වගුව 13.24 මා ඔයේ ජල නියදි රැස් කිරීමේ ස්ථාන

නියදි රැස් කිරීමේ ස්ථාන	භූ ගෝලීය පිහිටීම
නියදි රැස් කිරීමේ ස්ථානය 1 (කොවිකඩේ පාලම)	නැ.දේ 79 51 51, උ.අ. 7 16 14

නියඳි රැස් කිරීමේ ස්ථාන	භූ ගෝලීය පිහිටීම
නියඳි රැස් කිරීමේ ස්ථානය 2 (බඩල්ගම පාලම)	නැ.දේ 80 11 39, උ.අ. 7 18 07
නියඳි රැස් කිරීමේ ස්ථානය 3 (කොටදෙණියාව පාලම)	නැ.දේ 80 03 41, උ.අ. 7 17 07
නියඳි රැස් කිරීමේ ස්ථානය 4 (ගිරිඋල්ල පාලම)	නැ.දේ 80 07 23, උ.අ. 7 19 45
නියඳි රැස් කිරීමේ ස්ථානය 5 (අලවුව පාලම)	නැ.දේ 80 14 26, උ.අ. 7 17 34
නියඳි රැස් කිරීමේ ස්ථානය 6 (කරදන පාලම)	නැ.දේ 80 18 55, උ.අ. 7 19 17
නියඳි රැස් කිරීමේ ස්ථානය 7(හිරිවඩුන්න පාලම)	නැ.දේ 80 23 04, උ.අ. 7 17 17
නියඳි රැස් කිරීමේ ස්ථානය 8 (මාවනැල්ල පාලම)	නැ.දේ 80 26 20, උ.අ. 7 15 10



රූපය 14.3: මා ඔයේ නියඳි රැස් කිරීමේ ස්ථාන

13.4.1.2 2015 වසර තුල දී මහ ඔයේ ජලයේ තත්ත්වය

2015 වසරේ දී මා ඔයේ ජලයේ තත්ත්වය භෞතික,රසායනික සහ ක්ෂුද්‍ර ජෛව විද්‍යාත්මක පරාමිතීන් යටතේ ඇගයීමට ලක් කරන ලදී. ඔය දිගේ තෝරා ගත් සෑම නියඳි රැස් කිරීමේ ස්ථානයකදීම ජලයේ අඩංගු ක්ෂුද්‍ර ජීවීන් මගින් පෙනී යන්නේ ජලයට අධික ලෙස අපජලය මිශ්‍ර වන බවයි.මෙම තත්ත්වය වසර මුළුල්ලේම නිරීක්ෂණය කළ හැකි විය. මෙම ජලයේ ඉහළ ආවිලතා අගයන් ඔයේ ඉහළ ජලාධාර ප්‍රදේශ වල දී අධික ලෙස පාංශු ඛාදනය ,මැණික් ගැරීම,වැලිගොඩ දැමීම වැනි ක්‍රියාකාරකම් සහ නාගරික අප ජලය එක් වීම ආදිය නිසා මා ඔයේ ජලයේ තත්ත්වය හායනය වේ.තව ද විවිධ කාල වල දී ඔයේ එක් එක් පදේශ වලින් ඉහළ විද්‍යුත් සන්නායකතා අගයන් සහ ඉහළ රසායනික ඔකසිජන් ඉල්ලුමක් වාර්තා විය.

2015 වසර තුළ දී මූලික පරාමිතීන්ගේ සිදු වූ විචලනයන් පහත ප්‍රස්ථාරිකව නිරූපනය වේ.



රූපය 14.4: 2015 වසර තුල මා ඔයේ ජලයේ pH විචලනය



රූපය 14.5 : 2015 වසර තුල මා ඔයේ ජලයේ ආවිලතාවයේ විචලනය



රූපය 14.6: 2015 වසර තුල මා ඔයේ ද්‍රාවිත ඔක්සිජන් ප්‍රමාණය විචලනය



රූපය 14.7: 2015 වසර තුල මා ඔයේ ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුමෙහි විචලනය



රූපය 14.8: 2015 වසර තුල මා ඔයේ ජලයේ ක්ලෝරයිඩ ප්‍රමාණය විචලනය



රූපය 14.9: 2015 වසර තුල මා ඔයේ ජලයේ මුළු කෝලි ආකාර බැක්ටීරියා ප්‍රමාණය විචලනය

13.4.1.3 දඬුගම් ඔයේ ජලයේ තත්ත්වය පසු විපරමට ලක් කිරීම

තෝරා ගත් නියඳි රැස් කිරීමේ ස්ථාන හයකට අදාලව 2014 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ දී දඬුගම් ඔයේ ජලයේ තත්ත්වය ඇගයීමට ලක් කරන ලදී.

වගුව 13.25 දඬුගම් ඔයේ ජලයේ තත්ත්වය පසු විපරමට ලක් කිරීම

නියඳි රැස් කිරීමේ ස්ථාන	භූ ගෝලීය පිහිටීම
නියඳි රැස් කිරීමේ ස්ථානය 1 (කිරිඳිවිට පාලම)	නැ දේ.44386380, උ .අ.0784148
නියඳි රැස් කිරීමේ ස්ථානය 2 (කොටුගොඩ පාලම)	නැ දේ.44381229, උ .අ.0787535
නියඳි රැස් කිරීමේ ස්ථානය 3 (ඕපාත පාලම)	නැ දේ.44380612, උ .අ.0789277

නියඳි රැස් කිරීමේ ස්ථාන	භූ ගෝලීය පිහිටීම
නියඳි රැස් කිරීමේ ස්ථානය 4 (මුතුවාඩිය පාලම)	නැ දේ.44377962, උ .අ.0791871
නියඳි රැස් කිරීමේ ස්ථානය 5 (පල්ලිය හන්දිය පාලම)	නැ දේ.44377454, උ .අ.0788598
නියඳි රැස් කිරීමේ ස්ථානය 6 (කිරිදිගොඩ පාලම)	නැ දේ.44376592, උ .අ.0786017



රූපය 14.10: දඬුගම් ඔයේ ජල නියඳි රැස් කිරීමේ ස්ථාන

දඬුගම් ඔයේ ජලයේ තත්ත්වය පහත ප්‍රස්ථාරිකව නිරූපනය කෙරේ.

දඬුගම් ඔයේ ඉහළ සිට පහළට යන විට ජලයේ තත්ත්වය හායනයට ලක් වීමක් වාර්තා වේජල දූෂණ .කාරක ඔය පහළට යන විට ගෘහාශ්‍රිත මූලාශ්‍ර වල සිට කර්මාන්ත මූලාශ්‍ර දක්වා වෙනස් වේ .එසෙම 2015 වසරේ දී විශ්ලේෂණය කරන ලද සියලුම පරාමිතීන්ට අනුව දඬුගම් ඔයේ ජලයේ තත්ත්වය සතුටුදායක නොවන බව පැහැදිලි වේ.

දඬුගම් ඔයේ ජලයේ තත්ත්වය පහත ප්‍රස්ථාරිකව නිරූපනය කෙරේ.



රූපය 14.11 : 2015 වසර දඬුගම් ඔයේ ජලයේ pH අගය විචලනය



රූපය 14.12 : 2015 වසර දඬුගම් ඔයේ ජලයේ විද්‍යුත් සන්නායකතාව විචලනය



රූපය 14.13: 2015 වසර දඬුගම් ඔයේ ජලයේ ද්‍රාවිත ඔක්සිජන් මට්ටම විචලනය



රූපය 14.14: 2015 වසර දඬුගම් ඔයේ ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුම විචලනය



රූපය 14.15: 2015 වසර තුල දී දඬුගම් ඔයේ ජලයේ ක්ලෝරයිඩ ප්‍රමාණයේ විචලනය



රූපය 14.16: 2015 වසර දඬුගම් ඔයේ ජලයේ නයිට්‍රේට් ප්‍රමාණය විචලනය

13.4.1.4 බෙන්තොට ගඟේ ජලයේ තත්ත්වය පසු විපරමට ලක් කිරීම

2015වසර තුළ දී බෙන්තොට ගඟේ ජලය භෞතික, රසායනික සහ ක්ෂුද්‍ර ජෛව විද්‍යාත්මක පරාමිතීන් යටතේ ඇගයීමට ලක් කරන ලදී .මේ අනුව තෝරා ගත් නියඳි රැස් කිරීමේ ස්ථාන හයක් මාසිකව පසුවිපරමට ලක් විය.pH,විද්යුත් සන්නායකතාවය,ආවිලතාවය, සහ උෂ්ණත්වය යන පරාමිතීන් නියඳි රැස් කරන අවස්ථාවේ දීම මිනුම් කරන ලදී.

ගඟ දිගේ තෝරා ගත් සෑම නියඳි රැස් කිරීමේ ස්ථානයකදීම ජලයේ අඩංගු ක්ෂුද්‍ර ජීවීන් මගින් පෙනී යන්නේ ජලයට අධික ලෙස අපජලය මිශ්‍ර වන බවයි.මෙම තත්ත්වය වසර මුළුල්ලේම නිරීක්ෂණය කළ හැකි විය .

අනෙකුත් ජල ප්‍රභව සමග සන්සන්දනය කර බලන විට රසායනික ජල දූෂක වලට වඩා ගෘහස්ථ සහ නාගරික කැලි කසළ සහ අපජලය බෙන්තොට ගඟේ ජලයෙහි ගුණාත්මක භාවය හායනය වීමකෙරෙහී බලපා ඇති බව පෙනේ .

බෙන්තොට ගඟේ ජලයේ තත්ත්වය පහත ප්‍රස්ථාරිකව නිරූපනය කෙරේ.



රූපය 14.17 : 2015 වසර බෙන්තොට ගඟේ ජලයේ pH අගය විචලනය



රූපය 14.18: 2015 වසර බෙන්තොට ගඟේ ජලයේ විද්‍යුත් සන්නායකතාව විචලනය



රූපය 14.19: 2015 වසර තුල බෙන්තොට ගඟේ ජලයේ ද්‍රාවිත ඔක්සිජන් ප්‍රමාණය විචලනය



රූපය 14.20: 2015 වසර තුල බෙන්තොට ගඟේ ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුම විචලනය

13.5 ශ්‍රී ලංකායේ ඝන අපද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (EDCF ව්‍යාපෘතිය)

13.5.1 හැඳින්වීම

13.5.1.1 පසුබිම

වර්තමානයේ අවධිමත් ලෙස නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම තුළින් පාරිසරික සහ සෞඛ්‍යමය ගැටළු රාශියක් උද්ගතවී ඇති අතරමේ සඳහා විසඳුමක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඒකාබද්ධ කසළ කළමනාකරණ ක්‍රමවේදය හඳුන්වා දී ඇත. එහිදී අවශෙෂ නාගරික කසළ අවසාන බැහැරලීමට පහසුකම් සැලසීම සඳහා විද්‍යාත්මකව පිළිගත් සනීපාරක්ෂක කසළ රඳවන ඉදිකිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා රජයේ අනුමත ක්‍රමවේද අනුගමනය කරමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ තෝරාගත් නගරවල සනීපාරක්ෂක කසළ රඳවන 4ක් ඉදිකිරීම සඳහා කොරියානු අපනයන - ආනයන බැංකුවේ ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදලෙන් (EDCF) මූල්‍යමය සහාය ලබා ගැනීමට මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් සිදුකරන ලදි.

මෙමයෝජනාවට අනුව අනුරාධපුරය කීරක්කුලම, හික්කඩුව මොනරෝවියාවත්ත, පානදුර මාලමුල්ල හා උඩුනුවර ගෝනාධිකවත්ත යන ප්‍රදේශවලමෙමඟින් සනීපාරක්ෂක කසල රඳවන ඉදිකිරීමට අපේකෂිතය.අදාල පළාත්පාලන ආයතනවලින්බැහැරලන අවශෙෂකසළ සඳහා පොකුරු ක්‍රමය යටතේ අවසාන බැහැරලීමේ පහසුකම් ලබා දීමට බලාපොරොත්තු වේ.

මෙම ව්‍යාපෘතියේ පූර්ණ ඇස්තමේනතුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 41.886ක් වන අතර ඉන් මිලියන 33.536ක ප්‍රමාණයක් අපනයන සංවර්ධන සහයෝගීතා අරමුදලෙන් (EDCF) ලබා ගැනීමට නියමිත අතර මිලියන 8.350ක් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලැබේ.අපනයන සංවර්ධන සහයෝගීතා අරමුදල වෙතින් ලබා දෙන ණය ආධාර සඳහා කොන්දේසි, තත්වයන් ණය මුදල ලබා ගන්නා රට අනුව රඳා පවතී.

13.5.1.2 ව්‍යාපෘති විෂය පථය

- පහත සඳහන් ස්ථානයන්හි සනීපාරක්ෂක බිම් පිරවුම් ඉදිකිරීම.
    - යුදගනාව , මැදිරිගිරිය (මාලමුල්ල , පානදුර වෙනුවට)
    - නැගෙනහිර නුවරගම්පළාත, අනුරාධපුරය
    - කීරිමලෙ, යාපනය (ගෝනදිකවත්ත, උඩුනුවර වෙනුවට)
    - හික්කඩුව, මොන්රොවියාවත්ත
- ක්ෂීරිත කළමනාකරණ ක්‍රමවේද සඳහා සැලසුම් ස්ථාපිත කිරීම.
- බිම් පිරවුම් වායු කළමනාකරණ ක්‍රමවේද සඳහා සැලසුම් ස්ථාපිත කිරීම.
- අපද්‍රව්‍ය ඇස්තමේන්තු ගත කිරීම.
- අපද්‍රව්‍ය බැහැරලීමේ ක්‍රමවේද සහ පහසුකම් ශක්‍යතාව/පරිමාණය ඇගයීම

අපේක්ෂිත ප්‍රතිලාභ හා ප්‍රතිඵල

මෙකී ප්‍රදේශයන් පවිත්‍රව තබා ගැනීම සඳහා අවශ්‍යවන යටිතල පහසුකම් ගොඩනැගීමෙහිලා මෙම ව්‍යාපෘතියේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් උපකාරී වනු ඇත. ව්‍යාපෘතිය නිමවීමත් සමඟ රැකියා අවස්ථා උත්පාදනය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය මඟින් ජාතික ප්‍රතිරූපය ගොඩනැගීම සිදු වේ. මෙම ව්‍යාපෘතිය මඟින් නගරසභාවලට අයත් ඝන අපද්‍රව්‍ය ක්‍රමානුකූලව අපහරණය සහ කළමනාකරණය කිරීම හරහා වඩා හොඳ මහජන සෞඛ්‍ය සහ සනීපාරක්ෂක මට්ටමක් සුරක්ෂිත

කෙරෙන අතර එමඟින් රෝගී තත්වයන්ට ගොදුරුවීමේ සම්භාවිතාව අඩුවන අතර ඒ හරහා ආදයම් සුරකීම උපකාරී වේ.අවසානයේදී,

- ව්‍යාපෘති භූමිය ආශ්‍රිත පාරිසරික තත්ව වැඩි දියුණු කිරීමට.
- ප්‍රදේශවාසී පදිංචිකරුවන්ගේ සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව ඉහල නැංවීමට.
- ඉවතලන අපවිත්‍ර ජලය පිළිබඳ ගැටළු සඳහා වඩා සනීපාරක්ෂක විසඳුමක් ලබා දීම.
- පාංශු, ජල හා වායු දූෂණය සහ අනෙකුත් පාරිසරික සහ සමාජ, ආර්ථික ගැටළු අවම කිරීමට.
- ඒකාබද්ධ සහ අපද්‍රව්‍ය පිළියම් උදෙසා පහසුකම් සැලසීමේ මෙහෙයුම්වල තාක්ෂණික විශෙෂඥතාවය පවරාදීමට. මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂාකරන සුවිශෙෂී පාරිසරික, තාක්ෂණික සහ සාමාජ ආර්ථික ප්‍රතිලාභ පහත පරිදි වේ.පාරිසරික ප්‍රතිලාභ

- ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම
- සනීපාරක්ෂක පිළියම් පද්ධති මඟින් පදිංචිකරුවන්ට ප්‍රසන්න ජීවී පරිසර තත්වයක් උදාකිරීමට දායක වීම.
- සනීපාරක්ෂක පිළියම් පද්ධති හරහා පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය තත්වය ඉහල නැංවීම.
- ද්විතීක පරිසර ආශ්‍රිත ගැටළු අවම කිරීම සහ ක්‍රමානුකූල විද්‍යාත්මක පිළියම් ක්‍රියාවලියක් අනුගමනය කිරීම තුළින් භූමි අලංකරණය වැඩිදියුණු කිරීම.
- අක්‍රමිකව සිදු කරනු ලබන අනවසර අපද්‍රව්‍ය බැහැරකිරීම් මඟින් සිදුවන පරිසර දූෂණයෙන් භූමි ප්‍රදේශය ආරක්ෂා කර ගැනීම.
- විවිධ ප්‍රජා පැමිණිලි නිරාකරණය/නිවාරණය කිරීම සහ ජීවී පරිසරය සංරක්ෂනය කිරීම සහ පුරවැසියන්ගේ යහපත් සෞඛ්‍ය තත්වය සුරක්ෂිත කිරීම.
- ශ්‍රී ලංකා රජයට ජාතික භූමි පරිභෝජන සැලැස්ම අනුව විශ්‍රාන්තිකර හා විනෝදාශ්වාදී ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් භූමි භාගයක් සුරක්ෂිත කර ගැනීම සඳහා ඉඩහසර ලබා දීම.

තාක්ෂණික ප්‍රතිලාභ

- විස්තීර්ණ කළමනාකරණයක් තුළින් විශ්වාසනීය හා සකසුරුවම් අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම.
- දීර්ඝකාලීන පදනම මත සෞඛ්‍යාරක්ෂිතව අපද්‍රව්‍ය බැහැර කිරීම.
- බිම් පිරුවුම් මෙහෙයවීම නඩත්තුව පිළිබඳ තාක්ෂණික දැනුම එක්රැස් කර ගැනීම.
- ක්ෂීරිත පිළියම් සහ කළමනාකරණ තාක්ෂණය ඒකරාශී කර ගැනීම.

ආර්ථික ප්‍රතිලාභ

- සහෙතුක ඉඩම් පරිභෝජනය.
- අපද්‍රව්‍ය පිළියම් සඳහා පදිංචිකරුවන් හට වැයවෙන පිරිවැය ඉතිරි වීම.
- ඉදිකරීම් හා මෙහෙයුම් කටයුතු වල රැකියා අවස්ථා බිහි වීම.
- බිම් පිරවුම වැඩිදියුණු කිරීමේ කටයුතු තුළින් පරිසරය පිළිබඳ පුරවැසියන්ගේ දැනුවත් භාවය වැඩිදියුණු කිරීම.

- අවට පිහිටි පරිසරය හා බැඳුණු පහසුකම් සමඟ සුසංගතික අන්තර් ක්‍රියාකාරී කෘත්‍යයන් ස්ථාපනය කිරීම මඟින් ආර්ථික ප්‍රතිලාභ ප්‍රසම්පාදනය.
- ගෘහස්ථ අපද්‍රව්‍ය කළමණාකරණය සහ බැහැරලීම සඳහා වැයවන පිරිවැය ඉතිරිවීම.
- ද්‍රව්‍යමය සම්පත් ප්‍රතිචක්‍රීකරණය හරහා පිරිවැය කාර්යක්ෂමතාවය ළඟාකර ගැනීම.

සමාජ ප්‍රතිලාභ

- විශ්වසනීය සහ සෞඛ්‍යාරක්ෂිත අපද්‍රව්‍ය පිළියම් පහසුකම් ප්‍රසම්පාදනය.
- අදාල පරිසරයට වඩාත්ම උචිත වන්නාවූ පරිදෙන් බිම් පිරවුම් ඉදිකිරීම මඟින් නුසුදුසු පහසුකම් වලට එරෙහිව සතුටුදායී ආකල්ප ඇති කරලීම.
- පරිසර හිතකාමී සංකල්ප යොදාගැනීම මඟින් පරිසරය සහ බිම් පිරවුම් පහසුකම් පිළිබඳව ජනතා අවබෝධය පුළුල් කිරීම.
- අපද්‍රව්‍ය පිලියම් පහසුකම් ඉදිකිරීම මඟින් බිම් පිරුවම් සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීමේ ගැටළුව නිරාකරණය වීම.
- දීර්ඝ කාලීන පදනමෙන් සනීපාරක්ෂක බිම් පිරවුම් ඉදිකිරීම සුරක්ෂිතකිරීම.
- ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීම.

13.5.1.3 ව්‍යාපෘති ස්ථාන



රූපය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශ 14.21

13.5.2 අනුරාධපුර, කීරක්කුලම හා හික්කඩුව මොන්රෝවියාවත්ත

උක්ත ව්‍යාපෘති දෙකට අදාල සංකල්පිත සැලැසුම් වාර්තා (Conceptual Design Report) ව්‍යාපෘති කාර්යාලය වෙත ලැබුනු අතර එම වාර්තා තාක්ෂණික ඇගයීම් කමිටුව හා අදාල ප්‍රාදේශීය විශෙෂඥයන්ගේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ඇගයීමට භාජනයකරන ලදි.

සංකල්පිත සැලැසුම් වාර්තා ඇගයීම - කිරික්කුලම
2015.11.06

සංකල්පිත සැලැසුම් වාර්තා ඇගයීම - මොන්රෝවියාවත්ත
2015.11.12

උක්ත සැලසුම් වාර්තාව සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ අදහස් හා නිර්දේශයන්ට යටත්ව සවිස්තර සැලසුම් (Detailed Design) සැකසීමට අනුමැතිය 2015.11.07 වන දින ව්‍යාපෘති උපදේශක සමාගම වෙත ලබා දෙන ලදි.

13.5.3 පානදුර, මාලමුල්ල / බෙරුවල, පයාගල

මාලමුල්ල යෝජිත ව්‍යාපෘතිය තාක්ෂණික සහ සමාජීය සාධක මත එහි ඉදිකිරීම යෝග්‍ය නොවන බව ව්‍යාපෘතියේ උපදේශක සමාගම වන KUNHWA ඉංජිනේරු හා උපදේශන සමාගම ව්‍යාපෘතිය වෙත දන්වන ලදි.ඒ අනුව එම ස්ථානය වෙනුවටබෙරුවල, පයාගල ප්‍රදේශයේ ස්ථානයක් තෝරාගන්නා ලදි.

KUNHWA අයතනය මඟින් බෙරුවල, පයාගල යොජිත ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ අතර එමඟින් අදාල ව්‍යාපෘතිය ආර්ථික වශයෙන් යෝග්‍ය නොවන බව පෙන්වා දී ඇත. කෙසෙ වෙතත් අළුතින් පිහිටුවන ලද මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් තුමා විසින් දැනුම්දෙන ලද්දේ බස්නාහිර පළාතේ සියළුම සංවර්ධන කටයුතු හා අපද්‍රව්‍ය කළමනාකරණය නව අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බවයි. ඒ අනුව බස්නාහිර පළාතෙන් පිටතව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ස්ථානයන් සොයාගන්නා ලෙස ව්‍යාපෘති නියාමන කමිටුව විසින් උපදෙස් ලබා දෙන ලදි.

13.5.4 මැදිරිගිරිය, යුදගනාව (මාලමුල්ල ව්‍යාපෘති භූමියයට විකල්පයක් ලෙස)

ව්‍යාපෘති කාලසීමාව, ව්‍යාපෘති පරිමාණය හා ඉඩම් අවශ්‍යතාවය යන සාධක මත පොළොන්නරුව මැදිරිගිරිය, යුදගනාව ප්‍රදේශයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමියක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය යැයි හඳුනාගැනිනි.උපදේශක ආයතනයේ සාමාජිකයන්, මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ අදාල නිලධාරීන් හා අඩවි වන නිලධාරීවරයා සමග මූලික ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන ලදි. යෝජිත ව්‍යාපෘති භූමිය පිළිසරු ව්‍යාපෘතිය මඟින් ඉදිකර ඇති කොම්පෝස්ට් අංගනයට යාබඳව පිහිටා ඇත. ව්‍යාපෘති භූමියේ මූලික ලක්ෂණ සනීපාරක්ෂක කසළ රඳවයක් ඉදිකිරීමට යෝග්‍ය මට්ටමක පවතින බැවින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම මේ වන විට අරම්භ කර ඇත. භූමිය නිදහස්කර ගැනීම හා පාරිසරික නිර්දේශයන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ඊට සමගාමීව සිදු කෙරේ.

උඩුනුවර, ගෝනාධිකවත්ත

උඩුනවර ගෝනාධිකවත්ත යෝජිත ව්‍යාපෘති භූමිය නාය යෑමේ දැඩි අවධානම් සහිත ප්‍රදේශයක පිහිටා ඇති බව සැලසුම් සැකසීම් කාලය තුල තහවුරු කරගන්නා ලදි. එම නිසා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අදහස් වූයේ එම ව්‍යාපෘති භූමිය සඳහා සවිස්තර පාංශු අනුරූපනයන් සහිත භූ විද්‍යාත්මක පරීක්ෂණයක් (Detailed Geological Investigationwith Soil Mapping)සිදුකළ යුතු බවත් ඒ සඳහා මාස 06 ක පමණ කාලයක් ගත වන බවයි. ව්‍යාපෘතියේ කාල රාමුව හා අයවැය සලකා බැලීමේදී සියලුම ව්‍යාපෘති සමගාමීව පවත්වාගෙන යාම වඩා සුදුසු බැවින් උඩුනුවර ව්‍යාපෘතියේ පරිමාණයට සමාන විකල්ප භූමියක් සොයාගන්නා ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ව්‍යාපෘති නියාමන කමිටුවේදීව්‍යාපෘතිය වෙත උපදෙස් ලැබුනි.

13.5.5 යාපනය, කීරිමලෙ (ගෝනාධිකවත්ත ව්‍යාපෘති භූමියට විකල්පයක් ලෙස)

මධ්‍යම පරිසර අධිකාරියේ යාපනය දිස්ත්‍රික් කාර්යාලය මඟින් යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් උතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කීරිමලෙ හි මෙවැනි පහසුකමක් පිහිටු වීමට යොජනාවක් ඉදිරිපත් කර තිබුනි. උපදේශක ආයතනයේ සාමාජිකයන්, වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ අදාල නිලධාරීන් හා මධ්‍යම පරිසර අධිකාරියේ යාපනය දිස්ත්‍රික් කාර්යාලයීය නිලධාරීන් සමග මූලික ක්ෂෙත්‍ර පරීක්ෂාවන් සිදු කරන ලදි. එමෙන්ම යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා සමග සාකච්ඡා කළ අතර භූමිය නිදහස් කර ගැනීම පිළිබඳව මූලික එකඟතාව ලබා දෙන ලදි. මෙම ව්‍යාපෘති භූමිය අතහැර දමන ලද සිමෙන්ති නිශ්පාදනයට අවශ්‍ය හුණුගල් ලබා ගන්නා ලද වලවල් සහිත ප්‍රදේශයක් වන අතර ව්‍යාපෘති භූමියේ මූලික ලක්ෂණ සනීපාරක්ෂක කසළ රඳවයක් ඉදිකිරීමට යෝග්‍ය මට්ටමක පවතී. තවද ව්‍යාපෘති භූමිය සඳහා ශක්‍යතා අධ්‍යනය හා භූමිය නිදහස් කිරීමට අවශ්‍ය මිනුම් කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත.

13.5.6 සවිස්තර සැලසුම්කරණය සඳහා උපදේශනසෙවා

සනිපාරක්ෂක බිම් පිරවුම් සවිස්තර සැලසුම්කරණ උපෙදේශකත්වය සැපයීම සඳහා අදහස් ප්‍රකාශන (EOI) කැඳවීම 2012 වසෙර්දී නිමා කරන ලදි. EOIසඳහා ප්‍රතිචාර දක්වා තිබූ කොරියානු උපදේශකත්ව සමාගම් 7න් සමාගම් 03ක් තෝරාගත් අතර එසෙ තෝරාගත් සමාගම් සඳහා Eximබැංකුවේ අනුමැතිය ලැබිණි මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD)උපදෙස් මත අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශකත්ව ප්‍රසම්පාදන කමිටුව (CPCC) විසින් ප්‍රසම්පාදනය සඳහා යෝජනා ඉල්ලුම් කිරීම (RFP) අවසානයකට ගෙන එන ලදි. උපදේශකත්ව සමාගම් විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික/මූල්‍ය යොජනා ඇගයීම සහ RFP ඇගයුම් නිර්ණායක වැඩිදියුණු කිරීම සඳහා CPCC වෙත සහයවනුපිණිසඑහි සභාපතිවරයා විසින් නිර්දේශ කරන ලද පරිදි මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන ලදි.

තෝරාගත් සමාගම් 3න් අවසන් RFP ලේඛනය RFP කැඳවීම කොරියානු Exim බැංකුවේ එකඟත්වයෙන් සිදු කරන ලදි. මිළ ගණන් ඉදිරිපත් කරන්නට සිය යෝජනා ඉදිරිපත් කිරීම සඳහා 2013 සැප්තැම්බර් 18 දින තෙක් කාලය ලබා දෙන ලදි.

සන අපද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් ව්‍යාපෘතිය ඉදිකිරීම ක්‍රියාත්මක කිරීම සඳහා, ඇමරිකානු ඩොලර්තිස්තුන් මිලියන පන්සිය තිස් හය දහසකට (ඇ.ඩො. 33,536,000) සමාන මුදලක් නොයිකිම්වන ප්‍රමාණයක් කොරියානු වොන්වලින් ණය ප්‍රතිපාදන ලෙස ලබා ගැනීමේ එකඟතා පත්‍රයට අත්සන් කිරීම 2013 ජූලි 23 දින ආනයන -අපනයන බැංකුව වෙනුවෙන් EDCF හි විධායක අධ්‍යක්ෂ සොන්ග් - හ්යෝග් යිම් මහතා ද ශ්‍රීලංකා රජය වෙනුවෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම් පී.බී. ජයසුන්දර මහතාද මේ සඳහා අත්සන් කළහ. කොරියානු Exim බැංකුවටඅනුව මෙම ණය 2013 නොවැම්බර් 19 දින සිට ක්‍රියාත්මකය.

සන අපද්‍රව්‍ය බැහැරලීමේපහසුකම් ව්‍යාපෘතිය සඳහා උපදේශකත්ව සෙවා ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩරය ප්‍රදානය කිරීමට සහ ඒ සඳහා KUNHWA Engineering & Consulting Co. Ltd සමාගම සමඟ ඇ.ඩො. 2,844,156 /- ක මුදලකට කොන්ත්‍රාත්තුවකට එළඹීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2014 අප්‍රේල් 23 දින ලද අතර 2014 අප්‍රේල් 24 දින (Eximබැංකුවේ එකඟතාවයද ඇතිව) ටෙන්ඩරයKUNHWAසමාගමප්‍රදානය කරන ලදි.

2014 අප්‍රේල් 30 දින KUNHWAසමාගම සහ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය අතර කොන්ත්‍රාත්තුව සඳහා අත්සන් තබන ලද අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා Eximබැංකුවේ අනුමැතිය 2014 මැයි 23 දින වන විට ලබා ගන්නා ලදි.

උපදේශකවරුන් සමඟ ප්‍රථම නිල හමුවීම 2014 ජුනි 02 දින පැවැත්වුන අතර ඝන අපද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් ඉදිකිරීමේ උපදේශකත්ව සෙවා සැපයීම භාරගැනීම සඳහා 2014 ජුනි 30 දින උපදේශකවරුන් කැඳවන ලදි. ව්‍යාපෘති භූමි 04හි මූලික සංචාරයේ යෙදුනා වූ ඔවුහු ව්‍යාපෘති යෝජනාවේ සඳහන් අනුපිළිවෙළට වැඩ කටයුතු ආරම්භ කිරීමට එකඟතාවය පල කළහ.

කෙසෙ වෙතත්, උපදේශන සෙවා ගිවිසුම අනුව කටයුතු කිරීමට උපදේශක සමාගම අපොහොසත් වූ අතර පහත දැක්වෙන ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය විය.

ප්‍රධාන වෘත්තීයවේදීන් සෙවයේ යෙදවීම (දේශීය හා විදේශීය)

උපදේශක සමාගම මඟින් උපදේශන සෙවා ගිවිසුම අනුවප්‍රධාන වෘත්තීයවේදීන් සෙවයේ යෙදවීමනිසි පරිදි සිදු නොවිය. මෙම ගැටළුව පිළිබඳව පැවති සෑම ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී මෙන්ම ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම්වලදී ද සාකච්ඡා කරන ලද නමුත් KUNHWAසමාගමඅදාල ගැටළුව පිළිබඳව සැලකිය යුතු අවදානයක් නොවිය.

තවද ඔවුන් විසින් මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ගිවිසුමේ සඳහන් නොවන උප උපදේශකවරුන්ගේ (Sub consultant) හා පුද්ගලයන්ගේ සෙවාව ලබා ගෙන තිබුනි.

අදාල වාර්තා නියමිත කාලය තුලදී බාර දීමට අපොහොසත්වීමසංකල්පිත සැලසුම් 2014 සැප්තැම්බර් මස වන විට බාර දීමට නියමිතව තිබුනද නියමිත කාලයට අදාල සැලසුම් බාර දීමට ඔවුන් අපොහොසත් විය . එම සැලසුම් වල අසම්පූර්ණත්වය නිසා කිහිප විටක්මහාර දුන් අදාල සැලසුම් ප්‍රතික්ෂෙප විය. කෙසෙ වෙතත් 2015 ජුනි මස 03 දින සංශෝධිත සංකල්පිත සැලස්ම් භාරදීමට කටයුතු කරන ලදි.

KUNHWAසමාගම විසින් භාරදෙන ලද වාර්තා වලට අනුව යෝජිත සනීපාරක්ෂක බිම් පිරවුම්වල ජීව කාලයේ නොගැලපීම් ඇති බව ප්‍රගති සමාලෝචන සාකච්ඡා අතරතුරදී පෙන්වා දෙන ලදි.

උක්ත කරුණු ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවෙදී අඛන්ඩව සාකච්ඡාවට බඳුන් වූ අතර ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව විසින් ලබා දෙන ලද උපදෙස් වලට එකඟ වීමට උපදේශක සමාගම අපොහොසත් විය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් 2015 ඔක්තෝබර් 12 වන දින පැවති ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීමේදී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමා මෙම ගැටළුකාරී තත්වය නිවැරදි කර ගැනීමට අවසන් අවස්ථාවක් ලබා දුන් අතර මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමා, මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමා, ආනයන අපනයන බැංකුවේ නේවාසික නියෝජිත වරයා හා KUNHWA ඉංජිනේරු හා උපදේශන සමාගමේ උප

සභාපති වරයා යන අය එම රැස්වීමේ සාකච්ඡා සටහන් වලට අත්සන් තබන ලදි.

ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිරි ගමන්මග එළඹුනු තීරණ හා ඇති කරගත් එකඟතාවයන් මතව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ මීළඟ අනුගාමී රැස්වීම 2015 ඔක්තොම්බර් 26 දින පැවැත්විනි. එහිදී අනුරාධපුර කීරක්කුලම හා හික්කඩුව මොන්රොවියාවත්ත යන ව්‍යාපෘති දෙකට අදාල සංශෝධිත කාර්ය සැලසුම (Revised Work Plan) හා වෘත්තියවේදීන් සෙවයේ යෙදවීමේ සැලැස්ම (Professionals Mobilization Plan)KUNHWA සමාගම විසින් ඉදිරිපත් කරන ලද අතර එම ව්‍යාපෘති දෙක මූලිකව ආරම්භ කිරීමට සියළු පාර්ශව එකඟ විය. සංශෝධිත සැලැස්මේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් පහත පරිදි වේ.

වගුව 13.26 සංශෝධිත සැලැස්මේ ඇති වූ ප්‍රධාන වෙනස්කම්

		ප්‍රථම සැලැස්ම	සංශෝධිත සැලැස්ම
01	සංකල්පිත සැලසුම් වාර්තා අවසන් කිරීම	2014 සැප්තැම්බර් 30	2015 නොවැම්බර් 15
02	සැලසුම් කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කිරීම	2015 ජනවාරී 30	2016 පෙබරවාරී 15
03	අවසාන සැලසුම් වාර්තා	2015 ජුනි 30	2016 මාර්තු 15
04	ප්‍රසම්පාදන ක්‍රියාවලිය	2015 ජුලි - සැප්තැම්බර්	2016 මාර්තු - ජුනි

උපදේශක සමාගමේ කාර්යන්ගේ කාර්ය සාධනය පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරිය සෑහීමට පත්වීම මත ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව මඟින් 2016 ජනවාරි මාසයේදී ඉතිරි ව්‍යාපෘති භූමි දෙක සැලසුම් කටයුතු සඳහා ලබා දීම තීරණය කරනු ඇත. සු

දුසුකම්ලත් ඉංජිනේරුවරුන් 3 දෙනෙකුගෙන් සමන්විත නව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන ලෙස ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව විසින් මධ්‍යම පරිසර අධිකාරියට උපදෙස් දෙන ලදි. ඒ අනුව කීරික්කුලම හා මොන්රෝවියාවත්ත ව්‍යාපෘතින්ට අදාල සංකල්පිත සැලසුම් වාර්තා ඇගයීම සඳහා පහත සඳහන් සමාජිකයන්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයුම් කමිටුවක් පත් කරන ලදි.

තාක්ෂණික ඇගයුම් කමිටුවේ සභාපති

01. ඉංජි. ජේ.එම්.සූ. ඉන්ද්‍රරත්න - කළමණාකරු, සැලසුම් හා නිර්මාණ - SDF ව්‍යාපෘතිය/ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්,මුදල්, පරිපාලන), මධ්‍යම පරිසර අධිකාරිය

සාමජිකයන්

ඉංජි. ඒ. බී. ඉලංගසිංහ - අධ්‍යක්ෂ, ජාතික සන අපද්‍රව්‍ය කළමනාකරණ සහයෝගීතා මධ්‍යස්ථානය, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය

ඉංජි. ප්‍රසාද් අමරසූරිය - ඉංජිනේරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව,දකුණු පළාත් මොන්රෝවියාවත්ත ව්‍යාපෘති භූමියට අදාලව පමණක් කටයුතු කරනු ඇත.

ඉංජි. ජේ. කේ. අලස් - ඉංජිනේරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව,උතුරු මැද පළාත -කිරිබ්කුලම ව්‍යාපෘති භූමියට අදාලව පමණක් කටයුතු කරනු ඇත.

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

SDF ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ රුවිනි ධර්මසිරි මෙනවිය 2015 ඔක්තෝබර් 07 දින ව්‍යාපෘතියෙන් ඉවත්වූ අතර නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ සරෝජනී ජයසෙකර මහත්මිය 2015 දෙසැම්බර් 01 දින සිට ව්‍යාපෘති අධ්‍යක්ෂක තරනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇත.

වගුව 13.27 ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

	තනතුර	නම	සෙවට බැඳුනු දිනය	
01	ව්‍යාපෘති අධ්‍යක්ෂ	රුවිනි ධර්මසිරි මෙනවිය	2014.10.07	2015.10.06
		වැඩ බැලීම	2015.12.01	මේ දක්වා
02	නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ	සරෝජනී ජයසෙකර මිය	2012.06.01	මේ දක්වා
03	කළමනාකරු - සැලසුම් හා නිර්මාණ (අර්ධ කාලීන)	ඉංජි. ජේ.එම්. යූ. ඉන්ද්‍රරත්න මයා	2012.09.01	මේ දක්වා
04	කළමනාකරු - ප්‍රසම්පාදන හා සැපයුම්	පුරප්පාඩුයි		
05	ව්‍යාපෘති ගණකාධිකාරී	ඒ. ගල්ලොලුව මයා	2012.11.05	2015.01.31
	වැඩ බැලීම	ටී.පී.එස්. ප්‍රියදර්ශනී මිය	2015.02.16	2015.09.06
		ඩබ්. ලියනාරච්චි මයා	2015.09.06	මේ දක්වා
06	ව්‍යාපෘති නිලධාරී	ටී.ඩී.එන්. ගුණතිලක මයා	2014.07.23	2015.05.11
		කේ.ඩබ්. ගුණවර්ධන මයා	2014.07.11	මේ දක්වා
07	ව්‍යාපෘති ඉංජිනේරු	එච්.එන්. හික්කඩුව මයා	2014.10.27	2015.09.30
08	පරිපාලන නිලධාරී	ජී. එම්. ලියනගේ මිය	2014.03.17	මේ දක්වා
09	ප්‍රසම්පාදන නිලධාරී	පුරප්පාඩු		

	තනතුර	නම	සෙවට බැඳුනු දිනය	
10	ගිණුම් ලිපිකරු	කේ.එල්. ඒ. බී. වත්සලා මෙනවිය	2012.12.03	මේ දක්වා
11	ලිපිකරු	එච්.එච්.ටී. සඳරුවන් මයා	2013.08.01	මේ දක්වා
12	කාර්යාල සහයක	වයි.ජී.එන්. ගුණරත්න මයා	2013.11.14	මේ දක්වා

නීති නිලධාරී හා නියෝජ්‍ය කළමනාකරු - නීති, වෙනුවට 2015 මාර්තු 27 දින සිට මේ දක්වාකුලී පදනම මත ව්‍යාපෘතිය නීති උපදේශකවරයෙකුගේ සෙවය ලබා ගනී.

13.28 මූල්‍ය ප්‍රගතිය 2015

සාරාංශය			
විදේශීය සංරචක	100,000,000.00		
දේශීය සංරචක	92,000,00000	14,953,000.00	15,688,667.00
එකතුව	192,000,000.00	14,953,000.00	15,688,667.00

සටහන: විදේශීය සංචරචක මඟින් දක්වනනේKunhwa සමාගම වෙත ගෙවන ලද අත්තිකාරම් මුදල වන ඇමරිකානු ඩොලර් 568,531 සහ සෙවා වියදම් ඇමරිකානු ඩොලර් 568.83ක් ය.

වගුව 13.29 සවිස්තරාත්මක වියදම්

	සැබෑ වියදම්(රු.)	**සංශෝධිත වෙන් කිරීම්(රු.)**	
වියදම් වර්ගය			
ව්‍යාපෘති භූමි හා පහසුකම් සැපයීම	587,644.00	62,500,000.00	
ප්‍රවාහන	1,476,059.25	2,800,000.00	
කාර්යාල භාණ්ඩ	0 .00	300,000.00	
කාර්යාල සැපයුම්	177,291.68	300,000.00	
ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ වැටුප්	9,126,359.83	16,800,000.00	
සන්නිවේදන/තැපැල්	188,946.68.	400,000.00	
පුහුණු හා හැකියා වර්ධන	40,000.00	300,000.00	
බදු කුලී හා වෙනත්	3,675,000.00	3,300,000.00	
ව්‍යාපෘති කළමනාකරණ හා සමායෝජන	293,879.58	3,000,000.00	
අහඹු/හදිසි විවිධ වියදම්	123,486.20	2,300,000.00	
එකතුව	**15,688,667.22**	**92,000,000.00**	

13.6 ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජලාශ වල ජල තත්ව පසුවිපරම් කිරීමේ හා මධ්‍යම පරිසර අධිකාරියේ බලාත්මක කිරීමේ කාර්ය මණ්ඩලය බලගැන්වීමේ JICA ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් ලෙස සැලකෙන අතර, JICA ව්‍යාපෘති ප්‍රවීනයන් විසින් සැලසුම් කල ආකාරයට ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නියැලෙනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරිය දේශීය පාර්ශවකරුවා ලෙස ක්‍රියා කරයි. ව්‍යාපෘති ලේකම් හැරුණු කොට වෙනත් කාර්ය මණ්ඩලයක් බඳවාගෙන නොමැති අතර, JICA ආයතනය උපදේශන සෙවාවන් සපයන CTI ඉංජිනියරින් ඉන්ටර්නැෂනල් ආයතනය සහ ඔරියන්ටල් කන්සල්ටන්ට් ග්ලෝබල් ආයතනය යන ආයතන දෙකේ සෙවාවන් ලබාගනී. කැළණි ගඟ ආශ්‍රිත ජල තත්ව කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සහ ප්‍රාදේශීය කාර්යාල වල බලාත්මක කිරීමේ ක්‍රියාවලිය බල ගැන්වීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරයි. 2015 මාර්තු මස ආරම්භ කල මෙම ව්‍යාපෘතිය වසර 3 ක කාලයක් පුරා ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන නිමැවුම් 04 ක් අපේක්ෂා කෙරේ.

ජල මූලාශ්‍ර වර්ගීකරණය සහ සංසරණ ජල තත්ව සකස් කිරීම

ජල තත්ව විශ්ලේෂණය සඳහා රසායනාගාර කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය

ඉලක්කගත පාර්ශවකරුවන්ගේ විමර්ශණය කිරීම් ඇතුළු ජල තත්ව පසුවිපරම් කිරීමේ හා බලාත්මක කිරීමේ ධාරිතාවන් ශක්තිමත් කිරීම, දූෂකාරක නාමාවලියක් සැකසීම සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම

රට අභ්‍යන්තරයේ ඇති ජල මූලාශ්‍ර සඳහා විමර්ශන තොරතුරු, පරිසර ආරක්ෂණ බලපත්‍ර තොරතුරු සහ දූෂකාරක නාමාවලියේ ඇතුලත් දත්ත ද ඇතුලත්ව ජල තත්ව පසුවිපරම් කිරීම සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකසීම හා එය ඵලදායී ලෙස භාවිතා කිරීම

මෙම නිමවුම් වෙනුවෙන් ස්ථාපිත කර ඇති ක්‍රියාකාරී කණ්ඩායම් 04 ක් මඟින් මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සිදුකරගෙන යනු ලබයි. ජල මූලාශ්‍ර වර්ගීකරණය, නියැදි ලබාගැනීම සහ විමර්ශන කටයුතු කිරීම සඳහා මාර්ගෝපදේශයන් සඳහා කෙටුම්පතක් සකස් කිරීම, රසායනාගාරය සඳහා ISO තත්ව සහතිකය ලබාගැනීම සහ දූෂකාරක නාමාවලිය සැකසීමෙහිලා මෙම ක්‍රියාකාරී කණ්ඩායම් ක්‍රියා කරමින් සිටී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ජයග්‍රහනයන් පහතින් දක්වා ඇ.

13.6.1 ජල මූලාශ්‍ර වර්ගීකරණයට අදාල මාර්ගෝපදේශයන් සහ අදාල වෙනත් ලියකියවිලි සැකසීම

දැනට පවතින සංසරණ ජල තත්ව වර්ෂ 1992 දී ප්‍රකාශයට පත් කළ ඒවා බැවින්, ක්‍රියාකාරී කණ්ඩායම් 01, එම සංසරණ ජල තත්වයන් විශ්ලේෂණය කිරීම සිදුකර එහි වලංගු භාවය සොයා බලන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස සංසරණ ජල තත්වයන් 158 කින් 65 ක් සංශෝධනය කරන ලදි. මෙම ක්‍රියාකාරී කණ්ඩායම තව දුරටත් සාකච්ඡා කර ජල මූලාශ්‍ර වර්ගීකරණය කල යුතු වන්නේ එහි ඵලදායී භාවිතයන් පදනම් කරගනිමින් යන පදනම මත මාර්ගෝපදේශ කෙටුම්පතක් ද සකස් කොට ඇත. ක්ෂේත්‍ර සමීක්ෂණ වලින් ලබාගත් සකසායනය කළ දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය මඟින් කැළණි ගංගාව සඳහා ජල මූලාශ්‍ර වර්ගීකරණය යෝජනා කොට ඇත. දැනට පවතින පසුවිපරම් ස්ථානයන්හි වලංගු බව තක්සේරු කරමින් හා නිර්දේශිත පසුවිපරම් ස්ථාන හඳුනාගැනීම මඟින් වාර්ෂික පසුවිපරම් සැලැස්මක් පිළියෙල කරන ලදි. යෝජිත ජල මූලාශ්‍ර වර්ගීකරණයේ නිවැරදිතාවය පරීක්ෂාකර බැලීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂය මුළුල්ලේම සංසරණ ජල තත්ව පසුවිපරම් කිරීම සිදුකරයි.

13.6.2. ISO/ IEC 17025 ප්‍රතිකකරන තත්ව සහතිකය ලබාගැනීම සඳහා සම්මත ක්‍රියා පිළිවෙත් ජල තත්ව පිළිබඳ අත්පොත් සහ අනෙකුත් ලිවිලි සැකසීම

ප්‍රතිකකරනය නු වලංගු විශ්ලේෂණ ප්‍රතිඵල ලබාදෙන රසායනාගාරයක් ලෙස පිළිගැනීම සඳහා වූ විධිමත් ක්‍රියා පිළිවෙතයි. එමඟින් රසායනාගාරයේ නීත්‍යානුකූලභාවය වැඩිවීම ද සිදු වේ. මේ වන විට මධ්‍යම පරිසර අධිකාරිය ISO/ IEC 17025 ප්‍රතිකකරන තත්වය ලබාගැනීම සඳහා සම්මත ක්‍රියා පිළිවෙත්, ජල තත්ව පිළිබඳ අත්පොත් සහ අනෙකුත් ලියවිලි සැකසීම සිදුකර ඇත. රසායනාගර 18 ක් සහභාගී වූ අන්තර් රසායනාගාර මිනුම් සහ විශ්ලේෂණයන් සඳහා වූ පරීක්ෂණයට ද මධ්‍යම පරිසර අධිකාරිය සහභාගී විය. මෙම තත්ව සහතිකය ලබාගැනීමේ කටයුතු සිදු කෙරීගෙන යන ආකාරය සමාලෝචනය කිරීමේ දී, එම කාල වකවානු සංශෝධනය විය යුතු බව පෙනිණි. ඒ අනුව, එම කාල වකවානු පහත ආකාරයට සංශෝධනය කරන ලදි.

01. 2016 මාර්තු වන විට අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම

02. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම 2016 අප්‍රේල් වන විට අවසන් කිරීම

03. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ISO/ IEC 17025 ට අනුව ක්‍රියා කිරීම ඇරඹීම

04. 2016 ජුනි වන විට කළමනාකරණය පිළිබඳ සමාලෝචනය අවසන් කිරීම

05. 2016 අගෝස්තු වන විට ප්‍රතිතකරන තත්ව සහතිකය ලබාගැනීම

13.6.3. නියැදි ලබාගැනීම සහ පරීක්ෂා කිරීමේ මාර්ගෝපදේශයන් කෙටුම්පත් කරමින් සිටී.

සාධනීය සැලසුම්කරණය, නියැදි ලබාගැනීම සහ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලීන් සඳහා පිළිගත් සහ විස්තරාත්මක ක්‍රියාපටිපාටියක් මෙම මාර්ගෝපදේශ මඟින් ලබාදෙයි. මෙමඟින් අදාල නීති උල්ලංඝනය කිරීමේ මෙන්ම කර්මාන්ත මඟින් සිදුකරනු ලබන නිවැරදි ක්‍රියාකාරිත්වයන් හඳුනාගැනීමේ මධ්‍යම පරිසර අධිකාරිය සතු හැකියාවන් වර්ධනය කිරීම ද සිදුකරනු ලයි. එමඟින් පරිසරය සුරක්ෂිත කිරීම සඳහා ඉවහල් වන පාරිසරික සම්මතයන්, නීති සහ රෙගුලාසි බලගැන්වීමේ හැකියාව ද මර්දනය වීම සිදු වේ. මෙම මාර්ගෝපදේශයේ කෙටුම්පත සැකසීමෙන් අනතුරුව එය නියමු වැඩ සටහනක් ලෙස යොදාගෙන එහි වැඩි දියුණු විය යුතු ආකාරය හඳුනාගැනීමට නියමිතය. අවසන් සංස්කරණය සඳහා අනුමැතිය ලැබීමෙන් අනතුරුව පුහුණු වැඩ සටහන් සහ පුහුණු අත්පොත් සකසීමට නියමිතය. එහිදී එම පුහුණු වැඩ සටහන් ක්ෂේත්‍රය තුලදී මෙන්ම කාර්යස්ථ පුහුණු වැඩ සටහන් ලෙස පැවැත්වීම මඟින් මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලයට නිසි අයුරින් නියැදි ලබාගැනීමට හා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතාවයන් ලබාදීමට නියමිතය.

13.6.4 දූෂකාරක නාමාවලිය සැදීම ආරම්භ කිරීම

නිමවුම් 4 ට අදාල ප්‍රධාන ක්‍රියාකාරකම්, 3 – 2 දූෂකාරක නාමාවලියේ සැදීම යන ක්‍රියාකාරකම යටතේ සිදුකරනු ලබයි. 3 – 2 ක්‍රියාකාලී කණ්ඩායම දැනට පවතින දත්ත නාමාවලිය සඳහා එය පදනමක් ලෙස භාවිතා කිරීමට තීරණය කරන ලදි.

මෙම දූෂකාරක නාමාවලිය තුලට සෘජුවම අන්තර්ජාලය ඔස්සෙ සම්බන්ධ විය හැකි බැවින්, පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සඳහා පරිසර ආරක්ෂණ බලපත් ක්‍රියාවලියට අදාල දත්ත ඔවුන්ගේ බල ප්‍රදේශය තුලම කළමනාකරණය කරගැනීමට හැකියාව ලැබේ. එමෙන්ම, මෙම කණ්ඩායම විසින් දැනට පවතින දත්ත විශ්ලේෂණය කොට කුමන දත්ත හා පරාමිතීන් භාවිතා කරන්නේ දැයි තීරණය කරන ලදි.

දැනට පවතින දත්ත පදනම වෙනස් කොට දූෂකාරක නාමාවලියට සරිලන අන්දමින් සකස් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ තොරතුරු තාක්ෂණ අංශය මඟින් එම ක්‍රියාකාරී කණ්ඩායමේ අනුදැනුම ඇතිව සිදුකරමින් පවතී. දූෂකාරක නාමාවලිය සඳහා දත්ත (අපජලය පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තා දූෂකාරක පිළිබඳ භූගෝලීය දත්ත වැනි) රැස්කිරීම සහ ඒ සඳහා මූලික දත්ත සැකසීම 2016 ජනවාරි මාසය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

13.6.5 පරිසර ආරක්ෂණ ක්‍රියාදාමය ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශය කෙටුම්පත් කිරීම.

මෙම මාර්ගෝපදේශය මඟින් පරිසරයෙන් ලබාගන්නා වූ ප්‍රයෝජන ඒ සඳහා ඇති තර්ජන, පරිසර භායනය එමඟින් ඇතිවන බලපෑම් ආදිය පිළිබඳ මහජනතාව, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල දැනුම වැඩි දියුණු

කිරීම සඳහා ප්‍රවේශයක් ලබා දේ. එමඟින් පරිසර සංරක්ෂණය සඳහා මෙන්ම පරිසර ආරක්ෂණය සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය ලබාගැනීම අපේක්ෂා කෙරේ. එමෙන්ම මෙම මාර්ගෝපදේශය මඟින් කර්මාන්ත පරිසර ආරක්ෂණ බලපත් නොගෙන සිටීමට හේතූන්/ බධාවන් හා එම බාධාවන් මැඩලීම පිළිබඳව ද සඳහන් වේ.

එමෙන්ම මෙම ව්‍යාපෘතිය රසායනාගාරය සඳහා උපකරණ මිලදී ගැනීම මෙන්ම පාර්ශ්වකරුවන් සඳහා ජපානයේ පුහුණු වැඩ සටහනක් ද සිදුකරන ලදි.

13.6.6 උපකරණ මිලදී ගැනීම ආරම්භ කරන ලදි.

රසායනාගාරය සඳහා උචිත උපකරණ මිලදී ගැනීම ආරම්භ කර ඇති අතර, අයිතම 23 ක් දැනටමත් හඳුනාගෙන ඇත. මෙම වසර තුලදී අයිතම 13 ක් මිලදී ගෙන මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය වෙත භාර දී ඇත. ඉතිරි අයතම 10 මිලදී ගැනීම 2016 වර්ෂයේ දී සම්පූර්ණ කිරීමට නියමිතය.

13.6.7 පළමු විදේශ පුහුණු වැඩ සටහන සම්පූර්ණ කිරීම

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 5	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
සෙ.අ.අ. දායක මුදල්	66,012	48,267	1,608	1,571	806	1,096	68,427	50,933
සෙ.නි.හා.අ. දායක මුදල්	13,202	9,713	388	234	121	164	13,711	10,112
අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	5,995	7,968	800	794	48	308	6,843	9,069
වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	31,057	22,812	-	-	-	-	31,057	22,812
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	52,499	40,435	96	206	-	-	52,596	40,641
අධ්‍යක්ෂ මණ්ඩල සහ සභා සාමාජිකයින් සඳහා දීමනා	256	67	-	-	-	-	256	67
සභා, කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සංග්‍රහ කිරීම්	830	1,918	-	-	-	-	830	1,918
එකතුව	**615,357**	**462,816**	**16,020**	**10,651**	**9,101**	**9,546**	**640,477**	**483,013**

වගුව 15.14: සටහන 6

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 6	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ගමන් වියදම්								
දේශීය	28,994	25,025	-	-	-	-	28,994	25,025
විදේශීය	4,969	3,077	-	-	-	-	4,969	3,077

	ම.ප.අ.		පළාත්සරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 6	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
එකතුව	33,963	28,103	-	-	-	-	33,963	28,103

වගුව 15.15: සටහන 7

	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 7	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය								
ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා	9,301	9,573	729	677	177	276	10,207	10,526
ඉන්ධන සහ ලිහිසි තෙල්	37,415	41,462	1,550	1,342	-	-	38,965	42,804
නිල ඇඳුම්	495	328	-	-	-	-	495	328
මුද්‍රණ	31	621	-	-	-	-	31	621
පුවත්පත්	424	493	-	-	-	-	424	493
වාර සඟරා, ෆැක්ස් කඩදාසි සහ පෝස්ටර්	-	200	-	-	-	-	-	200
එකතුව	47,665	52,676	2,279	2,018	177	276	50,122	54,970

වගුව 15.16: සටහන 8

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
සටහන 8	**2015**	**2014**	**2015**	**2014**	**2015**	**2014**	**2015**	**2014**
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
නඩත්තු								
වාහන අළුත්වැඩියා සහ නඩත්තු	13,572	14,406	1,924	1,123	1,462	1,432	16,958	16,961
ගොඩනැගිලි සහ ව්‍යුහයන්	4,917	4,435	-	-	-	-	4,917	4,435
කාර්යාලය සහ රසායනාගාර උපකරණ	4,444	4,860	-	-	-	-	4,444	4,860
එකතුව	**22,933**	**23,700**	**1,924**	**1,123**	**1,462**	**1,432**	**26,319**	**26,256**

වගුව 15.17: සටහන 9

සටහන 9	**2015**	**2014**	**2015**	**2014**	**2015**	**2014**	**2015**	**2014**
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ගිවිසුම්ගත සේවා								
විදුලිය	11,617	13,786	-	-	-	-	11,617	13,786
ආරක්ෂක සෙවා	15,064	13,068	-	-	-	-	15,064	13,068
රක්ෂණ	9,172	4,780	-	-	-	-	9,172	4,780
තැපැල්	2,915	2,823	-	19	178	196	3,093	3,038
දුරකථන	9,115	8,464	-	-	-	-	9,115	8,464
ගොඩනැගිලි කුලී	9,553	7,028	4,162	3,861	3,150	3,150	16,865	14,039

සටහන 9	2015	2014	2015	2014	2015	2014	2015	2014
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ජල සැපයුම්	1,380	1,245	-	-	-	-	1,380	1,245
ජාති ගොඩනැගීමේ බදු	3,633	4,654	-	-	-	-	3,633	4,654
ආර්ථික සෙවා ගාස්තු	138	463	-	-	-	-	138	463
විගණන ගාස්තු	500	500	-	-	-	-	500	500
සාමාජික ගාස්තු	33	36	-	-	-	-	33	36
පොත් සහ වාර සඟරා	-	752	-	-	-	-	-	752
එකතුව	**63,119**	**57,600**	**4,162**	**3,880**	**3,328**	**3,346**	**70,609**	**64,825**

වගුව 15.18: සටහන 10

සටහන 10		2015	2014	2015	2014	2015	2014	2015	2014
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පර්යේෂණ සහ සංවර්ධන									
පරිසර අධ්‍යාපන සහ දැනුවත්කිරීමේ වියදම්	**10.1**	4,691	10,046	-	-	-	-	4,691	10,046
පරිසර දූෂණ පාලන	**10.2**	4,552	3,538	-	-	-	-	4,552	3,538
පරිසර කළමනාකරණ සහ ඇගයීම්	**10.3**	3,951	4,641	-	-	-	-	3,951	4,641
නීති වියදම්		1,446	1,535	-	-	-	-	1,446	1,535
මානව සම්පත් සංවර්ධන		1,584	2,598	52	-	40	43	1,676	2,641
කොම්පෝස්ට් බඳුන් වියදම්		-	-	-	-	-	-	-	-

සටහන 10		2015	2014	2015	2014	2015	2014	2015	2014
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
එකතුව		**16,224**	**22,358**	**52**	**-**	**40**	**43**	**16,316**	**22,401**

වගුව 15.19: සටහන 11

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
සටහන 11	**2015**	**2014**	**2015**	**2014**	**2015**	**2014**	**2015**	**2014**
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ක්ෂයවීම්								
ගොඩනැගිලි	4,913	4,913	38	38	-	-	4,950	4,950
මෝටර් වාහන	39,395	4,641	-	-	-	-	39,395	4,641
සොභා කෙත මධ්‍යස්ථානය	527	527	-	-	-	-	527	527
ලිඛිඩු සහ සවිකිරීම්	2,624	4,805	288	274	287	287	3,198	5,366
කාර්යාලයීය උපකරණ	9,502	8,711	14	-	981	959	10,498	9,669
රසායනාගාර උපකරණ	7,514	4,609	19	86	-	-	7,534	4,695
පුස්තකාල පොත්	581	648	-	-	-	-	581	648
නාමපුවරුව සහ උද්‍යාන පුටු	131	121	-	-	-	-	131	121
ප්‍රාදේශීය කාර්යාලය	1,712	1,162	-	-	-	-	1,712	1,162
දොම්පෙ සනීපාරක්ෂක කසල බැහැරකිරීම	9,880	-	-	-	-	-	9,880	-
එකතුව	**76,779**	**30,136**	**359**	**398**	**1,268**	**1,245**	**78,406**	**31,779**

වගුව 15.20: සටහන 12

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 12	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වෙනත් මෙහෙයුම් වියදම්								
වෙළඳ දැන්වීම්	616	472	-	-	-	-	616	472
විවිධ	471	435	18	747	122	299	610	1,481
සුභසාධන විදම්	4,393	4,573	134	-	-	-	4,527	4,573
ජාතික උත්සව	770	4,258	-	-	-	-	770	4,258
ආපදා ණය කපාහැරීම්	-	429	-	-	-	-	-	429
එකතුව	**6,250**	**10,168**	**152**	**747**	**122**	**299**	**6,524**	**11,214**

වගුව 15.21: සටහන 13

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
සටහන 13 වැඩසටහන් ක්‍රියාකාරකම්									
මාලේ ප්‍රකාශනය	13.1	534	798	-	-	-	-	534	798
ප්ලාස්ටික් අපද්‍රව්‍ය අවම කිරීමේ ව්‍යාපෘතිය	13.2	44,212	43,040	-	-	-	-	44,212	43,040
පරිසර නියමු වැඩසටහන - අමාත්‍යාංශය	13.3	22,010	7,637	-	-	-	-	22,010	7,637
ජාතික හරිත සම්මාන		3,961	2,732	-	-	-	-	3,961	2,732
SAICM උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය		737	581	-	-	-	-	737	581

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
SAICM පරිසර දූෂණය පාලනය කිරීම		66	682	-	-	-	-	66	682
පරිසර සංරක්ෂණව්‍යාපෘතිය		60	4,110	-	-	-	-	60	4,110
වාහන දුම් පරීක්ෂණ වියදම්		1,204	647	-	-	-	-	1,204	647
ම.ප.අ. රසායනාගාරය වැඩිදියුණු කිරීම - 2013		5,695	2,949	-	-	-	-	5,695	2,949
සායනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන		59,002	24,702	-	-	-	-	59,002	24,702
සුරක්ෂිත ලෙස ජංගම දුරකථන බැහැර කිරීම		166	1,182	-	-	-	-	166	1,182
ICES පාඨමාලා වියදම්		40	49	-	-	588	1,119	628	1,168
E- Flow වියදම්		111	840	-	-	-	-	111	840
පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය		1,005	-	-	-	-	-	1,005	-
ලෝක පරිසර දිනය		310	-	-	-	-	-	310	-
කැළණි ගඟ වියදම්		462	-	-	-	-	-	462	-
UNDP - විද්‍යුත් අපද්‍රව්‍ය වියදම්		175	-	-	-	-	-	175	-
ප්‍රවේශ මාර්ගය වැඩිදියුණු කිරීම - දොම්පෙ, පිළිසරු අරමුදල		18,026	-	-	-	-	-	18,026	-
අතේ ගෙනයාහැකි ජීව වායු ඒකකය - ගාල්ල කාර්යාලය		79	-	-	-	-	-	79	-
විද්‍යුත් අපද්‍රව්‍ය වැඩසටහන		264	-	-	-	-	-	264	-

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පරිසර නියමු කඳවුර - ගාල්ල		499	-	-	-	-	-	499	-
පුනුණු වැඩසටහන - පිළිසරු ව්‍යාපෘතිය		704	-	-	-	-	-	704	-
සොභා කෙත දැනුවත් කිරීමේ වැඩසටහන - දකුණු පළාත් කාර්යාලය		195	-	-	-	-	-	195	-
තෙත් බිම් දිනය වියදම්		32	-	-	-	-	-	32	-
හරිත ව්‍යාපෘතිය - වියදම්		33	-	-	-	-	-	33	-
තෙත් බිම් දිනය - වියදම්.		16	-	-	-	-	-	16	-
ජලයේ ගුණාත්මකභාවය - ප්‍රධාන ජලාශ		3,092	-	-	-	-	-	3,092	-
විද්‍යුත් අපද්‍රව්‍ය සතිය		-	1,474	-	-	-	-	-	1,474
තෙත් බිම් දිනය CBL		-	23	-	-	-	-	-	23
පාසල් හරිතකරණ වැඩසටහන		-	102	-	-	-	-	-	102
දැනුවත් කිරීමේ වැඩසටහන		-	58	-	-	-	-	-	58
දැයට කිරුළ		-	437	-	-	-	-	-	437
ම.ප.අ. රසායනාගාරය වැඩිදියුණු කිරීම - 2012		-	5	-	-	-	-	-	5
පෙර පාසල් වැඩමුළුව වියදම්		-	223	-	-	-	-	-	223
දැයට සෙවණ වියදම්		-	311	-	-	-	-	-	311
බක්මහ උළෙල වියදම්		-	1,728	-	-	-	-	-	1,728

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ශ්‍රී පාද වියදම්		-	3,477	-	-	-	-	-	3,477
එකතුව		**162,692**	**97,787**	**-**	**-**	**588**	**1,119**	**163,280**	**98,906**

වගුව 15.22: සටහන 14

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 14		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
දේපළ, පිරියත සහ උපකරණ									
ඉඩම්		27,453	27,453	-	-	-	-	27,453	27,453
ඉඩම් - අනුරාධපුර කාර්යාලය		2,450	-	-	-	-	-	2,450	-
දොම්පෙ සනීපාරක්ෂක කසල බැහැරකිරීම	14.1	385,320	-	-	-	-	-	385,320	-
ගොඩනැගිලි	14.1	130,315	134,614	1,276	1,313	-	-	131,591	135,927
මෝටර් වාහන	14.1	152,544	6,951	-	-	-	-	152,544	6,951
ජංගම රසායනාගාරය	14.1	-	-	-	-	-	-	-	-
ලීබඩු සහ සවිකිරීම්	14.1	18,313	16,489	861	1,149	860	1,147	20,034	18,785
කාර්යාලීය උපකරණ	14.1	62,408	62,666	62	41	1,395	2,376	63,866	65,083
රසායනාගාර උපකරණ	14.1	61,448	56,462	98	464	-	-	61,546	56,925

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 14		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පුස්තකාල පොත්	14.1	2,390	2,971	-	-	-	-	2,390	2,971
පිරියත සහ යන්ත්‍රසූත්‍ර	14.1	-	-	-	-	-	-	-	-
ප්‍රාදේශීය කාර්යාලය	14.1	80,745	77,793	-	-	-	-	80,745	77,793
නාම පුවරුව	14.1	427	557	-	-	-	-	427	557
ස්වභාවධර්ම ක්ෂේත්‍ර මධ්‍යස්ථානය	14.1	2,338	2,865	-	-	-	-	2,338	2,865
එකතුව		**926,151**	**388,821**	**2,297**	**2,967**	**2,255**	**3,523**	**930,703**	**395,310**

වගුව 15.23: සටහන 15

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 15	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආයෝජන								
භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව	9,960	9,960	-	-	-	-	9,960	9,960
එකතුව	**9,960**	**9,960**	**-**	**-**	**-**	**-**	**9,960**	**9,960**

වගුව 15.24: සටහන 16

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 16	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
මාර්ගස්ථ බඩු සහ සිදුකෙරෙමින් පවතින වැඩ								
පර්යේෂණ අධ්‍යයන - E Flow	306	-	-	-	-	-	306	-
Toyoster 650VA UPS	214	-	-	-	-	-	214	-
පරිගණක 120 ක්	14,157	-	-	-	-	-	14,157	-
ගිණුම්කරණ මෘදුකාංගය - 50%	200	-	-	-	-	-	200	-
CCTV කැමරා	2,142	-	-	-	-	-	2,142	-
ශබ්ද මට්ටම මැනීමේ මීටරය	516	-	-	-	-	-	516	-
කාර්යාලීය ලිබඩු	227	-	-	-	-	-	227	-
අධ්‍යක්ෂ මණ්ඩල කාමරය සඳහා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරය සහ තිරය	149	-	-	-	-	-	149	-
සභාපතිවරයාගේ කාර්යාලය සඳහා සෝපාව	79	-	-	-	-	-	79	-
ඩිජිටල් උෂ්ණත්ව දර්ශකය සහිත BOD ඉන්කියුබේටරය	2,421	-	-	-	-	-	2,421	-
චුම්භක මන්තය සහිත උඳුන් තැටිය	611	-	-	-	-	-	611	-
BOD/ DO මීටරය (බංකුවට සවිකරණ)	3,439	-	-	-	-	-	3,439	-
පාරජම්බුල බැලිය හැකි වර්ණාවලිදීප්තිමානය	1,112	-	-	-	-	-	1,112	-

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 16	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
කේන්ද්‍රඅපසාරකය	3,435	-	-	-	-	-	3,435	-
රසියනික ද්‍රව්‍ය	2,266	-	-	-	-	-	2,266	-
විදුරු භාණ්ඩ	2,119	-	-	-	-	-	2,119	-
ආරක්ෂිත උපකරණ	333	-	-	-	-	-	333	-
UPS 06 ක්	22	-	-	-	-	-	22	-
රසායනික ද්‍රව්‍ය - JICA අරමුදල	800	-	-	-	-	-	800	-
ම.ප.අ. රසායනාගාරය වැඩිදියුණු කිරීම - 2013 - රසායනාගාර උපකරණ	-	167	-	-	-	-	-	167
ලේඛනාගාරය WPO	-	287	-	-	-	-	-	287
GPS යන්ත්‍ර 27	-	765	-	-	-	-	-	765
දකුණු කාර්යාලය ඉදිකිරීම	-	2,027	-	-	-	-	-	2,027
පර්යේෂණ අධ්‍යයන - E Flow	-	418	-	-	-	-	-	418
එකතුව	**34,546**	**3,663**	**-**	**-**	**-**	**-**	**34,546**	**3,663**

වගුව 15.25: සටහන 17

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 17	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
තොග								
ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	2,491	2,009	-	-	-	-	2,491	2,009
පොත් සහ ප්‍රකාශන	2,206	1,222	-	-	-	-	2,206	1,222
මෝටර්වාහන අමතර කොටස්	145	462	-	-	-	-	145	462
විදුලි උපකරණ	9	14	-	-	-	-	9	14
ක්ෂෙත්‍ර නිලධාරීන් සඳහා යතුරුපැදි	-	6,536	-	-	-	-	-	6,536
කොම්පෝස්ට් බඳුනු	-	-	74	240	-	-	74	240
ප්‍රවර්ධන ද්‍රව්‍ය	-	-	120	191	-	-	120	191
එකතුව	**4,850**	**10,243**	**194**	**430**	**-**	**-**	**5,044**	**10,673**

වගුව 15.26: සටහන 18

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 18		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
අයවිය යුතු		-	-	737	-	9	-	746	-
විවිධ අත්තිකාරම්	18.1	17	177	-	-	-	-	17	177

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 18		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
මිලදී ගැනීම් අත්තිකාරම්	18.2	270	1,202	-	-	-	-	270	1,202
ලැබිය යුතු තැන්පතු	18.3	1,334	1,138	-	-	-	-	1,334	1,138
යතුරුපැදි ණය - රියදුරු	18.4	1,247	1,459	-	-	-	-	1,247	1,459
EIA අත්තිකාරම්	18.5	31	202	-	-	-	-	31	202
ප්ලාස්ටික් අපද්‍රව්‍ය මුදල් අත්තිකාරම්	18.6	0	4	-	-	-	-	0	4
ආපදා ණය		76,976	70,599	-	-	-	-	76,976	70,599
උත්සව අත්තිකාරම්		353	796	14	-	-	-	366	796
පවුල් වෛද්‍ය රක්ෂණය		250	261	-	-	-	-	250	261
විශෙෂ අත්තිකාරම්		1,465	58	-	-	-	-	1,465	58
ලැබිය යුතු වැට් බදු		4,822	2,400	-	-	-	-	4,822	2,400
මුදල් අග්‍රිම		60	60	-	-	-	-	60	60
මාලේ ව්‍යාපෘතිය (ඉන්ධන පිරිවැය) අයවිය යුතු		459	330	-	-	-	-	459	330
ව්‍යාපෘති ආරම්භකිරීමේ අත්තිකාරම් - නිරොන් එන්ටර්ප්‍රයිසස්		9,284	-	-	-	-	-	9,284	-
පිළිසරු ව්‍යාපෘතිය - අයවිය යුතු		315	-	-	-	-	-	315	-
වැටුප් අත්තිකාරම්		43	-	-	-	-	-	43	-

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 18		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
සමුද්‍රීය පරිසර දූෂණ අධිකාරිය		396	-	-	-	-	-	396	-
අයවිය යුතු කුලී - ප්ලාස්ටික් සහ පිළිසරු ව්‍යාපෘති		-	1,076	-	-	-	-	-	1,076
සායනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන (Sisil Hanaro Encare)		-	6,000	-	-	-	-	-	6,000
එකතුව		**97,321**	**85,761**	**751**	**-**	**9**	**-**	**98,081**	**85,761**

වගුව 15.27: සටහන 19

		ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCF ව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 19		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පූර්ව ගෙවීම්									
කල්තබා ගෙවීම්	19.1	4,574	4,508	2,921	200	-	-	7,495	4,708
ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ - අත්තිකාරම් අග්‍රිම		49	1,000	-	-	-	-	49	1,000
එකතුව		**4,623**	**5,508**	**2,921**	**200**	**-**	**-**	**7,544**	**5,708**

වගුව 15.28: සටහන 20

	ම.ප.අ.		පිළිසරු ව්‍යාපෘතිය		EDCF ව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 20	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
මුදල් සහ මුදල් හා සමාන ද්					**-**	**714**	-	714
ලංකා බැංකුව, පැලවත්ත - ප්‍රධාන ගිණුම 0-002937303	147,541	87,407	-	-	-	-	147,541	87,407
ලංකා බැංකුව, පැලවත්ත -මාලේ - 0002972309	1,404	1,936	-	-	-	-	1,404	1,936
ලංකා බැංකුව, ආයතනික ශාඛාව, 1608	5,219	8,093	-	-	-	-	5,219	8,093
ලංකා බැංකුව, පැලවත්ත, පොලිසෙස් 2937361	2,265	1,775	-	-	-	-	2,265	1,775
ලංකා බැංකුව, පැලවත්ත - DEO - 2937330	-	-	-	-	-	-	-	-
බැංකුවේ ඉතිරි මුදල්	-	-	-	22,318	-	-	-	22,318
මුදල් අග්‍රිම	-	-	-	30	-	-	-	30
එකතුව	**156,429**	**99,210**	**-**	**22,348**	**-**	**714**	**156,429**	**122,273**

වගුව 15.29: සටහන 21

		ම.ප.අ.		පිළිසරු ව්‍යාපෘතිය		EDCF ව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 21		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ගෙවිය යුතු									
ගෙවිය යුතු තැන්පතු	21.1	53	53	-	-	-	-	53	53
පාරිසරික බලපෑම් තක්සේරු ව්‍යාපෘති	21.2	70,537	66,286	-	-	-	-	70,537	66,286
යතුරුපැදි සඳහා ලැබුණු අත්තිකාරම්		454	-	350	350	6	6	810	356
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		1,607	1,266	-	-	-	-	1,607	1,266
වෛද්‍ය රක්ෂණ නිමිකම්පෑම්		312	143	-	-	-	-	312	143
ඉහළ කොත්මලේ ජලයේ ගුණාත්මකභාවය		728	728	-	-	-	-	728	728
ගෙවිය යුතු මුද්දර බදු		2,907	2,168	-	-	-	-	2,907	2,168
කල්තබා ලැබුණු පොලී (ස්ථාවර් තැන්පත්)		293	323	-	-	-	-	293	323
රඳවා තබාගැනීමේ ගාස්තු		505	496	16,785	21,008	-	-	17,290	21,504
යතුරුපැදි රක්ෂණ		70	70	-	-	-	-	70	70
බෙසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම		174	174	-	-	-	-	174	174
සණ අපද්‍රව්‍ය කළමනාකරණ දීමනා (එම))		3	3	-	-	-	-	3	3
යුනි ලංකා ආරක්ෂක සෙවා		300	-	-	-	-	-	300	-

		ම.ප.අ.		පිළිසරු ව්‍යාපෘතිය		EDCF ව්‍යාපෘතිය		එකතුව	
		2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 21		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිලිසරු අත්තිකාරම් ශෙෂය		8	-	-	-	-	-	8	-
අයකරගැනීම් - කැමරාව		-	60	-	-	-	-	-	60
එකතුව		**77,951**	**71,769**	**17,135**	**21,358**	**6**	**6**	**95,091**	**93,134**

වගුව 15.30: සටහන 22

	ම.ප.අ.		පිළිසරු ව්‍යාපෘතිය		EDCF ව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 22	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
උපචිත වියදම්	-	-	-	-	275	897	275	897
වැටුප් හා වේතන	4,399	3,567	-	-	-	-	4,399	3,567
සෙවක අර්ථසාධක අරමුදල	5,677	4,581	-	-	-	-	5,677	4,581
සෙවා නියුක්තයන්ගේ භාර අරමුදල	1,135	916	-	-	-	-	1,135	916
අතිකාල	628	614	-	-	-	-	628	614
ගමන් වියදම් - දේශීය	3,018	1,554	-	-	-	-	3,018	1,554
ගමන් වියදම් - විදේශීය	28	3	-	-	-	-	28	3
ගොඩනැගිලි අලුත්වැඩියා සහ නඩත්තු	397	477	-	-	-	-	397	477

	ම.ප.අ.		පිළිසරු ව්‍යාපෘතිය		EDCF ව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 22	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
කාර්යාල උපකරණ අලුත්වැඩියා සහ නඩත්තු	81	65	-	-	-	-	81	65
අආරක්ෂක ගාස්තු	2,128	4,722	-	-	-	-	2,128	4,722
විදුලිය ගාස්තු	907	1,755	-	-	-	-	907	1,755
ඉන්ධන සහ ලිහිසි තෙල්	2,823	2,543	-	-	-	-	2,823	2,543
ලිපිද්‍රව්‍ය	643	299	-	-	-	-	643	299
විදුලි සංදේශ	967	931	-	-	-	-	967	931
පුවත්පත්	19	31	-	-	-	-	19	31
ජල සැපයුම්	59	50	-	-	-	-	59	50
වැටි (උපචිත වියදම් සඳහා වැටි)	1,015	263	-	-	-	-	1,015	263
විගණන ගාස්තු	2,543	2,043	-	-	-	-	2,543	2,043
කාර්යාල ගොඩනැගිලි කුලී	75	27	-	-	-	-	75	27
ප්ලාස්ටික් ව්‍යාපෘතිය වියදම්	31	320	-	-	-	-	31	320
ජාතිය ගොඩනැගීමේ බද්ද	429	682	-	-	-	-	429	682
ආපදා ණය - මුද්දර ගාස්තු	1	0	-	-	-	-	1	0
NRM අංශය	234	300	-	-	-	-	234	300

	ම.ප.අ.		පිළිසරු ව්‍යාපෘතිය		EDCF ව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 22	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
සැලසුම් සහ අධීක්ෂණ ඒකකය	300	111	-	-	-	-	300	111
පරිසර දූෂණ පාලන අංශය (රසායනාගාරය)	39	561	-	-	-	-	39	561
විවිධ වියදම්	61	3	-	-	-	-	61	3
පරිසර දූෂණ පාලන අංශය	59	390	-	-	-	-	59	390
කාර්යාල උපකරණ	22	2,056	-	-	-	-	22	2,056
කාර්යාල ලීබඩු	156	2,306	-	-	-	-	156	2,306
පාසල් වැඩසටහන - භාණ්ඩාගාරය	109	220	-	-	-	-	109	220
WIP ප්‍රාග්ධන වත්කම්	15,533	3,496	-	-	-	-	15,533	3,496
වෛද්‍ය නිවාඩු ප්‍රතිපූර්ණය	31,057	22,812	-	-	-	-	31,057	22,812
ජාතික උත්සව	142	13	-	-	-	-	142	13
පාසල් වැඩසටහන -අමාත්‍යාංශය	3,683	43	-	-	-	-	3,683	43
සුභසාධන වියදම්	251	70	-	-	-	-	251	70
රක්ෂණ	498	400	-	-	-	-	498	400
ආර්ථික සෙවා ගාස්තු	138	155	-	-	-	-	138	155
උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ අංශය	528	27	-	-	-	-	528	27

	ම.ප.අ.		පිළිසරු ව්‍යාපෘතිය		EDCF ව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 22	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
මෝටර් වාහන අලුත්වැඩියා සහ නඩත්තු	562	-	-	-	-	-	562	-
රසායනාගාරය වැඩිදියුණු කිරීම	528	-	-	-	-	-	528	-
සායනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන	15,092	-	-	-	-	-	15,092	-
හරිත සම්මාන	16	-	-	-	-	-	16	-
රසායනාගාරය සඳහා රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම	216	-	-	-	-	-	216	-
සාමාජික ගාස්තු	3	-	-	-	-	-	3	-
යතුරුපැදි ණය	0	-	-	-	-	-	0	-
පළාත්පාලන ආයතන / ආයතන	-	-	195,281	180,466	-	-	195,281	180,466
පාරිතෝෂික දීමනා - ගෙවිය යුතු	0	-	-	-	-	-	0	-
නීති ගාස්තු	2	-	-	-	-	-	2	-
විද්‍යුත් අපද්‍රව්‍ය වැඩසටහන	233	-	-	-	-	-	233	-
KOICAව්‍යාපෘතිය	139	-	-	-	-	-	139	-
EEA අංශය - 319	1,170	-	-	-		-	1,170	-
JICAව්‍යාපෘතිය	1,385	-	-	-	-	-	1,385	-
රසායනාගාරය වැඩිදියුණු කිරීම - 413	16,459	-	-	-	-	-	16,459	-

	ම.ප.අ.		පිළිසරු ව්‍යාපෘතිය		EDCF ව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 22	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
දේශීය පුහුණු	-	119	-	-	-	-	-	119
රසායනාගාර උපකරණ	-	191	-	-	-	-	-	191
ආක්‍රමණකාරී පැලෑටි ඉවත්කිරීමේ ව්‍යාපෘතිය	-	25	-	-	-	-	-	25
SAICM පරිසර දූෂණ පාලන	-	16	-	-	-	-	-	16
VET වියදම්	-	38	-	-	-	-	-	38
පාසල් වැඩසටහන	-	958	-	-	-	-	-	958
ICES වැඩසටහන	-	26	-	-	-	-	-	26
GIS අංශය	-	2	-	-	-	-	-	2
තැපැල් ගාස්තු	-	2	-	-	-	-	-	2
පරිසර සංරක්ෂණ	-	290	-	-	-	-	-	290
පෙර පාසල් වැඩසටහන	-	50	-	-	-	-	-	50
මුද්දර ගාස්තු	-	0	-	-	-	-	-	0
එකතුව	**115,616**	**60,124**	**195,281**	**180,466**	**275**	**897**	**311,172**	**241,487**

වගුව 15.31: සටහන 23

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 23	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පුනරාවර්තන ප්‍රදාන								
මාලේ ප්‍රකාශනය	2,550	3,084	-	-	-	-	2,550	3,084
ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රදාන	16,815	16,316	-	-	-	-	16,815	16,316
GISව්‍යාපෘතිය	67	67	-	-	-	-	67	67
පරිසර දූෂණ ක්‍රියාකාරකම් සඳහා දත්ත සංචිතයක් සකස් කිරීම	111	111	-	-	-	-	111	111
මහා පරිමාණ ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම ප්‍රදාන	660	660	-	-	-	-	660	660
KITA ප්‍රදාන	106	106	-	-	-	-	106	106
ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමේ වැඩසටහන	265	265	-	-	-	-	265	265
ප්‍රජා පාදක ජලයේ ගුණාත්මකභාවය කළමනාකරණය කිරීමේ වැඩසටහන	526	526	-	-	-	-	526	526
ජලයේ ගුණාත්මකභාවය - ප්‍රධාන ජලාශ තුනක්	291	291	-	-	-	-	291	291
ම.ප.අ. රසායනාගාරය වැඩිදියුණු කිරීම - 2013	19,268	2,326	-	-	-	-	19,268	2,326
ම.ප.අ. රසායනාගාරය වැඩිදියුණු කිරීම - 2012	857	857	-	-	-	-	857	857
ජාතික තොරතුරු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම	94	94	-	-	-	-	94	94
SAICM උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය	599	1,336	-	-	-	-	599	1,336

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 23	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
SAICM පරිසර දූෂණය පාලනය කිරීම	3,716	3,782	-	-	-	-	3,716	3,782
පාසල් හරිතකරණ වැඩසටහන - HNB ඇෂුවරන්ස්	68	68	-	-	-	-	68	68
පාසල් නියමු වැඩසටහන	2,277	137	-	-	-	-	2,277	137
පරිසර සංරක්ෂණ ව්‍යාපෘතිය	692	690	-	-	-	-	692	690
තෙත් බිම් දිනය -2016	468	-	-	-	-	-	468	-
කැළණි ගඟ ප්‍රදාන	1,038	-	-	-	-	-	1,038	-
ජලයේ ගුණාත්මකභාවය - ප්‍රධාන ජලාශ	1,512	-	-	-	-	-	1,512	-
ජාතික හරිත සම්මාන ප්‍රදාන	290	-	-	-	-	-	290	-
හරිත ව්‍යාපෘතිය ප්‍රදාන	67	-	-	-	-	-	67	-
සුරක්ෂිත ලෙස ජංගම දුරකථන බැහැර කිරීම පිළිබඳ ව්‍යාපෘතිය	304	-	-	-	-	-	304	-
විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රදාන	-	470	-	-	-	-	-	470
තෙත් බිම් දිනය CBL	-	191	-	-	-	-	-	191
ICES පාඨමාලා ප්‍රදාන	-	232	-	-	-	-	-	232
සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩසටහන	-	1,347	-	-	-	-	-	1,347
එකතුව	**52,639**	**32,957**	**-**	**-**	**-**	**-**	**52,639**	**32,957**

වගුව 15.32: සටහන 24

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 24	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	227,134	176,821	163	66	-	-	227,297	176,887
එකතුව	**227,134**	**176,821**	**163**	**66**	**-**	**-**	**227,297**	**176,887**

වගුව 15.33: සටහන 25

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 25	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ප්‍රාග්ධන ප්‍රදාන	-	-	**8,760**	**8,760**	**2,255**	**3,523**	**11,015**	**12,283**
FRMP ප්‍රාග්ධන ප්‍රදාන	1	2	-	-	-	-	1	2
Dutch ප්‍රාග්ධන ප්‍රදාන	4,008	6,360	-	-	-	-	4,008	6,360
EA1P ප්‍රදාන	5,047	5,221	-	-	-	-	5,047	5,221
ප්‍රාග්ධන ප්‍රදාන - භාණ්ඩාගාර අරමුදල්	105,902	98,161	-	-	-	-	105,902	98,161
ප්‍රාග්ධන ප්‍රදාන - භාණ්ඩාගාර අරමුදල් (මෝටර් වාහන)	123,024	3,424	-	-	-	-	123,024	3,424
UNDP	1,735	2,689	-	-	-	-	1,735	2,689
APPELLව්‍යාපෘතිය	8	16	-	-	-	-	8	16

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 25	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පුස්තකාල පොත් ප්‍රදාන	105	141	-	-	-	-	105	141
අන්තර්ජාතික සංවර්ධන සංගමය	110,507	114,656	-	-	-	-	110,507	114,656
IRMP	1,289	1,289	-	-	-	-	1,289	1,289
UNEP	-	1	-	-	-	-	-	1
UNEP ප්‍රාග්ධන ප්‍රදාන	-	1	-	-	-	-	-	1
විද්‍යුත් අපද්‍රව්‍ය - ප්‍රාග්ධන ප්‍රදාන	19	28	-	-	-	-	19	28
ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රාග්ධන ප්‍රදාන	2,693	2,995	-	-	-	-	2,693	2,995
GIS ප්‍රාග්ධන ප්‍රදාන	440	560	-	-	-	-	440	560
ගෘහස්ථ අපද්‍රව්‍ය අවම කිරීමේ ව්‍යාපෘතිය - ගම්පහ	94	142	-	-	-	-	94	142
පශ්චාත් සුනාමි ප්‍රාග්ධන ප්‍රදාන	43	64	-	-	-	-	43	64
සොභා කෙත මධ්‍යස්ථානය - ප්‍රදාන	388	400	-	-	-	-	388	400
අතරමැදි මහල	20,625	21,250	-	-	-	-	20,625	21,250
පරිසර දූෂණ ක්‍රියාකාරකම් සඳහා දත්ත සංචිතයක් සකස් කිරීම	659	824	-	-	-	-	659	824
දකුණු ආසියා වැඩසටහන	42	53	-	-	-	-	42	53
සුරක්ෂිත ලෙස ජංගම දුරකථන බැහැර කිරීම	203	238	-	-	-	-	203	238

	ම.ප.අ.		පිළිසරුව්‍යාපෘතිය		EDCFව්‍යාපෘතිය		එකතුව	
	2015	2014	2015	2014	2015	2014	2015	2014
සටහන 25	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ජෝන් කීල්ස් පදනම	71	83	-	-	-	-	71	83
පුස්තකාල තොරතුරු මධ්‍යස්ථානය	1,091	1,253	-	-	-	-	1,091	1,253
නියමු වැඩසටහන - අමාත්‍යාංශ අරමුදල	143	167	-	-	-	-	143	167
ම.ප.අ. රසායනාගාරය වැඩිදියුණු කිරීම	51,835	49,667	-	-	-	-	51,835	49,667
පරිසර සංරක්ෂණ ව්‍යාපෘතිය	191	215	-	-	-	-	191	215
SAICM උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය	434	489	-	-	-	-	434	489
SAICM පරිසර දූෂණය පාලනය කිරීම	420	471	-	-	-	-	420	471
පිළිසරුව්‍යාපෘතිය - රසායනාගාර උපකරණ	3,247	3,148	-	-	-	-	3,247	3,148
EDCF ගොඩනැගිලි අරමුදල	1,595	1,637	-	-	-	-	1,595	1,637
KOICA ප්‍රාග්ධන ප්‍රදාන	425,510	-	-	-	-	-	425,510	-
ජලයේ ගුණාත්මකභාවය - JAICA	6,152	-	-	-	-	-	6,152	-
ජලය අධීක්ෂණය කිරීම (JICA)	390	-	-	-	-	-	390	-
යුනිසෙෆ්	104	-	-	-	-	-	104	-
අබාන්ස් ඔටෝ (පුද්) සමාගම	97	-	-	-	-	-	97	-
එකතුව	**868,112**	**315,642**	**8,760**	**8,760**	**2,255**	**3,523**	**879,127**	**327,926**

16.0 විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } අයිඊඑන්/ඊ/සීඊඒ/01/15/22 මගේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2016 දෙසැම්බර් 07 දින

සභාපති,
මධ්‍යම පරිසර අධිකාරිය

මධ්‍යම පරිසර අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මධ්‍යම පරිසර අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 6(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2016 අගෝස්තු 26 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටීන් සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03

ඉකුත් වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි ලෙස වර්ගීකරණය කර තිබූ වටිනාකම රු.2,450,000 ක් වූ ඉඩම් සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කර තිබුණ ද එයට අදාල රු. 428,750 ක් වූ ක්ෂය සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07

සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් පමණක් නිබෙන දේපළ පිරියත හා උපකරණ සෑම වසර 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් රු.95,469,873 ක් වටිනා මෝටර් වාහන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පරිගණක යන්ත්‍ර සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් ජීවිත කාලය ඇගයීමකින් තොරව කාර්යාල උපකරණ වෙනුවෙන් අනුගමනය කරනු ලබන පිරිවැයෙන් සියයට 10 ක් වූ වාර්ෂික ක්ෂය කිරීම් ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ විවිධ ආයතන වලින් හා වෙනත් ව්‍යාපෘතිවලින් ලැබී තිබූ එකතු වටිනාකම රු.20,178,000 ක් වූ වත්කම් ගිණුම් ගත කර නොතිබුණු අතර ඒ වෙනුවෙන් වූ ක්ෂය ප්‍රතිපාදයන්ද සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් ඉකුත් වර්ෂයේදී ලැබී තිබූ වටිනාකම රු. 395,200,000 ක් වූ ව්‍යාපෘති 2014 වර්ෂයේදී ප්‍රාග්ධනිත නොකිරීම නිසා එයට අදාළ රු.9,443,854 ක් වූ ක්ෂය අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ලියා හැර තිබුණි.

(ඇ) විවිධ ආයතන වලින් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.528,152,772 ක් වූ වත්කම්වල වටිනාකම මූල්‍ය වලනයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර තිබූ අතර ඉකුත් වර්ෂයේදී මෝටර් බයිසිකල් මිලදී ගැනීම සඳහා වැයකළ රු.7,320,000 ක් සමාලෝචිත වර්ෂයේ මුදල් ගලා යෑමක් ලෙස දක්වා තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 34,546,481 ක් වූ මාර්ගස්ථ තොග හා කෙරිගෙන යන වැඩ සහ එකතුව රු. 164,361,911 ක්වූ පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු ව්‍යාපෘති වියදම් සඳහා පිළිවෙලින් විස්තරාත්මක උපලේඛන සහ බිල්පත් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති රීති, හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ)	2006 ඔක්තෝබර් 10 දිනැති අංක 1466/5 දරන ගැසට් පත්‍රය.	සණකම මයික්‍රෝන 20 හෝ ඊට අඩු පොලිතීන් දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය කිරීම, එම නිෂ්පාදනයන් විකිණීමට හෝ භාවිතා කිරීම තහනම් කර තිබුණද, මෙකී නියෝගයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10.3 වගන්තිය හා 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය	ආපදා ණය ගෙවීමේදී නිලධාරීන්ගේ මූලික වැටුප පදනම් කරගෙන ණය මුදල ගණනය කළ යුතු වුවද, අධිකාරිය විසින් දළ වැටුප පදනම් කරගෙන ගණනය කර ගෙවීම් කර තිබීම හේතුවෙන් නිලධාරීන් 123 දෙනෙකුට රු.17,431,997 ක් වැඩිපුර ගෙවීම් කර තිබූ අතර නිලධාරීන් 59 දෙනෙකු වෙත චක්‍රලේඛ සීමාව ඉක්මවා ආපදා ණය ගෙවා තිබුණි.
(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය	වාර්ෂිකව ස්ථාවර වත්කම් සමීක්ෂණය කර ස්ථාවර වත්කම් ලේඛනයේ ශේෂය සමඟ සැසඳිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඈ)	2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය	අතිරේක දීමනා ගෙවීමේදී ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගත යුතු වුවද එයට පටහැනිව පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති නිලධාරීන් 22 ක් සඳහා වැටුප් වර්ධක තුන බැගින් ලබාදී තිබුණි.

(ඉ) භාණ්ඩාගාර චක්‍රලේඛ

(i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 චක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 චක්‍රලේඛය	පරිගණක හා පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ හා ඊට අදාල ව්‍යාපෘති 02 හි මූල්‍ය ප්‍රතිඵලය රු.72,318,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.61,310,000 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,008,000 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.86,026,000 කින් වර්ධනය වී තිබුණද මෙහෙයුම් වියදම රු.97,033,000 කින් ඉහළ යාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණද 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. එසේ වුවද සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී අධිකාරියේ දායකත්වය 2014 සහ 2015 වර්ෂවල පිළිවෙලින් රු.453,482 හා රු.646,565 ක් විය.

3.2 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

ආයතනය විසින් පරිසර දූෂණ හා පරිසර බලපත්‍ර ලබා නොගැනීම් සම්බන්ධයෙන් බාහිර ආයතන හා පුද්ගලයින්ට එරෙහිව අධිකරණවල සමාලෝචිත වර්ෂයේදී නඩු 60 ක් හා ඉකුත් වර්ෂයේ දී නඩු 116 ක් ගොනුකර තිබුණි.

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 10 වන වගන්තියට අනුව ප්‍රධාන අරමුණු පහතින් දැක්වේ.

- ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිසරයේ අනතුරුදායක මෙන්ම අනතුරුදායකවීමට ඉඩ තිබෙන අපද්‍රව්‍ය මුදා හැරීම, තැන්පත් කිරීම හෝ වෙනත් දූෂණ මාර්ගවල ස්වභාවය, ප්‍රමාණය, අන්තර්ග්‍රහණය සහ බලපෑම් විධිමත් කිරීම, පවත්වාගෙන යෑම හා පාලනය කිරීම.

- පාරිසරික බලපෑම් ඇගයීම උපයෝගී කරගෙන ක්‍රමවත්ව ඇගයීමට ලක් කරන ලද පාරිසරික ගැටළු මඟින් පරිසරයට හිතකාමී සංවර්ධනයක් තහවුරු කරමින් රටේ ස්වභාවික සම්පත් පද්ධතිය ආරක්ෂා කිරීම.

- පරිසරය ආරක්ෂා කිරීමෙහිලා මහජන සහයෝගය සහ සහභාගිත්වය ලබා ගැනීම. විශේෂයෙන් පාසල් ළමුන්ගේ සහයෝගය ලබා ගැනීම අරමුණු කොට දේශීය, ජාතික මෙන්ම ගෝලීය පරිසර ගැටළු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම.

එම අරමුණු අතරින් පහත සඳහන් අරමුණු ඉටුකර නොනිබුණි.

(i) යම් පළාත් පාලන ආයතනයක පාලන සීමාව ඇතුළත පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ යම් නිර්දේශ සහ විශේෂයෙන්ම පාරිසරික දූෂණය පිළිබඳ වූ නිර්දේශ අනුව ක්‍රියාකරන ලෙස හා ඒ නිර්දේශ බලාත්මක කරන ලෙස ඒ පළාත් පාලන ආයතනයට නියම කිරීම.

(ii) පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වෙනත් රටවල් සහ අන්තර් ජාතික සංවිධාන සමඟ සම්බන්ධතා ඇති කිරීම සහ පවත්වා ගෙනයාම.

(ආ) පිළිසරු ව්‍යාපෘතිය

2008 – 2010 වර්ෂය දක්වා වර්ෂ 03 ක කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට සැලසුම්කර තිබූ ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් රු.බිලියන 5.633 ක් වෙන්කර දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.බිලියන 2.555 හෙවත් සියයට 45 ක් පමණක් උපයෝජනය කර තිබුණි. 2016 මැයි අවසානය දක්වා ව්‍යාපෘතිය නිමකර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 දැයට කිරුළට සමගාමීව මාතර මහ නගර සභාවේ නිර්වායු ජීර්ණ තාක්ෂණය යොදාගනිමින් ක්‍රියාත්මක වන කොටවිල කසල කළමනාකරණ ව්‍යාපෘතියට 2014 වර්ෂයේදී හා 2015 වර්ෂය ආරම්භයේදී කොන්ත්‍රාත්තුව සඳහා ප්‍රතිපාදන මුදලින් සියයට 55 ක් හෙවත් රු.64,356,000 ක් වැඩ පූර්ව අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් සමාගමට ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු අතරමහ නවතා තිබූ අතර එම ව්‍යාපෘතිය 2016 මැයි 01 දින වන විටත් නැවත ආරම්භ කර නොතිබුණි.

(ii) කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභා හතරකට හා නගර සභාවකට රු.5,552,962 ක් ලෙස අත්තිකාරම් ලබා දී තිබුණද එම ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

(iii) පළාත් පාලන ආයතන 06 ක කොම්පෝස්ට් ව්‍යාපෘති මාස 05 සිට අවු 03 මාස 09 දක්වා කාල ප්‍රමාදයක් සහිතව ආරම්භ කර තිබුණි.

(iv) ව්‍යාපෘතියේ අරමුණු වලින් බැහැරව මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් සඳහා රු.1,372,000 ක් වියදම් කර තිබුණි.

(ඇ) ආර්ථික සහයෝගිතා අරමුදල් ණය පහසුකම් මත සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (EDCF)

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය මාස 48 කින් නිම කිරීමේ පදනම් මත කොරියන් රජයෙන් හා ශ්‍රී ලංකා රජයෙන් පිළිවෙළින් ඇමරිකානු ඩොලර් 33,536,000 ක් හා ඇමරිකානු ඩොලර් 8,350,000 ක් යොදවා 2013 නොවැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණි. 2016 මැයි වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 02 මාස 05 ක කාලයක් ගතවී තිබුණද යෝජිත බිම් පිරවුම් මධ්‍යස්ථාන 04 හි ඉදිකිරීමේ

කටයුතු නිමකර නොතිබුණි. මේ සඳහා 2014 වර්ෂයේ රු.143,515,900 ක් හා 2015 වර්ෂයේ රු.192,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(ii) ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ගොඩනැංවීම සඳහා 2015 වර්ෂයේ විදේශ ණය ලෙස රු.300,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමකින් තොරව 2015 දෙසැම්බර් 29 දින අමාත්‍යාංශයේ වෙළි ආරක්ෂණ හා ජල සම්පත් කළමනාකරණ සැලසුම්කරණ ව්‍යාපෘතිය සඳහා මාරුකර තිබුණි.

(iii) විදේශ මූල්‍යයනය ආශ්‍රිත දේශීය පිරිවැය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.92,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද රු.14,953,000 ක් පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 84 ක් එනම් රු.77,047,000 ක් ඌනඋපයෝජිතව පැවතුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දොම්පේ සනීපාරක්ෂක කසල රඳවන බිම් පිරවුම් ව්‍යාපෘති පරිශ්‍රයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා රු.69,500,000 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී සම්මත රේටයන්වලට වඩා වැඩියෙන් ඇස්තමේන්තු කිරීම, සිදුකර නොමැති විෂයයන් සඳහා ඇස්තමේන්තු කිරීම හා අසම්භාව්‍යයන් වෙනුවෙන් ඇස්තමේන්තු කිරීම හේතුවෙන් රු.22,266,495ක අධි ඇස්තමේන්තු කිරීම නිසා කොන්ත්‍රාත්කරුට රු.8,151,173 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද මාර්ගය ඉදිකිරීම් කටයුතු නියමිත ප්‍රමිතියට සිදුකර නොමැති බව රසායනාගාර වාර්තා 05 ක් මඟින් සනාථ වී තිබුණද අධිකාරිය මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(ආ) පරිසර අමාත්‍යාංශය මඟින් අධිකාරිය වෙත ලබා දී තිබුණු වාහන 06 ක් වසර තුනක් නිස්සේ අධිකාරිය විසින් භාවිත කරමින් පැවතියද එහි අයිතිය විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විධායක දීමනා ලෙස අධිකාරියේ නිලධාරීන්ට ගෙවා තිබූ රු.1,901,000 ක දීමනා 2016 අප්‍රේල් වන විටත් නැවත අයකර ගෙන නොතිබුණි.

(ඇ) පාරිසරික බලපෑම් තක්සේරු ව්‍යාපෘති වාර්තා අනුමත කිරීමේ කාර්ය වෙනුවෙන් ව්‍යාපෘති 21කට අදාළව ව්‍යාපෘති යෝජකගෙන් අයකරගත යුතු රු.325,339 ක පරිපාලන ගාස්තු අයකර ගෙන නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධිකාරියේ නිලධාරීන් 874 ක් සඳහා ආහාර දීමනා ලෙස දිනකට රු.85 බැගින් රු.12,902,384 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

පුනරාවර්තන හා ප්‍රාග්ධන ආධාර ලෙස ව්‍යාපෘති 10 ක් සඳහා ලැබුණු රු.4,333,917 ක මුදලක් අදාල අරමුණු සඳහා යෙදවීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

4.5 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මයික්‍රෝන 20 ට අඩු පොලිතීන් නිෂ්පාදන පරීක්ෂාව සඳහා 2007 වර්ෂයේදී රු.452,660 ක් වැය කර මිලදී ගෙන තිබූ පරීක්ෂණ උපකරණ 10 ක්, 2016 මැයි දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) වටිනාකම රු.6,050,000 ක් වූ මෝටර් වාහනයක් වසර හතරකට ආසන්න කාලයක සිට භාවිතා කිරීමකින් තොරව වාහන අංගනය තුළ නවතා තිබුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

2014 වර්ෂයේදී ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් නියමිත දිනට නොගෙවීම් හේතුවෙන් අධිභාර ලෙස රු.18,130 ක මුදලක් ගෙවා තිබූ අතර මෙම මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.7 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදී තිබූ අධිකාරියේ සම්පත්

දොම්පේ ග්‍රීන් පාර්ක් මධ්‍යස්ථානය වෙත ලැබුණු රු.6,675,000 ක් වූ කම්පැක් වාහනයක් 2014 වර්ෂයේ සිට කඩුවෙල මහ නගර සභාවේ ප්‍රයෝජනය සඳහා අනුමැතියකින් තොරව ලබා දී තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 1173 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 874 ක් විය.

(ආ) නව බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීමකින් තොරව කාර්ය මණ්ඩල අනුමත කිරීම් හා උසස් කිරීම් වලදී නීත්‍යානුකූල පදනමකින් කටයුතු කර නොතිබුණ අතර මේ හේතුවෙන් නිසි සුදුසුකම්ලත් නිලධාරීන් පත්කර ගැනීමේ අවස්ථාව මහහැරී ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම පවත්නා බඳවාගැනීමේ පරිපාටිය තුළ එක් එක් තනතුරට අදාලව තිබිය යුතු මූලික උපාධි සහ පශ්චාත් උපාධි සුදුසුකම් හා අධිකාරිය තුළ අවුරුදු කිහිපයක සේවා පළපුරුද්ද සමාන ලෙස සලකා සුදුසුකම් තීරණය කර තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර ඇතැම් තනතුරු වල දැනට කටයුතු කරන නිලධාරීන්ගේ පවතින සුදුසුකම් ඇතුළත්කර බඳවාගැනීමේ පරිපාටිය සකස්කර තිබූ බව ද නිරීක්ෂණය විය.

4.9 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාවිතයෙන් ඉවත්කර ඇති වාහන 04 ක් අපහරණය කිරීමට හෝ වෙන්දේසි කිරීමට හෝ අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) අස්ථාන ගතවූ පිරිවැය රු. 183,000 ක් වූ මෝටර් බයිසිකලයක් සම්බන්ධයෙන් වූ පරීක්ෂණ කටයුතු විගණිත දිනය වූ 2015 දෙසැම්බර් 31 දින දක්වාම අවසන් කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ යෝජිත කාර්ය මණ්ඩලය අභ්‍යන්තර විගණක ඇතුළු නිලධාරීන් 07 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද 2016 අගෝස්තු 01 දිනට නිලධාරීන් තිදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. අධිකාරියේ විෂය පථය හා සැලකීමේදී මෙම කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

5.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ පරිසර පැමිණිලි 2053 ක් ලැබී තිබූ අතර ඉන් 1614 ක් හෙවත් සියයට 79 ක් විසඳීමට කටයුතු කර නොතිබූ අතර පැමිණිලි විසඳීමේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ජාතික ගැටළුවක්ව පවතින නගරාසන්න ප්‍රදේශ තුළ එකතු වන කසල සම්බන්ධයෙන් රට තුළ සුළු හෝ මධ්‍ය පරිමාණයෙන් යුක්තව කසළ කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ඇතිවන අතුරු ඵලයක් වන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය තුළින් රසායන පොහොර භාවිතයට විකල්ප විසඳුමක් ලබා දීම හා පරිසර හානිය අවම කිරීමට මෙන්ම අධිකාරියට ආදායමක් ලබා ගැනීම යනාදී කරුණු සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් දැක්වීම අධිකාරිය සතු වගකීමක් වුවද ඒ සඳහා වැඩි අවධානයක් යොමු කර නොතිබුණි.

(ඇ) කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිසි ක්‍රමවේදයකින් තොරව නිකුත් කිරීම හේතුකොටගෙන අධිකාරිය විසින් ජනතාවට ලබාදිය යුතු සේවාව සාර්ථකව ඉටු වී නොතිබුණි.

(ඈ) සමනළ අඩවිය රක්ෂිතය තුළ ඇලි 07 නමින් හැඳින්වෙන දිය ඇලි 07 න් 06 වන ඇල්ලට ඉහළින් අමුණක් ඉදිකර ජලය හරවා නාය ගහ කුඩා පරිමාණ විදුලි බලාගාරය තැනීම මගින්, 06 හා 07 වන දිය ඇලි වල ජලය සිදී යාමේ අවදානමක් ඇති බව හඳුනාගෙන තිබූ අතර ඒ පිළිබඳ ඉදිරිපත් කර තිබූ පැමිණිලි හා අවදානම් නොසලකා ඊට අදාල මූලික පාරිසරික වාර්තා ලබා දී තිබුණි. මේ වන විට ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර එකී දිය ඇලි 07 න් 02 ක් සිදී යාමේ තර්ජනයක් පවතින බව

ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවලින් තහවුරු කරගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) ජානික පාරිසරික පනතේ සඳහන් අරමුණු හා ප්‍රධාන කාර්යයන් අතර පරිසරය කරා අපද්‍රව්‍ය සහ දූෂිත ද්‍රව්‍ය පිටවීමට සහ පරිසරයේ තත්ත්වය ආරක්ෂා කිරීමට මෙන්ම වැඩිදියුණු කිරීමට අදාල සියළු විධිමත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම අධිකාරිය සතු විය. බොහෝ පළාත් පාලන ආයතන විසින් නගරාශ්‍රිතව එකතුවන කසළ අපද්‍රව්‍ය බැහැර කිරීම පරිසරයට මෙන්ම ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධ බරපතල ගැටළුවක් වන බැවින් ඊට කඩිනමින් විසඳුම් ලබාදීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) කාර්ය මණ්ඩල පරිපාලනය	බඳවාගැනීමේ පටිපාටිය අනුව බඳවා ගැනීම්, උසස්වීම්, වැටුප් වර්ධක ලබානොදීම.
(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පාලනය	නියමිත දිනට ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු නොකිරීම හා ව්‍යාපෘති වලට අදාල අවසන් වාර්තා හා ගිණුම් ඉදිරිපත් කර නොතිබීම.
(ඇ) වාහන පාලනය	භාවිතයටගත නොහැකි වාහන ඉවත් කිරීම හා කුලී වාහන ලබා ගැනීම අවම කිරීමට කටයුතු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබීම.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)